

THE LIBRARY
343.4 (058)
L. S. T

ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2007

REFERENCE
ONLY
LIBRARY
L S T

ශ්‍රී ලංකාව:
මානව හිමිකම් තත්ත්වය 2007

11 FEB 2010

ශ්‍රී ලංකාව:
මානව හිමිකම් තත්ත්වය 2007

මෙම වාර්තාව *"Sri Lanka : State of Human Rights 2007"*
ඉංග්‍රීසි වාර්තාවේ සමස්ත සමාලෝචනය සහ එම වාර්තාවේ ඉතා
වැදගත් පරිච්ඡේදයන් 3ක පරිවර්තනයකි.

නීතිය හා සමාජ භාරය
3, කින්සි ටෙරසය
කොළඹ 08
ශ්‍රී ලංකාව

© නීතිය හා සමාජ භාරය
2009 ඔක්තෝබර්

008160

ISBN 978-955-1302-22-1

CLASS NO : 343.4 (058)
ACC. NO : 8160

REFERENCE
ONLY
LIBRARY
LST

පටුන

I. වර්ෂ 2006 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සමාලෝචනය 1

1. හැඳින්වීම 1

2. සටන් විරාම ගිවිසුම අසාර්ථක වීම 5

3. ගැටුම් උත්සන්න වීම 6

3.1 ප්‍රධාන සිද්ධීන් 7

3.2 සිවිල් ජනතාව කෙරෙහි වූ බලපෑම් 8

3.2.1 අභ්‍යන්තරිකව අවතැන් වීම 8

3.2.2 යාම්-ඊම් නිදහස සීමා කිරීම 10

3.2.3 ළමුන් බඳවා ගැනීම 11

4. මානව හිමිකම් සුරක්ෂිත කිරීම ආශ්‍රිත ව්‍යුහාත්මක දුර්වලතා 12

5. අහඹු ලෙස ආයතන ස්ථාපිත කිරීම 14

6. මුස්ලිම් ජාතිකයන්ගේ අත්දැකීම් - ඉතිහාසය ලුහුඬින් හා 2006 වසර සඳහා එහි බලපෑම 16

6.1 1990 වසරේ මුස්ලිම් ජාතිකයන් පළවා හැරීම 17

6.2 පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය (P-TOMS) 19

6.3 2006 අගෝස්තු වල මුතූර් 21

7. අවසානය 23

II. මානව හිමිකම් සඳහා වන අධිකරණමය රැකවරණය 24

1. හැඳින්වීම 24

2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සන්දර්භයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයක ප්‍රතිචාරය 26

2.1 11 වන ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් චෝදනාකරමින් ඉදිරිපත්වූ මූලික අයිතිවාසිකම් ඉල්ලීම්වල අඩුවීම 26

3. සමානාත්මතාවයේ අයිතිය සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරය 36

3.1 මහින්ද රාජපක්ෂ එ. චන්ද්‍රා ප්‍රනාන්දු, පොලිස්පති සහ තවත් අය 35

3.2 එන්. ඩබ්. එම්. ජයන්ත විජේසේකර සහ තවත් අය එ. නීතිපති සහ තවත් අය 41

3.3 12(1) ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වෙනත් නඩුවලදී මතුවූ මූලධර්මයන් 48

4. පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරය 52

4.1 දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත් කෙටුම්පත 52

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ සිය අධිකරණ බලය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරය 55

5.1 එන්. වී. කේ. කේ. වේරගොඩ, මහලේකම් එ. ජා. ප. එ. දිසානායක සහ තවත් අය 55

5.2 සීමන්මෙමෙරු පතිරණගේ ශාන්ත ධර්මප්‍රිය පතිරණ එ. නියෝජ්‍ය පොලිස්පති පුද්ගලික පුහුණු හා වෙනත් අය 58

5.3 විශුවලිංගම් සහ තවත් අයෙක් එ. නීතිපති සහ තවත් අය 62

6. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පළමුවන අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය යටතේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් සිදුකොට ඇති නිවේදනයන් 65

6.1 ප්‍රොටොකෝලයට පසුව ප්‍රවේශවීම 65

6.2 සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ එ. ශ්‍රී ලංකාව 67

7. සිංගරාසා නඩුව 73

7.1 සිද්ධිමය පසුබිම 73

7.2 නඩුතීන්දුව පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය 75

III. අභ්‍යන්තරිකව අවතැන් වූ තැනැත්තන් සහ
සිවිල් ජනතාවගේ රැකවරණය 84
1. හැඳින්වීම 84
2. අවතැන් වීමේ ගතිකයන් 85
2.1 අභ්‍යන්තරිකව අවතැන් වූ තැනැත්තන් පිළිබඳ නිර්වචනය 85
2.2 ශ්‍රී ලාංකීය සන්දර්භය 85
2.3 අවතැන්වීමට බලපාන හේතු 87
2.4 බහුවිධ අවතැන්වීම 89
3. ජාතික රාමුව 90
3.1 නීති සහ ප්‍රතිපත්ති 90
3.2 ව්‍යුහයන් 93
3.3 මානුෂවාදී අර්බුදයක් තුළ ආරක්ෂක ගැටළු 94
3.4 කඳවුරුවල ආරක්ෂාව සම්බන්ධ සිදුවීම් 95
3.5 විශේෂිත කණ්ඩායම් පිළිබඳ සැලකිල්ල දැක්වීම 97
4. සංචලනයේ සීමාවන් හා බාධාවන් 98
4.1 මාර්ග වසා දැමීම සහ ප්‍රජාවන් වෙත එහි බලපෑම 98
4.2 සීමාකිරීම් උපකරණයක් ලෙස භාවිත කිරීම:
කුමන වන්දියක් යටතේද? 100
4.3 ජීවිකාවන් කරගෙන යාමට ඇති සීමාවන් 101
5. අවතැන්වීම් සහ යුධමය උපායමාර්ග 101
5.1 යුධෝපක්‍රම හේතුවෙන් සංචලනයට ඇතිවී ඇති බාධාවන් 102
5.2 සංචලනයට බලකිරීම 103
5.3 අධි ආරක්ෂිත කලාප සහ සීමාවන් 104
6. ආපදා සූදානමක් පවතීද? 105
6.1 නැඹුරුතාවන් : රාජ්‍ය හා රාජ්‍ය නොවන
ක්‍රියාධරයින්ගේ භූමිකාව 106
7. සාධාරණත්වය 108
8. මානුෂවාදී උපකාරයන්: විකාශය වෙමින් පවත්නා
නැඹුරුතාවන් 111
8.1 මානුෂවාදී ආධාර කිරීම් දේශපාලනයට යොදාගැනීම 111

8.2 මධ්‍යගත කිරීම 112
8.3 අදහස් විමසීමේ හා සහභාගිත්වයේ ඌනතාවය 113
8.4 සීඝ්‍ර මිලිටරීකරණය 114
8.5 මානුෂවාදී සහන සැලසීම් ජනවාර්ගිකත්ව චුවමනාවන් වෙනුවෙන් යොදාගැනීම 115
9. මානුෂවාදී අවකාශය ඌනනය වීම 117
9.1 මානුෂවාදී ක්‍රියාධරයින්ට පවත්නා තර්ජනයන් 117
9.2 මානුෂවාදී ක්‍රියාධරයින් වෙත පැනවී ඇති බාධාවන් 119
10. අවසානය 121

IV. ශ්‍රී ලංකාවේ අභිචෝදන ක්‍රමය තුළ විමර්ශනය සඳහා වූ කොමිසම්හි කාර්යභාරය 122
1. හැඳින්වීම 122
2. විමර්ශනය සඳහා වූ කොමිසම් පනත යටතේ අදාළ කොමිසම්වල විෂය පථය සහ ස්වභාවය 123
3. මානව හිමිකම් කඩකිරීම්, අතුරුදහන් කිරීම් සහ අධිකරණ බාහ්‍ය ඝාතනයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිසම් පත්කිරීම සම්බන්ධ කෙටි හැඳින්වීමක් 124
4. විමර්ශන කොමිසම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විවිධ ප්‍රවේශයන් පිළිබඳ සුවිශේෂී විග්‍රහයක් 126
4.1 1994 විමර්ශන කොමිසම ක්‍රියාත්මක කිරීම හා සසඳා බැලීමේදී 2006 විමර්ශන කොමිසමේ පුළුල් අරමුණු 126
4.2 ප්‍රසිද්ධියේ හෝ කැමරා ඉදිරිපිටදී හෝ සිදුවන ක්‍රියාදාමයන් පිළිබඳ පැනනැඟින ගැටළුව 127
4.3 සාධාරණ ලෙස කටයුතු කිරීමේ යුතුකම නිසි ක්‍රියාපටිපාටියක් සඳහා අවම කාල සීමාව 133
4.4 විමර්ශන කොමිසම් පත් කිරීමේ ප්‍රායෝගික යථාර්ථයන් සහ ප්‍රයෝජනාත්මක අගයන් පිළිබඳ කෙටි විග්‍රහයක් 135
4.5 විමර්ශන කොමිසම් හි බලතල සහ බැඳීම් 137
4.5.1 එහි කාර්යපටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අදාළ කොමිසම් හි බලතල 137

4.5.2 ක්‍රියාපටිපාටින් හැසිරවීම සම්බන්ධයෙන් කොමිසම් හි බැඳීම් 142
4.6 ඇඹිලිපිටිය පාසැල් සිසුන් 53ක් සහ තවත් 11 දෙනෙකු පැහැරගෙනයාම සහ අතුරුදහන්වීම 145
4.6.1 පොලීසිය විසින් කටඋත්තර වාර්තා කිරීම ප්‍රතික්ෂේප කිරීම 145
4.6.2 පසුව ඇතිවන විමර්ශන ක්‍රියාවලිය 146
4.7 අභිචෝදන ක්‍රමය සහ ඇටෝර්නි ජෙනරාල්වරයාගේ කාර්යභාරය 148
4.7.1 ප්‍රාථමික විමර්ශන පිළිබඳ සංකල්පය - (ලඝු නොවන කාර්යපටිපාටිය) 148
5. නීතියෙහි වියයුතු සංශෝධන සම්බන්ධ නිර්දේශයන් කෙටියෙන් 159
6. අවසානය 165

උප ලේඛන

2006 දෙසැම්බර් 31 වන දිනට:

I. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති එක්සත් ජාතින්ගේ මානව හිමිකම් සම්මුතීන් හා ත්‍රස්තවාදය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් 166
II. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් 170
III. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර තිබෙන මානුෂවාදී නීති සම්මුතීන් 175
IV. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන 176
V. තීරණය කරන ලද මූලික අයිතිවාසිකම් නඩු තීන්දු 178
VI. ගෙනහැර දක්වන ලද නඩු තීන්දු - ශ්‍රී ලාංකීය සහ වෙනත් අධිකරණ බල සීමා 179

දායකත්වය

වර්ෂ 2006 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සමාලෝචනය
ෆර්සානා හනීෆා සහ දුලාංජි කුලසිංහ

මානව හිමිකම් සඳහා වන අධිකරණමය රැකවරණය
කිශාලි පින්ටෝ ජයවර්ධන

අභ්‍යන්තරිකව අවතැන් වූ තැනැත්තන් සහ සිවිල් ජනතාවගේ රැකවරණය
භවානි ෆොන්සේකා

ශ්‍රී ලංකාවේ අභිචෝදන ක්‍රමය තුළ විමර්ශනය සඳහා වූ කොමිසම් හි කාර්යභාරය
ආචාර්ය ජයන්ත ද අල්මේදා ගුණරත්න

සම්බන්ධීකරණය
සේනානි කරුණාරත්න

සිංහල පරිවර්තනය
ලක්ෂිත ජයවර්ධන
ගංගන හේවාවිතාන
විදුර මුණසිංහ
චතුරාණි අබේවික්‍රම

කවරය
මානික්‍යා කොඩිතුවක්කු, ත්‍යාගි පියදාස

පරිගණක පිටු සැකසුම සහ මුද්‍රණය
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම
අංක 67, කාර්මික ජනපදය
කටුවාන පාර
හෝමාගම
info@karusons.com

REFERENCE
ONLY
LIBRARY
L S T

පෙරවදන

ශ්‍රී ලංකා රාජ්‍යය සිය දේශීය මෙන්ම අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් කොතෙක් දුරට ඉටුකරන්නේද, එතුළින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම් කොතෙක් දුරට සුරක්ෂිතව ඇත්තේද යන කරුණු විදහා දක්වෙන නීතිය හා සමාජ භාරය වාර්ෂිකව ඉංග්‍රීසියෙන් පළ කරන ''ශ්‍රී ලංකාවඃ මානව හිමිකම් තත්ත්වය 2007'' වාර්තාවේ විශේෂ වැදගත්කමකින් යුත් පරිච්ඡේද තුනක් සහ සමස්ත සමාලෝචනයේ පූර්ණ පරිවර්තනයකි මෙම කෘතිය.

මුල් වාර්තාවෙන් පරිවර්තනය කොට මෙම කෘතියට ඇතුළත් කර ඇත්තේ, වර්ෂ 2006 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සමාලෝචනය, මානව හිමිකම් සඳහා වන අධිකරණමය රැකවරණය, අභ්‍යන්තරිකව අවතැන් වූ තැනැත්තන් සහ සිවිල් ජනතාවගේ රැකවරණය සහ ශ්‍රී ලංකාවේ අභිචෝදන ක්‍රමය තුළ විමර්ශනය සඳහා වූ කොමිසම් හි කාර්යභාරය යන පරිච්ඡේදයන් වේ. 2006 වර්ෂය තුළ ඉහත කී මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ සිදුව ඇති වෙනස්වීම් සහ ප්‍රවණතා එකී පරිච්ඡේදයන් තුළදී විෂය මූලික ලෙස සලකා බලා ඇත.

මෙහි මුල් ඉංග්‍රීසි වාර්තාවේ අඩංගු පරිච්ඡේදයන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් විසින් දීර්ඝ පර්යේෂණාත්මක සහ විමර්ශනාත්මක ක්‍රියාවලියක් තුළින්, අදාළ වර්ෂයේ අදාළ මාතෘකා පිළිබඳව ලබාගන්නා නිවැරදි දත්ත හා මූලාශ්‍ර පදනම් කරගෙන, ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් දර්ශක හා සසඳමින් ලියා ඇති අතර එකී එක් එක් පරිච්ඡේද අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වෙනත් ප්‍රවීනයකු ලවා විමර්ශනය කරවා ගැනීමෙන්ද පසු පළකරන ලද්දකි.

මෙම වාර්තාව ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් බැඳීම් ඇතිකරගෙන තිබෙන මානව හිමිකම් දර්ශකයන්ට අනුකූලව කටයුතු කරනවාද යන්නත් නොඑසේ නම් අන්තර්ජාතික වගකීම්වල සිදුවන අඩුපාඩුකම් පිළිබඳව රාජ්‍ය වගකීමක් දක්වෙන සුවිශේෂී වාර ප්‍රකාශනයක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව මෙම වාර්තාව තුළින් රජය ඵලදායී ලෙස මානව හිමිකම් සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ යාන්ත්‍රණයක් කරා යොමු කරවීමත්, මානව හිමිකම් සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳව සිවිල් සමාජය තුළ සහ රජය හා සිවිල් සමාජය අතර හරවත් සංවාදයක් ජනිත කරලීමත්

අපේක්ෂා කරයි. සිංහල භාෂාවට පරිවර්තනය කර ඉදිරිපත්කිරීම තුළින් ඉහත කී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මානව හිමිකම් සුරක්ෂිතතාවය පිළිබඳ උනන්දුවක් දක්වන වඩාත් පුළුල් පාඨක පිරිසක් ආමන්ත්‍රණය කිරීමට හැකිවනු ඇත.

මෙහි මුල් වාර්තාව සකස් කරලීමටත්, එහි පරිච්ඡේද පරිවර්තනය කර සකස් කිරීමටත් සහ මෙම වාර්තාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමටත් නන් අයුරින් සහාය දුන් සැමට අපගේ කෘතඥතාවය පළ කර සිටිමු.

නීතිය හා සමාජ භාරය
කොළඹ
2009 ඔක්තෝබර්

REFERENCE
ONLY
LIBRARY
L S T

1

වර්ෂ 2006 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සමාලෝචනය

ෆර්සානා හනීෆා[*] සහ දුලානි කුලසිංහ[+]

1. හැඳින්වීම

2006 වසරේ ශ්‍රී ලාංකීය දේශපාලන සහ මානව හිමිකම් ක්ෂේත්‍රයන්හි ඉස්මතුවූ ගැටළු පෙර වසරෙහි අවසාන මාස කිහිපය එනම්, විශේෂයෙන්ම 2005 නොවැම්බර් මස 18 දින මහින්ද රාජපක්ෂ ජනාධිපති ලෙස තේරී පත්වූ කාල වකවානුව, ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකිය. ජනතා විමුක්ති පෙරමුණ (JVP) සහ ජාතික හෙළ උරුමය ප්‍රමුඛ සිංහල ජාතිවාදී දේශපාලන පක්ෂ සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතිකරගත් සහයෝගීතාවය මත ගොඩනැගුණු, සාම ක්‍රියාවලියට එරෙහි, ඒකීය රාජ්‍ය සංකල්පයට පක්ෂපාතී ප්‍රතිපත්තියක් මත ඔහු බලයට පත්විය. 51%ක ඡන්ද ප්‍රමාණයකින්වූ රාජපක්ෂගේ ජයග්‍රහණයට මූලිකම හේතුව වූයේ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (LTTE) සංවිධානය විසින් උතුරේ හා නැගෙනහිර ද්‍රවිඩ ජනතාව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වලක්වනු ලැබීමයි. ස්වකීය වෙන්වීම සංකේතවත් කළ එකී ක්‍රියාව තුළින් එල්.ටී.ටී.ඊ ය සාමයට නැඹුරු, ෆෙඩරල් මතධාරී එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රනිල් වික්‍රමසිංහ බලයට පත්වීම සාර්ථකව වලක්වන ලදී. දකුණේ සිංහල බහුතරය නියෝජනය දින්නා සේ දිස්වුණු මැතිවරණ ප්‍රතිඵලය තුළින්ද

---

* කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය සහ නීතිය සහ සමාජ භාරයේ "ගැටුම් තුළ මානව හිමිකම්" වැඩසටහනේ උපදේශිකා

\+ නීතිය හා සමාජ භාරයේ, "ගැටුම් තුළ මානව හිමිකම්" වැඩසටහනේ පර්යේෂිකා

රාජපක්ෂ ප්‍රතිපත්ති අනුමත කරන බවක් පෙනුණි. රාජපක්ෂ රජය සාම ක්‍රියාවලියෙන් ඉවත්ව යාමෙහි මෙන්ම ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (LTTE) සංවිධානය අනුගමනය කළ දැඩි ස්ථාවරයෙහි ප්‍රතිඵලය වූයේ වර්ෂය මුළුල්ලේම අඛණ්ඩව ඉහළ යමින් පැවති යුධමය ගැටුම් හමුවේ නිල වශයෙන් නොවුවද ප්‍රායෝගිකව සටන් විරාම ගිවිසුම (CFA) බිඳ වැටීමයි.

ජනාධිපතිවරයා විසින් (එක් සහෝදරයකු ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයකු වශයෙන් සහ අනෙක් සහෝදරයා ආරක්ෂක ලේකම්වරයා වශයෙන්) සිය සහෝදරයන් දෙදෙනෙකු නව රජයේ තනතුරුවල පිහිටුවීමද ඉන් අනතුරුව ඔහු විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය නොසලකමින්, අනෙකුත් තනතුරු අතර, ජාතික පොලිස් කොමිසම, අධිකරණ සේවා කොමිසම හා මානව හිමිකම් කොමිසම යන කොමිෂන් සභාවලට සෘජුවම ප්‍රධානීන් පත්කිරීමද තුළින්, දඬුවම් වලින් මුක්තිය ලැබීමේ නිදහස යන නීතියේ පාලනය පිළිබඳ තදබල අවිනිශ්චිතතා සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයක නව මානයක් පිළිබඳ පෙර නිමිති පළ වුණි. බලතල බෙදීම පිළිබඳ කාරණය සම්බන්ධයෙන් 2006 වසර තුළ වැදගත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් වූයේ *එන්.ඩබ්.එම්.ජයන්ත විජේසේකර සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය නඩුවේ*[1] තීන්දුව වූ අතර, එම නඩු තීන්දුවෙන්, 1987 ඉන්දු - ලංකා ගිවිසුමේ සිට ඒකාබද්ධ කර තිබුණු උතුරු හා නැගෙනහිර පළාත විවාදාත්මක ලෙස “වෙන් කරනු” ලැබීය.[2]

උග්‍ර ගැටුම්කාරී තත්ත්වය මෙන්ම, ඊට සමාන්තරව දඬුවම් සම්බන්ධයෙන් මුක්තිය හිමිවීමේ අවස්ථාවන්හි ඉහළයාම හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශ තදබල ලෙස බලපෑමට ලක්වෙමින් රටෙහි මානව හිමිකම් හා මානුෂීය සාධක යන දෙඅංශයම වසර මුළුල්ලේ සැලකිය යුතු ලෙස තවතවත් අසතුටුදායක තත්ත්වයකට පත්වුණි. 2005 වසරේදී පරිදිම, පශ්චාත් සුනාමි කාල පරිච්ඡේදය තුළ පුනරුත්ථාපන කටයුතු අතපසුවූ උතුරු - නැගෙනහිර ප්‍රදේශවල තත්ත්වය තුළින් විශේෂයෙන් ම අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් මුහුණ දෙන බෙදනීයත්වය

1 ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම් අංක (SC(FR) Application Nos.) 243-245/06. ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් (SCM) 16/10/06

2 මෙම නඩුවේදී නඟන ලද විසඳිය යුතු ප්‍රශ්ණ සම්බන්ධයෙන් කර ඇති සාකච්ඡාවක් සඳහා මෙම වෙළුමෙහි කිශාලි පින්ටෝ ජයවර්ධනගේ "මානව හිමිකම් වල අධිකරණමය රැකවරණය" යන පරිච්ඡේදයේ 3.2 කොටස කියවන්න.

ආශ්‍රිතව සිවිල්, දේශපාලන, සාමාජීය හා ආර්ථික අයිතිවාසිකම්වල අන්තර් සබැඳියාව ඉස්මතු විය.[3] මීට පෙර පැවති කැරලි මැඩ පැවැත්වූ කාල පරිච්ඡේදයන්[4] කරා වික්ෂිප්ත පුනරාගමනය වීමක් ලෙස දිස්වූ, රජය වෙතට චෝදනා එල්ල කෙරුණු බලහත්කාරයෙන් පැහැරගැනීමේ සිද්ධීන් මාලාවක් කොළඹ නගරය තුළ සිදුවිය.

සත්‍ය වශයෙන්ම, 2006 වසරේදී සිදුවූ හිංසන ක්‍රියා අතුරින් බොහොමයක් තුළින් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ ඊට පෙර සිදුවූ සිදුවීම් දාමයන් යළි රැව් පිළිරැව් දුනි. අප්‍රේල් මාසයේදී ත්‍රිකුණාමලය මහජන පොළ තුළ LTTEය විසින් සිදුකරන ලදැයි සැක කෙරුණු බෝම්බ ප්‍රහාරයෙන් පුද්ගලයන් පස් දෙනෙකු මරුමුවට පත්වූහ. පිපිරීමෙන් මිනිත්තු 15කටත් වඩා අඩු කාලයක් තුළ සිංහල කැරලිකාරී කණ්ඩායම් සිදුකළ කලකෝලාහල වලින් තවත් පුද්ගලයන් 20 දෙනෙකු මරණයට පත්වූ අතර, 75 දෙනෙකු තුවාල ලබා රෝහල්ගත කෙරුණි. එකී කැරලිකෝලාහල සංවිධානාත්මකව සිදු වන්නට ඇති බැව් ඇස දුටු සාක්ෂි අනුව පෙනී ගිය අතර, 1983 ජූලි කලබල සිහිගැන්වූ එහිදී කැරලිකරුවන් මර්දනය කිරීමට මැදිහත් වීමට පෙර පොලීසිය පැය දෙකක කාලයක් ඊට ඉඩදී බලාසිටියේ යැයිද ප්‍රකාශ වුණි.[5] වෙනත් වාර්තාවලින් කියැවුනේ ආරක්ෂක හමුදාවන් හුදෙක් සිද්ධිය බලාසිටියා නොව ඔවුන් කලකෝලාහල අවුළුවාලීමෙහි ක්‍රියාකාරීව නිරතවූ බවයි.[6]

1970 දශකයේ මුල් භාගයේදී හා 1980 අග භාගයේදී පරිදිම, ශ්‍රී ලංකා හමුදාවන් වෙතට චෝදනාත්මක ඇඟිල්ල දිගුවූ බලහත්කාරයෙන් අතුරුදන් කිරීමේ සිද්ධීන් විශාල වශයෙන් සිදු විය. කෙසේ වුවද, මෙවර මෙකී අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් සුළුතර දෙමළ භාෂාව කථා කරන ජනතාව, එනම් දෙමළ සහ මුස්ලිම් දෙපාර්ශ්වය කෙරෙහි,

3 සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට අනුව ශ්‍රී ලංකාව තුළ වසර අවසානයේදී ඇස්තමේන්තුගත පුද්ගලයන් 215, 421 දෙනෙක් අභ්‍යන්තරිකව අවතැන්ව සිටියහ. http://www.unhcr.lk/statistics/docs/SummaryofDisplacement-7Apr06-2Jan07.pdf බලන්න.

4 1971 හා 1987-1990

5 Human Rights Watch "ද්‍රවිඩ ජනතාවට එරෙහි හිංසා ක්‍රියා වලට රජය ප්‍රතිචාර දැක්විය යුතුය" 2006 අප්‍රේල් 25, http://hrw.org/english/docs/2006/04/25/slanka13262.htm.

6 මානව හිමිකම් සඳහා වූ විශ්ව විද්‍යාලයීය ආචාර්යවරු (යාපනය) (UTHR (J) "කෝපය අතීතයට මුසුව අමතකව ගිය කළු නොගැලපෙන න්‍යාය පත්‍රයන් පිළිබඳව සැලකිල්ල යොමු කිරීම. විශේෂ වාර්තාව අංක 21, 2006 මැයි 15

විෂම අනුපාතිකව බලපෑවේය. සමහරවිට මෙහි උච්චතම අවස්ථාව ලෙස නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා කොළඹ අධි ආරක්ෂිත කලාපයක් තුළ පැහැරගෙනයාම දැක්විය හැකි අතර, ඔහු වසර අවසානය තෙක්ම අතුරුදහන්ව සිටියේය.

මෙම තත්ත්වයට ප්‍රතිචාරයක් වශයෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා අහඹු යාන්ත්‍රණ දෙකක් ස්ථාපිත කරන ලදී. ඒවා නම්, රට තුළ සිදුවන අතුරුදහන්වීම් හා පැහැරගෙනයාම් පිළිබඳව පරීක්ෂා කිරීම පිණිස හිටපු මහාධිකරණ විනිසුරු මහානාම තිලකරත්නගේ ප්‍රධානත්වයෙන් වූ ඒක පුද්ගල කොමිසම[7] සහ තදබල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක කුමාර උදලාගමගේ ප්‍රධානත්වයෙන් සහ තවත් විශේෂිත තැනැත්තන් සත් දෙනෙකුගෙන් සමන්විතවූ ජනාධිපති පරීක්ෂණ කොමිසමයි.[8]

මේ සම්බන්ධයෙන් ඓතිහාසිකව අත්දකිනු ලැබූ නිෂ්ඵලත්වය පසෙකලා යොදනු ලැබූ මෙකී රාජ්‍යමය පිළියම් පැවතියද ගැටුම් හා සමාන්තරව ඉහළ ගිය තදබල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පාලනය කිරීමෙහිලා ඉන් සැලකිය යුතු බලපෑමක් ඇතිවූ බවක් පෙනෙන්නට නොතිබුණි.

විශේෂයෙන්ම මුස්ලිම් ජාතිකයන් මෙම ගැටුම් තුළින් බලපෑමට ලක්වී ඇති නමුත් ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව සන්නිවේදනය වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. 1990 වසරේදී උතුරේ මුස්ලිම් වැසියන් LTTE ය විසින් පිටුවහල් කිරීමෙන් පසු නිර්මාණය වූ අඛණ්ඩ නිහැඬියාවේ සිට 2006 අගෝස්තු මාසයේ මුතූර් අත්පත් කරගනු ලැබූ කාලවකවානුවේ රජය හා එල්.ටී.ටී.ඊ. ය යන දෙපාර්ශ්වයම විසින් සිවිල් ජනතාව නොතකා හරිමින් කටයුතු කළ අවස්ථාව තෙක්වූ මුස්ලිම් ජනතාවගේ දේශපාලන අත්දැකීම් භූගෝලීය සාධක සහ ගැටුමට සම්බන්ධ සන්නද්ධ පාර්ශවයන්හි උපායමාර්ගික නොසැලකිල්ල හේතුවෙන් වැළලී ගොස් ඇත. මෙම නිහැඬියාව පිළිබඳව සොයා බැලීමේ උත්සාහයක් වශයෙන්, සුළුතර මුස්ලිම් ජනතාවගේ දේශපාලන අත්දැකීම් තුළින් ශ්‍රී ලංකාවේ 2006 වසරේ මානව හිමිකම් අභියෝග පිළිබඳව කරන විපරමකින් මෙම සමාලෝචනය අවසන් කෙරේ.

---

7 2006 සැප්තැම්බර් 15 දිනැති අංක 1462/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය

8 2006 නොවැම්බර් 13 දිනැති අංක 1471/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය

2. සටන් විරාම ගිවිසුම අසාර්ථක වීම

සටන් විරාම ගිවිසුමේ පැවතුණු ව්‍යුහාත්මක දුර්වලතා විශ්ලේෂකයන් විසින් හඳුනාගෙන ඇත. මානව හිමිකම් ඵලදායීව ආරක්ෂා කිරීමේ අඩුලුහුඬුකම්[9] මුස්ලිම් සුළුතරය බැහැර කිරීම[10] හා ඵලදායී ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම පිළිබඳව අවධානය මඳ වීම[11] ඉන් කිහිපයකි. සාම ක්‍රියාවලියේදී තමන් දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා වන්නේ යැයි එල්.ටී.ටී.ඊ. සංවිධානය දැරූ අදහස සටන් විරාම ගිවිසුම තුළද අන්තර්ගතවූ අතර, මුස්ලිම් ප්‍රජාව හුදු නරඹන්නන්ගේ තත්ත්වයට පත් කෙරිණි. දුර්වල සටන් විරාමය අවදානමකට ලක් වෙතැයි සැකයෙන් ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ගැනීමට පැකිළීමේ හේතුවෙන්, බොහෝ අවස්ථාවලදී රජයේ හමුදාවන්ට ඉවත බලා සිටීමට උපදෙස් දී තිබුණු අතර, සටන් විරාමයෙන් සැළසුණු එහා මෙහා යාමේ නිදහස ප්‍රයෝජනයට ගනිමින් රජයේ පාලන ප්‍රදේශවල සිටි දේශපාලන විරුද්ධවාදීන් තුරන් කිරීමේ කොටින්ගේ උපාය මාර්ගය හමුවේ සටන් විරාමයේත් පෙර කී දුර්වලතා වඩාත් සංකීර්ණ තත්ත්වයකට පත් කළේය. ඵලදායි නිරීක්ෂණ යන්ත්‍රණයක් නොමැතිවීම සටන් විරාම ගිවිසුම තවදුරටත් දුර්වල තත්ත්වයකට පත්කිරීමට හේතු විය. සටන් විරාම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවට සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කෙරෙන අවස්ථා වාර්තා කිරීම පමණක් කළ හැකිවූ නමුත්, ගිවිසුම කඩ කිරීමට වගකිව යුතු යම් පාර්ශ්වකරුවකුට එරෙහිව දඬුවම් පැනවීමේ කිසිදු බලයක් එය සතු නොවීය.

2006 වසර තුළදී ගැටුම් හේතුවෙන් ආසන්න වශයෙන් පුද්ගලයන් 4000ක් පමණ ඝාතනයට ලක්වූහ. රජයට හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානයට හෝ සටන් විරාම ගිවිසුමෙන් නිල වශයෙන් ඉවත්වීමේ හැකියාවක් නොවුවද දෙපාර්ශ්වයම එහි කොන්දේසි නොසලකා හරිමින් කටයුතු කළහ. එය කෙතරම් දුරට වර්ධනය වී තිබුණේද යත්න සටන් විරාම ගිවිසුමට වසර 5 ක් සපිරුණු 2007 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව "... පැහැරගැනීම්, හිරිහැරකිරීම්, ඝාතන, වෙඩිතැබීම් හා ගුවන්

9 "ශ්‍රී ලංකාවඃ සාම ක්‍රියාවලිය අසාර්ථක වීම", අන්තර්ජාතික අර්බුද කණ්ඩායම (ICG), ආසියානු වාර්තාව අංක 124, 2006 නොවැම්බර් 28

10 ෆර්සානා හනීෆා "ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම තුළ මුස්ලිම් ජාතිකයන්" ISIM විවරණය, 2007

11 ICG. "සාම ක්‍රියාවලිය අසාර්ථක වීම"

ප්‍රහාර යුද්ධයක මට්ටමින් සිදුවෙමින් පවතී."[12] යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි විය.

එතෙක් රජයේ ප්‍රකාශ වලට වඩා ක්‍රියාවන් තුළින් හෙළිදරව්වූ ආකාරයට ගැටුමේ එම අදියරේදී අනුගමනය කළ න්‍යාය, දේශපාලන විසඳුමක් සඳහා සාකච්ඡා පැවැත්වීමට පසුබිම සැකසීම පිණිස ඍජු යුධමය ක්‍රියාදාමයකින් කොටි සංවිධානය දුර්වල කිරීම බැව් පෙනෙන්නට තිබුණි.

3. ගැටුම් උත්සන්න වීම

සටන් විරාමය උල්ලංඝනය කිරීමේ සිද්ධීන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් රජයේ ආරක්ෂක හමුදා කුපිත කිරීමේ අරමුණින් හෝ දෙමළ ප්‍රජාව තුළ පැවැති අප්‍රසාදය තුරන් කිරීමේ අරමුණින් සිදු කරනු ලැබුවද, 2005 වසර අවසානයේදී හා 2006 වසර මුල් භාගයේදී සහාසික ක්‍රියා සිදු කිරීමේ නව ප්‍රවණතාවයක් රජයේ ආරක්ෂක අංශ තුළින්ම විද්‍යමාන විය.[13] වසර ආරම්භ වූයේ 2006 ජනවාරි 02 දින ත්‍රිකුණාමලයේදී සිසුන් පස් දෙනෙකු අභිරහස් ලෙස ඝාතනය කිරීමෙනි. එම සිසුන් පස් දෙනා තම අතෙහිවූ අත් බෝම්බ අත්වැරදීමකින් පිපිරීමෙන් මරුමුවට පත් කොටි සංවිධානයේ සාමාජිකයන් බව ආරක්ෂක හමුදා වෙතින් මුලින් ප්‍රකාශ වුවද ඉනික්බිතිවම අනාවරණය වූයේ එකී තරුණයින් කෙටි දුරක සිට තබන ලද වෙඩි ප්‍රහාරයකට ලක්වීමෙන් මරණයට පත් ව ඇති බවය. ඒ සම්බන්ධයෙන් රජයේ ආරක්ෂක අංශ වෙතට චෝදනා එල්ල වුණි.[14]

සටන් විරාම නිරීක්ෂණ කමිටුව එල්.ටී.ටී.ඊ. සංවිධානයට පක්ෂපාතිත්වය දක්වන්නේ යයි චෝදනා කරමින් 2006 ජූනි 12 වන දින නිකුත් කෙරුණු මාධ්‍ය ප්‍රකාශයකින් රජය ප්‍රකාශ කළේ රාජපක්ෂ ජනාධිපති ධුරයට තේරී පත්වූ දින හා ත්‍රිකුණාමලයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු යැයි පැවසුනු විග්නේෂ්වරන් ඝාතනය කරන ලද 2006 අප්‍රේල් 7 අතර කාලය තුළ සන්නද්ධ හමුදා සාමාජිකයින් 173 දෙනෙකු ඝාතනය කරනු ලැබ තිබුණු බවයි. කෙසේ වුවද, සටන් විරාම ගිවිසුම

12 ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM), "සටන් විරාම ගිවිසුමට වසර 5 ක් සපිරෙයි", 2007 පෙබරවාරි 22, http://www.slmm.lk/press_releases/CFA%205%20years.pdf

13 UTHR(J), "ත්‍රස්තවාදය, ත්‍රස්තවාදය මර්දනය කිරීම සහ මානව හිමිකම් වෙත වන අභියෝග," විශේෂ වාර්තා අංක 20, 2006 අප්‍රේල් 1

14 ඉහත අංක 13

අත්සන් කළ දින සිට නැගෙනහිර පළාතේ එල්.ටී.ටී.ඊ. ඉලක්ක වෙත ගුවන් හමුදා ප්‍රහාර එල්ල කිරීමද ඇතුළුව, රජය හා එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ප්‍රථම වරට විවෘතව යුධමය සටන් ආරම්භ වීමට හේතුව වූයේ 2006 අප්‍රේල් 25 වෙනි දින කොළඹ හමුදා මූලස්ථානයේදී හමුදාපති සරත් ෆොන්සේකා ඝාතනය කිරීමට එල්.ටී.ටී.ඊ. ය දැරූ උත්සාහයයි. එවැනි සටන් වල ක්‍රමික වර්ධනයක් වසර පුරාම දක්නට ලැබිණි.

3.1 ප්‍රධාන සිද්ධීන්

තදබල නියඟයක් පැවති ජූලි 'මස අග භාගයේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මාවිල්ආරු සොරොව්ව වසා දැමීමෙන් ප්‍රධාන වශයෙන්ම සිංහල ගොවීන්ට වාරි ජලය අහිමිවූ අතර එය සන්නද්ධ හමුදාව විසින් එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් රැඳී සිටි ස්ථාන වෙත ප්‍රබල ප්‍රහාර දියත් කිරීමට හේතු විය. සොරොව්ව නැවත විවෘත කරවා ගැනීමට සටන් විරාම නිරීක්ෂණ කමිටුව මැදිහත් වුවද, ලද අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට මෙන් අගෝස්තු 05 වන දින ශ්‍රී ලංකා හමුදාව එම ප්‍රදේශයට බෝම්බ හෙළීය. එල්.ටී.ටී.ඊ. සංවිධානය, මුතූර්වලට ප්‍රහාරයක් එල්ල කරමින් ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීය. නගරය වැටලීමේදී දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් හෝ සිවිල් ජනතාවට සිදුවන හානි අවම කිරීමට උත්සාහ නොකළ අතර, ප්‍රධාන වශයෙන්ම මුස්ලිම් ජාතිකයින් ඇතුළත් වූ 50 කට ආසන්න සංඛ්‍යාවක් මරණයට පත් වූහ. ඊට අමතරව French NGO Action Contrela Faim සංවිධානයේ සේවය කළ දේශිය සහන සේවකයින් 17 දෙනෙකු මෙම කාලයේදී ඝාතනයට ලක් වූහ. මෙම කාලය වන විට නගරයේ බලය අත්පත් කරගැනීම සඳහා සටන් පැවතුන අතර, මෙම ඝාතන සම්බන්ධයෙන් රජය එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා එල්ල කල අතර, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව හා එල්.ටී.ටී.ඊ. ය රජය වෙත දෝෂාරෝපණ එල්ල කළහ.

සැප්තැම්බර් මාසයේදී රජය සාම්පූර්හි බලය අත්පත් කරගත් අතර, එය සටන් විරාම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් පසුව දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් විසින් හෝ විශාල සතුරු භූමි ප්‍රදේශයක් අත්පත් කරගත් ප්‍රථම අවස්ථාව විය. ඔක්තෝබර් මාසයේදී නාවිකයින් 90 කට වැඩි සංඛ්‍යාවක් මරුමුවට පත් කරමින් මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු හමුදා යාත්‍රා වලට ප්‍රහාරයක් එල්ල කරන ලද අතර, කිසිවකු තුවාල නොලැබුවද ගාල්ල වරායට එල්ලවූ මුහුදු කොටි ප්‍රහාරය රජය මවිතයට පත්කිරීමට හේතු

විය. නොවැම්බර් මාසයේදී අනුරාධපුරයේදී එල්.ටී.ටී.ඊ. ය ක්ලේමෝර් බෝම්බ ප්‍රහාරයක් එල්ල කොට සිවිල් වැසියන් 67 දෙනෙකු ඝාතනය කළ අතර, සිවිල් මෙහෙයුම් කොමිසමේ සාමාජිකයෙකු වූ ද යාපනයේ හිටපු නගරාධිපතිවරයකු වූ ද ද්‍රවිඩ ජාතික සන්ධාන මන්ත්‍රී නඩරාජා රවිරාජ්, ඔහුගේ පෞද්ගලික ආරක්ෂකයකු ද සමඟින් යුද හමුදා ආරක්ෂාවද පැවැති කොළඹ නගර මධ්‍යයේදී වෙඩිතබා ඝාතනය කෙරිණි. අවසාන වශයෙන්, 2006 දෙසැම්බර් මාසයේදී ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතන ප්‍රයත්නය හදිසි අවස්ථා රෙගුලාසි ලෙසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ විධිවිධාන නැවත බලාත්මක කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය නීතිය තුළ ඉන් පෙර අර්ථනිරූපණය කොට නොතිබුණු, ත්‍රස්තවාදය යන වරද හඳුන්වා දීමට හේතුවිය. රජයට එරෙහි ඕනෑම ස්වරූපයක විරෝධයකට වුවද දඬුවම් කිරීමට ප්‍රමාණවත් තරම් පුළුල් විෂය පථයක් සහිතව කෙටුම්පත් කරන ලද සේ පෙනුණු එම නව වරදට අමතරව පුද්ගල නිදහස විශාල ලෙස සීමා කරන සහ හදිසි අවස්ථාව යටතේ රඳවා තබාගැනීමේ සිද්ධීන් වලදී අධිකරණ අභිමතය සීමා කරන සුළු විධිවිධාන වැනි ගැටළු සහගත විධිවිධාන එහි ඇතුළත් විය.[15]

3.2 සිවිල් ජනතාව කෙරෙහි වූ බලපෑම්

3.2.1 අභ්‍යන්තරිකව අවතැන් වීම

එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ අවතැන්වීම් පිළිබඳ ගෝලීය වාර්තාව අනුව, වසර අවසානය වන විට ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තරිකව අවතැන් පුද්ගලයින් සංඛ්‍යාව 496,200 ක් හා තම ප්‍රදේශ කරා ආපසු පැමිණි තැනැත්තන් සංඛ්‍යාව 89,400 ක් විය.[16] ගැටුම් තදබල ලෙස උත්සන්නව පැවැති දිස්ත්‍රික්ක වඩාත්ම ජනතාව බලහත්කාරයෙන් අවතැන්වීමට ලක්වූ දිස්ත්‍රික්ක වූ අතර, ත්‍රිකුණාමලය හා මඩකලපුව යන දිස්ත්‍රික්ක ඉන් ප්‍රධාන විය. යාපනය දිස්ත්‍රික්කය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ එල්.ටී.ටී.ඊ. පාලනය පැවැති ප්‍රදේශ සහ මුලතිව් දිස්ත්‍රික්කය ඉන් අනතුරුව විය.

---

15 2006 වර්ෂයේදී පනවන ලද හදිසි අවස්ථා නියෝග පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් සඳහා ඉංග්‍රීසි වෙළුමේ සාලිය එදිරිසිංහ ඉදිරිපත් කර ඇති " Emergency Rule " කියවන්න.

16 එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ (UNHCR) ගෝලීය වාර්තාව 2007 - ශ්‍රී ලංකාව, http://www.unhcr.org/publ/PUBL/4666d2460.pdf

සිවිල් ජනතාව අවතැන්වීමේ පරිමාණය සහ වේගය කෙතරම් වූයේද යත් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට රජයේ සම්පත් ප්‍රමාණවත් නොවීය. එහෙයින් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ආගමික කණ්ඩායම් මෙන්ම ලෝක ආහාර වැඩසටහන (WFP) සහ එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) වැනි ජාත්‍යන්තර නියෝජිතායතනද ආහාර සහ නිවාස සැපයීමේදී බොහෝ විට සහාය වූහ. කෙසේ වුවද, අභ්‍යන්තරිකව අවතැන් ජනතාව රැඳී සිටි කඳවුරු පැවැති ප්‍රදේශ වෙතට වූ මානුෂීය ආධාර ප්‍රවේශය අදාල ප්‍රදේශවල ආයුධ සන්නද්ධ බලය පැතිරවූ රජය හෝ එල්.ටී.ටී.ඊ. ය හෝ විසින් බොහෝ විට සීමා කරනු ලැබීය.[17] පෞද්ගලික ආරක්ෂාව සහතික කරගැනීම තදබල ප්‍රශ්නයක්ව පැවතුණු අතර, එල්.ටී.ටී.ඊ. ය හා කරුණා කණ්ඩායම යන දෙපාර්ශවයම විසින් සිදු කළ පැහැරගෙනයාම් සහ හිරිහැර කරදර කිරීම් ඇතැම් අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ කඳවුරු ආශ්‍රිතව පැවති ගැටළු ලෙස හඳුනා ගැනුණි. රජය විසින්ද බලහත්කාරයෙන් පුද්ගලයන් ආපසු හරවා යැවුණු අවස්ථා කිහිපයක් වාර්තා වී තිබුණි.[18]

මෑත කාලීනව යුද්ධය ආශ්‍රිත සැහැසිකම් හේතුවෙන් අවතැන්වූ පුද්ගලයන් බොහෝවිට ඊට පෙර යුද්ධයේ මුල් අදියර වලදී මෙන්ම 2004 සුනාමියෙන්ද අවතැන්ව සිටියෝ වූහ. කෙසේ වුවද, අවතැන්වීමට මුල්වූ මෙකී හේතු එකිනෙකට වියුක්තවූ ඒවා නොවේ. සුනාමි ආපදාවෙන් පසුව, අවිධිමත් ලෙස වෙරළ ආරක්ෂක කලාපය සලකුණු කිරීම ඉඩම් ආරවුල් නිර්මාණය කිරීමට හේතුවී තිබුණු බවත්, ඒවාද විශේෂයෙන්ම මුස්ලිම් හා ද්‍රවිඩ ජාතිකයන් විශාල වශයෙන් ජීවත්වූ නැගෙනහිර ප්‍රදේශවල යළි ඇරඹි යුද්ධය උත්සන්න කිරීමට බලපෑ බවත්, එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සඳහන් කළේය.

---

17 අභ්‍යන්තර අවතැන්වීම් නිරීක්ෂණ මධ්‍යස්ථානය (IDMC), නෝර්වේජියානු සරණාගත කවුන්සිලය, "ශ්‍රී ලංකාව: ගැටුම් උත්සන්න වීමෙන් දසදහස් ගණන් අභ්‍යන්තරිකව අවතැන්වූවන් අනාරක්ෂිත හා අසරණභාවයට පත් වෙති. අභ්‍යන්තර අවතැන්වීම් තත්වය පිළිබඳ සටහනක්, " 2006 නොවැම්බර් 16

18 ශ්‍රී ලංකාවේ සරණාගතයන් සඳහා ජාත්‍යන්තර රැකවරණයක අවශ්‍යතා පිළිබඳ එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ තත්ත්ව වාර්තාව, 2006 දෙසැම්බර්, http://www.unhcr.org/home/RSDLEGAL/4590f12a4.pdf

3.2.2 යාම්-ඒම් නිදහස සීමා කිරීම.

අගෝස්තු මස මුලදී රජයේ හමුදා සහ එල්.ටී.ටී.ඊ. ය අතර ගැටුම් උත්සන්න වීම තුළ, යාපනය අර්ධද්වීපය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ හා යා කෙරුණු ඒ-9 මාර්ගය රජය විසින් වසා දමන ලදී. ඉදිකිරීම් ද්‍රව්‍ය ඇතුළු මානුෂීය ආධාර මෙන්ම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය කිරීම පිණිස වූ ප්‍රධාන ගොඩබිම් සබඳතාවය මෙම මාර්ගයෙන් සැපයුනු හෙයින් එය වසාදැමීම උතුරේ සාමාන්‍ය ජනතාවට තදබල බලපෑමක් එල්ල කළ කරුණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයුම් සීඝ්‍ර ලෙස පහත වැටුණු අතර, සාමාන්‍ය ජනතාවට දැරිය නොහැකි මට්ටමට මිල ගණන් ඉහළ ගියේය.[19]

ගැටුම් උත්සන්නවීම, රජයේ පාලනයට යටත් ප්‍රදේශවල පිහිටුවන ලද ස්ථිර සෝදිසි මුරපොළ සංඛ්‍යාව විශාල ලෙස වැඩිකිරීම ඇතුළුව, රට පුරාම ආරක්ෂක හමුදා විශාල වශයෙන් ක්‍රියාකාරීව සිටිනු දක්නට ලැබීමට හේතු විය. එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් හඳුනාගැනීමේ හා රඳවා තබා ගැනීමේ අරමුණින් පනවන ලද මෙකී සීමාකිරීම් ද්‍රවිඩ ජනතාව කෙරෙහි සුවිශේෂයෙන් බලපෑමක් ඇතිකරන ලදී.

අනාරක්ෂිත යැයි හැඟුණු තම උපන් ගම්-බිම් වලින් හෝ අවතැන්ව සිටි ප්‍රදේශවලින් ඉවත්ව යාමෙන් සිවිල් ජනතාව වැලැක්වීමට ගැටුම්වල නියැළි දෙපාර්ශ්වයම විසින් කටයුතු කරනු ලැබූ බව වාර්තා විය. නාවික හමුදා විසින් අභ්‍යන්තරිකව අවතැන්වූවන්හට අල්ලෙයිපිඩ්ඩි සිට යාපනය දක්වා පලායාමට ඉඩ නොදුන් බව ප්‍රකාශ වූ අතර, සැප්තැම්බර් මස අගදී යුධ හමුදාව සහ නාවික හමුදාව ගුවන් හා මුහුදු බාධක යොදමින් අභ්‍යන්තරිකව අවතැන්වූවන් මුතූර් නගරයෙන් පලායාමෙන් වළක්වන ලදැයි ප්‍රකාශ විය. එල්.ටී.ටී.ඊ. යද ගැටුම් හේතුවෙන් අනාරක්ෂිත යැයි තමනට හැඟුණු ප්‍රදේශ හැරයාමට ස්ථිරපදිංචිකරුවන් හා අවතැන්වූවන් යන කාණ්ඩ දෙකෙහිම සිවිල් ජනතාවට ඉඩ නොදුන් බව වාර්තා විය. ප්‍රධාන වශයෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පැමිණ, අයහපත් මානුෂීය සහ ආරක්ෂක තත්ත්වයන් යටතේ වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

19 ක්‍රිස්තියානු විද්‍යාත්මක නිරීක්ෂණය "මාර්ගස්ථ වූ ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡා", http://www.csmonitor.com/2006/1122/p07sO1-wosc.html

තුළ කොටුවී සිටි අභ්‍යන්තරිකව අවතැන්වූවන් 32,000 කට ආසන්න සංඛ්‍යාවක් මීට ඇතුළත් විය.[20]

බලහත්කාරයෙන් ආපසු ගෙන්වාගැනීමද 2006 වසරේ අවතැන්වීමේ ගැටළුව හා බැඳුණු තවත් සංසිද්ධියක් වූ අතර, ඒ තුළ මුස්ලිම් ජාතිකයන් මුතූර් නගරයට ආපසු ගෙන්වාගැනීමටත්, අවතැන්වූ ද්‍රවිඩ ජාතිකයන් ත්‍රිකුණාමලය නගරය වෙත ආපසු ගෙන්වාගැනීමටත් හා අවතැන්වූ සිංහල ජාතිකයන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මායිම් ගම්මාන වෙතට ගෙන්වාගැනීමටත් ආරක්ෂක හමුදා විසින් සෘජුවම බලය පාවිච්චි කිරීම හා අත්‍යවශ්‍ය සේවා කපාහරින බවට තර්ජනය කරමින් පෙළඹවීම් ඇති කිරීම දක්නට ලැබුණි.[21]

3.2.3 ළමුන් බඳවා ගැනීම

යුද්ධයට මැදිවූ ළමුන් පිළිබඳ විශේෂ නියෝජිත, එක්සත් ජාතීන්ගේ විශේෂ උපදේශක ඇලන් රොක්, තොරතුරු සොයා බැලීමේ දූත මෙහෙවරක් සඳහා 2006 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය. විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. ය සහ කරුණා පාර්ශ්වය යන දෙපාර්ශවයම විසින් ළමා සොල්දාදුවන් බඳවා ගැනීම අඛණ්ඩව සිදුකරන බව ඔහුගේ වාර්තාවෙහි සඳහන් විය. රොක් මහතා වැඩිදුරටත් සඳහන් කළේ රජයේ පාලනය යටතේ පැවති ප්‍රදේශවල ක්‍රියාත්මකවූ කරුණා පාර්ශ්වය විසින් සිදු කළ ළමා සොල්දාදුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලියට රජයේ හමුදා සහාය දක්වා ඇති බවට සාක්ෂි ඇති බවයි.[22] යුධ හමුදාව මෙම චෝදනා ප්‍රතික්ෂේප කළ අතර,[23] ජනාධිපතිවරයා වහාම පරීක්ෂණයක් පවත්වන

---

20 අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව (IASC), "ශ්‍රී ලංකාවේ ගැටුම් ආශ්‍රිත අභ්‍යන්තර අවතැන්වීම: බලහත්කාරයෙන් අවතැන් කිරීම, යාම-ඒම නිදහස, ආපසු පැමිණීම හා නැවත ස්ථානගත කිරීම පිළිබඳ අධ්‍යයනයක්, 2006 අප්‍රේල් - 2007 අප්‍රේල්,"
http://www.humanitarianinfo.org/srilanka-hps1/docs/protection/conflict-related%20Internal.pdf

21 ඉහත අංක 20

22 ඇලන් රොක් නිකුත් කළ මාධ්‍ය ප්‍රකාශය http://www.unicef.org/srilanka/media_2514.htm

23 ඩේලි මිරර් "චෝදනා පිළිකුල් සහගතයි" හමුදාව,
http://www.dailymirror.lk/2006/11/14/front/4.asp

බවට පොරොන්දු විය.[24] එසේ වුවද වසර අවසානය වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන ඇති බවක් දක්නට නොලැබුණි.[25]

4. මානව හිමිකම් සුරක්ෂිත කිරීම ආශ්‍රිත ව්‍යුහාත්මක දුර්වලතා

මානව හිමිකම් රැකවරණ සැලසීම හා පසු විපරම් කටයුතු සිදුකිරීම සඳහා බලය පවරාදී ඇති ස්වාධීන ආයතන දුර්වල කිරීමද මෙම වර්ෂය තුළ දක්නට ලැබුණු ලක්ෂණයක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පත්කරන ලද සභාපතිනිය වූ රාධිකා කුමාරස්වාමිගේ ධුර කාලය 2006 අප්‍රේල් මාසයේදී අවසන්වූ විට රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් සෘජුවම ජාතික මානව හිමිකම් කොමිසමට නව කොමසාරිස්වරුන් පත් කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයේ 41 (ආ) (1) ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශයක් නොමැතිව සිදුකරන ලද මෙම ක්‍රියාවේ ව්‍යවස්ථා විරෝධීභාවයට ප්‍රතිචාරයක් ලෙස කලින් සිටි සම්මානනීය කොමසාරිස්වරුන් දෙදෙනෙක් පත්වීම් භාරගැනීම ප්‍රතික්ෂේප කළහ. 2006 දෙසැම්බර් මාසයේදී එවකට කොමිසමේ ප්‍රධානියා වූ විනිසුරු පී. රාමනාදන් ධුරය දරමින් සිටියදී මිය ගිය විට, ජනාධිපතිවරයා විසින් රටෙහි ප්‍රධාන මානව හිමිකම් ආයතනය වූ එහි සභාපතිවරයා වශයෙන් විනිසුරු එස්. ආනන්ද කුමාරස්වාමි පත්කරන ලදී.[26] ස්වාධීන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක විය යුතුව තිබුණු ආයතනයක විශ්වසනීයත්වය මෙසේ බිඳවැටීමට සමාන්තර තත්ත්වයක් විධායකය ඇතුළතම වර්ධනය විය. එය නම්, 2006 මැයි මාසයේදී ගරු මහින්ද සමරසිංහගේ ප්‍රධානත්වයෙන් ආපදා කළමනාකරණය හා මානව හිමිකම් සඳහා අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමයි. මානව අයිතිවාසිකම්

---

24 ඩේලි මිරර් "කම්පනය ගෙනදෙන එ.ජා. වාර්තාව පිළිබඳව පූර්ණ පරීක්ෂණයක්", http://www.dailymirror.lk/2006/11/14/front/O1.asp

25 2007 සැප්තැම්බර් මාසයේදී මානව හිමිකම් කවුන්සිලය ඉදිරිපිට ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිස විසින් කරන ලද ප්‍රකාශයකින් මෙය සනාථ වේ. එහි සඳහන් වන්නේ මානව හිමිකම් අමාත්‍යවරයා විසින් චෝදනා පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා "ඉහළ මට්ටමේ විෂයාන්තර කමිටුවක්" මෑතදී පත් කර ඇති බවයි. එහි ඉන් පෙර ගනුලැබූ යම් ක්‍රියාමාර්ගයක් පිළිබඳව කිසිදු සඳහනක් නැත. http://www.slembassyusa.org/archives/main_index_pages/2007/child_recruitment_21sep07.pdf

26 ඩේලි මිරර්-මානව හිමිකම් කොමිසමේ ක්ෂණික ඇමතුම් දුරකථනයට දැනුම් දීම් 75කට වැඩි සංඛ්‍යාවක් ලැබේ. http://www.dailymirror.lk/2007/01/09/news/11.asp

විෂය පථයද ඇතුළත් වන පරිදි නව අමාත්‍යාංශය ස්ථාපිත කරනු ලැබූ හෙයින්, විශේෂයෙන්ම එහි ප්‍රධානියා ඍජුවම පත් කරනු ලැබූ තත්ත්වයක් තුළ එමඟින් මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරීත්වය කොතෙක් දුරට ශක්තිමත් කෙරේද හෝ දුර්වල කෙරේද යන්න පැහැදිලි නොවීය.

රාජ්‍ය ව්‍යුහය තුළ සිදුකරන ලද වෙනත් වෙනස්කම්ද මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ අතර, ඒ අතර ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පාලනය යටතට ගැනීම ඔස්සේ පොලීසිය මිලිටරීකරණයට ලක්වීම ප්‍රධාන විය.[27] මෙම තත්ත්වය, ජාතික පොලිස් කොමිසමට අලුතෙන් ප්‍රධානියෙකු පත්කිරීමට අසමත් වීමෙන් වඩාත් සංකීර්ණ මුහුණුවරක් ගත් අතර, 2005 නොවැම්බර් මාසයේදී හිස්වූ එම තනතුරේ පුරප්පාඩුව 2006 වසර අවසානය වන විටත් පුරවනු ලැබ නොතිබුණි.

මෙකී සිදුවීම් සියල්ල සිදුවූයේ 2005 අගෝස්තු මාසයේදී ලක්ෂ්මන් කදිරගාමර් විදේශ අමාත්‍යවරයා ඝාතනය කරනු ලැබීමෙන් පසුව පනවන ලද හදිසි අවස්ථා පාලනය ක්‍රියාත්මක තත්ත්වයක් තුළය. මෙම වාර්තාවේ මීට පෙර සංස්කරණවලදීද සාකච්ඡා කළ පරිදි එකී හදිසි අවස්ථා නියෝග, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් රැකවරණයන් මෙන්ම වධ හිංසාවලට එරෙහි ප්‍රඥප්තිය සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති යටතේ ශ්‍රී ලංකාව සතු අන්තර්ජාතික ගිවිසුම්මය බැඳීම් හැල්ලු වන අයුරින් ක්‍රියාත්මක විය.[28] ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්වරයා ඝාතන තැතට පසුව 2006 දෙසැම්බර් මාසයේදී යළි හඳුන්වාදෙනු ලැබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන මෙකී ගැටළු සහගත වාතාවරණය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක විය.

ශ්‍රේෂ්ඨාධිකරණයද *සිංගරාසා නඩුවේ තීරණය* තුළින්, ශ්‍රී ලංකාව තුළ ඇති තම අන්තර්ජාතික සම්මුතීන් කෙරෙහි ඇති බැඳීම් ඉටුකිරීමට ඇති කැපවීම සම්බන්ධයෙන් සැකසංකා පළ කළේය. එම නඩු තීන්දුවෙන් ශ්‍රී ලංකාව, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික වෛකල්පික ප්‍රොටොකෝලයේ (OP-ICCPR) ගිවිසුම් බලාත්මක කරන ආයතනය වන

27 ICG, "සාම ක්‍රියාවලිය අසාර්ථක වීම"

28 මානව හිමිකම් තත්ත්වය 2006, V වන පරිච්ඡේදය, සාලිය එදිරිසිංහ "හදිසි අවස්ථා පාලනය" 167-221 පිටු බලන්න.

මානව හිමිකම් කමිටුව වෙතට පෙත්සම් ඉදිරිපත්කිරීමට හැකිවන පරිදි එකී ප්‍රොටොකෝලයට අත්සන් තැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බව අධිකරණය තීරණය කළේය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික වෛකල්පික ප්‍රොටොකෝලයට අත්සන් තැබීමෙන් මානව හිමිකම් කමිටුව වෙත අධිකරණ බලතල ප්‍රදානය කිරීමක් සිදුවූයේය යන මතය මෙම නඩු තීන්දුවට පදනම්වූ බව පෙනෙන්නට තිබුණද මානව හිමිකම් කමිටුවේ නීතිමය රාමුව තුළින් එවැනි අදහසක් සනාථ නොවේ.[29]

දිනෙන් දින දුර්වල වෙමින් පැවති මානව හිමිකම් තත්ත්වය තුළ ජාතික අධිකරණ පද්ධතියද දුර්මුඛව සිටි බව 2006 වසර තුළ ගොනුකරන ලද මූලික අයිතිවාසිකම් නඩු සංඛ්‍යාව අඩුවීමෙන් පැහැදිලි විය.[30] (1998 -2003 කාල පරිච්ඡේදය ආවරණය කරමින්) අතුරුදහන්වූ පුද්ගලයන් පිළිබඳ ලබා ගත් තොරතුරු වලට අනුව (30000 කට අධික අතුරුදහන්වීමේ සිද්ධීන් සංඛ්‍යාවක් ලියාපදිංචි කොට තිබූ) අතුරුදහන්වීම් පිළිබඳ කොමිෂන් සභා හතරක ක්‍රියාකාරිත්වය මත ගොනුකරන ලද අධිචෝදනා 350 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධයෙන් 2003 වර්ෂය වන විට දඬුවම් නියම කොට තිබූ අවස්ථා ගණන නවයක් පමණ විය.[31] ඒ අනුව අහඹු යාන්ත්‍රණ ස්ථාපිත කරමින් දුර්වල ආයතන ශක්තිමත් කිරීමේ රජයේ ප්‍රයත්නය, සුවිශේෂී තත්ත්වයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ ඵලදායී උපායමාර්ගයක් ලෙස පෙනෙන්නට නොතිබුණි.

5. අහඹු ලෙස ආයතන ස්ථාපිත කිරීම

බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම් හා පැහැරගෙනයාම් සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පැවතුණු ගැටළුවට ප්‍රතිචාරයක් වශයෙන් ජනාධිපතිවරයා විසින් ඒ පිළිබඳව පරීක්ෂා කොට නිර්දේශ ඉදිරිපත්කිරීම සඳහා ඒක පුද්ගල කොමිසමක් පත්කරන ලදී. කෙසේ වුවද, ආරම්භයේදී දැඩි අදහස් ප්‍රකාශ කළද අදාළ කරුණු පිළිබඳව වූ තම 2006 වාර්තාවෙන්

29 මෙම නඩුව පිළිබඳව කර ඇති සාකච්ඡාවක් සඳහා මෙම වෙළුමේ "මානව අයිතිවාසිකම්වල අධිකරණමය රැකවරණය" බලන්න.

30 ඉහත අංක 29

31 LST හා AHRC " ශ්‍රී ලංකාව තුළ සිදුවන වධ හිංසාඃ නොනවතින ප්‍රශ්න සහ සුවිශේෂ ගැටළු" වධ හිංසාවලට එරෙහි කමිටුව වෙත ඉදිරිපත් කෙරුණු විකල්ප වාර්තාව, 2005 නොවැම්බර් 7, ඇමුණුම 3

විනිසුරු තිලකරත්න ප්‍රකාශ කළේ අතුරුදහන්වූයේ යයි වාර්තාවූ තැනැත්තන්ගෙන් බහුතරය, එක්කෝ ආපසු පැමිණ ඇති බවත්, එසේ නැතහොත් ඔවුන් අතුරුදහන්වූවන්ගේ පවුල් තුළ සහ අතුරුදහන්වූවන් වෙනුවෙන් ක්‍රියාකරන්නන් තුළ කැළඹීම් ජනිත කරමින් අනියම් සහකරුවන් සමඟ "පැන ගොස්" ඇති බවත්ය. අතුරු වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත්කරනු ලැබුවද වසර අවසානය වන විටත් එම වාර්තාවේ නිරීක්ෂණ හෙළිදරව් කර නොතිබුණි.

2006 සැප්තැම්බර් මස 04 වන දින, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිළිබඳව රාජපක්ෂ ජනාධිපතිවරයා නිවේදනය කළේය. එම අවස්ථාවේ ඔහු ප්‍රකාශ කළේ කොමිසමට දේශීය මෙන්ම ජාත්‍යන්තර කොමසාරිස්වරුන්ද ඇතුළත්වනු ඇති බවයි. එයවූ කලී ක්‍රියාකාරී ජාතික මානව හිමිකම් ආරක්ෂණ යාන්ත්‍රණ නොමැති තත්ත්වයක් තුළ අන්තර්ජාතික නිරීක්ෂණ කමිටුවක් උදෙසා හඬ නැගූ සිවිල් සමාජ ක්‍රියාකාරී කණ්ඩායම්වල අස්වැසිල්ලට කරුණක් වූ බව පෙනුණි. කෙසේ වුවද, ඉන් දින දෙකකට පසුව, ජනාධිපතිවරයා විසින් එකී කොමිසමට දේශීය කොමසාරිස්වරුන් පමණක් ඇතුළත්වනු ඇති බව සහ ඒ සමඟම උසස්තම පරිචයන් පිළිබඳව කොමිසමට උපදෙස්දීම පිණිස අන්තර්ජාතික විශේෂඥයන්ගෙන් සමන්විත වෙනම ආයතනයක්ද පිහිටුවන බව ප්‍රකාශ කළ අවස්ථාවේ පෙර කී පොරොන්දුවේ වටිනාකම අඩු විය. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක උදලාගමගේ ප්‍රධානත්වයෙන්වූ කොමිසම 2006 නොවැම්බර් මාසයේදී විධායකයේ නියෝගයක් මගින් ස්ථාපිත කරන ලද අතර, පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන්ව නොවිසඳී තිබුණු මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් 16ක් පිළිබඳව පරීක්ෂා කර බැලීමට ඊට බලය පැවරුණි. ජාත්‍යන්තර ස්වාධීන විශේෂඥයන් කණ්ඩායමට පැවරෙන බලතල පිළිබඳව වසර අවසානය වන විටත් අවසන් තීරණයකට එළැඹ නොතිබුණි.[32]

32 ජනාධිපතිවරයාගේ 2007 ජනවාරි 12 දිනැති ඇරයුම් ලිපියක කොන්දේසි අවසානාත්මකව තීරණය කරන ලදී., http://www.iigep.org/mandate.htm.

6. මුස්ලිම් ජාතිකයන්ගේ අත්දැකීම් - ඉතිහාසය ලුහුඬින් හා 2006 වසර සඳහා එහි බලපෑම

ශ්‍රී ලංකාවේ දිගින් දිගටම පවතින යුද්ධය පිළිබඳව බොහෝ දුරට ස්ථාපිත මතය වන්නේ එය සිංහල බහුතරය හා දෙමළ සුළුතරය අතර සටනක් බවයි. පාර්ශ්ව දෙකක් අතර යුද්ධයක් ලෙස සිත් කාවැදී ඇති යුද්ධය පිළිබඳ මෙම අවබෝධය තුළ, රටේ සමස්ත ජනගහනයෙන් 8.9% ක් හා යුද්ධයෙන් බලපෑමට ලක්වූ නැගෙනහිර පළාතේ ජනගහනයෙන් 40% ක් පමණ වන්නාවූ, එමෙන්ම උතුරු පළාතෙන් එල්.ටී.ටී.ඊ. ය විසින් පළවා හරිනු ලැබුවාවූ මුස්ලිම් ප්‍රජාවට කිසිදු අවකාශයක් නැතිවා සේය.

වෙනම ජනවාර්ගික කණ්ඩායමක් ලෙස වර්ගීකරණය කරනු ලැබුවද මුස්ලිම් ජාතිකයන් දෙමළ බස කථාකරන්නන් වන අතර, දෙමළ ජාතිවාදීන් සමහර අවස්ථාවලදී මුස්ලිම් ජාතිකයන් වනාහී පැතිරුණු දෙමළ ජාතියක කොටසක් වන්නේ යයිද ප්‍රකාශ කර ඇත.[33] මෙකී හැඳින්වීම සාවද්‍යයයි මුස්ලිම් නායකයන් විසින් ඓතිහාසික අවස්ථාවන්හිදී ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කර තිබුණද, රජයට එරෙහි දෙමළ සන්නද්ධ සටන්කාමීත්වය ඇරඹි මුල් කාල වකවානුවේදී නැගෙනහිර පළාතේ මුස්ලිම් තරුණයන් දෙමළ දේශපාලන සන්නද්ධ කණ්ඩායම්වල සාමාජිකයන්ව සිටි අතර, මුස්ලිම් ජාතිකයන් ෆෙඩරල් පක්ෂය සහ පසුකාලීනව, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ වැනි දෙමළ දේශපාලන පක්ෂ යටතේ බොහෝ විට මැතිවරණ වලට තරඟ කළහ. නැගෙනහිර පළාතේ දෙමළ-මුස්ලිම් විරසකය අවුළුවාලීම සම්බන්ධයෙන් රජයද වගකිව යුතු වන්නේය.

මෙම කොටසේදී, 1990 වසරේ මුස්ලිම් ජාතිකයන් පළවාහැරීම, 2005 වසරේ පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ ව්‍යුහය හා 2006 වසරේ මුතූර් නගරය වැටලීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් හරහා යුද්ධය හා සාම ක්‍රියාවලිය තුළ මුස්ලිම් ජාතිකයන්ට හිමි ස්ථානය පිළිබඳ ඉතිහාසය පිරික්සා බැලීමට උත්සාහ දරනු ලැබේ.

33 රටේ මුස්ලිම් ජනගහනයෙන් 30% කට ආසන්න ප්‍රමාණයක් දෙමළ කථා කරන ජනතාව වෙසෙන උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචිකරුවෝ වෙති. ඉතිරි මුස්ලිම් ජනගහනය, බහුතර සිංහල ප්‍රදේශ තුළ විසිරුණු කුඩා ජන කණ්ඩායම් ලෙස වාසය කරති. මෙම ප්‍රජාවිද්‍යාත්මක සාධකයද ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ මුස්ලිම්වරුන්ට හිමි ස්ථානය සහ යුද්ධය පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිචාරය තීරණය වීම කෙරෙහි බලපෑම් එල්ල කර ඇත.

6.1 1990 වසරේ මුස්ලිම් ජාතිකයන් පළවාහැරීම

1990 ඔක්තෝබර් මාසයේදී එල්.ටී.ටී.ඊ.ය විසින් උතුරු පළාත පුරා පදිංචිව සිටි ලක්ෂයකට ආසන්න මුස්ලිම් ජනතාවක් වෙත තුවක්කු එල්ල කොට බියවද්දා, තම බඩුබාහිරාදිය එල්.ටී.ටී.ඊ.යට භාරදී ස්වකීය වටිනා ද්‍රව්‍ය එල්.ටී.ටී.ඊ.ය විසින් නම්කරන ලද ගබඩා ස්ථානවල තබා සිය නිවාසවලින් පළා යන ලෙසට තර්ජනය කළේය. මෙම ක්‍රියාවලිය උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහ තුළ කෲර අයුරින් ක්‍රියාත්මක විය.[34]

2006 වසර අවසානය වන විට පවා මෙකී උතුරු පළාත් මුස්ලිම් ජාතිකයන්, සම්පත් ඌණතාවයෙන් පෙළෙන පුත්තලම දිස්ත්‍රික්කය තුළ අධික ජන තදබදයකින් යුත් ජනාවාසවල ජීවත්වෙමින් සිටියහ. පුත්තලම වූ කලී, පළවාහරිනු ලැබීමට යටත්වූ වැඩිම මුස්ලිම් ජාතිකයන් සංඛ්‍යාව ජීවත්වූ උතුරු පළාත තුළ පිහිටි දිස්ත්‍රික්කය වූ මන්නාරම දිස්ත්‍රික්කයට යාබදවම දකුණින් පිහිටි දිස්ත්‍රික්කය වේ. ස්වකීය ජීවිත විනාශ මුඛයට ඇද වැටී, අවතැන්ව රට තුළ සිටි ලක්ෂ ගණන් දෙමළ හා සිංහල ජනතාවගේ ජීවිත හා ඔවුන්ගේ ජීවිත එක සමාන වේ.[35] එහෙත් මුස්ලිම් ජාතිකයන් අත්විඳි අත්දැකීම්වල ඇතැම් වෙනස්කම් තුළින් ශ්‍රී ලාංකික සමාජ ක්‍රමය තුළ මුස්ලිම් ජාතිකයන්ට හිමි ස්ථානය පිළිබිඹු වේ. ඔවුන් සිංහල බස කතාකරන්නන් වාසය කරන දිස්ත්‍රික්කයක් තුළ පදිංචි දෙමළ බස කතාකරන පිරිසක් වන අතර, භාෂාව ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර ඉතා අල්පය. භාෂා ගැටළු හේතුවෙන් ඔවුන්ට සෞඛ්‍ය පහසුකම් හා රජයෙන් සැලසෙන අනෙකුත් පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇත. ඔවුන් පළවාහරිනු ලැබුවේ යම්

34 2002-2005 සාම ක්‍රියාවලියේ මුල් කාලයේදී එල්.ටී.ටී.ඊ.යේ හිටපු න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් 2002 අප්‍රේල් මාසයේ කිලිනොච්චියේ පැවති මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කළේ මුස්ලිම්වරුන් පළවා හැරීම තමන්ගේ පැත්තෙන් සිදුවූ "උපායමාර්ගික වරදක්" බවය. යාපන ප්‍රදේශයේ සිට අවතැන්වූ මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයකු මෙන්ම වර්තමානයේදී දේශපාලනඥයකු සහ මානව හිමිකම් ක්‍රියාකාරියකු වන මවුලවි සුෆියන්ට අනුව එල්.ටී.ටී.ඊ. යේ දේශපාලන අංශ නායක තමිල් සෙල්වම් විසින් ඔහුව හමුවීමට පැමිණි මුස්ලිම් ජාතික නියෝජිතයන්ගෙන් නිල වශයෙන් සමාව අයැද සිටි අතර, උතුරු පළාත ඔවුන්ගේ පරිපාලනයට නතුවූ දිනෙක මුස්ලිම් ජනතාවට නැවත පදිංචිවීමට සහය වන බවත් සහතික වී ඇත.

35 ශ්‍රී ලංකාව තුළ සිදුවූ මිනිසුන් සමූහයක් වශයෙන් පළවාහැරීමේ එකම අවස්ථාව මෙය නොවේ. උතුරු හා නැගෙනහිර සමස්ත ප්‍රදේශයම එල්.ටී.ටී.ඊ. ය විසින් පාලනය කිරීම වැළැක්වීම පිණිස, උතුරු හා නැගෙනහිර පළාත්වලට මායිම්ව පිහිටි උපායමාර්ගික වශයෙන් වැදගත් වන මෙම මාවිල්ආරු ප්‍රදේශයේ හමුදා බලය තහවුරු කරගැනීම සඳහා නැගෙනහිර පළාතේ මාවිල්ආරු ප්‍රදේශයේ සිටි දෙමළ පදිංචිකරුවන් ශ්‍රී ලංකා හමුදාව විසින් පළවා හැරියේය. මෙම පුද්ගලයන් අදටත් සරණාගත කඳවුරුවල කාලය ගත කරමින් සිටිති.

සංවිධානයක් විසින්ද එම සංවිධානයේ කැමැත්ත නොමැතිව ඔවුනට තම පාරම්පරික වාසභූමි වෙත ආපසු යා නොහැකිය. පළවාහරිනු ලැබූ මුස්ලිම් ජාතිකයන් බොහෝ දෙනෙකු පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් ලෙස ලියාපදිංචි වීමට බියක් දක්වති. ඊට හේතුව, එමගින් රජයේ සහනාධාර සලාකයට ඇති අයිතිවාසිකම මෙන්ම දේපල සඳහා හිමිකම්පෑමේ හා උතුරේ නැවත පදිංචිවීමේ අයිතිවාසිකම තමනට අහිමි වේය යනුවෙන් ඔවුන් තුළ පවතින බියයි.[36] පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් සරණාගතයන්ගේ ආගමනය පිළිබඳව බලවත් අප්‍රසාදය පළ කරන අතර, ඔවුන් ප්‍රකාශ කරන්නේ එකී සරණාගතයන්ගේ පැමිණීම ප්‍රදේශය තුළ පවතින අල්ප සම්පත් ප්‍රමාණයට තර්ජනයක් වනු ඇති බවයි.

ස්වකීය ජන ජීවිතයේ ස්වභාවය අනුවත්, වාසය කිරීමට බල කෙරෙන ප්‍රදේශය තුළ පවතින උග්‍ර ඌන සංවර්ධිත තත්ත්වය අනුවත්, දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරීන් මත වන ඔවුන්ගේ දැඩි රැඳියාව වැළැක්විය නොහැකිය. ආහාර ද්‍රව්‍ය සලාක බෙදාහැරීම සඳහාත්, සේවා සැපයීම සඳහාත් පොදු පහසුකම් හා ජීවන මාර්ග වෙතට ප්‍රවේශය ලබාගැනීම සඳහාත් ප්‍රජාවට එහි සිටින දේශපාලනඥයන්ගේ අනුග්‍රහය අවශ්‍ය වන අතර, පරිපාලකයන්ට අභියෝග කරනු වස් ඔවුනට කළ හැකි යමක් නැත්තේය. ඡන්දදායක ලැයිස්තු අලුත් කිරීමේ ආකෘති පත්‍ර ප්‍රජාව අතර බෙදා හැරෙනුයේ ඉතාමත් කලාතුරකිනි. ඡන්දය ප්‍රකාශ කළ හැකි වයස් මට්ටමට එළඹෙන බොහෝ දෙනෙකුට ඒ සඳහා ලියාපදිංචි වීමට අවස්ථාවක් ලැබී නොමැති අතර, ඔවුන් වසර ගණනාවකින් ඡන්දය ප්‍රකාශ කොට නැත.[37] එහි ප්‍රතිඵලයක් ලෙස උතුරේ මුස්ලිම් ජාතිකයන්ට තම ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය අහිමිවී ගොස් ඇති අතර, දේශපාලන වෙනසක් ඇති කිරීමේ හෝ තමන් වෙනුවෙන් දේශපාලන හඬක් ලබා ගැනීමේ ඔවුන්ගේ හැකියාව හීනවී ගොස් ඇත.

පරීක්ෂණ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම තුළින් හෝ අවතැන් වූවන් වෙනුවෙන් විශේෂිත පරිපාලන විධිවිධාන හඳුන්වාදීම තුළින් හෝ රජය ඔවුන්ගේ ප්‍රශ්ණයෙහි ඇති අනන්‍ය ස්වභාවය හඳුනාගෙන පිළියම් යෙදීමට කිසිදු අයුරකින් කටයුතු කර නැත. පුත්තලමේ පිහිටුවා ඇති,

---

36 කැතරින් බෲන්, "දේශීය පුරවැසියන් හෝ අභ්‍යන්තරිකව අවතැන්වූවන් - ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීන අවතැන්වීම පිළිබඳ උභතෝකෝටික ගැටළුව", සරණාගත අධ්‍යයන පිළිබඳ සඟරාව 16(4), පිටුව 376

37 පුත්තලම පදිංචිකරුවකු කළ ප්‍රකාශයකි.

මෑතකදී ස්ථාපනය කරන ලද උතුරේ මුස්ලිම් ජාතිකයන් සඳහා වූ රජයේ ලේකම් කාර්යාලය මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් ඇතැම් පරිපාලන කරුණු සම්බන්ධයෙන් කටයුතු කරයි. කෙසේ වුවද, දිගු කාලීන විසඳුම් කවරේදැයි පැහැදිලි නැත.

2002 සටන් විරාම ගිවිසුමෙන් පසුව, නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රදේශ වෙතට එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකිවූ අතර, බිය වැද්දීමේ හා කප්පම්ගැනීමේ සිද්ධීන් හා මුස්ලිම් ජාතිකයන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් අඩපණ කිරීමේ උපායමාර්ගික ප්‍රයත්නයන් බොහොමයක් පිළිබඳව වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර පළාත තුළ මුස්ලිම් ජාතිකයන් හා එල්.ටී.ටී.ඊ. ය අතර සබඳතා දෙදරා ගියේය.

6.2 පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය - (P-TOMS)

නැගෙනහිර පළාතේ මුළු ජනගහනයෙන් තුනෙන් එකක් පමණ වන මුස්ලිම් ජනතාව ඉඩම් සීමිත වීම හේතුවෙන් සාගරය දෙසට වඩවඩාත් ව්‍යාප්ත වෙමින් තදබදයෙන් යුක්තව සමූහ වශයෙන් ජීවත් වෙති.[38] සුනාමියේදී මෙම ජන කණ්ඩායම් වෙත අතිශය විනාශයක් අත්වූ අතර, නිල සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ මුළු මුස්ලිම් ජනගහනයෙන් 1% ක් මරුමුවට පත්වූහ. නැගෙනහිර පළාතේ එල්.ටී.ටී.ඊ. පාලනය පැවති ප්‍රදේශවල සිටි දෙමළ පදිංචිකරුවන් දහස් ගණනක්ද දරුණු ලෙස බලපෑමට ලක්වූහ. ආපදාවෙන් විනාශයට පත්වූ ප්‍රදේශවල බොහෝ බිම් කොටස් එල්.ටී.ටී.ඊ. යේ පාලනයට නතුව තිබුණු හෙයින්, සුනාමි සහනාධාර සැපයීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේදී එල්.ටී.ටී.ඊ. ය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලෙස දේශීය ක්‍රියාකාරීන් හා අන්තර්ජාතික ප්‍රජාව රජයෙන් ඉල්ලා සිටියහ. 2002 සටන් විරාමයත් සමඟ ඇරඹුණු රටේ සාම ක්‍රියාවලිය 2004 දෙසැම්බර් මාසය වන විට නිෂ්ක්‍රීය තත්ත්වයට පත්ව තිබුණ අතර, සහනාධාර බෙදාහැරීම සඳහා "ඒකාබද්ධ යාන්ත්‍රණයක්" පිහිටුවීම නිහැඬියාව බිඳහෙළිය හැකි උපායමාර්ගයක් වශයෙන් සළකන ලදී. 2005 ජූලි මාසයේදී උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ

38 ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ජනවාර්ගික පදනමින් ඉඩම් බෙදා වෙන්කිරීමේ ප්‍රවණතාවය තුළ ස්වකීය ගම්බිම් අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විශේෂයෙන් නම් නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන මුස්ලිම් ජනතාවට රජයේ ඉඩම් ප්‍රදාන හරහා ඉඩම් ලබාගැනීමේ දුෂ්කරතාවයක් පවතී.

කටයුතු සිදුකිරීම සඳහා පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ ව්‍යුහය (P - TOMS) කරළියට පැමිණුනි.

මුස්ලිම් ජාතිකයන්ට මෙය තිගැස්මට කරුණක් විය. 18,000 කට ආසන්න මුස්ලිම් ජාතිකයන් සංඛ්‍යාවක් මරුමුවට පත්වූ හා මුස්ලිම් ගම්මාන රාශියක් අර්ධ වශයෙන් විනාශයට පත්වූ නැගෙනහිර පළාත සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ඉලක්ක කෙරුණු මෙම වැඩපිළිවෙලේදී මුස්ලිම් ජාතිකයන්ගේ අදහස් විමසීමකින් තොරව මුස්ලිම් ජාතිකයන්ගේ ගැටළුවලට පිළියම් යෙදීමට අපේක්ෂා කෙරුණි. සටන් විරාම ගිවිසුම මෙන්ම එයද රජය හා එල්.ටී.ටී.ඊ.ය අතර පමණක් වූ ගිවිසුමක් විය. නිසැක ලෙසම හුදු ආකෘතිමය ස්වරූපයක් පෙන්නුම් කළ ඉහළම පරිපාලන මට්ටම තුළ මුස්ලිම් පක්ෂවල නියෝජිතයකු වෙනුවෙන් ඉඩකඩ වෙන්වී තිබුණද, කළමනාකරණ ව්‍යුහයේ අනෙකුත් ස්ථිර තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නිෂේධ බලයද හිමිව තිබූ එල්.ටී.ටී.ඊ යට වාසිදායක අයුරින් හැඩගස්වා තිබුණි. ගිවිසුම කෙටුම්පත් කිරීමෙන් බලපෑමට ලක්වූ මුස්ලිම් ජාතිකයන් හෝ මුස්ලිම් දේශපාලන නියෝජිතයන්ගේ ඉතා අවම අදහස් විමසීමක් සහිතව සිදුකරන ලද අතර, මුස්ලිම්වරුන්ට හෝ මුස්ලිම් දේශපාලන පක්ෂවලට ගිවිසුමේ අන්තර්ගතය දැනගැනීමට පූර්ව අවස්ථාවක් හෝ ලබා නොදුණි. තවද, ඔවුනට ගිවිසුම තුළ අත්සන්කාර පාර්ශවකරුවකුගේ තත්ත්වයද හිමි නොවීය.

සාම ක්‍රියාවලිය හා පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ ව්‍යුහය අතර තිබුණු තිළ නොවන සබඳතාවය නිසාද මුස්ලිම් ජාතිකයෝ එකී කළමනාකරණ ව්‍යුහයට බිය පළ කළහ. එය බොහෝ දෙනෙකු දුටුවේ අනාගතයේදී මුස්ලිම් ජනතාවගේ දුක් ගැනවිලි ඇතුළත් කරන මුවාවෙන් පිළියෙල කරනු ලබන යම් ක්‍රියාවලියක් තුළින් මුස්ලිම් පක්ෂ බැහැර කිරීමේ පූර්වාදර්ශයක් ලෙසය. මුස්ලිම් පක්ෂවලට හැඟී ගියේ මෙය මුස්ලිම් ජාතික දේශපාලන නායකත්වය යටපත් කිරීම සඳහා වූ එල්.ටී.ටී.ඊ යේ තවත් එක් උත්සාහයක් බවයි. රජයේ සාමාජිකයන්ගේ අදහස වූයේ, ඉහළම පරිපාලන මට්ටම තුළ මුස්ලිම් ජාතිකයන් ඇතුලත් කිරීමේ වැදගත් ඉදිරි පියවර ඔවුන් විසින් ප්‍රමාණවත් ලෙස තක්සේරුවට ලක් කර නොමැති බවයි. තම අදහස් විමසනු ලැබීමෙන් තොරව, තමන්ව "ඇතුළත් කරන ලද" ක්‍රියාවලියක් තුළ පැවති පක්ෂග්‍රාහිත්වයට එරෙහි මුස්ලිම් කැළඹිල්ල කොතෙක්විද යත්, රජයට අඩුතරමින් මුස්ලිම් ජාතිකයන් සමඟ සාකච්ඡාවට ගොස් ඔවුන්ගේ ගැටළුද ඊට ඇතුළත් කිරීමේ උත්සාහයක් දැරීමට පවා

සිදුවිය. යුද්ධය පිළිබඳ ශ්‍රී ලාංකීය කතිකාවතෙහි මුස්ලිම් ජාතිකයන්ට හිමි ස්ථානයේ විකාශනයෙහි වැදගත් සංධිස්ථානයක් ලෙස P-TOMS ආශ්‍රිත පසුබෑම සනිටුහන් වී ඇත. කෙසේ වුවද ඉහත කී කැළඹිල්ල හේතුවෙන් ඇතිකරන ලද යම් වෙනස්කමක් හෝ වීද එයද අවලංගු බවට පත්විය. ඊට හේතුව ගිවිසුමේ ඇතැම් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි යයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම වූ අතර, ජනාධිපතිවරණයට දින නියම වීමෙන් කුමාරතුංග පාලනයේ අවසානයේ පෙරනිමිති පහළ විය.

6.3 2006 අගෝස්තුවල මුතූර්

2006 වර්ෂයේදී රජයේ හා එල්.ටී.ටී.ඊ. යේ සන්නද්ධ සටන්කරුවන් විසින් මුස්ලිම් ජාතිකයන් ප්‍රහාරවලටත්, අවතැන්වීමටත් හා දේපළ අහිමි කිරීමටත් බඳුන් කරන ලදී. මේ පිළිබඳ පැහැදිලි නිදසුනක් වූයේ එම වසරේ අගෝස්තු මාසයේදී මුතූර් නගරය වටලනු ලැබීමයි. 2006 වසරේ කැපී පෙණුනු එදිරිවාදිකම් ඉහළයාමේ එක් අවස්ථාවක 2006 ජූලි මස 20 දින එල්.ටී.ටී.ඊ. ය විසින් මාවිල්ආරු සොරොව්ව වසාදැමීම සිංහල ගොවි ජනතාව අසහනයට පත්කළ අතර, එය එම ප්‍රදේශය "මුදා ගැනීමට" ආරක්ෂක හමුදා මෙහෙයුමක් දියත් කිරීමට මඟ පෑදීය. මෙම හමුදා මෙහෙයුම තුළ නැගෙනහිර පළාතේ වැඩිම මුස්ලිම් ජනගහනයක් සිටි, එමෙන්ම ත්‍රිකුණාමලය ස්වාභාවික වරායට එක්පසෙකින් මායිම්ව පිහිටි මුතූර් නගරයේ පාලනය ලබාගැනීම පිණිස අරගලයක් පැවතුණි. 2006 අගෝස්තු මස 01 දින දෙපාර්ශවය විසින් නගරයේ පාලනය අත්පත් කරගැනීම සඳහා සටන් වැදුණු අවස්ථාවේදී නගරය ප්‍රහාරයට ලක්වූ අතර, දෙපාර්ශවයම නගරයේ ගොඩනැගිලි ඉදිකර තිබූ ස්ථාන ආශ්‍රිත ඉලක්ක වෙත කාලතුවක්කු ප්‍රහාර එල්ල කළහ. මුතූර් දිස්ත්‍රික් රෝහලේ මාතෘ ඒකකය, නද්වාතුල් උලේමා අරාබි පාසල, අශ්රෆ් උසස් විද්‍යාලය හා අල්හිලාල් පාසල ප්‍රහාරයට ගොදුරු විය. මෙකී සිදුවීම් වලදී ආරක්ෂාව පතා පාසල් ගොඩනැගිලි තුළටවී සිටි 49 දෙනෙකු මරු මුවට පත්වූහ. මුතූර් නගරය මහත් සේ එල්.ටී.ටී.ඊ. පාලනයට යටත්ව තිබුණු අවස්ථාවේදී මුස්ලිම් ප්‍රජාව මැදිහත්කරුවන් හරහා, කාලතුවක්කු ප්‍රහාර නතර කරන මෙන් රජයෙන් ඉල්ලා සිටියහ. හමුදාව නගරයට ප්‍රහාර එල්ල කිරීම අඛණ්ඩව කරගෙන ගියහ.

තෙවන දිනය අවසානයේදී මුතූර්හි මුස්ලිම් වැසියන් නගරය අතහැර යාමට තීරණය කළ අතර ඔවුන්ට එල්.ටී.ටී.ඊ. ය විසින් ආරක්ෂාව පිළිබඳ

සහතිකයක් ලබා දෙන ලදී.[39] අගෝස්තු 04 වන දින කත්තලේ බලා යන අතර මගදී එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් විසින් ඔවුන් A-15 ප්‍රධාන මාර්ගයෙන් වෙනතකට හරවා එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයක් වූ කිරන්තිමුනෙයි වෙත රැගෙන යන ලදහ. මෙහිදී, ඇසු දුටු සාක්ෂි අනුව, එල්.ටී.ටී.ඊ. ය විසින් එහි සිටි පිරිමින්, ගැහැණුන්ගෙන් හා ළමුන්ගෙන් වෙන්කරනු ලැබූහ. මුහුණු ආවරණය කර සිටි මිනිසුන් දෙදෙනෙක්, රජය සමඟ එක්ව කටයුතු කරමින් සිටි මුස්ලිම් සන්නද්ධ කණ්ඩායමක සාමාජිකයන් යයි සැකකෙරුණු පුද්ගලයන් තෝරා වෙන්කර ගත්හ. මෙකී පුද්ගලයින් බැඳ දමනු ලැබූ අතර, ඉතිරි තැනැත්තන්ට නොනැවතී ගමන් කරන ලෙස අණ කෙරිණ. කිරන්තිමුනෙයි හිදී අතුරුදහන්වූ පුද්ගලයින් 66 දෙනෙකුගේ ඉරණම කුමක්දැයි මෙතෙක් දැනගැනීමට නැත.[40]

2002 වසරේදී සාම ක්‍රියාවලිය ආරම්භවූ අවස්ථාවේ සිට 2005-2006 කාල වකවානුව තුළ එය අඩපණ වීම අතරතුර මුස්ලිම් ජනතාවගේ දුක්ගැනවිලි පිළිබඳ සැලකිල්ල යොමුකිරීමේ යම් වර්ධනයක් තිබුණද එය එකී දුක්ගැනවිලි විසඳීම දෙසට කිසියම් හරයාත්මක පියවරක් තැබීම තෙක් ව්‍යාප්ත නොවීය. එකී කාල වකවානුව තුළ අත්පත් කරගත් යම් සුළු හෝ ප්‍රතිලාභයක් වීද එයද මේ වන විටත් අතුරුදහන්ව ඇති සෙයක් පෙනී යයි. රාජ්‍ය පාලනාධිකාරියට සමීප ක්‍රියාකාරී මුස්ලිම් දේශපාලන නායකයන් සිටියදීද, සටන් විරාම ගිවිසුම යටතේ සාම ක්‍රියාවලිය, මුස්ලිම් ජාතිකයන්ගේ විශේෂිත දුක්ගැනවිලි ප්‍රමාණවත් පරිදි සැලකිල්ලට ගැනීමට අපොහොසත් විය. (සත්‍ය වශයෙන්ම, මුස්ලිම් ජාතිකයන් "ගැටුමේ ඍජු පාර්ශවකරුවකු නොවන කණ්ඩායමක්" ලෙස සටන් විරාම ගිවිසුමේ පූර්විකාවෙහි සඳහන් විය) සිවිල් සමාජයේ සහ දේශපාලන ක්‍රියාකාරීන්ගේ උද්ඝෝෂණ මෙම ආකල්පය යම්තාක් දුරකට වෙනස්කිරීමට සමත් වුවද, ඒවායේ ප්‍රතිලාභ වර්තමානයේදී අමතකව ගොස් ඇති සේ පෙනේ. අවාසනාවකට මෙන් මෙම විෂය සඳහා පාර්ලිමේන්තුවේ වෙන් කෙරුණු පූර්ණ එක්දින විවාදය

39 මුතූර් පදිංචිකරුවකු පැවසුව පරිදි 1987 දී හා1990 දී රජය හා එල්.ටී.ටී.ඊ. ය අතර වූ ඒ හා සමාන ගැටුම් වලට මුතූර් නගරය මැදි වුවද ඉතිහාසය තුළ එහි පදිංචිකරුවන්ට නගරය හැරයාමට සිදු වූ ප්‍රථම අවස්ථාව එය විය.

40 රජයේ හමුදා වෙතින් ෂෙල් වෙඩි ප්‍රහාරයක් එම ප්‍රදේශයට එල්ලවූ අතර, එහිදී පුද්ගලයන් කිහිපදෙනෙකු මරුමුවට පත්ව තවත් කිහිපදෙනෙකු තුවාල ලැබූහ. කිහිපදෙනෙකු පැන යාමටත් සමත් වූහ. ෂෙල් වෙඩි එල්ලවූ අවස්ථාවේදී, එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් දිවගිය බවත්, නිර්මාණය වූ ව්‍යාකූල පරිසරය තුළ මුස්ලිම් ජාතිකයන් පැනයාමට සමත්වූ බවත්, පදිංචිකරුවෝ පැවසූහ. කෙසේ වුවද, බොහෝ දෙනෙක් මරුමුවට පත් වූහ. අගෝස්තු 15 වන දින එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් කිරන්තිමුනෙයිහි මළ සිරුරු සොයාබැලීමට ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට හා මුස්ලිම් නියෝජිතවරුන්ට පැයක පමණ කාලයක් පමණක් ලබා දුනි. මළ සිරුරු 3 ක් පමණක් සොයා ගැනුණි.

සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීම අඩුවීමෙන් මෙකී උදාසීනත්වය පෙන්නුම් කෙරුණු අතර, එකී විවාදයේදී කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙකු පමණක් කථා කළ අතර, පක්ෂ සියල්ලේම පාහේ ඉදිරි පෙළ අසුන් හිස්ව පැවතුණි.[41] යුධමය විසඳුමක් හඹායන සහ පැහැදිලිවම බහුතරවාදී ප්‍රතිපත්තියක් මත පිහිටා කටයුතු කරන වත්මන් පාලනයද මුස්ලිම් ජන ප්‍රජාවගේ ප්‍රශ්ණ පිළිබඳව දක්වන්නේ අල්ප උනන්දුවක් බව පෙනී යයි.

ශ්‍රී ලාංකීය දේශපාලන ව්‍යුහය තුළ පූර්ණ සහභාගිත්වයක් සාක්ෂාත් කරගැනීමේදී මුස්ලිම් ජාතිකයන් මුහුණ දුන් අභියෝග පිළිබඳව ඉහත දැක්වූ කෙටි ඉතිහාසය තුළින් ඒ පිළිබඳ සමස්ත චිත්‍රයම අවබෝධ කරගත නොහැකිය. එසේ වුවත්, වෙනත් ඕනෑම තනි සිදුවීමකට වඩා, 2006 අගෝස්තු මාසයේ මුතූර් නගරයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමේ සිද්ධිය මුස්ලිම් සිවිල් ජනතාවගේ ජීවිත සම්බන්ධයෙන් රජයේ හා එල්.ටී.ටී.ඊ. යේ නොසැලකිල්ල පෙන්නුම් කිරීමට ප්‍රමාණවත්ය.

7. අවසානය

යුද්ධයේ මෑතකාලීන අවසන් අදියරේ රජයේ ක්‍රියාමාර්ග වලින් නිරූපණය වන පරිදි, අඩු වශයෙන් ශ්‍රී ලංකාව යනුවෙන් රටවල් දෙකක් ඇත. ඉන් එකක සිංහල ජනතාව, උතුරේ හා නැගෙනහිර ජනතාවගේ දැරිය නොහැකි වේදනාව දෙස සාපේක්ෂ උපේක්ෂාවකින් යුක්තව බලා සිටින අතර, අනෙකෙහි, දෙමළ හා මුස්ලිම් පුරවැසියෝ, තමන් නිවසෙන් පිටවන විට තමනට නැවත තම පවුලේ සාමාජිකයන් දැකගැනීමට අවස්ථාවක් නොලැබෙනු ඇතැයි යන බියෙන් ජීවත් වෙති. 2006 වසරේ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් රැකවරණය පිළිබඳව පුළුල්ව නෙත් යොමු කළ කල්හි අන් සියල්ලටම වඩා අධිකරණමය අනනුකූලතා, ආයතනික දුබලතා, දේශපාලන උදාසීනත්වය සහ ආරක්ෂාව සම්බන්ධ කරුණු වලට ප්‍රමුඛතාවය ලබාදීම යන කාරණාවල සංයෝජනයක් තුළින් පවත්නා යාන්ත්‍රණයන් දුර්වල කරන ලද බැව් පෙනී ගියේය. මෙම ප්‍රවණතාවය නතර කරනු නොලැබුවහොත් ශ්‍රී ලාංකීය ආයතනික රාමුවට වන හානිය පිළිසකර කිරීමට ඉතා දිගු කාලයක් ගතවනු ඇත. එකී ආයතන සඵලදායීව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් තර්ජනයට ලක්වනු ඇත.

41 ඩේලි මිරර්, ගිහාන් ද චිකේරා හා කැලුම් බණ්ඩාර "මූතූර් අර්බුදය පිළිබඳ විවාදයට ප්‍රබලයෝ සහභාගී නොවෙති", 2006 අගෝස්තු 11

2

මානව හිමිකම්වල අධිකරණමය රැකවරණය

*කිෂාලි පින්ටෝ ජයවර්ධන**

හැඳින්වීම

විමර්ශනයට ලක්කරනු ලබන වසරේ විශේෂ ලක්ෂණය වනුයේ 126 ව්‍යවස්ථාව යටතේ සහනයන් ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත්වූ පෙත්සම් සංඛ්‍යාව අඩුවීමයි.[1] නීතිය හා සමාජ භාරය විසින් සිදුකරනු ලැබූ අධ්‍යයනයේදී[2] හෙළිවූ පරිදි පෙත්සම් ගොනුකිරීමේ සුවිශේෂී අඩුවීම සිදුව තිබුණේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (මින්පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන) 11 වන ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් වන ඉල්ලීම්ය.

* නීතිඥවරියකි/ නීති උපදේශකවරියකි; නියෝජ්‍ය අධ්‍යක්ෂිකා සහ ප්‍රධානී, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වැඩසටහන, නීතිය හා සමාජ භාරය, කර්තෘ මණ්ඩල උපදේශිකා සහ මානව අයිතිවාසිකම් පිළිබඳ තීරු ලිපි රචක, ද සන්ඩේ ටයිම්ස්, කොළඹ.

1 "2004 වසරේදී ගොනුකරනු ලැබූ මූලික අයිතිවාසිකම් ඉල්ලීම් සංඛ්‍යාව 626 කි. 2005 දී එය 517 ක් විය. 2006 නොවැම්බර් මස අවසානය වන විට ගොනුකරනු ලැබූ පෙත්සම් සංඛ්‍යාව 342 ක්වූ අතර එය 2005 ට වඩා 175 කින් පහළ යාමක්ද, 2004 ට වඩා 284 කින් පහළ යාමක්ද විය. (Sri Lanka: State and Rights collapsing amidst growing violence and injustice, "*The State of Human Rights in Eleven Asian Nations* (ආසියාතු මානව හිමිකම් කොමිසම: හොංකොං, 2006), පි. 288.

2 මෙම පරිච්ඡේදයේ 2. 1 ඡේදය බලන්න.

මූලික අයිතිවාසිකම් පෙත්සම් සංඛ්‍යාවේ අඩුවීමට[3] බලපෑ නිශ්චිත හේතූන් සම්බන්ධයෙන් වන මතයන් විවිධ විය හැක. එමෙන්ම 126 ව්‍යවස්ථාව යටතේ ලබාදෙන ලද නඩු තීන්දු සංඛ්‍යාවද සංඛ්‍යාත්මකව බෙහෙවින් පහළ බැස තිබුණා පමණක් නොව එකී නඩු තීරණවලින් සමහරක් දේශපාලනික වශයෙන් ආන්දෝලනාත්මක සහ ඉමහත් ප්‍රසිද්ධියක් ලබා ගැනීමටද සමත්විය.

පසුගිය වසරවලදී මෙන් මෙම පරිච්ඡේදය ප්‍රශ්නගත කාල පරිච්ඡේදය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ අධිකරණය විසින් ලබාදෙන ලද තීන්දු විමර්ශනයට ලක්කරනු ඇත. පසුගිය පරිච්ඡේදයන්ට අනුව යමින් පනත් කෙටුම්පත් මෙන්ම අයිතිවාසිකම් පිළිබඳ ගැටළු හා සම්බන්ධයෙන් අභියාචනාධිකරණය ලබාදුන් තීන්දු සම්බන්ධයෙන් අධිකරණයේ අවසන් නිර්ණායකයන් විමර්ශනයට ලක්කිරීම සිදුවනු ඇත. අධිකරණමය තීරණ මඟින් විශ්ලේෂණය සඳහා පොදු ගැටළු ඉදිරිපත්වන විට එකී ගැටළු වෙත වෙනම අවධානය යොමු කෙරනු ඇත. අනෙකුත් අවස්ථාවන්හිදී ප්‍රශ්නගත අධිකරණ තීන්දුව පිළිබඳ පොදු විශ්ලේෂණයක් පමණක් විශ්ලේෂණයට ඇතුළත් වනු ඇත.

මෙම පරිච්ඡේදයේ අවසන් කොටස් දෙක 2006 වසරේදී අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලයේ බලපෑම කෙරෙහි අවධානය යොමුකරනු ඇත. පළමුව විමර්ශනයට ලක්කරනු ලබන වසර තුල සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය අනුව සිය අධිකාරය ක්‍රියාවේ යොදවමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් දක්වනු ලැබ ඇති අදහස් විශ්ලේෂණය කෙරෙනු ඇත. දෙවනුව එය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලයට අත්සන් කිරීමට ජනාධිපතිවරයා ගත් තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධායක බලතල අභිබවායාමක් ලෙස මෙන්ම ව්‍යවස්ථා විරෝධී ලෙස අධිකරණ බලය කොමිසම වෙත පැවරීමක් බවද ප්‍රකාශයට පත්කරමින් *සිංගරාසා* නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුව විචාරාත්මකව විශ්ලේෂණයට ලක්කරනු ඇත.

---

3 "මෙසේ වී ඇත්තේ රටේ දේශපාලනික පරිසරය සහ ප්‍රචණ්ඩත්වයේ මට්ටම වඩාත් නරක අතට හැරුනු තත්ත්වයකදීය. වර්තමාන තත්ත්වයන් යටතේ වියයුතුව තිබුණේ මූලික අයිතිවාසිකම් පෙත්සම් සංඛ්‍යාව ඉහළ යාමයි." ඉහත 1 සටහන, පි, 288,

8160

2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සන්දර්භයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයක ප්‍රතිචාරය

2.1 11 වන ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් චෝදනා කරමින් ඉදිරිපත්වූ මූලික අයිතිවාසිකම් ඉල්ලීම්වල අඩුවීම

නීතිය හා සමාජ භාරය[4] විසින් සිදුකරන ලද පර්යේෂණයකින් හෙළිවූයේ අදාල 11 වන ව්‍යවස්ථාව සම්බන්ධ පෙත්සම් 115 ක් 2000 වසරේ ගොනුකොට ඇති බවත් 2001 හා 2002 වසරවලදීද මෙයට ආසන්න පෙත්සම් සංඛ්‍යාවන් ඉදිරිපත්ව ඇති බවත්ය. කෙසේ වෙතත් එතැන් සිට 2006 දක්වා මේ සම්බන්ධ ඉල්ලීම් සංඛ්‍යාවන් ප්‍රගතිශීලී ලෙස අඩුවී ඇති අතර 2006 වසරේදී එම සංඛ්‍යාව 40 ක් විය[5].

> පෙර වසරවලදී ගොඩුරු බවට පත්වූවන් වෙනුවෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම්වලදී පෙනීසිටි සහ එම නඩු කටයුතු කරගෙනයාම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතාවයන් අත්කරගෙන සිටින නීතිඥවරු බොහොමයක් දැන් එවැනි නඩු භාරගැනීම ප්‍රතික්ෂේප කොට සිටිති. එයට හේතුවී ඇත්තේ එකී නඩු කටයුතු කරගෙනයාමේදී විඳීමට සිදුවන හිරිහැරයන් දැරිය නොහැකි තත්ත්වයකට පත්ව තිබීමය.
>
> ප්‍රබල තර්ජනයන්ට මුහුණදීමට සිදුවීම හේතුවෙන් සෑම ආකාරයකම අප්‍රසන්න අත්දැකීම් සඳහා මඟපෑදිය හැකි එමෙන්ම, පැමිණිල්ල කෙතරම් යුක්තිසහගත හා බැරෑරුම් එකක් වුවද තෘප්තිමත් වියහැකි ප්‍රතිඵලයක් ළඟාකරදීමේ අඩු සම්භාවිතාවයක් සහිත මෙවැනි නඩු භාරගැනීම ගොඩුරු

4 අධිකරණයේ ලේඛණාගාරයෙන් පෙත්සම්/නඩු තීන්දු ලබාගැනීම සම්බන්ධයෙන් නීතිඥ එම්. කේ. පී. චන්ද්‍රලාල් වෙත මාගේ ස්තුතිය හිමිවේ. පරීක්ෂා කිරීමේ, හරස් අවේක්ෂණයට ලක්කිරීමේ ක්‍රියාවලියක් මඟින් දත්තයන්ගේ නිරවද්‍යතාවය සහතික කරගැනීමට නීතිය හා සමාජ භාරය බලවත් පරිශ්‍රමයක් දරන ලද නමුත් ගොනුකොට ඇති පෙත්සම් සහ අදාළ නඩුවල තත්ත්වය සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම අතිශය අසීරුවූ බවද මෙහිදී සඳහන් කළයුතුය. කඩ කරනු ලැබ ඇතැයි චෝදනා කරනු ලබන අයිතිවාසිකමෙ ස්වභාවය අනුව 11 වන ව්‍යවස්ථාව යටතේ වන ඉල්ලීම් සම්බන්ධ දත්ත ලබාගැනීම සීමාකොට ඇත. එමෙන්ම මෙම අධ්‍යයනය අධිකරණය ඉල්ලීම් විභාගයට නොගෙන ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්ද විමර්ශනයට ලක්කරන ලදී.

5 එම.

බවට පත්වූවන්ට මෙන්ම තමන්ටද කරදරයක් ලෙස ඔවුහු සලකති. මෙවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඔවුහු එවැනි ඉල්ලීම් වලදී 'ගිනි පෙනෙල්ලෙන් බැට කෑ එකා කණාමැදිරියටත් බය' වන ආකාරයේ ප්‍රවේශයකින් කටයුතු කරති[6].

මෙම පහත වැටීම 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ලබාදෙනු ලැබූ නඩු තීන්දු සංඛ්‍යාවෙන් වඩාත් මැනවින් නිරූපණය වෙයි 2000 වසරේ[7] සිටම මෙවැනි නඩු තීන්දු සංඛ්‍යාව පහළ යමින් පැවැති අතර අනතුරුව එළැඹි කාල පරිච්ඡේදය තුළ එය වඩා කැපී පෙනෙන අයුරින් දැකගත හැකිවිය. උදාහරණයක් ලෙස 2006 වසරේදී 11 වන ව්‍යවස්ථාව කඩ කිරීම පිළිබඳ නඩු තීන්දු දෙකක්[8] පමණක් ප්‍රකාශයට පත්වූ අතර එම නඩු දෙක පිළිබඳව මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කෙරෙනු ඇත. ඊට පෙර වසරේදී (2005) නඩු තීන්දු 4 ක්[9] ප්‍රකාශයට පත්වූ අතර අයිතිවාසිකම් කඩවී ඇතැයි අධිකරණය කියා සිටියේ ඉන් එක් අවස්ථාවකදී පමණකි[10]

6 ආසියාතු මානව හිමිකම් කොමිසම, "Sri Lanka; State and Rights collapsing amidst growing violence and injustice", පි. 288.

7 නීතිය හා සමාජ භාරය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ නඩු තීන්දු 7 ක් එම වසරේදී ප්‍රකාශයට පත්කෙරිනි. SC (FR) /33/99, 547/98, 837/97, 255/98, 802/99, 279/98, 280/98 යන අංක දරන මෙම නඩු 7 න් පැමිණිලි 7 කදී මානව හිමිකම කඩවී ඇතැයි අධිකරණය විසින් තීන්දු කරනු ලැබිණ.

8 *කෝරලලියනගේ පාලිත තිස්ස කුමාර එ. සිල්වා සහ තවත් අය* (SC (FR) 121/2004, SCM 2006. 02.07) *සහ දූල්කඳුර ආරච්චිගේ නිමාලි සිල්වා වෙනුවෙන් නීතිඥ එම්. කේ. පී. චන්ද්‍රලාල් එ.* ASP *රත්මල් කොඩිතුවක්කු සහ තවත් අය* (SC (FR) 565/2000, SCM 2006. 11. 16)

9 SC (FR) /263/01, 231/03, 17/03, 553/02.

10 *බ්‍රාහ්මණගේ අරුන් ෂෙරෝන් සුරංග විජේවර්ධන එ. පියසෙන් අම්පාවිල සහ තවත් අය* (FR) 553/02. SCM. 2005.05.27 (11 සහ 13(2) ව්‍යවස්ථාවන් යටතේ හිමිකරදී ඇති අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි තීරණය කරමින් රු. 12,000 ක වන්දියක් ප්‍රදානය කරමින් රාජා ප්‍රනාන්දු විනිසුරුවරයා ලබාදුන් තීන්දුව)

2.2.1. 11 සහ 13(1) හා (2) ව්‍යවස්ථාවන් සම්බන්ධයෙන් වන නඩු තීන්දු නීතිය පිළිබඳ විශ්ලේෂණය - අදාළ තීන්දු

අ. *කේ.පී.ටී. කුමාර එ. සිල්වා*[11]

මෙය වැලිපැන්න පොලිස් ස්ථානයේ නිලධාරීන්ට එරෙහිව තිස් එක් වියැති කර්මාන්තකරුවකු විසින් බරපතල වධ හිංසා පැමිණවීමේ සිද්ධියක් පදනම් කොටගෙන ඉදිරිපත්වූ පැමිණිල්ලකි. මෙහි සුවිශේෂත්වය වූයේ සොරකමක් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන සිටි පෙත්සම්කරුට රෝග ආසාදනය කිරීමේ චේතනාවෙන් යුතුව පෙත්සම්කරුගේ මුඛයට කෙළ ගැසීමට ක්ෂයරෝගයෙන් පෙළෙන්නකුට උප පොලිස් පරීක්ෂකවරයා (නඩුවේ පළවන වගඋත්තරකරු) විසින් බල කළේය යන චෝදනාවයි.

13(1) ව්‍යවස්ථාව (හිතුවක්කාරී ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස) කඩ කළේය යන චෝදනාව අධිකරණය බැහැර කළේ පෙත්සම්කරු සොරකමට සහභාගීවූ බවට සාධාරණ සැකයක්, ලැබී තිබූ පැමිණිල්ලට අනුව පැවතීම හේතුවෙනි. එමෙන්ම 13 (2) ව්‍යවස්ථාව කඩකරමින් තමන්ව පැය 81 ක් රඳවා තබාගත්තේය යන චෝදනාව සම්බන්ධයෙන් වන ඔප්පු කිරීමේ භාරයද තෘප්ත කිරීමට සමත්වී නොමැති බැවි අධිකරණයේ මතය විය. කෙසේ වෙතත් 11 වන ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් මීට පෙර නඩු තීරණයන්හි නිරූපණය වූ මූලධර්මයන්ම යොදාගනු ලැබිණි. සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තා කොට තිබූ පරිදි බරපතල නොවූ තුවාල තිස් එකක් සහ එක් බරපතල තුවාලයක් (වළලුකර අස්ථි බිඳීමක්) පෙත්සම්කරුගේ ශරීරයේ තිබීම සම්බන්ධයෙන් පළවන වගඋත්තරකරුගේ පැහැදිලි කිරීම වූ 'පෙත්සම්කරු සිරභාරයට ගැනීමේදී සාධාරණ බලය පාවිච්චි කිරීම'[12] යන්න නොපිළිගන්නා ලදී. අධිකරණ තීන්දුව ප්‍රකාශයට පත්කරමින් ශිරානි ඒ. බණ්ඩාරනායක විනිසුරුවරිය නියෝග කළේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා වන්දියක් ලෙස රු. 25,000 ක මුදලක් ගෙවන ලෙසයි.[13]

---

11 *කෝරලලියනගේ පාලිත තිස්ස කුමාර එ. සිල්වා සහ තවත් අය*, SC(FR) 121/2004, SCM 2006.02.17.

12 නඩු තීන්දුවේ 16 වන පිටුව.

13 පළමු වගඋත්තරකරුවූ උප පොලිස් පරීක්ෂකවරයාට රු. 5,000 ක් පුද්ගලිකවද, රජය විසින් රු. 20,000 ක් ද ලෙස.

ආ. එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු[14]

සැබෑ පෙත්සම්කරු කියා සිටියේ තමන්ට පහරදී ආහාර ජලය හෝ වැසිකිලි පහසුකම් ලබානොදී ඇඳකට තබා මාංචු දමා දින තුනක් තිස්සේ රඳවා තබාගනු ලැබූ බවය. මෙම රඳවාගනු ලැබූ කාල පරිච්ඡේදය තුළදී ඔහුට වධ හිංසා පමුණුවා තිබූ අතර ඒ හේතුවෙන් වෙනත් කරුණු අතර ඔහුගේ එක් ඇසක්ද අහිමිව තිබිණි. වගඋත්තරකාර පොලිස් නිලධාරීහු වධ හිංසා පැමිණවූ බවට වූ චෝදනාව ප්‍රතික්ෂේප කර සිටි අතර සැබෑ පෙත්සම්කරු ප්‍රකට පාතාල චරිතයක් බවත් ඔහු අත්අඩංගුවට ගැනීමේදී පැනයාමට උත්සාහ කළ බවත් එහිදී ඇතිවූ පොරයේදී එකී තුවාල සිදුවූ බවත් ඔවුහු කියා සිටියහ.

සැබෑ පෙත්සම්කරු දැක්වූ පරිදි ඔහුව අත්අඩංගුවට ගනු ලැබූ දිනය ලෙස 2000 ජූනි 19 වන දින අධිකරණය පිළිගත් අතර වගඋත්තරකරුවන් කියා සිටි ඊට දින 18 කට පසු දිනයක් වූ 2000 ජූලි 08 දිනය අත්අඩංගුවට ගනුලැබූ දිනය ලෙස සැලකීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර සිටින ලදි. පොලිස් මූලස්ථානය/ජනාධිපතිවරයා ඇතුළු විවිධ අධිකාරයන්ට පෙත්සම්කරුගේ බිරිඳ සහ මව විසින් පැමිණිලිකොට තිබූ අතර එය අත්අඩංගුවට ගැනීම 2000 ජූනි 19 දින සිදුවූවක් බව සහතික කරන්නක් විය. මෙම දැන්වීම් ඔවුන් විසින් වගඋත්තරකරුවන් දැක්වූ 2000 ජූලි 08 දිනට පෙර දිනවලදී සිදුකරන ලද ඒවා විය.

තවද එම කාලය තුළ පොලිස් භාරයේ සිටි ස්වාධීන සාක්ෂිකරුවකු විසින් ලබාදුන් සාක්ෂි සහ විමර්ශන නිලධාරියාගේ සාක්ෂි අනුව තහවුරු වූයේ වගඋත්තරකරුවන් කියාසිටි දිනට පෙර දිනෙක සැබෑ පෙත්සම්කරු රඳවා සිටින ලද බවයි. මේ අනුව අධිකරණය තීරණය කළේ 2000 ජූනි 19 වන දින සිදුකළ පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම (වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කරසිටි) 13(1) ව්‍යවස්ථාවට පටහැනි බවත් ඔහුව 2000 ජූලි 08 දින දක්වා රඳවා තබාගැනීම (රැඳවුම් නියෝගය ලබාගත් දිනය) 13(2) ව්‍යවස්ථාවට පටහැනි බවත්ය. මේ අතර වෛද්‍ය සාක්ෂි මඟින් සැබෑ පෙත්සම්කරුගේ චෝදනාවන් තහවුරු කරනු ලැබූ බැවින් 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමද සිදුව ඇතැයි අධිකරණයේ නිගමනය විය.

---

14 *දූල්කඳුර ආරච්චිගේ නිමාලි සිල්වා වෙනුවෙන් නීතිඥ එම්. කේ. පී. චන්ද්‍රලාල් එ. උපපොලිස් පරීක්ෂක රත්මල් කොඩිතුවක්කු සහ තවත් අය* (SC (FR) 565/2000, SCM 2006.11. 16)

2.2.2. තීන්දු පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක්

අ) 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම

ඉහත නඩු දෙකේදීම වෛද්‍ය සාක්ෂි තුවාල හා සැසඳුනු බැවින් අධිකරණයට ස්ථාපිත නඩු තීන්දු නීතියේ සීමාවන් අභිබවා ගොස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කඩකිරීම කෙරෙහි යොමුවීමේ අවශ්‍යතාවය පැන නොනැඟුනි. මෙම නඩු තීන්දු ප්‍රකාශයට පත්කරමින් විනිසුරුවරුන් දෙදෙනාම මේ වන විට අනිවාර්ය උපුටනයක් බවට පත්ව ඇති අමල් සුදත් සිල්වා නඩුව[15] ද ගෙනහැරපාමින් අපරාධකරුවන්ටද නිසි ක්‍රියාදාමයේ පිහිට හිමිවිය යුතුය යන මූලධර්මය කියා සිටියහ.

ආ) 13 (1) සහ 13 (2) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීම

එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු හිදී තීරණය වූයේ අධිකරණය වෙත ඉදිරිපත්වූ කරුණු සැබෑ පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් වන බවත් ඔහුට එරෙහිව නැගී තිබූ චෝදනාවන් අනුව එසේ නොකර සිටීමට හේතුවක් නොවූ බවත්ය. මේ අනුව අත්අඩංගුවට ගැනීමේ හේතු නොදැක්වීමේ ප්‍රතිවාදය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ නමුත් මෙහිදී අධිකරණය ඉදිරියේ පැවති ප්‍රශ්නය වූයේ[16] 'මෙහිදී අත්අඩංගුවට ගැනීම සඳහා ප්‍රමාණවත් සැකයක් පැවතියද අත්අඩංගුවට ගැනීම නීතිය මඟින් ස්ථාපිතකොට ඇති කාර්යපටිපාටිය අනුව සිදුවීද'[17] යන්න තීරණය කිරීමය. මේ අනුවː

---

15 බලන්න *අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු*. මෙම මූලධර්මය අනතුරුව ලබාදුන් නඩු තීන්දුවලදී පුනර්වාචනය කෙරුනු අතර මෙහිදී සිදුවූයේ පෙත්සම්කරුගේ චෝදනා කරනු ලැබූ නරක වාර්තාවන් ඔහුට එරෙහිව සැලකිල්ලට ගතයුතුය යන්න අධිකරණය විසින් සම්පූර්ණයෙන්ම බැහැර කරනු ලැබීමයි. මෙහිදී පෙත්සම්කරුගේ ජීවිතය අහිමි කිරීම සඳහා වගඋත්තරකරු විසින් සිදුකළ ක්‍රියාවන් හේතුකොටගෙන චෝදනා කෙරුනු නරක වාර්තාවන්ගෙන් මිදීමට ඔහුට හැකිවිය.- බලන්න *සිල්වා එ. ඉද්දමල්ගොඩ* [2003] 2 SLR 63 සහ මානව හිමිකම් සඳහා වන අධිකරණමය රැකවරණය පිළිබඳ අදාළ පරිච්ඡේදයන්, Sri Lanka: State of Human Rights 2005 (නීතිය හා සමාජ භාරයː කොළඹ, 2006), පි. 27.

16 නඩු තීන්දුවේ 10 වන පිටුව.

17 13(1) ව්‍යවස්ථාවේ මෙසේ දක්වේ. "නීතියෙන් නියම කරන ලද කාර්යපටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකල යුත්තේය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව එම තැනැත්තාට දැන්විය යුත්තේය."

2000.06.19 දින අත්අඩංගුවට ගනු ලැබුවේය යන්න වගඋත්තරකරුවන් ප්‍රතික්ෂේප කරසිටින බැවින්ද ඉදිරිපත්ව ඇති සාක්ෂි ඊට ප්‍රතිවිරුද්ධ බැවින්ද 13(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කළ බවට නිගමනය කරනු ලැබීම වැළැක්විය නොහැක්කකි.[18]

වෙනත් වචන වලින් පවසන්නේ නම් ප්‍රශ්නගත වැරදි සඳහා සැබෑ පෙත්සම්කරු සම්බන්ධවූ බවට විශ්වාස කළහැකිවීම විසින් ඔහුව අත්අඩංගුවට ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට ප්‍රකාශයට පත්කරනු ලැබීම වැළැක්වීමට සමත් නොවුනි. මීට ප්‍රතිපක්ෂව කේ.පී.ටී. කුමාර එ. සිල්වා හිදී වගඋත්තරකරු අපරාධයකට සම්බන්ධ යැයි සාධාරණ ලෙස සැකකළ හැකි තැනැත්තකුට එරෙහිව කටයුතු කළ අයකුය යන පදනම මත පිහිටා 13(1) ව්‍යවස්ථා උල්ලංඝනයක් සිදුවී නැතැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබිණ. මෙහිදීද පෙත්සම්කරු හා වගඋත්තරකරු අතර අත්අඩංගුවට ගනු ලැබූ දිනය සම්බන්ධයෙන් පරස්පරතා පැවැති නමුත් අධිකරණය මෙය 13(1) ව්‍යවස්ථාව අදාළ නොකොට 13(2) ව්‍යවස්ථාව යටතේ නීතිවිරෝධී රඳවා තබාගැනීමක් පිළිබඳ ප්‍රශ්නයක්ය යන සන්දර්භයේ සිට සෘණාත්මක ලෙස සලකා බැලූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වගඋත්තරකරු ඉදිරිපත් කළ දිනය, අත්අඩංගුවට ගනු ලැබූ දිනය බවට පිළිගන්නා ලදී.

මෙයින් ගම්‍ය වන අධිකරණ මතයේ වෙනස්වීම සලකා බැලීමේදී එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු හි අධිකරණයේ තර්කනයවූ අත්අඩංගුවට ගනු ලැබූ දිනය පිළිබඳව පොලිස් නිලධාරීන් අසත්‍ය ප්‍රකාශ සිදුකර තිබීම 13(1) යටතේ නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීමක් නොව 13(2) යටතේ

18 නඩු තීන්දුවේ 10 වන පිටුව

නීතිවිරෝධී රඳවා තබාගැනීමක්[19] ලෙසට අධිකරණමය අධිගමනයක් සඳහා වන කරුණක් වී ඇති බව පෙනීයයි. මෙසේ වන්නේ පෙත්සම්කරු අත්අඩංගුවට ගනු ලැබූ දිනය ලෙස දක්වූ දිනය (එනම් 2000.06.19) පොලීසිය විසින් රඳවා තබාගැනීමේ නියෝගය ලබාගනු ලැබූ 2000.07.08 දක්වා වන කාලය දෙස බැලීමේදී එය තීරණාත්මක වන බැවිනි. අත්අඩංගුවට ගනු ලැබූ දිනය පොලීසිය විසින් වසන්කිරීම හේතුකොටගෙන 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනයවී ඇතැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබූවද එකී කරුණ යොදාගනිමින් 13(1) ව්‍යවස්ථාවද උල්ලංඝනයවී ඇතැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබීම විවාදාත්මක වෙයි.

13(1) සහ 13 (2) ව්‍යවස්ථාවන් අතර සම්බන්ධතාවයේ නිශ්චිත ස්වරූපය අධිකරණයේ නඩු තීන්දු නීතියේ විෂය කරුණක් වෙයි. මේ සම්බන්ධයෙන් තීරණාත්මක අධිකාරයක් වන *වන්න පීරිස් එ. නීතිපති*[20] හිදී ප්‍රකාශ වූයේ 13(1) සහ 13(2) අතර අවියෝජනීය සම්බන්ධතාවයක් පැවතියද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී එක් එක් ව්‍යවස්ථාවට වෙන්වූ තාර්කිකබවක් ඇති බවයි.

---

19 13(2) අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව සොයාගැනීම සඳහා සාධාරණ කාලයක් ඇතුළත මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු නොලැබීම අනිවාර්ය වන්නේය යන්න සිද්ධිවාචක කරුණකි. 13(2) ව්‍යවස්ථාවේ දක්වෙන්නේ 'අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබාගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් නිදහස අහිමි කරවනු ලැබූ හෝ සෑම තැනැත්තකුම නීතියෙන් නියමකර ඇති කාර්යපටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත ගෙන යායුතු අතර නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාරව මිස ඒ තැනැත්තා අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ අන්‍යාකාරයකින් නිදහස අහිමි කිරීම හෝ නොකළයුතු' බවයි. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ (37 වගන්තිය) දක්වෙන්නේ පොලිස් ස්ථානයක පැය 24 ක් රඳවා තබාගනු ලැබූ සැකකරුවකු මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ඉදිරිපත් කළයුතු බවයි. මේ අනුව අත්අඩංගුවට ගැනීමේ සිට පැය 24 ක් ඇතුළත සැකකරු මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ගෙන ආ යුතු බව ප්‍රකාශයට පත්ව ඇත. (උදාහරණ සඳහා බලන්න *ෆායිස් එ. නීතිපති*). අපරාධ නඩුවිධාන සංග්‍රහයට සිදුකළ මෑත කාලීන වෙනස්කම වන 2005 අංක 15 සහ 2007 අංක 42 දරන විශේෂ විධිවිධාන පනත් මඟින් වරෙන්තුවක් නොමැතිව අපරාධ කාණ්ඩයකට සැකකරමින් අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තකු පැය 24 ක කාලයක් ඇතුළත අධිකරණය වෙත ඉදිරිපත් කළයුතු බවට වන අතුරු විධානය නියම කරන ලද අපරාධ කාණ්ඩයක් සම්බන්ධයෙන් එම කාලය තවත් පැය 24 කින් දීර්ඝ කිරීමට, එනම් රඳවාගැනීමේ කාලය පැය 48 ක් බවට පත්කිරීමද මෙහිදී වැදගත් වෙයි. විශේෂ විධිවිධාන සංශෝධනයට අනුව සහකාර පොලිස් අධිකාරීවරයකුට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියකු විසින් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මත මහේස්ත්‍රාත්වරයා විසින් ලබාදෙනු ලබන නියෝග යක් අනුව අතිරේක පැය 24 රඳවා තබාගැනීම කළහැක.

20 [1994] 1 SLR 1

ඇ) 14 (1) (උ) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම

තමන්ව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීම හේතුවෙන් නීත්‍යානුකූල රැකියාවක යෙදීමට තමන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(එ) ව්‍යවස්ථාව මඟින් හිමිකරදී ඇති අයිතිවාසිකම උල්ලංඝනයවී ඇති බවට *එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු* හි සැබෑ පෙත්සම්කරු කියාසිටින ලදී. මෙම ප්‍රතිවාදය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර එයට හේතු ලෙස දක්වනු ලැබූයේ පෙත්සම්කරු වැරදි කිහිපයකම නිරතවී ඇති බවට සාධාරණ සැකයක් ඇතිකරගැනීමට අවශ්‍ය කරුණු පොලිස් නිලධාරීන් වෙත පැවතුනු බවයි.[21]

ඈ) ප්‍රතිපුරුෂ වගකීම

ඉහළ නිලධාරීන් (මෙම නඩු දෙකේදී පිළිවෙලින් පොලිස් ස්ථානාධිපතිවරයා සහ සහකාර පොලිස් අධිකාරීවරයා)ට එරෙහිව ප්‍රතිපුරුෂ වගකීම පිළිබඳ චෝදනාවන් ඒ පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි පෙනෙන්නට නොවූ බව දක්වමින් ප්‍රතික්ෂේප කරනු ලැබින. *කේ.පී.ටී. කුමාර එ. සිල්වා* හිදී පෙත්සම්කරු රැගෙනවිත් වධ හිංසාවන්ට ලක්කරනු ලැබූ දිනයේදී දෙවන වගඋත්තරකරුවූ පොලිස් ස්ථානාධිපතිවරයා නොසිටීම හේතුකොටගෙන ඔහුව වරදින් නිදොස් කරනු ලැබිණි. මේ අනුව අධිකරණයේ මතය වූයේ දෙවන වගඋත්තරකරු ප්‍රතිපුරුෂ වගකීම සම්බන්ධයෙන් වගකිවයුතු නොවන බවයි.[22]

එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු හිදී අදාළ අත්අඩංගුවට ගැනීම සිදුවූ දිනයේ ඔහු එහි නොසිටි බවට වූ පළමුවන වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරීවරයාගේ විත්තිවාචකය පිළිබඳව විනිසුරුවරු සෑහීමට පත්වූහ. කෙසේ වෙතත් සිය කාර්යාලයේ දින ගණනාවක් පුරාවට සැබෑ පෙත්සම්කරු රඳවාගනු ලැබීමත් එම කාලය තුළ ඔහුව බරපතල වධ හිංසාවන්ට ලක්කිරීමත් සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරීවරයාගේ සම්බන්ධයක් තිබිණිද යන්න අධිකරණයේ අවධානයට ලක්ව නොමැති බව පෙනීයන්නේ 'සැබෑ පෙත්සම්කරුට පහරදීම සහ වධ හිංසා පැමිණවීම සම්බන්ධයෙන් පළමුවන වගඋත්තරකරුට චෝදනාවක් නොමැත' යනුවෙන් ප්‍රකාශ කරනු

21 අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැබෑ පෙත්සම්කරු සතුව බලපත්‍ර රහිත රිවෝල්වරයක් සහ ජීව උණ්ඩ පැවතුනි. බලන්න නඩු තීන්දුවේ 12 පිටුව.

22 නඩු තීන්දුවේ 18 වන පිටුව.

ලැබීමෙනි[23]. මේ අතර කේ.පී.ටී. කුමාර එ. සිල්වා හිදී වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා ඉදිරියට පෙත්සම්කරුව පමුණුවන ලද අවස්ථාවේදී ඔහුව වෛද්‍යවරයකු වෙත ඉදිරිපත්කරන ලෙසට නියෝග කිරීම මඟින් නිරූපණය වූ නිසි අවධානයේ අවම ප්‍රමිතීන් පවා *එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු* හිදී දක්නට නොවුනි.

මේ අනුව ප්‍රශ්නය වන්නේ (*එම්.කේ.පී. චන්ද්‍රලාල් එ. කොඩිතුවක්කු* හි සහකාර පොලිස් අධිකාරීවරයාගේ ප්‍රතිපුරුෂ වගකීම සම්බන්ධ) සිය සේවා ස්ථානය තුළ සිය පහළ සේවකයින් විසින් සිදුකරනු ලැබූ ක්‍රියාවන් සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරීවරයා නීතිය මඟින් නියමකොට ඇති ප්‍රමිතියට අනුකූලව ඔහු දැරියයුතු වගකීමෙන් මිදී ඇතිද යන්නයි. පෙර නඩු තීන්දුවල ඉහළ නිලධාරීන්ගේ වගකීම් සම්බන්ධයෙන් කිසිදු අවිනිශ්චිතතාවයක් දක්නට නොමැත. *සිල්වා එ. ඉද්දමල්ගොඩ*[24] හි පළමුවන වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිගේ වගකීම සහභාගීත්වය, අනුමැතිය දීම, සහායවීම සහ/හෝ පෙත්සම්කරුට සිදුකරන ලද හිංසාකිරීමේ ක්‍රියාවන් පිළිබඳව දැනුවත්ව සිටීමට පමණක් සීමාකොට නොමැත. මෙහිදී නීතියට අනුකූලව පෙත්සම්කරුට සැලකීම සහතික නොකිරීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිවරයා වගකිවයුතු බව ප්‍රකාශ කෙරුනු අතර සිය පහළ සේවකයින්ගේ ක්‍රියාවන් නිරීක්ෂණයට ලක්නොකිරීම තුලින් සිදුවූ ඔහුගේ සාපරාධී අක්‍රියතාවය හේතුවෙන් පෙත්සම්කරුට තවදුරටත් අයුතු ලෙස සැලකීම වැළැක්වීමට අපොහොසත් වීමේත් විෂමාචාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අපොහොසත් වීමේත් වගකීම මෙහිදී පළමුවන වගඋත්තරකරු වෙත පැවරිණි.

මීට සමාන්තරව *වෑවලගේ රාණි ප්‍රනාන්දු (මියගිය ළමාහේවගේ ලාල් යන අයගේ බිරිඳ)* සහ තවත් අය *එ. පොලිස් ස්ථානාධිපති සුළු වැරදි, සීදූව පොලිස් ස්ථානය, සීදූව සහ තවත් අය*[25] හි 3 වන, 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් වූ මීගමුව බන්ධනාගාරයේ ස්ථානාධිපති, ප්‍රධාන ජේලර්වරයා සහ බන්ධනාගාර නියාමක – මීගමුව බන්ධනාගාරය යන අය සිය වගකීම් පැහැරහැරීම යන චෝදනාවට

---

23 නඩු තීන්දුවේ 13 වන පිටුව.

24 [2003] 2 SLR 63.

25 SC(FR) 700/2002, SCM 26/07/2004.

(මියගිය තැනැත්තාට පහරදීමට ඔවුන්ගේ ඍජු සම්බන්ධතාවයක් ඇති බවට සාක්ෂි නොවුවද) වරදකරුවන් කෙරිනි.

3.1 මහින්ද රාජපක්ෂ එ. චන්ද්‍රා ප්‍රනාන්දු, පොලිස්පති සහ තවත් අය[26]

මෙහිදී ප්‍රශ්නගත කරුණ වූයේ පශ්චාත් සුනාමි කාලපරිච්ඡේදය තුළ 'හෙල්පින් හම්බන්තොට' නම් අරමුදල සඳහා ලැබුණු අරමුදල් පුද්ගලික ගිණුමකට බැර කිරීමෙන් ආධාර අයුතු පරිහරණය සහ විශ්වාසය කඩකිරීමේ චෝදනාවන් සම්බන්ධයෙන් පෙත්සම්කරු පිළිබඳ විමර්ශනයක් සිදුකිරීමේ පොලිස්පති සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකලාපයයි. පෙත්සම්කරු කියාසිටියේ අපරාධ පරීක්ෂණයක් ආරම්භ කිරීම, එය තවදුරටත් කරගෙනයාම සහ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ 'බී' වාර්තාවක් ගොනුකිරීම හේතුකොටගෙන නීතිය ඉදිරියේ සමානව සැලකීමේ අයිතිවාසිකම තමන්ට අහිමිකොට ඇති බවය.

පෙත්සම ගොනුකරන අවස්ථාව වන විට රාජපක්ෂ අගමැතිව සිටි අතර පැවැත්වීමට නියමිතව තිබූ ජනාධිපතිවරණය සඳහා පොදුජන එක්සත් පෙරමුණේ අපේක්ෂකයා ලෙස ඔහු ඉදිරිපත් කිරීම සඳහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් සලකා බැලෙමින් පැවතුනි. රටේ අගමැති විසින් බලය අයුතු ලෙස යොදාගත් බවට චෝදනා කරමින් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට (එම රජයේම කොටසක් වන) එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකිරීම සමහරකුට අරුමයක් වියහැකි නමුත් ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතියේ විකාර සහගතභාවය පිළිබඳ හොඳින් දන්නා අයට එය එසේ නොවනු ඇත. මෙම පැතිකඩ පිළිබඳ පසුව සලකා බලනු ලැබේ.

පෙත්සම්කරු විසින් එල්ලකරන ලද චෝදනාව වූයේ පොලිස් නිලධාරීන් විපක්ෂය සමඟ එක්ව කටයුතු කරමින් ආසන්නව ඇති ජනාධිපතිවරණ

26 SC(FR) 387/2005, SCM 27/03/2006, අගවිනිසුරු සරත් නන්ද සිල්වාගේ තීන්දුවකි. 2005 ජනාධිපතිවරණයට පෙර පෙත්සම විභාග කිරීමට අවසර ලබාදීම සහ විමර්ශන අත්හිටුවීම සඳහා අතුරු තහනම් නියෝගයක් නිකුත්කිරීම සිදුවිය. පොලිසියේ ක්‍රියාකාරීත්වය සහ ප්‍රථම තොරතුරේ වැදගත්කම සලකා බලමින් "Judicial Protection of Human Rights" හි අතුරු තහනම් නියෝගය පිළිබඳ සාකච්ඡාව, *Sri Lanka: State of Human Rights 2006*, පි. 136.

ඡන්ද ව්‍යාපාරයේදී තමන්ව අපකීර්තියට පත්කිරීමේ චේතනාවෙන් කටයුතු කරන බවය. මෙහි අන්තර්ගත නෛතික ප්‍රශ්නය වූයේ ඉහත කී විමර්ශනය ආරම්භ කිරීම සඳහා පොලීසියට සාධාරණ හේතු පැවතියේද නොඑසේනම් ඔවුන්ගේ ක්‍රියාවන් 12(1) ව්‍යවස්ථාව කඩකිරීමක්දැයි නිර්ණය කිරීමය. මෙහිදී නඩුවේ තොරතුරු සැලකිල්ලට ගනිමින් සිදුකළ විශ්ලේෂණය නඩු තීන්දුව තුළ අනාවරණය කොට තිබුණේ පහත අයුරිනි.

3.1.1 නඩුවෙන් ඉස්මතුවන අදාළ කරුණු

අ) ප්‍රථම තොරතුරේ ස්වභාවය සහ වැදගත්කම

විරුද්ධ පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුවූ 4 වන වගඋත්තරකරු විසින් පොලිස් මූලස්ථානය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව පොලීසියේ කටයුතු ආරම්භකොට තිබිණ. 4 වන වගඋත්තරකරු පොලිස් ස්ථානයක් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අසමත්ව තිබූ නමුත් පොලිස් මූලස්ථානය වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත්කොට තිබිණ. අධිකරණයේ මතය වූයේ එය 'ප්‍රථම පැමිණිල්ලක[27]' අවශ්‍යතාවන් තෘප්ත කිරීමට සමත් නොවූවක් වන බවය. අපරාධ පරීක්ෂණ ක්‍රියාදාමයක් තුළ ප්‍රථම පැමිණිල්ලේ වැදගත්කම මෙන්ම පැමිණිල්ලක සත්‍යතාවය පිළිබඳවද අධිකරණය විසින් අවධාරණය කරන ලදී. සැමවිටකම පැමිණිල්ලක් පොලිස් මූලස්ථානය විසින් නොව පොලිස් ස්ථානයක් විසින් සටහන් කරගත යුතු වන බව අවධාරණය කෙරිණි. මෙම කරුණ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති පෙත්සම්කරුගේ අයිතිවාසිකම් කඩවී ඇති බව තීරණය කිරීම සඳහා තීරණාත්මක විය.

අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ (මෙතැන්සිට පනත යනුවෙන් හැඳින්වේ) 109 (1) වගන්තියේ දැක්වෙන්නේ 'වරදක් සිදුකිරීම පිළිබඳ සෑම තොරතුරක්ම පොලිස් නිලධරයකු වෙත වාචිකව හෝ ලියවිල්ලකින් හෝ දෙනු ලැබිය හැක' යනුවෙනි. මේ අතර ඊළඟ උප වගන්තීන්ගෙන් දැක්වෙන්නේ එකී ප්‍රථම තොරතුර ඇතුලත් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙලයි. පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් පවත්වාගෙන යනු ලබන තොරතුරු සටහන් පොතක එකී ප්‍රථම තොරතුර ඉතා පරීක්ෂාකාරීව ඇතුළත් කළයුතු බව එහි දැක්වේ.

---

27 නඩු තීන්දුවේ 14 වන පිටුව

අධිකරණයේ තීරණය වූයේ මෙම නඩුවේදී පොලිස් නිලධාරීන් විසින් නිසි පරීක්ෂාකාරීත්වයකින් තොරව කටයුතුකොට ඇති බවත් ඔවුන් විසින් ලේඛනය ව්‍යාජ ලෙස ප්‍රබන්ධ කිරීමට කටයුතුකොට ඇති බවත්ය. එහිදී ප්‍රකාශ වූයේ කිසිදු උපස්ථම්භක ලේඛනගත සාක්ෂියකින් තොරව හුදෙක් ප්‍රවාදක තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කිරීම නීතියෙන් නියමකොට ඇති කාර්යපටිපාටියට පටහැනි බවත් 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවත්ය[28]. සුනාමි ආධාර මුදල් නිසි පරිදි තැන්පත් කරන ලද බවට අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් සිදුකරන ලද කරුණු පැහැදිලිකිරීම අධිකරණය විසින් පිළිගත් අතර ලිඛිත පැමිණිල්ල සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාලයේදී 4 වන වගඋත්තරකරු ලබාදුන් ප්‍රකාශයේ අවිශ්වාසනීයත්වය අධිකරණය විසින්ද පිළිගන්නා ලදී. ලැබුණු සම්පූර්ණ ආධාර මුදල් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ගිණුමක තැන්පත් කර තිබුණු අතර එය සම්පූර්ණයෙන්ම පැවතියේ අග්‍රාමාත්‍ය ලේකම්වරයා (රජයේ ඉහල නිලධාරියකු) භාරයේය යන්න සුවිශේෂී අවධානයට ලක්විය.

ආ) පොලීසිය විසින් ලේඛන සාවද්‍ය ලෙස සකස් කිරීම

අධිකරණයේ මතය වූයේ පොලිස් මූලස්ථානයේ සහ අනෙකුත් ස්ථානයන්හි පැවැති ලේඛනයන් සාවද්‍ය ලෙස සකස් කළ ඒවා වූ බවත් ඒ අනුව 'පොලීසියේ ඉහළම මට්ටම විසින් කණගාටුදායක ලෙස කරුණු වසන් කරමින් වියවුලක් නිර්මාණය කොට ඇති'[29] බවත්ය.

ඇ) නිසි උත්තරවාදයේ වැදගත්කම

මෙම නඩුවේ තවත් වැදගත් කරුණක් වන්නේ 4 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා විසින් ගොනුකරනු ලැබූ උත්තරවාදයන් පිළිබඳව බරපතල ලෙස ඔහුට දෝෂාරෝපණය කොට තිබීමයි. උදාහරණයක් ලෙස 4 වන වගඋත්තරකරුගේ පැමිණිල්ල 'සම්පූර්ණයෙන්ම අසත්‍ය සහ ද්වේශසහගත එමෙන්ම විරුද්ධවාදී අරමුණකින් යුතුව සිදුකරන ලද්දක්'[30]

---

28 නඩු තීන්දුවේ 25 වන පිටුව

29 නඩු තීන්දුවේ 16 වන පිටුව. ශ්‍රේෂ්ඨාධිකරණය එවැනි නිරීක්ෂණයන් සිදුකිරීම අපගේ නීතිවිද්‍යාව තුළ එතරම් දුර්ලභ නොවේ. බලන්න ක්ෂේමසිරි කුමාර කල්දේරා නඩුව, S.C. (F.R.) 343/99), SCM 6/11/2001, මෙහිදී රාජකාරි ලේඛනයන් ව්‍යාජ ලෙස සකස්කිරීම පොලිස් නිලධාරීන්ගේ පුරුද්දක්ව ඇති බවට අධිකරණය විසින් චෝදනා කරන ලදී.

30 නඩු තීන්දුවේ 1 සහ 12 වන පිටු

බවට පෙත්සම්කරු විසින් දක්වා තිබූ ප්‍රකාශයට විරුද්ධව කරුණු දැක්වීමට 4 වන වගඋත්තරකරු අසමත්ව තිබිණ.

තවද 1 වන වගඋත්තරකරුවූ පොලිස්පතිවරයා හෝ 2 වන වගඋත්තරකරුවූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරීවරයා විසින් ගොනුකරන ලද ලේඛනයන්ට 4 වන වගඋත්තරකරුගේ ලිඛිත පැමිණිල්ලේ පිටපතක් අමුණා නොතිබිණි[31]. එම පැමිණිල්ල 4 වන වගඋත්තරකරුගේ ලිපි ශීර්ෂයක යතුරු ලියනයකොට නොතිබීම, එහි ප්‍රකාශය කරන තැනැත්තා ලෙස 4 වන වගඋත්තරකරුගේ නම හෝ ලිපිනය සිංහල භාෂාවෙන් අන්තර්ගත නොවීම ආදීවූ වැරදි කිහිපයක්ම අධිකරණය විසින් දක්වා සිටින ලදී. එමෙන්ම එහි දින මුද්‍රාවක් යොදා නොතිබුනු අතර පොලිස් මූලස්ථානය වෙත එය ලැබුණු බවට සහතික කරමින් කවර හෝ නිලධාරියකු විසින් පිටසන් කිරීමක්ද එහි නොවීය.

ඇ) 126 ව්‍යවස්ථාවේ සන්දර්භය තුළ විධායකයේ කොටසක් නොවන තැනැත්තන්ගේ වගකීම

විධායකයේ වරදට ඉඩදෙනු ලැබීමට විරුද්ධ පක්ෂ දේශපාලනඥයකු ලෙස 4 වන වගඋත්තරකරු වගකිවයුතු වූ අතර පෙත්සම්කරුට එරෙහිව (වැරදි සහගත) විමර්ශනයක් ආරම්භ කිරීමේ පදනම දැමීම සඳහා ඔහු වගකිවයුතු විය[32].

3.1.2 තීන්දුව සම්බන්ධයෙන් විචාරාත්මක විශ්ලේෂණයක්

මෙම නඩුවේ කේන්ද්‍රීය ගැටළුව පොලිස් විමර්ශනය ආරම්භ කිරීම සහ ඉදිරියට කරගෙනයාම පිළිබඳව විය. තීරණය විසින් ඉහතින් දක්වන ලද විමර්ශනයන් හැමවිටම ආරම්භ කළ යුත්තේ ප්‍රථම පැමිණිල්ලක් මතය යන පොදුවේ පිළිගත් මූලධර්මය නැවත ප්‍රකාශයට පත්කරන ලදී. අධිකරණය තවදුරටත් කියා සිටියේ ප්‍රථම පැමිණිල්ල පොලිස් ස්ථානයක මිස පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් නොවිය යුතු බවයි. පොලිස් ස්ථානය සහ

---

31 නඩු තීන්දුවේ 17 වන පිටුව

32 මෙම මූලධර්මයට අදාළ නඩු තීන්දු නීතිය ඇතුලත් *ෆායිස් එ. නීතිපති* ([1995] 1SLR 372), *රහුමා උම්මා එ. නීතිපති* ([1996] 2 SLR 40) සහ *පීරිස් එ. රූපසිංහ* ([2000] 1SLR 40) යන නඩු තීන්දු උපුටා දක්වනු ලැබුවද අධිකරණය විශේෂිතවම පදනම් කරගත්තේ *ෂාහුල් හමීඩ් එ. රූපසිංහ* නඩු තීන්දුවයි ([1990] 1 SLR 104).

පොලිස් මූලස්ථානය අතර වෙනස සාමාන්‍ය ජනයාගේ මනසට එතරම් නොවැටහෙනු ඇති නමුත් මෙම මූලධර්මය අදාළ කළයුතු වන්නේ නම් එය ඒකාකාරීව සෑම දෙනා කෙරෙහිම අදාළ කළයුතු වෙයි. විශේෂයෙන්ම අගමැතිවරයකු සතු බලය වැනි දේශපාලන බලයක් හිමිනොවන තමන් වෙනුවෙන් පෙනී සිටීමට කිසිවකුත් නොමැති තැනැත්තන්ට එරෙහිව ප්‍රථම තොරතුරක් නොමැතිව අපරාධ පරීක්ෂණයන් ආරම්භ කරනු ලබන අවස්ථාවන් සඳහාද මෙම මූලධර්මය එකාකාරව අදාළ කළයුතු වෙයි.

තවදුරටත් මෙම නඩුවේ කරුණු විශ්ලේෂණය කිරීමේදී අපවාදයට ලක්වූ 'හෙල්පින් හම්බන්තොට' අරමුදල පුද්ගලික බැංකුවක ආරම්භ කරන ලද බවත් 'පුනර්ජීවන අරමුදල' නම්වූ රජයේ අරමුදලකට මුලින් තැන්පත් කරනු ලැබූ මුදල් එය වෙත මාරු කරන ලද බවත් සිහියට නැංවිය යුතුය. 'පුනර්ජීවන අරමුදල' මුල්‍ය රෙගුලාසි අනුව පාලනය වන්නක් වූ අතර 'හෙල්පින් හම්බන්තොට' අරමුදලට ඒවා අදාළ නොවීය. මේ අනුව ගැටළුව වූයේ නිසි ක්‍රියාදාමය සහ කාර්යපටිපාටීන් අනුගමනය කිරීම සම්බන්ධයෙනි. ඊට අමතරව අග්‍රාමාත්‍ය වැනි ඉහළ අමාත්‍ය මට්ටමේ ධූරයක් හිමි අයෙකුට ඔහුගේ ලේකම් සහ ගණකාධිකාරීවරයා සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීම සඳහා අවසර ලැබී තිබුණිද යන්න මෙම නඩුවේදී විවාදාත්මක කරුණක් (අධිකරණය විසින් තීන්දුවක් ලබාදුන්නද) විය.

භාණ්ඩාගාරයේ නීත්‍යානුකූල අනුමැතිය ලැබීමෙන් අනතුරුව සහ එකී වියදම් කිරීම සිදුකළයුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශයන් නිකුත් කිරීමෙන් අනතුරුව මිස අරමුදල් ආපසු ගැනීමක් සිදුනොකරන බවට අරමුදල වෙත තැන්පත් කරනු ලැබූ රුපියල් මිලියන 82.9 ක මුදල වියදම් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයා[33] විසින් මුලසුන හොබවන ඔහු විසින්ම ස්ථාපිත කළමනාකරණ කමිටුව විසින් භාණ්ඩාගාරය වෙත දන්වා තිබූ අතර එකී මුදල් පුද්ගලික බැංකුවක ගිණුමක තැන්පත් කිරීම අනුමැතිය සහිත ක්‍රියාවක්දැයි යන කේන්ද්‍රීය පැනය සඳහා මෙම සියළු කරුණු අනුයාත වෙයි.

කෙසේ වෙතත් පොලීසිය විසින් සිදුකළ යුතුව තිබුණේ ඔවුන් ක්‍රියාකළ ආකාරයට බලපුළුවන්කාරකම් පෙන්වමින් දේශපාලන දඩයමක නිරතවීම නොව දැඩි පරෙස්සමකින් යුතුව අපරාධ පරීක්ෂණය සිදුකිරීම බවට නම් සැකයක් නැත.

---

33 වර්තමානයේ ජනාධිපති ලේකම්වරයා

මෙම දෘෂ්ටිකෝණයෙන් බැලූ කල අගමැති ධූරයේ කටයුතු කරන්නෙක් රටේ වඩාත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් පමණක් නොව එක්තරා අවස්ථාවකදී අනම්‍ය ලෙස මෙම නඩුව ඉදිරියට ගෙනයාමට කටයුතු කළ රජයේ නීති නිලධාරීන්ව තමන්ට එරෙහිව විපක්ෂය විසින් මෙහෙයවන ලද බවට අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත්කිරීම තුළ පවත්නා දුරවබෝධ උත්ප්‍රාසය පිළිබඳව කරුණු නොදන්නා අය මවිතයට පත්වනු ඇත. පැමිණිල්ලේ කටයුතු දිගටම පවත්වාගෙන ගිය රජයේ නිලධාරීන්ගේ දැඩි උත්සාහය යහ පාලනය (එනම් දේශපාලනිකව අතිශය බලවත්වූ තැනැත්තාට මෙන්ම අඩු වරප්‍රසාද හිමි තැනැත්තාටද නීතිය එකසේ සැලකිය යුතු බව) පිළිබඳ ආදර්ශයක් නොව එවකට පැවතුනු පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රධානත්වය දැරූ ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සහ ඇයගේ අග්‍රාමාත්‍යවරයා වූ මහින්ද රාජපක්ෂ අතර පැවතුනු මතවාදයන්ගේ කටුක වෙනස්කම් තුලින් පැනනැඟුනක් විය. මෙය සිදුවූයේ ජනාධිපතිවරණයට තරඟ කිරීම සඳහා රාජපක්ෂට (මෙම නඩුවේ පෙත්සම්කරු) නාමයෝජනා ලබාදීම සම්බන්ධයෙන් කුමාරතුංග මුල් අවස්ථාවේදී විරුද්ධවී පසුව අකමැත්තෙන් එකඟවූ සන්දර්භයක් තුළය.

මෙම සම්පූර්ණ සිදුවීම තුලින් නිරූපණය වන්නේ පොලීසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව අතිශයින් අවාසනාවන්ත ලෙස දේශපාලනීකරණය වී ඇති ආකාරයයි. මෙම නඩුවේදී මැතිවරණයට පෙර අතුරු සහනයක් ලබාදීම සම්බන්ධයෙන් මැතිවරණයට පෙර නීතිපතිවරයා විරෝධය දැක්වූ නමුත් පෙත්සම්කරු විධායක ජනාධිපති ලෙස පත්වීමෙන් අනතුරුව නඩුව 'තවදුරටත් කරගෙන නොයාමට' තීරණය කරන ලදී. නීතිපතිවරයාට නඩුව 'තවදුරටත් කරගෙන නොයාමට' අවශ්‍යවීමට හේතුව 'වැඩිදුර සාක්ෂි' අධිකරණය වෙත ඉදිරිපත්වීම ලෙසින් දක්වනු ලැබූවද ඒවා හෙළිදරව් නොකෙරිණි[34]. නීතිපති දෙපාර්තමේන්තුව වෙත එල්ලවූ දේශපාලනික පීඩනය, එනම් අපරාධ පරීක්ෂණය සඳහා අවසරදීමේදී මෙන්ම නඩුව තවදුරටත් කරගෙන නොයාමට තීරණය කළ අවස්ථාවේදීද ඊට බලපෑ හේතූන් මහජනතාවට ප්‍රසිද්ධ නොකළ නමුත් ප්‍රකටව විද්‍යමාන විය. පසුගිය දශක කිහිපය තුළ විභාග වූ මෙම ආකාරයේ එකම නඩුව මෙය නොවුණි.

34 නඩු තීන්දුවේ 3 වන පිටුව

3.2 එන්.ඩබ්.එන්. ජයන්ත විජේසේකර සහ තවත් අය එ. නීතිපති සහ තවත් අය[35]

2006 වසරේදී ඉමහත් ආන්දෝලනයකට තුඩුදුන් මෙම නඩුවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරනු ලැබූ 13 වන සංශෝධනයේ 154 අ(2) ව්‍යවස්ථාවෙන් නැගෙනහිර පළාත සඳහා වෙනම පළාත් සභාවක් ස්ථාපිත කිරීමට අසමත්වීමෙන් තමන්ට 12(1) ව්‍යවස්ථාව යටතේ හිමිකරදී ඇති අයිතිවාසිකම් උල්ලංඝනයවී ඇති බවත්, නැගෙනහිර පළාත් සභාව සඳහා සභිකයින් තෝරා පත්කර ගැනීමට තමන්ට ඇති හිමිකම අඛණ්ඩව ප්‍රතික්ෂේප කොට ඇති බවත් පෙත්සම්කරුවෝ කියා සිටියහ.

ජනාධිපතිවරයාගේ නියමයෙන් සහ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධව පැවතීම තවදුරටත් පවත්වාගෙන යාමට 1988 සැප්තැම්බර් මාසයේදී ගනු ලැබූ තීරණය[36] අවලංගු කරන ලෙස පෙත්සම්කරුවෝ ඉල්ලා සිටියහ. මෙම තීරණය මඟින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ (මෙතැන් සිට පළාත් සභා පනත) 37(1)(අ) වගන්තියේ දක්වා ඇති ආකාරයට උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධකොට පවත්වාගැනීම සඳහා අනුගම්‍ය කොන්දේසීන් නීතිවිරෝධී ලෙස සංශෝධනය කිරීම සිදුව තිබීන.

ඉහත කී 37 (1)(ආ) වගන්තියේ දක්වුනේ (1)(අ) උපවගන්තියේ විධිවිධානයන් උතුරු හා නැගෙනහිර පළාත් සඳහා අදාළ කිරීමේ නියෝගයක් ප්‍රකාශයට පත්කිරීමට පෙර තෘප්ත කළයුතු විශේෂිත කොන්දේසි දෙකකි. '1988.12.31 දිනට පසු නොවන දිනයක' මැතිවරණයක් පැවැත්වෙන තුරු එක් පරිපාලනමය ඒකකයක් ලෙස ඒකාබද්ධ කෙරුනු පළාත් දෙක කෙරෙහි මෙම නියෝගය බලපැවැත්වින. මෙහි දක්වුනු කොන්දේසි දෙක වූයේ '1987.7.29 දින වනවිට වෙනම රාජ්‍යයක් ස්ථාපිත කිරීම සිය අරමුණ කොටගත් ත්‍රස්තවාදී හෝ වෙනත් සන්නද්ධ කණ්ඩායම් සතුව හෝ ඔවුන්ගේ පාලනය යටතේ පවතින අවි ආයුධ, උණ්ඩ, පුපුරන

---

35 SC (FR) No 243-245/06, SCM 16/10/06, නඩු තීන්දුව අගවිනිසුරු සරත් නන්ද සිල්වා

36 ඉන්දු ලංකා ගිවිසුමට සමගාමීව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය හා පළාත් සභා පනත බලාත්මක කරනු ලැබීන. 13 වන සංශෝධනය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට XVII(අ) නම් පරිච්ඡේදයක් අළුතින් එක්කරන ලද අතර එමඟින් අභිනවයෙන් පිහිටුවනු ලැබූ පළාත් සභා වෙත විධායක සහ ව්‍යවස්ථාදායක බලයන් බෙදාදෙනු ලැබීන. සංශෝධනයේ අන්තර්ගතවූ 154අ(1) ව්‍යවස්ථාව මඟින් 1988. 2. 3 දින සිට බලාත්මක වන පරිදි පළාත් නවයට එක් පළාතකට එක බැගින් පළාත් සභාවන් නවයක් ස්ථාපිත කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමිකර දුනි.

ද්‍රව්‍ය සහ අනෙකුත් මිලිටරිමය උපකරණ ශ්‍රී ලංකා රජය හෝ එය විසින් නියම කරනු ලබන අධිකාරයක් වෙත භාරදීම්' සහ අදාළ පළාත තුළ එකී කණ්ඩායම් විසින් සිදුකරනු ලබන එදිරිවාදී ක්‍රියා සහ අනෙකුත් ප්‍රචණ්ඩ ක්‍රියාවන් නැවැත්වීමය. 1987 ඔක්තෝබර් මාසයේදී දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) විසින් ඉන්දු ලංකා ගිවිසුම කඩකිරීමෙන් පසුව මේ එකදු කොන්දේසියක් හෝ තෘප්ත කරනු නොලැබීන.

කෙසේ වෙතත් මෙම නඩුවේ අරමුණ වූයේ එවකට සිටි ජනාධිපතිවරයා විසින් හදිසි අවස්ථා රෙගුලාසි යටතේ 37 (1)(ආ) වගන්තියෙන් නියම කරනු ලැබූ කොන්දේසි දෙකට තවත් විකල්පයක් නියම කිරීම මඟින් සංශෝධනය කරනු ලැබීමයි. උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කරනු ලැබීමෙන් අනතුරුව '1988.12.31 දිනට පෙර' මැතිවරණයක් පැවැත්විය යුතුව තිබුණද 1988 සිට 2005 දක්වා සිටි සියළුම ජනාධිපතිවරුන් විසින් හදිසි අවස්ථා රෙගුලාසි උපයෝගී කරගනිමින් එය දිගින් දිගටම කල්දමනු ලැබූ අතර එය කිසිදිනෙක නොපැවැත්වින.

නීතිපතිවරයා ඇතුළු වගඋත්තරකරුවන් කියා සිටියේ පළාත් සභා පනතේ 37(1)(ආ) වගන්තියේ අන්තර්ගත කොන්දේසි ඉහත කී හදිසි අවස්ථා රෙගුලාසි මඟින් සංශෝධනයවී ඇති බවත් ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) ව්‍යවස්ථාව මඟින් ජනාධිපතිවරයාට හිමිකරදී ඇති මුක්තිය ප්‍රකාරව ඔහුගේ රෙගුලාසියක් හෝ ප්‍රකාශනයක් ශූන්‍ය බවට පත්කරන ඉල්ලාසිටීම පෙත්සම්කරුවන්ට කිසිම ආකාරයකින් කළනොහැකි බවත්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අයිතිවාසිකම් කඩවීම පිළිබඳව දැනුවත්ව මාසයක කාලයක් ඇතුළත අධිකරණය වෙත ඉල්ලීම ඉදිරිපත් කළයුතුය යන කාලසීමාව ඉක්මවා ඇතැයි යන්නද පෙත්සම්කරුවන්ට එරෙහිව ඉදිරිපත්කරන ලද තර්කයක් විය.

3.2.1 නඩුව තුළින් පැනනඟින ප්‍රස්තුතයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව නිර්ණය කිරීම සඳහා පිළිතුරු සැපයිය යුතු ප්‍රයුක්තීන් පහත පරිදි විය.

අ) විධායක බලය හෝ අභිනියෝජිත ව්‍යවස්ථා සම්පාදක බලය ක්‍රියාවේ යෙදවීද ?

අධිකරණය තීරණය කළේ පළාත් සභා පනතේ 37(1) වගන්තිය යටතේ ප්‍රකාශ නිකුත්කිරීමේදී ජනාධිපතිවරයා සිය විධායක බලයට වඩා අභිනියෝජිත ව්‍යවස්ථා සම්පාදක බලය භාවිතාකොට ඇති බවත් එකී ප්‍රකාශනය 'අනු නීති සෑදීමක්'[37] බවත්ය.

වෙනත් කරුණු අතර පාර්ලිමේන්තුව විසින් සිය ව්‍යවස්ථාදායක බලය අභිනියෝජනය කිරීම සහ/හෝ අත්හැරීම තහනම් කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76(1) ව්‍යවස්ථාව සහ එකී තහනමට ව්‍යතිරේකයක් ලෙස වෙනත් කරුණු අතර පාර්ලිමේන්තුව විසින් 'යම් නීතියක් හෝ යම් නීතියක කොටසක් හෝ නියමයක් මඟින් යම්කිසි ප්‍රදේශයකට හෝ ජන කොට්ඨාශයකට හෝ සීමාකොට ක්‍රියාත්මක කරවීම' සඳහා අනුනීති සෑදීමට බලය දෙනු ලබන 76 (3)(ආ) අනුව්‍යවස්ථාවේ බලපෑම අධිකරණයේ සැලකිල්ලට ලක්විය. අධිකරණය ප්‍රකාශ කළේ ජනාධිපතිවරයා විසින් කළ ප්‍රකාශනය 'සාධාරණ හා සෘජුවම' 76(3)(ආ) ව්‍යවස්ථාවේ විෂය පථය තුළට ගැනෙන බවයි[38].

ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ(3) ව්‍යවස්ථාවේ 'නීතිය' යන යෙදුමේ අර්ථය කුමක්ද ?

පළාත් නවයට එක් පළාතට එක් පළාත් සභාව බැගින් පළාත් සභා නවයක් පැවතිය යුතු බව දක්වන 154අ(1) සහ (2) ව්‍යවස්ථාවන්ට ව්‍යතිරේකයක් ලෙස යාබද පළාත් දෙකක් හෝ තුනක් 'යම් නීතියක් මඟින් හෝ නීතියක් යටතේ' එක් පරිපාලන ඒකකයක් ලෙස ඒකාබද්ධ කිරීමේ හැකියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ(3) ව්‍යවස්ථාව මඟින් ලබාදෙයි.

---

37 නඩු තීන්දුවේ 13 වන පිටුව

38 නඩු තීන්දුවේ 13 වන පිටුව

154අ(1) ව්‍යවස්ථාවට අනුව මෙම ඒකාබද්ධ කිරීමේ බලය දැඩි ලෙසම පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය තුළ රඳවාගත යුතු බව සලකමින් මෙහි 'නීතිය' යන්නට පටු අර්ථකථනයක් ලබාදුන් අධිකරණය එය 170 වන ව්‍යවස්ථාවේ 'නීතිය' යන්නට ලබාදී ඇති ''පාර්ලිමේන්තුවේ පනතක් සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර කවර අවස්ථාවක වුවද යම්කිසි ව්‍යවස්ථාදායකයක් විසින් පනවන ලද පනතක් හෝ රාජ සභා ආඥාවක්' යන අර්ථ නිරූපණය මෙහිදීද අදාළ වන බව ප්‍රකාශයට පත්කරන ලදී. මේ අනුව හදිසි අවස්ථා රෙගුලාසිය 170 වන ව්‍යවස්ථාව යටතේ නීතියක් ලෙස සැලකිය නොහැකි බව අධිකරණයේ මතය විය[39]. මෙම නඩුවේ ප්‍රශ්නගත රෙගුලාසිය (පළාත් සභා පනතේ 37(1)(ආ) වගන්තියේ නියමකර තිබූ කොන්දේසි දෙක සංශෝධනය කොට නව විකල්ප කොන්දේසියක් හඳුන්වාදුන්) 154අ(3) අනුවව්‍යවස්ථාවට නොගැළපුනු හෙයින් එය බලරහිත විය.

මහජන ආරක්ෂණ පනතේ 5(2)(ඇ) වගන්තිය මඟින් ජනාධිපතිවරයාට නීතිය සංශෝධනය කරමින් හදිසි අවස්ථා රෙගුලාසි සෑදීමේ බලය ලබාදෙන්නේය යන මෙම නඩුවේ මැදිහත්වූ පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතීඥවරයාගේ ප්‍රතිවාදයට පිළිතුරු සපයමින් අගවිනිසුරුවරයා 155(2) ව්‍යවස්ථාව කෙරෙහි අවධානය යොමුකරවමින් කියා සිටියේ හදිසි අවස්ථා රෙගුලාසියකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක් යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාවක් නොමැති බවයි. මෙම රෙගුලාසිය 154අ(3) ව්‍යවස්ථාව හා එක්ව කියැවිය යුතු බව අධිකරණය විසින් පෙන්වා දෙනු ලැබිණි.

ඇ) මෙම රෙගුලාසි මහජන ආරක්ෂක පනතේ 5 (1) වගන්තිය යටතේ දක්වා ඇති අරමුණක් වෙනුවෙන් සාදන ලද ඒවා වේද?

මෙම ප්‍රශ්නයටද අධිකරණය විසින් පිළිතුරු සපයන ලදී. ඉහතකී අරමුණු පළමුව මහජන ආරක්ෂාව සහ පොදු පිළිවෙල තහවුරු කිරීම සඳහාද, දෙවනුව කැරලි කෝලාහල හෝ සිවිල් කැළඹීම් මැඩපැවැත්වීම

39 මෙය මූලික අයිතිවාසිකම් 'නීතිය' මඟින් නියම කරනු ලබන සීමාවන්ට යටත්ව ක්‍රියාත්මක වියයුතු බව දක්වයි. 'මෙහි කාර්යයන් සඳහා 'නීතිය' යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත්' වන බව තවදුරටත් එහි දක්වේ.

සඳහාද, තුන්වනුව ජන ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවාවන් පවත්වාගෙනයාම සඳහාද වෙයි. අපවාදයට ලක්වූ රෙගුලාසිය මේ එකදු අරමුණක් සමඟ හෝ 'තාර්කික සම්බන්ධතාවයක්'[40] නොමැති බව අධිකරණයේ මතය විය. එපමණක් නොව 'සබඳතාවයක් නොමැති වෙනත් නීතියක් ඒකපාර්ශවිකව සංශෝධනය කිරීම මඟින් නීතිය මඟින් පනවනු ලැබූ විශේෂිත කොන්දේසීන් ඉක්මවා කටයුතු කිරීමට තමන්ට බලය ලබාගැනීම සඳහා ජනාධිපතිවරයා කටයුතු කරඇති බව'[41] අධිකරණයේ මතය විය.

ඇ) පළාත් සභා පනතේ 37(1)(ආ) වගන්තිය යටතේ සිදුකළ ප්‍රකාශනය වලංගු නොවේද ?

පළාත් සභා පනතේ 37(1)(ආ) හි දැක්වුනු ප්‍රකාශනයක් නිකුත්කිරීම සඳහා සැපිරිය යුතුවූ පූර්ව කොන්දේසි දෙකින් එකක් හෝ තෘප්ත නොවී පැවැති බැවින් උතුරු හා නැගෙනහිර එක් පරිපාලන ඒකකයක් ලෙසට ප්‍රකාශයට පත්කරමින් 1988 දී නිකුත් කෙරුනු ප්‍රකාශනය වලංගු එකක් නොවන බවට ප්‍රකාශයට පත්කරනු ලැබිණි[42].

3.2.2 තීරණය පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක්

වගඋත්තරකරුවන් විසින් කාලසීමාව සහ ජනාධිපති මුක්තිය සම්බන්ධයෙන් ඉදිරිපත්කරන ලද ප්‍රතිවිරෝධතාවන්ගේ ස්වභාවය සහ අන්තර්ගතය විශ්ලේෂණය කිරීම සිත්ගන්නාසුලුය.

කාලසීමාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රතිවිරෝධතාවය තර්කයන් දෙකක් මත පදනම් විය. පළමුවැන්න වූයේ අපවාදයට ලක්වූ ප්‍රකාශනය සහ රෙගුලාසිය 1988 තරම් ඈත කාලයේ නිර්මාණය කරන ලද්දක් වන බවයි. දෙවන තර්කය වූයේ උතුරේ හා නැගෙනහිර ඡන්ද දායකයින්ට ඒකාබද්ධ කළ සභාව තවදුරටත් පවත්වාගෙන යායුතුද යන්න තීරණය

40 නඩු තීන්දුවේ 20 වන පිටුව

41 එම

42 බලන්න. *සුජීව අරුණ සේනසිංහ එ. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුගේගොඩ සහ තවත් තුන් දෙනෙක්* [2003] 1 SLR 172@186) එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුවරයාගේ තීන්දුව. මෙය අධිකරණය විසින් ජනාධිපතිවරයාගේ ප්‍රකාශයට පත්කිරීමක් (මෙහිදී ජනමත විචාරණ පනත සම්බන්ධයෙන්) බලරහිත බවට තීරණය කරනු ලැබූ තවත් අවස්ථාවක් විය.

කිරීම සඳහා පළාත් සභා පනතේ 37(2)(අ) වගන්තිය යටතේ පැවැත්විය යුතුව තිබූ ඡන්දය 2005 නොවැම්බර් මස 23 වන දින පැවැත්වීම සඳහා දින නියමකොට ඇති බවයි. 126(2) වගන්තිය අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීමට නම් ඉල්ලීම 'මාසයක කාලයක් ඇතුළත' ඉදිරිපත් වියයුතු බැවින් මෙම පදනම් දෙක මත පෙත්සම්කරුවන්ට මෙම ඉල්ලීම ඉදිරිපත්කළ නොහැකි බැව් තර්ක කෙරිනි. පෙත්සම්කරුවන් විසින් සිය අයිතිවාසිකම් කඩවීම 'දිගින් දිගටම සිදුවන්නක්'[43] බැවින් මාසයක කාලය අදාළ නොවන බව කියාසිටි අතර එය අධිකරණය විසින් පිළිගන්නා ලදී.

126(2) ව්‍යවස්ථාවේ අන්තර්ගත මෙම ප්‍රතිපාදනය ඉතාමත් සතුටුදායක ප්‍රජාතන්ත්‍රීය ආකාරයකින් කියවනු ලැබුවද අධිකරණය 'දිගින් දිගටම කඩවීම' යන සංකල්පය තවදුරටත් ගවේෂණය කිරීමට කටයුතු කළේ නම් වඩාත් ප්‍රයෝජනවත් වන්නට ඉඩ තිබුණේ මෙම නෛසර්ගිකව අපැහැදිලි යෙදුම එක් පංතියක පෙත්සම්කරුවන් විසින් 126(2) ව්‍යවස්ථාවේ විෂය පථයෙන් ඔබ්බට ගෙනයමින් සීමාරහිතව අනෙකුත් පෙත්සම් වර්ගයන් සඳහාද යොදාගැනීමට ඇති ඉඩ වළකා එය ව්‍යවස්ථාවේ විෂය පථය තුළට දැඩිව සීමාකිරීම සිදුකළ හැකිව තිබුණු බැවිනි.

සාමාන්‍ය රීතිය වන්නේ කාලය ගණනය කිරීම ඇරඹෙන්නේ කඩවීම සිදුවූ අවස්ථාවේ සිට වන බවයි. කෙසේ වෙතත් පෙත්සම්කරු කඩවීම සම්බන්ධයෙන් දැනුවත්ව සිටිය යුතු බවට ව්‍යතිරේකයක් පවතින බව මෙහිදී පෙනීයන බැවින් අවශ්‍ය දැනුවත්කම සහ චේතනාව එක්වූ අවස්ථාවේ[44] සිට කාලය ගණනය කිරීම ඇරඹෙන බව පෙනීයයි. සන්නිවේදනය සිදුකළ නොහැකි ලෙස පෙත්සම්කරුව රඳවාගනු ලැබ සිටීම වැනි අතිශය සුවිශේෂී තත්ත්වයන්හිදී, එනම් වෙනත් කරුණු අතර පෙත්සම්කරුගේ පාර්ශවයෙන් ප්‍රමාදයක් නොමැති අවස්ථාවන්හිදී අධිකරණය කළ නොහැකි දේ කිරීමට බල නොකරන්නේය යන මූලධර්මය අදාළ කරමින් කාලරාමුව ලිහිල් කිරීම සිදුකරනු ලැබිය හැක.

---

43 නවූ තීන්දුවේ 22 වන පිටුව

44 *ගමැතිගේ එ. සිරිවර්ධන* [1988] 1 SLR, 385 බලන්න *හේවාකුරුප්පු එ. ජී.ජ්.ඩී. ද සිල්වා, තේ කොමසාරිස්* (SC FR No 118/84 SCM 10.11.1984) *මහෙන්තිරන් එ. නීතිපති* (SC FR No 68/1980 SCM 05.08.1980).

වසර ගණනාවක් තිස්සේ ක්‍රියාකාරින් මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත්කිරීම සඳහා පැවැති අනවශ්‍ය බාධකයක් ලෙස (දකුණු ආසියාවේ වෙනත් කිසිම රටක මෙවැනි කාල බාධකයක් නොමැත) 126(2) වගන්තියට එරෙහිව උද්ඝෝෂණය කරන ලද නමුත් බොහෝ අවස්ථාවන්හිදී සාමාන්‍ය පුරවැසියන් ඈත්කොට තැබීම සඳහා මෙම වගන්තිය යොදාගනු ලැබ ඇත. උදාහරණයක් ලෙස කුඩා කඩයක් පවත්වාගෙන යාමෙන් තමන් හා සිය පවුල නඩත්තු කළ අයෙකුට ප්‍රදේශයේ පොලිසිය විසින් තර්ජනය කිරීම් හේතුවෙන් තමන්ට ඇති අයිතිවාසිකම කඩවීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම ඔහුගේ නොදැනුවත්භාවය හේතුකොටගෙන මසක කාලයක් ඇතුළත සිදුකළ නොහැකිවූ අවස්ථාවක එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක[45].

මේ අතර වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ විරෝධතාවය වූයේ ප්‍රශ්නගත හදිසි අවස්ථා නියෝග අධිකරණමය විමර්ශනයට ලක්කිරීම ජනාධිපති මුක්තිය යටතේ වලකනු ලබන බවයි. නමුත් මෙය ශ්‍රේෂ්ඨාධිකරණය පසුගිය දශකයෙන් වැඩි කොටසකදී හදිසි අවස්ථා රෙගුලාසිවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය[46] විමර්ශනය කිරීම සඳහා තමන්ට බලය ඇතැයි සලකා කටයුතු කිරීමෙන් නිර්මාණය වූ අධිකරණයේ සම්මත චාරිත්‍රය අනුව කටයුතු කිරීමක් විය. එවැනි විරෝධතාවයක් නීතිපතිවරයා වෙනුවෙන් පෙනීසිටි අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් මතුකරනු ලැබීම එක්තරා දුරකට පුදුම එලවන සුළුය.

කෙසේ නමුත් වඩා අසීරු ප්‍රශ්නයක්වූ ජනාධිපතිවරයාගේ ප්‍රකාශනය අධිකරණමය විමර්ශනයට ලක්කිරීමෙන් මුක්තිය ලබන බවට නීතිපතිවරයා විසින් මතුකරන ලද දෙවන විරෝධතාවය සම්බන්ධයෙන් සුවිශේෂී සැලකිල්ලක් යොමුවූ බවක් දක්නට නොවුනි. අතීතයේදී අධිකරණය ජනාධිපතිවරයාගේ ප්‍රකාශනයන් විමර්ශනය කිරීම සම්බන්ධයෙන් පොදුවේ එතරම් කැමැත්තක් දක්වා නොමැතිමුත් සුජීව අරුණ සේනාසිංහ එ. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුගේගොඩ සහ තවත් අය[47] හි එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුවරයා විසින් ජනමත විචාරණ පනත යටතේ ජනාධිපතිවරයා විසින් සිදුකරන ලද ප්‍රකාශනයක් වලංගු වේද සහ/හෝ ජනමත විචාරණ

---

45 මනඃකල්පිත උදාහරණයකි

46 විශේෂයෙන් *වික්‍රමබාහු එ. හේරත්* [1990] 2 SLR 348, *ජෝසප් පෙරේරා එ. නීතිපති* [1992] 1 SLR 199 සහ *කරුණාතිලක එ දිසානායක* [1999] 1 SLR 157.

47 [2003] 1 SLR 172@186).

යෝජනාව නිසි ලෙස සිදුකර ඇත්තේද යන්න විමර්ශනය කිරීම සඳහා අධිකරණයට අධිකරණ බලයක් ඇතිද යන්න සැලකිල්ලට ගනුලැබ තිබීම යොදාගනු ලැබියහැකි පූර්ව නිදර්ශනයක් වෙයි.

මෙම නඩුවේදී අධිකරණමය විමර්ශනය සම්බන්ධයෙන් මතුකරන ලද විරෝධතාවය පදනම් වූයේ ඒවා 'දේශපාලනික ප්‍රශ්න' වන්නේය යන සූත්‍රගත කිරීම තුළය. කෙසේ නමුත් රජයේ බලධාරීන් වෙත ප්‍රදානය කොට ඇති සියළු බලයන් සහ අභිමතයන් සාධාරණ හා සද්භාවයෙන් යුතුව මහජනතාවගේ යහපතට හේතුවන නීත්‍යානුකූල පදනමක සිට කටයුතු කළයුතුය යන පිළිගත් මූලධර්මය මත පිහිටා කටයුතු කළ අධිකරණය මෙම විරෝධතාවය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන ලදී. මේ අනුව එකී බලයන් සියළු බැම්වලින් මිදුණු පරම හෝ විමර්ශනයට ලක්කළ නොහැකි ඒවා නොවේ. ඒවායේ නීත්‍යානුකූලභාවය හෝ යෝග්‍යතාවය ඒවා යොදවනු ලැබූ අරමුණ පිළිබඳව සලකමින් තීරණය කළයුතු වෙයි.

මේ සම්බන්ධයෙන් ප්‍රනාන්දු විනිසුරුවරයා නැවත නැවතත් දක්වා සිටියේ 'මුක්තිය විසින් එය සිදුකරන්නා මිස ඔහුගේ ක්‍රියාව ආවරණය නොකරයි' යන මූලධර්මයයි. එනම් ජනාධිපතිවරයාට එරෙහිව කිසිදු අධිකරණයක හෝ විනිශ්චය සභාවක නඩු කටයුත්තක් ආරම්භ කළ නොහැකි නමුත් ඔහුගේ ක්‍රියාවන් මත කටයුතු කරන අනෙකුත් තැනැත්තන්ගේ ක්‍රියාකාරීත්වය සාධාරණීකරණය කිරීම සඳහා එකී ක්‍රියාවන් විමර්ශනයට ලක්කළ යුතුවන බවයි.[48]

3.3 12(1) ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වෙනත් නඩුවලදී මතුවූ මූලධර්මයන්

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ස්වභාවික විද්‍යා පීඨයේ පරිගණක විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් තමන්ව මහාචාර්ය ධුරයට පත්නොකිරීමට එරෙහිව ඉදිරිපත්කළ මූලික අයිතිවාසිකම් ඉල්ලීමක්වූ *ආචාර්ය අශෝක සෝමබන්ධු කරුණානන්ද එ. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සහ තවත් අය*[49] හිදී ශාස්ත්‍රාලීය නිදහස සම්බන්ධයෙන් වන වැදගත් ප්‍රශ්න ගණනාවක්ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සැලකිල්ලට ලක්කරන ලදී.

48 මේ සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදයේ 5.3 කොටසේ සාකච්ඡාව බලන්න

49 SC(FR) 450/2003, SCM 03.08.2006, ශිරානි ඒ. බණ්ඩාරනායක විනිසුරුවරියගේ තීන්දුව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාවට අනුව 'ශාස්ත්‍රාලීය ප්‍රයුක්තීන්' අධිකරණමය විමර්ශනයට අදාළ වන්නේද යන්න අධිකරණය විසින් තීරණය කළයුතුවූ මුල්ම ප්‍රශ්නය විය. නීතිපතිවරයා වෙනුවෙන් පෙනීසිටි ජ්‍යෙෂ්ඨ රජයේ නීතීඥවරයා බලවත් පරිශ්‍රමයක් දරමින් කරුණු ඉදිරිපත්කරමින් (ඉංග්‍රීසි නඩු තීන්දු නීතිය උපුටමින්) දක්වා සිටියේ බරපතල අසද්භාවයන් සහ කාර්යපටිපාටික අකටයුතුකම් පිළිබඳව එල්ලවී ඇති චෝදනාවන් විමර්ශනය කරමින් සිදුකරන ලද තක්සේරුව වැරදිද නිවැරදිද යන්න තීරණය කිරීම සඳහා පෙත්සම්කරුගේ ශාස්ත්‍රාලීය කටයුතු වෙත එබීකම් කිරීමේ අයිතියක් අධිකරණයට නොමැති බවයි.

පෙත්සම්කරුගේ නීතීඥවරයා තර්ක කර සිටියේ ප්‍රශ්නගත කාරණය වන්නේ මහාචාර්ය තනතුර සඳහා නම්කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු කාර්යපටිපාටිය දක්වමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කරන ලද චක්‍රලේඛයේ දැක්වෙන කාර්යපටිපාටිය නිසි පරිදි අනුගමනය කර ඇතිද යන්න වන බැවින් උසස්වීම සඳහා ඉදිරිපත් කළ අයැදුම්පත්‍රය ශාස්ත්‍රඥයකු විසින් ඇගැයුමට ලක්කරන ලද පමණින් එය ශාස්ත්‍රාලීය ප්‍රයුක්තියක් නොවන බවයි.

අධිකරණය යුක්තිය පසිඳලීම සඳහා 'පිටස්තර' තැනැත්තකු පත්කරනු ලබන එංගලන්තයේ තත්ත්වයෙන් ලංකාව වෙනස්කර දක්වන ලද අධිකරණය කියා සිටියේ පැමිණිලි සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා පිටස්තර අයෙකු නම්කිරීම සම්මත චාරිත්‍රය වී තිබුණද අධීක්ෂණමය අධිකරණ බලයක් අතික්‍රමණය කර ඇති අවස්ථාවක අධිකරණයට මැදිහත්වීමේ බලය පැහැදිලිව තහවුරුව ඇති බවයි.

අධිකරණය කියා සිටියේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල 1978 අංක 16 දරන (සංශෝධිත) විශ්ව විද්‍යාල පනත යටතේ නිර්මාණය කරනු ලැබූ නෛතික පුද්ගලයින් වන බැවින් එයට කිසිදු අවස්ථාවක අභ්‍යාගාමී අධිකරණ බලයක් හිමිනොවන බවයි. විශ්ව විද්‍යාල පරිපාලනය සම්බන්ධයෙන් අධිකරණමය විමර්ශනය පිළිබඳ දේශීය අධිකරණ පූර්ව නිදර්ශනයන් මනාව ස්ථාපිතව ඇත[50]. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබිත.

---

50 *මනෝහර එ. සභාපති, පේරාදෙණිය මණ්ඩපය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය*, නීතිඥ සංගමයේ නීති සඟරාව [1983] 1 වන වෙළුම, 11 කොටස, පි. 45, *චූලසුභද්‍රා එ. කොළඹ විශ්ව විද්‍යාලය* [1985] 1 SLR. 244, *සන්නස්ගල එ. කැළණිය විශ්ව විද්‍යාලය* [1991] 2 SLR 193 සහ විශේෂයෙන්ම අභියාචකට උපාධියක් ලැබීමට හිමිකමක් ඇත්තේද යන කාරණය අධිකරණය විසින් විමසා බැලූ *ඩබ්.කේ.සී. පෙරේරා එ. මහාචාර්ය දයා එදිරිසිංහ* [1995] 1 SLR 148.

ශාස්ත්‍රාලීය තීන්දුවක් ගැනීම පසුබස්වන අවවාදාත්මක ප්‍රකාශයන් පැවතිය හැකිමුත් ශාස්ත්‍රාලීය තීරණයන් අභියෝගයට ලක්කළ නොහැකිය යන මතය හා මම එකඟ නොවෙමි. 'හුදු ශාස්ත්‍රාලීය ස්වභාවයක් ගත්' කාරණාවන් සඳහා අනවශ්‍ය ලෙස මැදිහත්වීමක් අධිකරණයට අවශ්‍ය නොවන අතර එකී ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීම ඊට වඩාත් සුදුසුකම්ලත් ශාස්ත්‍රඥයින් විසින් සිදුකළයුතු වෙයි. කෙසේවෙතත් ශාස්ත්‍රාලීය ස්ථාපිතයන්ගේ තීරණයන්ට එරෙහිව චෝදනාවන් පවතින විට එය 126 ව්‍යවස්ථාවෙන් නියම කරනු ලැබ ඇති වර්ගීකරණය යටතට වැටෙයි. එවිට ශාස්ත්‍රාලීය ස්ථාපිතයක් විසින් ගනු ලැබූ තීරණයක් සම්බන්ධයෙන් වුවද අධිකරණය විසින් අදාළ කඩකිරීම හෝ කඩවීමට ආසන්නව පැවතීමේ චෝදනාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම වළකාලන ප්‍රතිපාදනයක් නොමැත[51].

මෙම නඩුවේ සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් ගත්කළ අධිකරණය තීරණය කළේ මහාචාර්ය ධුරය සඳහා උසස්වීම සඳහා පෙත්සම්කරු විසින් ඉදිරිපත්කළ ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් කාර්යපටිපාටික සාධාරණත්වය සහ නියමිත ප්‍රමිතීන් අනුගමනය කොට නොමැති අතර පළමුවන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය හිතුවක්කාරී, අසාධාරණ, අයුතු සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් නිකුත්කරන ලද චක්‍රලේඛයට පටහැනිව කටයුතු කොට ඇති බවයි. නීතියට අනුව අනුගමනය කළයුතු සියළු පියවර අනුගමනය කරමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛය සහ බාහිර විශේෂඥයින් තිදෙනකු විසින් ලබාදෙන තක්සේරු කිරීම් තුනක් මත පෙත්සම්කරු විසින් ඉදිරිපත්කරන ලද අයදුම්පත්‍රය නැවත සලකා බලන ලෙස තේරීම් කමිටු සාමාජිකයන් සහ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත නියෝග කරනු ලැබිනි.

වික්‍රමගේ දොන් රොහාන් විශ්වනාත් එ. ප්‍රාදේශීය ලේකම් මදුරාවල[52] හිඳී පුපුරන ද්‍රව්‍ය පනත යටතේ සිය බලපත්‍රය අළුත් කිරීම සහ සිය කොරිය සඳහා වෙළඳ බලපත්‍රය නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීම 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවට පෙත්සම්කරු ඉදිරිපත්කළ දුක්ගැනවිල්ල

51 නඩු තීන්දුවේ 34 වන පිටුව

52 SC(FR) No. 174/2003, SCM 17.02.2006, ශිරානි ඒ. බණ්ඩාරණායක විනිසුරුවරියගේ තීන්දුවකි.

ප්‍රතික්ෂේප කරනු ලැබුවේ පිළිගත් සම්මතයවූ අඛණ්ඩ ඇගයීම් සිදුකිරීම සහ නිරීක්ෂණය කිරීමේ ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් හා කොටසක් ලෙස බලපත්‍ර නිකුත්කිරීම ප්‍රතික්ෂේපකොට තිබූ බැවිනි. එහිදී පෙන්වාදෙනු ලැබූයේ අපවාදයට ලක්වූ ක්‍රියාකාරකම්හි බලපෑම එම අදියරේදී පමණක් මැනීම කළ නොහැකි බැවින් මූලික තක්සේරුවෙන් පමණක් බලධාරීන් තෘප්තිමත් වීමට ඉඩ නොමැති බවයි.

ඩබ්ලිව්.එම්.අයි.ඩී.බී. විජයකෝන් සහ තවත් අය එ. අබේසූරිය සහ තවත් අය[53] හිදී නිත්‍ය සේවයට තමන් අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව තමන් විසින් උපයාගන්නා ලද වැටුප් වැඩිවීම් එකතු නොකිරීම හේතුවෙන් නීතියේ සමාන රැකවරණය සඳහා තමන්ට ඇති අයිතිය උල්ලංඝනයවී ඇති බවට පොලිස් ස්වේච්ඡා භට කණ්ඩායමක් විසින් ඉදිරිපත්කරන ලද තර්කය පිළිගැනීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ඔවුන්ගේ ඉල්ලීම් කාල සීමාව ඉක්මවා ඇති බවට තීරණය කරන ලද අතර එහිදී තවදුරටත් ප්‍රකාශ කරනු ලැබූයේ නිත්‍ය සේවය ස්ථාපිත කිරීමත් සමඟ නව සේවයට පෙත්සම්කරුවන් අන්තර්ග්‍රහණය කරගනු ලැබ නිත්‍ය සේවයේ අනෙකුත් පොලිස් නිලධාරීන් හා සමානව ඔවුන්ගේ නව ධුරයන්හි වැටුප් පරිමාණයන්හි පිහිටුවනු ලැබූ බවයි. මේ අනුව ඔවුන්ගේ පත්වීම් ලිපිවල සඳහන්ව තිබූ ආකාරයට ඔවුන්ගේ වැටුප් පරිමාණයන් ස්ථිර ඒවා විය. ඒ අනුව පෙත්සම්කරුවන්ට 12(1) ව්‍යවස්ථාව කඩකරමින් තමන්ට වෙනස් ලෙස සලකනු ලැබූ බවට චෝදනා කරමින් 'එකම නිලධාරීන් පිරිසක් අතර කණ්ඩායම් දෙකක් නිර්මාණය කිරීම' කළ නොහැකි බව ප්‍රකාශ කෙරිනි[54].

---

53 SC(FR) Nos. 512-514/2004, SCM 05.07.2006, ශිරානි ඒ. බණ්ඩාරනායක විනිසුරුවරියගේ තීන්දුවකි.

54 නඩු තීන්දුවේ 16 වන පිටුව

4. පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරය[55]

4.1 දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත් කෙටුම්පත[56]

මෙම පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත මඟින් අපේක්ෂා කරන ලද්දේ වෙනත් කරුණු අතර දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදනයන් භාවිතා කිරීම හේතුවෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම සඳහා රජයට උපදෙස් දීමට දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියක් ස්ථාපිත කිරීමයි. නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම/විමර්ශනයන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය මෙන්ම මද්‍යසාර දුම්කොළ සහ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වෙළඳම සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු සිදුකිරීම පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත්කිරීම මෙම ජාතික අධිකාරියේ කාර්යභාරය වෙයි. මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක්කරමින් ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම්වල[57] ප්‍රධාන චෝදනාව වූයේ දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදනය හා වෙළඳම නීත්‍යානුකූල ව්‍යාපාරයන් වන බවත් ඒවා නීතිවිරෝධී මද්‍යසාර හා මත්ද්‍රව්‍ය වෙළඳාමෙන් වෙන්කර දැක්විය යුතු බවත්ය. මේ දෙකම පාලනය කිරීම සඳහා එකම නෛතික ප්‍රතිපාදනයක් තුළින් කටයුතු කිරීම ප්‍රවිචාරණයක් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය) මෙන්ම සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහස (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව), භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වන ව්‍යවස්ථාව) සහ නීත්‍යානුකූල වෙළඳාමක ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියැලීමේ නිදහස (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(උ) වන ව්‍යවස්ථාව) උල්ලංඝනය කිරීමක්ද වන බවයි.

පනත් කෙටුම්පතට විරෝධය දක්වමින් ඉදිරිපත්වූ පෙත්සම්වල ප්‍රතිවාදයන් ප්‍රතික්ෂේප කළ ශ්‍රේෂ්ඨාධිකරණය විවිධ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් මඟින්

---

55 පරිච්ඡේදයේ මෙම කොටස අධිකරණය විසින් වසර තුළ මේ සම්බන්ධව නිකුත් කළ සියළු නඩු තීන්දු වෙනුවට අයිතිවාසිකම් හා සුරක්ෂිතයන් සම්බන්ධයෙන් සුවිශේෂී බලපෑමක් සිදුකරන බවට ප්‍රකාශවූ එක් තෝරාගත් පනත් කෙටුම්පතක් පිළිබඳව පමණක් අවධානය යොමු කරයි.

56 SC (SD) Nos. 13-22/05, 2006 පෙබරවාරි 1 දින හැන්සාඩ් වාර්තාව.

57 භික්ෂු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් යෝජනා කරනු ලැබූ පනත් කෙටුම්පතට දුම්කොළ හා මධ්‍යසාර නිෂ්පාදකයින් රාශියක් විසින් විරෝධය දක්වා සිටින ලද අතර මැදිහත්වූ පෙත්සම්කරුවන් විශාල සංඛ්‍යාවක් එයට සහාය පළකර සිටියහ. ඒ වැඩිපිරිසක් පැවිදි පක්ෂයේ අය වූහ.

දඬුවම් කළහැකි නීතිවිරෝධී වෙළඳම නීතියට එකහෙලාම පටහැනි වන බවත් එවැනි නීතිවිරෝධී වෙළඳමක් නියාමනය කිරීමේ ප්‍රශ්නයක් මෙහිදී උද්ගතව නොමැති බවයි. කෙසේ වෙතත් අධිකරණය විසින් පෙන්වා දෙනු ලැබුවේ නීත්‍යානුකූල බලපත්‍ර ලබාගෙන කරගෙන යනු ලබන වෙළඳාමක් මහජන සෞඛ්‍යයට හානිකර වන්නේ නම් එහි ප්‍රතිඵලයන් අවම කිරීම සඳහා එයට සීමා පැනවීම අත්‍යාවශ්‍ය වන බවයි. මෙම ප්‍රකාශය කරමින් අධිකරණය දුම්කොළ හා මද්‍යසාරවල හානිකර ප්‍රතිඵල පිළිබඳව දක්වමින් සහ එකී අහිතකර ප්‍රතිඵලයන් අවම කිරීම ඉලක්ක කරගත් උපායමාර්ගයන් හා වැඩසටහන් සාමාජික රටවල් විසින් ක්‍රියාවට නැංවිය යුතු බවට ඉල්ලාසිටින එක්සත් ජාතීන්ගේ විශේෂඥ නියෝජිතායතනයන් විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ වාර්තාවන් අධිකරණය විසින් උපුටා දක්වන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට තර්ක කරනු ලැබූ පනත් කෙටුම්පතේ විශේෂිත වගන්ති වෙත අවධානය යොමුකරමින් අධිකරණය කියා සිටියේ ළමයින් හෝ තරුණ වැඩිහිටි තැනැත්තන් නිතර ගැවසෙන ස්ථානයක සිට මීටර් 100 ක දුර ප්‍රමාණයක් ඇතුළත දුම්කොළ හෝ මද්‍යසාර වෙළඳම් කිරීම වරදක් බවට පත්කරන (පෙත්සම්කරුවන් තර්ක කළ ආකාරයට මේ අනුව කොළඹ හෝ වෙනත් කිසිදු නගරයක නිෂ්පාදන වෙළඳම් කිරීම සිදුකළ නොහැකි වනු ඇත) 29 වන වගන්තිය සපුරා ගැනීමට අපේක්ෂා කරන අරමුණ සමඟ තාර්කික සම්බන්ධයක් නොමැති බවයි. අධිකරණය විසින් යෝජනාකර සිටියේ වගන්තියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි ස්වභාවය නිවැරදි කිරීම සඳහා එම නිෂ්පාදන විකිණීම සඳහා සම්පූර්ණ තහනමක් වෙනුවට අවු. 21 ට අඩු තැනැත්තන්ට එම නිෂ්පාදන විකිණීම තහනම් කිරීමේ පූර්ණ තහනමක් ඇතුළත් කිරීම කළහැකි බවයි[58].

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) ව්‍යවස්ථාවේ අයිතිවාසිකම්වලට සීමා පැනවීමක් විය හැකිවූ පනත් කෙටුම්පත විසින් බලාත්මක කිරීමට අපේක්ෂා කළ ප්‍රචාරණය තහනම් කිරීමට[59] අධිකරණයේ අනුමැතිය ලැබුණේ එය භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට සීමා පැනවීම යටතට නොගැනෙන

58 තහනම වයස අවු. 19 වියයුතු බවට (ඡන්දය ප්‍රකාශ කිරීමේ බලය හිමිවන වයස) තීරණය කළයුතු බවට ඉල්ලා සිටිමින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත්වූ අතර සෞඛ්‍යයට හානිකර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් මෙම පනත අදාළ වන බව පෙන්වා දුන් අධිකරණය එම අවස්ථාවන් දෙක පාලනය වන්නේ තත්වයන් දෙකක් යටතේ බව පෙන්වා දෙන ලදී.

59 33 වගන්තිය. කෙසේවෙතත් 33 (2)(ඊ) වගන්තිය මහජනතාවට යහපතක් සැලසෙන ආකාරයේ දුම්කොළ/ මධ්‍යසාර පිළිබඳ දැන්වීම් පළකිරීමට අවසර ලැබෙන පරිදි වෙනස්කළ යුතු බවට නිර්දේශ කරනු ලැබිණි.

බව දක්වමිනි[60]. 'අක්‍රීය දුම්පානයේ' සෞඛ්‍යමය අන්තරායයන් පිළිබඳව සැලකීමේදී 'සංවෘත පොදු ස්ථානයන්හි' දුම්පානය කිරීම තහනම් කරමින් ගැළපෙන ප්‍රතිපාදනයක් පනත් කෙටුම්පතට අන්තර්ගත වියයුතුව තිබුණු බව ප්‍රකාශයට පත්වීම වඩාත් වැදගත් වෙයි.

මේ අනුව 'අක්‍රීය දුම්පානය' පිළිබඳ වගන්තියක් 40 වන වගන්තිය ලෙස ඇතුළත් කරනු ලැබූ අතර හෝටල් සංගම් සමූහයක් සහ දුම්කොළ සමාගමක් තවදුරටත් අධිකරණ නිශ්චයට අවස්ථාව ලබාදෙමින් මෙම නව ප්‍රතිපාදනය අභියෝගයට ලක්කරන ලදී[61]. අධිකරණයේ මතය වූයේ 40 වන වගන්තිය යටතේ සංවෘත පොදු ස්ථානයක් තුළ කිසියම් තැනැත්තකු දුම්පානය කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම තහනම් කරනු ලැබීම (40(1) වගන්තිය) මෙන්ම සංවෘත පොදු ස්ථානයක හිමිකරු, පදිංචිකරු, කළමණාකරු හෝ භාරකරු වෙත එම ස්ථානයේ දුම් නොබොන බවට වගබලාගැනීමේ වගකීම පැවරීම (40(2) වගන්තිය) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන බවයි. 40(2) වගන්තිය යටතේ කාමර 30 කට වැඩි සංඛ්‍යාවක් සහිත ඕනෑම හෝටලයක්, තානායමක් හෝ ලැගුම්හලක්, 30 දෙනකුට වැඩි ගණනකට එකවර පහසුකම් සැලසිය හැකි ආපන ශාලාවක් හෝ සමාජ ශාලාවකට සහ ඕනෑම ගුවන් තොටුපලකට දුම්බොන්නන් සඳහා වෙනම කලාප ඇතිකළ හැකි බවට වන අතුරු විධානය සම්බන්ධයෙන්ද අධිකරණය එම අදහසම දරන ලදී.

40(5) වගන්තියේ 'සංවෘත පොදු ස්ථානය' යන්නෙහි අර්ථ නිරූපණය පළමුවැනි කොටසේ මහජනයාට අයිතිවාසිකමක් ලෙස හෝ වෙනයම් ආකාරයකින් ප්‍රවේශ වියහැකි ඕනෑම ස්ථානයක් අදහස් වන පරිදි 'පොදු ස්ථානයක්' ලෙසද, දෙවන කොටස දැනටමත් අර්ථ නිරූපණයේ විශේෂිතව දක්වා ඇති ස්ථාන අදහස් වන පරිදි 'සංවෘත පොදු ස්ථාන' ලෙසද වෙනස් කරන ලෙසට අධිකරණය විසින් නිර්දේශ කරනු ලැබිණි[62].

---

60 *ජෝන් ඩබ්. රස්ට් එ. වැන් ඩීමන් ඇන්ඩ් කම්පැනි* (1915, 60 US Lawyers Ed. 679, at 690) නඩුවේ නිරීක්ෂණයන් මත පදනම් වෙමින් *හැම්ඩාඩ් ඩවඛානා එ. යුනියන් ඔෆ් ඉන්ඩියා* (AIR, 1960 SC, ms. 544) නඩුවේදී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉදිරිපත් කරන ලද දක්ම පිළිබඳ සඳහන් කරමින් අනුමැතිය ලබාදෙන ලදී.

61 SC (SD) Nos. 1-6/06, 2006 ජූලි 6 හැන්සාඩ් වාර්තාව

62 එවැනි ස්ථාන ලැයිස්තුවෙන් 'ටෙලිෆෝන් කුටුව' යන්න ඉවත්කළයුතු බවට නිර්දේශ කරනු ලැබිණ.

තවද පනත් කෙටුම්පතේ අදාළ වගන්තියේ මුල් සැකසුම තුළ මද්‍යසාර නිෂ්පාදන යන්න සියයට එකකට වඩා වැඩියෙන් මද්‍යසාර ප්‍රතිශතයක් අන්තර්ගත පානයන් යන්න 4.5% දක්වා වෙනස්කොට ඇති බව අධිකරණය විසින් සිදුකළ දෙවන විමර්ශනයේදී පෙනීයන ලදී. මේ අනුව බියර් වෙළඳම පනතේ විෂයපථයෙන් බැහැර කිරීමට ඉඩ සැලසින. (තර්කකරන ලද ආකාරයට) මෙම වෙනස්කම මද්‍යසාර නිෂ්පාදන කර්මාන්තයේ යහපත වෙනුවෙන් සිදුකරන ලද්දක් බව පෙනීයන ලද අතර එකී සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට පටහැනි බව තීරණය කරන ලදී.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ සිය අධිකරණ බලය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරය[63]

5.1 *එන්.වී.කේ.කේ. වේරගොඩ, මහලේකම් එ.ජා.ප. එ. දිසානායක සහ තවත් අය*[64]

මෙම නඩුව ඡන්දය දීමේ අයිතිය සහ නාමයෝජනා පත්‍ර නීතියට අනුකූල වන බවට සහතික වන බවට දේශපාලන පක්ෂයක් මත පැවරී ඇති අනුගාමී වගකීම සම්බන්ධයෙන් වූවකි. මෙය 2006 පූර්ව මැතිවරණ සමයේදී අපේක්ෂකයින් එක් අයකු හෝ කිහිපදෙනෙකුගේ නාමයෝජනා සම්බන්ධයෙන්වූ තාක්ෂණික දෝෂ හේතුවෙන් සම්පූර්ණ නාමයෝජනා

---

63 මූලික අයිතිවාසිකම්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සුරක්ෂිතභාවය අභියාචනාධිකරණයන්හි රිට් අධිකරණ බලය සම්බන්ධයෙන් ධනාත්මක ලෙය බලපා ඇති අතර ඒ පිළිබඳව අයිතිවාසිකම්වල අධිකරණමය ආරක්ෂාව පිළිබඳ පරිච්ඡේදයන්හි සාකච්ඡා කරනු ලැබ ඇත. බලන්න, 2004 සහ 2005 සඳහා වන *Sri Lanka: State of Human Rights*, අදාල නඩු තීන්දු සඳහා බලන්න, *පෙරේරා එ. එදිරිසිංහ* [1995] 1 SLR 148, 156 සහ *හෙදර් මුන්ඩි එ. මධ්‍යම පරිසර අධිකාරිය සහ තවත් අය* (SC Appeal 58/03, SC), ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචන 58/2003 හි 2004. 01. 20 දින කාර්ය සටහන්, මාක් ප්‍රනාන්දු විනිසුරුවරයාගේ නඩු තීන්දුව. අදාළ තර්කනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්මයන් සහ ප්‍රතිපාදනයන් විසින් පරිපාලනමය අභිමතයන් හා මුක්තීන් සීමා කොට ඇති බවයි. ඒ අනුව මැන්ඩාමුස් සඳහා අදාළ වන පොදු වගකීම් සහ වරදකාරී ක්‍රියාවන්හි ප්‍රවර්ගයන් මෙන්ම සර්ෂියෝරාරි සහ ප්‍රොහිබිෂන් (140 වන ව්‍යවස්ථාව අනුව) සඳහා විෂය වන තීරණයන් පමණක් නොව අධිකරණමය විමර්ශනයේ විෂයපථයද පුළුල් කරනු ලැබ ඇත. මේ ආකාරයට අභියාචනාධිකරණයන් විසින් රිට් අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීම අයිතිවාසිකම් සඳහා අධිකරණමය රැකවරණය ලැබීමට විශාල බලපෑමක් ඇතිකොට ඇත. පරිච්ඡේදයේ මෙම කොටස මේ සම්බන්ධයෙන් අධිකරණය විසින් ලබාදුන් වැදගත් තීරණ දෙකක් විමර්ශනයට ලක්කරනු ඇත.

64 CA/330/2006 - ශ්‍රී පවන් විනිසුරුවරයාගේ 2006.03.24 දින කාර්ය සටහන් (සිසිර ඩි ආබෲ විනිසුරුවරයාගේ එකඟත්වය ඇතිව).

පත්‍රයම තේරීම්භාර නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත ගොනුකරනු ලැබූ ඉල්ලීම් ගණනාවක් අතුරින් එකක් විය[65].

5.1.1 නඩුව තුලින් පැනනඟින අදාළ කරුණු

මෙහිදී ප්‍රශ්න කරනු ලැබූ ප්‍රතික්ෂේප කිරීම වූයේ කොළඹ මහනගර සභාවට, විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කළ නාමයෝජනා ලැයිස්තුවට තිසි වයස සම්පූර්ණ නොකළ තරුණයෙකු ඇතුලත්වීම හේතුවෙනි. වෙනත් කරුණු අතර 1987 අංක 24 සහ 1990 අංක 25 දරන පනත්වලින් සංශෝධිත පළාත් පාලන ආයතන මැතිවරණ ආඥා පනතේ 89 වන වගන්තිය මඟින් පළාත් පාලන මැතිවරණයන්හිදී තරුණ අපේක්ෂකයින්ට කෝටාවක් ලබාදෙන ලද අතර ඒ අනුව නාමයෝජනා ලැයිස්තුවක 40 % ක් තරුණයින් (අවු. 18 සහ 35 අතර) වියයුතුවූ අතර සෙසු අය 35ට වැඩි අය විය හැකිවිය.

අ) 'තරුණයා' යන්න නිර්ණය කිරීමේදී අදාළ කරගනු ලබන දිනය පිළිබඳ නිර්වචනය[66]

'තරුණයා' යන්න නිර්ණය කිරීම සඳහා යොදාගත යුතු දිනය ඡන්ද හිමි නාමලේඛනය ආරම්භ වන දිනයද නොඑසේනම් එය සහතික කරනු ලැබූ දිනයද යන්න මෙහි ප්‍රශ්නගත කරුණ විය. නව ඡන්දහිමි නාමලේඛනය ආරම්භවූ 2004 ජූනි 1 දා සිට ගණනය කරනු ලැබුවහොත් එජාපය විසින් නාමයෝජනා ඉදිරිපත් කළ එක් අපේක්ෂකයකුගේ වයස අවු. 18 ට අඩු විය. නමුත් එම ඡන්දහිමි නාමලේඛනය සහතික කරනු ලැබූ 2005 ජූනි 5 වන දිනයේ සිට ගණනය කළහොත් ඔහුගේ වයස අවු. 18 ට වැඩිවිය. අභියාචනාධිකරණය තේරීම්භාර නිලධාරියාගේ ගණනය කිරීම සනාථ කළ අතර නිවැරදි දිනය ලෙස ඡන්ද හිමි නාමලේඛනය සහතික කළ දිනය නොව ඡන්ද හිමි නාමලේඛන අළුත් කිරීම ආරම්භවූ දිනය නිවැරදි දිනය ලෙස යොදාගනු ලැබිනි.

---

65 මෙහි ප්‍රාමාණික බලපෑම සලකා මෙම පරිච්ඡේදයේ විශ්ලේෂණය මෙම නඩුවට සීමා වෙයි.

66 (සංශෝධිත) පළාත් පාලන මැතිවරණ ආඥා පනතට අනුව 'තරුණයා' යනුවෙන් හැඳින්වෙන්නේ 'ක්‍රියාත්මකව පවත්නා ඡන්ද හිමි නාමලේඛනය ආරම්භවූ වසරේ ජූනි 1 වන දිනට වයස 18ට නොඅඩු තැනැත්තෙකි.

ආ) එක් අපේක්ෂකයෙකුගේ වරදක් මත මුළු නාමයෝජනා ලැයිස්තුවම ප්‍රතික්ෂේප කිරීමේ බලය තේරීම්භාර නිලධාරියාට හිමිවේද ?

වගඋත්තරකරුවන් (නීතිපතිවරයා, තේරීම්භාර නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමට සහාය දක්වන අනෙකුත් දේශපාලන පක්ෂ) කියා සිටියේ එක් අපේක්ෂකයකු නිසි වයස සම්පූර්ණ කළ අයෙකු නොවන බැවින් සහ 1990 සංශෝධනය සමඟ කියවනු ලබන පළාත් පාලන ආයතන මැතිවරණ ආඥා පනතේ 31(1) වගන්තියට අනුව 40% අංගය තෘප්ත නොවීම හේතුකොටගෙන සම්පූර්ණ නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප කළයුතු බවයි.

පෙත්සම්කරුගේ තර්කය වූයේ අපේක්ෂකයාගේ වයස පිළිබඳ කාරණය මෙහිදී අදාළ වන බැවින් එය පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධිත) ආඥා පනතේ 9 වන වගන්තිය යටතට ගැනෙන්නක් වන බවයි. නාමයෝජනා පත්‍රයේ භෞතික පරීක්ෂාව සහ අපේක්ෂක සංඛ්‍යාව ගණනය බවත් ඔහුට මෙම නඩුවේදී කරඇති ආකාරයට සම්පූර්ණ නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප කිරීමේ බලයක් නොමැති බවත් කියාසිටින ලදී. මීට ප්‍රතිචාර ලෙස වගඋත්තරකරුවන් කියාසිටියේ එය අවශ්‍ය උපචාරයන් අනුගමනය නොකිරීමක් වන බැවින් 1990 අංක 25 දරන පනතින් සංශෝධිත පළාත් පාලන මැතිවරණ පනතේ 31(1) වගන්තියට අනුව තේරීම්භාර නිලධාරියාට වෙනත් විකල්පයක් නොමැති බවයි.

අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් වන වයස සපුරා නොතිබීම හේතුකොටගෙන නාමයෝජනා පත්‍රය වගඋත්තරකරුගේ ක්‍රියාව නීතියට අනුකූල වන්නක් වන බවත්, 31(1)(ආ) වගන්තියට අනුව තේරීම්භාර නිලධාරියාට සම්පූර්ණ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇති බවත් අධිකරණයේ තීරණය විය.

5.1.2 නඩුව පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය

මෙහිදී අභියාචනාධිකරණය විසින් අපේක්ෂකයකුගේ සුදුසුකම්[67] අභියෝගයට ලක්කිරීම සහ නිසි ආචාරයන් අනුව කටයුතු කර නොතිබීම[68] මත නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබීම අතර අර්ථවත් විභේදනයක් සිදුකොට ඇති මෙම කාල වකවානුව තුළ ගොනු කෙරුනු මෙම නඩුව හා මෙම ස්වරූපයේ අනෙකුත් නඩු විසින් නිරූපණය කරන ලද්දේ පළාත් පාලන ආයතන පිළිබඳ නීතියේ අඩුලුහුඬුතාවයන්ය. විශේෂයෙන්ම එක් අපේක්ෂකයකුගේ නුසුදුසුකමක් හේතුවෙන් සමස්ත නාමයෝජනා ලැයිස්තුවම ප්‍රතික්ෂේපවීම වැනි නියමයන් මෙහිදී විශේෂ වෙයි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද අදාළ වෙයි.

එක් අපේක්ෂකයකුගේ නුසුදුසුකමක් හේතුකොටගෙන සම්පූර්ණ ලැයිස්තුවම ප්‍රතික්ෂේප කරනු ලැබීම මැතිවරණ ක්‍රමය තුළ සියළු පක්ෂවල ප්‍රජාතන්ත්‍රීය සහභාගීත්වය සහතික කිරීම හඟවන්නක් නොවනු ඇති අතර නාමයෝජනා පත්‍රවල ඇති එවැනි නුසුදුසුකම් නිවැරදි කිරීම සඳහා පක්ෂවල ලේකම්වරුන්ට දින දෙකක කාලයක් ලබාදිය යුතුය[69].

5.2 *සීමන්මෙමෙරු පතිරණගේ ශාන්ත ධර්මප්‍රිය පතිරණ එ. නියෝජ්‍ය පොලිස්පති පුද්ගලික පුහුණු හා වෙනත් අය[70]*

අයිතිවාසිකම් කඩකරන්නන්ගේ වගකීම සහ විශේෂයෙන්ම ව්‍යාකූල අසූ ගණන් සහ අනූව මුල් භාගයේ සිදුවූ අතුරුදන්වීම් සම්බන්ධයෙන් චෝදනා එල්ලවූ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් මෙම තීන්දුව අතිශයින් වැදගත්වේ. අසූ ගණන්වලදී සිය සහෝදරයා අතුරුදන්වූ අතුරුදන්වූවන්ගේ මාපිය-දූදරු සංවිධානයේ ප්‍රධාන ලේකම්වරයා වූ පෙත්සම්කරු විසින්, පළමුවන වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පතිවරයා

---

67 විග්නේශ්වරන් සහ ස්ටීවන් එ. දයානන්ද දිසානායක සහ තවත් අය [2002] 3 SLR 59 (CA) re the Parliamentary Elections Act, No 1 of 1981.

68 එදිරිවීර එ. කපුකොටුව [2003] 1 SLR 228

69 බලන්න "Representations of the Law & Society Trust to The Select Committee of Parliament on Reforms to Parliamentary, Provincial and Local Government Elections Laws,", Law & Society Trust Review, 16 වන වෙළුම 224 කලාපය, 2006 ජුනි, පි. 20.

70 අභියාචනාධිකරණ රිට් අයදුම්පත් අංක 1123/2002, 2006. 10. 09 දින කාර්ය සටහන්, ශ්‍රී ස්කන්ධරාජා විනිසුරුවරයාගේ තීන්දුවකි.

(වර්තමාන පොලිස්පතිවරයා) විසින් අතුරුදන්වීම් විමර්ශන ඒකකය විසින් පරීක්ෂණ පවත්වනු ලැබ අධිකරණයෙන් නඩු පවරන ලද නමුත් එම නඩුවලින් ඇප ලබා සිටින නිලධාරීන් සියළු දෙනාවම නැවත පෙර තනතුරුවල ස්ථාපිත කරන ලෙසට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් වෙත දන්වමින් නිකුත්කරනු ලැබූ චක්‍රලේඛයකට විරෝධය දක්වමින් මෙම ඉල්ලීම ඉදිරිපත් කරන ලදී. එවකට අධිකරණය ඉදිරියේ පැවැති සංඛ්‍යාලේඛනයන්ට අනුව නීතිපතිවරයා විසින් පොලීසියේ හා ආරක්ෂක හමුදාවන්හි 450 කට වැඩි සංඛ්‍යාවකට චෝදනා ගොනුකරනු ලැබ තිබිණ.

5.2.1 නඩුවෙන් මතුවන අදාළ කරුණු

අ) රජයේ නිලධාරියකුට එරෙහිව අපරාධ නඩුවක් ගොනුකළවිට ඔහුගේ වැඩ තහනම් කිරීම අත්‍යාවශ්‍ය වේද ?

ආයතන සංග්‍රහයේ 27.10 ඡේදය නියම කර ඇත්තේ රජයේ කවර හෝ සේවකයකුට එරෙහිව අපරාධ නඩුවක් පවරනු ලැබ ඇතිවිට ඔහුගේ සේවය නඩු විභාගය අවසානය වනතෙක් තහනම් කළයුතු බව සහ ඔහු/ඇය වරදකරු කරනු ලැබුවහොත් සේවයෙන් පහකළ යුතු බවය. වගඋත්තරකරුවන් කියා සිටියේ අපවාදයට ලක්වූ චක්‍රලේඛය සංග්‍රහයේ 27.8 සහ 27.9 ඡේද යටතේ නිකුත්කොට ඇති බවත් පොලීසිය/වෙනත් ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් අත්අඩංගුවට ගනුලැබ නඩු කටයුතු සිදුවෙමින් පවතින නිලධාරියකු ඇප මත මුදාහැරීම සම්බන්ධයෙන් 27.9 ඡේදය අදාළ වන බවත්ය.

අධිකරණය ප්‍රකාශකොට සිටියේ රජයේ සේවකයකුට එරෙහිව අපරාධ නඩුවක් විභාගවීමේදී අදාළ වන ඡේදය 27.10 වන බවයි. මේ අනුව අදාළ අපවාදයට ලක්වූ චක්‍රලේඛය මඟින් නැවත සේවයේ පිහිටුවනු ලැබූ නිලධාරීන් නඩු කටයුතු අවසන් වනතෙක් වැඩ තහනමට ලක්කළ යුතුව තිබූ බව ප්‍රකාශ විය. තවදුරටත් අධිකරණය කියා සිටියේ පළමුවන වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට හෝ 3 වන වගඋත්තරකාර පොලිස්පතිවරයාට ආයතන සංග්‍රහයේ 27.10 ඡේදය මඟින් අනිවාර්ය කොට නියමකොට ඇති ප්‍රතිපාදනයන් නොතකා හැර සිටිය හැකි මොනම ආකාරයක හෝ අධිකාරයක් හිමි නොවන බවයි. අපවාදයට ලක්වූ චක්‍රලේඛය බලාතික්‍රමණයක් ලෙස තීරණය කෙරුනු අතර සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරනු ලැබිණ.

ආ) නීත්‍යානුකූලභාවය සහ ප්‍රමාදය සම්බන්ධයෙන්වූ මූලික විරෝධතාවන්

පෙත්සම්කරුවන්ගේ නීත්‍යානුකූලභාවය සහ ඉල්ලීම ප්‍රමාදවී ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මූලික විරෝධතාවන් දෙකක් ඉදිරිපත්වූ අතර අධිකරණය විසින් ඒ දෙකම නොපිළිගන්නා ලදී. පළමුව අධිකරණයේ මතය වූයේ රිට් අභියාචනයන් සම්බන්ධයෙන් පවත්නා රීති දැඩි නොවන ඒවා (මූලික අයිතිවාසිකම් පෙත්සම්වලටත් වඩා) වන බවයි[71]. දෙවනුව අධිකරණය ස්ථාපිත නඩු තීන්දු නීතිය නැවත ගෙනහැර දක්වමින් කියා සිටියේ ප්‍රමාදය පෙත්සම්කරු වෙත ආරෝපණය කළ නොහැකි නම්[72] සහ එකී ප්‍රමාදය හේතුකොටගෙන අපවාදයට ලක්වූ නියෝගය ශූන්‍ය බවට පත්වන්නේ නම්[73] හැර ප්‍රමාදය සර්ෂියෝරාරි ආඥාවක් නිකුත්කිරීම වළකාලීම සිදුකරනු නොලබන බවයි.

ඇ) පරිපාලනමය අපහසුව යන පදනම අධිකරණය සමඟ තුලිත කළයුතු වේද ?

විභාගය අතරතුරදී ඉදිරිපත් කළ අපවාදයට ලක්වූ චක්‍රලේඛය අවලංගු කිරීම විසින් පරිපාලනමය අපහසුතාවයන් නිර්මාණය කරනු ඇතිය යන විරෝධතාවය (ඉතා නිවැරදි ලෙස) ප්‍රතික්ෂේප කරනු ලැබින[74].

---

71 කෙසේවෙතත් අධිකරණයේ එවැනි වගකීමක සීමාවන් පවතී. විමර්ශනයට ලක්කරනු ලබන වසර තුළ යහ පාලනය සඳහා වන පුරවැසි ව්‍යාපාරයේ නිලධාරීන් විසින් ගොනු කරන ලද ඉල්ලීමක් නීත්‍යානුකූල තත්ත්වයක් නොමැතිවීමේ පදනම මත ප්‍රතික්ෂේප කරමින් අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීන්දුවක් සඳහා බලන්න, *එච්.ඩබ්. වනසිංහ සහ තවත් අය එ. කොළඹ විශ්ව විද්‍යාලය සහ තවත් අය*, අභියාචනාධිකරණ රිට් අයැදුම් අංක 1261/2004, 2006.07.06 දින කාර්ය සටහන්, ශ්‍රීස්කන්ධරාජා විනිසුරුවරයාගේ තීන්දුව, මෙහිදී අභියාචනාධිකරණය විශ්ව විද්‍යාලයේ පත්වීම් (මෙහිදී අසාධාරණයට ලක්වූවන් පෞද්ගලිකව අධිකරණය හමුවට නොගිය අතර විශ්ව විද්‍යාල සේවා අභියාචක මණ්ඩලයට පැමිණිලි කිරීම පමණක් සිදුකළහ) සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් විසින් පෙන්වන ලද 'ප්‍රමාණවත් උනන්දුව' තක්සේරුවට ලක්කරමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබින.

72 *වීරකේසරී සමාගම එ. ප්‍රනාන්දු* (6 NLR 145).

73 *වාස් පී. හේලි සහ සමාගම එ. වානිජ හා කාර්මික සේවකයින් සහ තවත් අය* (1995) 2 SLR 42.

74 *කොන්ග්‍රිව් එ. ස්වදේශ කටයුතු කාර්යාලය* (1976) QB 623 තීන්දුව උපුටා දක්වමින් *ශ්‍රී ලංකා පාරිභෝගික සංගමය එ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම සහ තවත් තිදෙනෙක්*, අභියාචනාධිකරණ රිට් අයදුම් අංක 1776/2003, 2005. 07. 25 කාර්ය සටහන්.

5.2.2 තීන්දුව පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක්

ශ්‍රී ලංකාවේ ගැටුම් පැවැති කාලපරිච්ඡේදයන්හි සිදුකරන ලද වරදවල් සම්බන්ධයෙන් චෝදනා එල්ලවූ වහාම ඇප ලබාදීමේ චූදිත රජයේ නිලධාරීන්ගේ සංසිද්ධිය වැනි සිද්ධීන් ශ්‍රී ලංකාවේ ඉතාමත් සුලභ වෙයි. මෙහිදී දෙමළ ප්‍රජාව එකී සිදුවීම්වල ගොදුරු බවට පත්වූ උතුරු නැගෙනහිර ගැටුම් පැවැති කාලයේ සිදුවූ සිදුවීම් මෙන්ම දහස් ගණන් සිංහල ජනතාව ගොදුරු බවට පත්වූ අසූව අවසන් භාගයේ/අනූව මුල් භාගයේ ජනතා විමුක්ති පෙරමුණේ ආයුධ සන්නද්ධ නැගිටීම යන දෙකෙහිදීම ක්‍රියාකළ ආකාරය සමාන විය.

අධිකරණයන්හි ප්‍රමාදය (අභියාචනාධිකරණයේ ලේඛනයන් අනුව පෙනීගියේ එක් නඩුවක් වසර 10 පමණ කාලයක් මහාධිකරණයේ විභාගවී ඇති බවය) ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ පවත්නා ඉතා පැහැදිලි වරදකි. අතීතයේදී නඩු විභාගයන් දිනපතා අඛණ්ඩව ඉතා විශිෂ්ට ආකාරයකින් පවත්වාගෙන යනු ලැබූ අතර පසුගිය දශකය හෝ ඊට වැඩි කාලයක් තිස්සේ එය ක්‍රියාත්මක නොවුණි. නඩු කල්දැමීම ඉතා සුලභ වන අතර සමහර අවස්ථාවන්හි ඒ සඳහා ඉදිරිපත්කරනු ලබන හේතූන් අතිශයින් විසුළු සහගත වෙයි. 1994 අංක 22 දරන වධ හිංසා සහ අනෙකුත් අමානුෂික දඬුවම් පිළිබඳ සම්මුතිය පනත අනුව රජයේ නිලධාරීන් විසින් වධ හිංසාවන් සිදුකිරීමේ සිද්ධීන් පිළිබඳ 'සාමාන්‍ය' නඩු විභාගයන්හිදීද මෙවැනි ප්‍රමාදයන් නිරීක්ෂණය කළහැකි විය.

මෙසේ වන අතරම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් එම නඩුවල චෝදනාවන්ට ලක්ව සිටින පොලිස් නිලධාරීන්ට තවදුරටත් දඬුවම් කිරීම නවතා නැවත සේවයේ පිහිටුවිය යුතුය යන තර්කය සාධාරණීකරණය කිරීම සඳහා මෙම ප්‍රමාදයන් යොදාගැනීම, පද්ධතියේ එක් ශාඛාවක් තවත් ශාඛාවක වරදක් සිය වරද වසාගැනීම සඳහා යොදාගැනීමේ කපටි උත්සාහය පිළිබඳ ප්‍රබල නිදර්ශනයක් වෙයි. මේ අනුව අපවාදයට ලක්වූ චක්‍රලේඛය අවලංගු කරමින් රිට් ආඥාවක් නිකුත් කිරීමේදී අභියාචනාධිකරණය අනුගමනය කළ දැඩි ආකල්පය ඉතා ප්‍රශංසනීය වෙයි.

5.3 විශුවලිංගම් සහ තවත් අයෙක් එ. නීතිපති සහ තවත් අය[75]

අතුරු සහනයක් ඉල්ලා සිටිමින් ඉදිරිපත්වූ මෙම ඉල්ලීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 17 වන සංශෝධනය ක්‍රියාවට නැංවීමේ ඉතාමත් කුපිත කරවන කාරණය ඉදිරිපත්විය. පෙත්සම්කරුවන් කියාසිටියේ 17 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව රාජ්‍ය සේවා කොමිසමට සහ ජාතික පොලිස් කොමිසමට සාමාජිකයන් පත්කිරීමේදී ඒ සඳහා නාමයෝජනා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සිදුකළ යුතු බව දක්වා තිබියදී ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 'බැහැර කරමින්' ඒකපාක්ෂිකව රාජ්‍ය සේවා කොමිසමට සහ ජාතික පොලිස් කොමිසමට සාමාජිකයන් පත්කොට ඇති බවයි. වෙනත් කරුණු අතර ඔවුන් ඉල්ලා සිටියේ පත්කිරීම් නිෂ්ප්‍රභා කරමින් සර්ෂියෝරාරි ආඥාවක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාකාරීත්වය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පත්කිරීම් සිදුකරන ලෙසට මැන්ඩාමුස් ආඥාවක් නිකුත්කරන ලෙසය. කෙසේවෙතත් අධිකරණය විසින් 'ජනාධිපතිවරයාද ඇතුළත්ව කිසිදු තැනැත්තකු නීතියට ඉහළින් නැත' යන්න පිළිගනු ලැබුවද 35(1) ව්‍යවස්ථාව මඟින් ජනාධිපතිවරයාට හිමිකරදී ඇති මුක්තිය හේතුවෙන් තමන්ට එවැනි නියෝගයක් කළ නොහැකි බව ප්‍රකාශ කරමින් ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී[76].

5.3.1 තීන්දුව පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය

මෙම පැමිණිල්ලේ පසුබිම වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මුවාවෙන් සිදුකෙරුනු දේශපාලනික රැවටිල්ලයි. 2001 වසරේදී කලාතුරකින් දැකියහැකි දේශපාලනික මිත්‍රත්වයක් ප්‍රදර්ශනය කරමින් 17 වන ව්‍යවස්ථා

---

75 අභියාචනාධිකරණ අයදුම් අංකඃ 668/2006, 02/06/2006 දින කාර්ය සටහන්, ශ්‍රීපවන් විනිසුරුවරයාගේ තීන්දුවකි.

76 *පොදු යහපත උදෙසා වන නීති පදනම එ. නීතිපති*, (අභියාචනාධිකරණ අයැදුම් අංක 1396/2003-2003.12.17 දින කාර්ය සටහන්) හි උපුටා දැක්වීම, මෙම නඩුවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) ව්‍යවස්ථාව විසින් ජනාධිපතිවරයාට වෙනත් කරුණු අතර අමාත්‍ය විෂයන් හෝ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති කාර්යයන් සහ මැතිවරණ පෙත්සම් වැනි විශේෂිතව දක්වා ඇති අවස්ථා කිහිපයකදී හැර තමන් නිල හෝ පෞද්ගලික වශයෙන් සිදුකරනු ලබන ඕනෑම කටයුත්තක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගනු ලැබීමෙන් මුක්තිය නැමැති ආවරණය සපයන බව ප්‍රකාශ කෙරිණ. මේ අනුව මැතිවරණ කොමිසමට සාමාජිකයින් පත්කිරීමට හිටපු ජනාධිපති කුමාරතුංගට නියම කරන ලෙස ඉල්ලමින් ඉදිරිපත්වූ පෙත්සම මෙම ව්‍යතිරේඛී විෂයපථයට නොගැනෙන බැවින් 35(1) ව්‍යවස්ථාව අදාළ වෙමින් පෙත්සම නීතියට අනුව ඉදිරිපත් කළ නොහැක්කක් බවට ප්‍රකාශයට පත්විත.

සංශෝධනය ඒකච්ඡන්දයෙන් ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරනු ලැබිනි. රජයේ සේවයේ තීරණාත්මක තනතුරු වූ පොලිස්පති, නීතිපති සහ අගවිනිසුරු ඇතුළු ධුරයන් සඳහා වන පත්කිරීම් සාමාජිකයන් දස දෙනෙකුගෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කළයුතු බවට එමඟින් නියම කරනු ලැබිනි. තවද පොලිස්, මැතිවරණ, රාජ්‍ය සේවා සහ මානව හිමිකම් යන කොමිසම් සඳහා පත්කිරීම් සිදුකිරීමේදී නම් යෝජනාකිරීමේ බලයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සතුවිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිත්වය කථානායකවරයා සතුවූ අතර දේශපාලනඥයින් නොවන ප්‍රකට තැනැත්තන් 6 දෙනෙක්ද[77], තිල බලයෙන් පත්වන ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකවරයා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා මෙන්ම ජනාධිපතිවරයාගේ නියෝජිතයකුද මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඇතුළත් විය.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එහි ප්‍රථම ධුර කාලය වූ 2002 සිට 2005 දක්වා පමණක් ක්‍රියාත්මකවූ අතර 2005 වසරේදී දේශපාලනඥයින් නොවන නව සාමාජිකයන් පත්කිරීම සිදු නොකෙරින. නාමයෝජනා 5 ක් ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ඉදිරිපත් කර ඇති අතර සුළු පක්ෂවලට සිය නියෝජිතයා සම්බන්ධයෙන් එකඟතාවයකට එළැඹීමට නොහැකිව ඇත. මෙම සාමාජිකයන් 5 දෙනා නම්කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගණපූරණය සම්පූර්ණ වන හෙයින්[78] එවිට 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ අරමුණු ක්‍රියාවට නංවමින් එහි ක්‍රියාකාරීත්වය ඇරඹිය හැකි බවට වන අනුනයන තර්කයන් පවතිද්දීම තමන් වෙත දැනටමත් එවා ඇති නාමයෝජනාවන් සඳහා අනුමැතියදීම ඉතිරි සාමාජිකයාද නම්කරන තුරු ජනාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. 2006 වසරේදී ජනතාවගේ බලවත් අප්‍රසාදය නොතකා හරිමින් රාජ්‍ය සේවයේ ඉහළ තනතුරු සඳහා ජනාධිපතිවරයා විසින් තැනැත්තන් නම්කරනු ලැබිනි. මෙම රීති පෙත්සම් ගොනුකරනු ලැබුයේ යහ පාලනය ස්ථාපිත කිරීම අරමුණු කොටගෙන සිදුකෙරුනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොතකාහරිමින් දේශපාලනික පත්වීම් සිදුකරන පසුබිමකය.

---

77 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයින් 5 දෙනකු (සුළුතරය පිළිබඳවද සැලකිලිමත් වෙමින්) අගමැතිවරයා සහ විපක්ෂනායකවරයා එක්ව පත්කරනු ලබයි. එක් සාමාජිකයකු අගමැතිවරයාගේ හෝ විපක්ෂ නායකවරයාගේ පක්ෂයට අයත් නොවන පාර්ලිමේන්තුවේ කුඩා පක්ෂ විසින් පත්කරනු ලබයි. මෙම පත්කිරීම වසර 3 ක ධුර කාලයක් සඳහා වන අතර ඔවුන්ව ඉවත්කළ හැක්කේ දැඩි විධිවිධානයන් අනුගමනය කිරීමෙනි. එහිදී පුරප්පාඩු වන තනතුර සඳහා පත්කෙරෙන තැනැත්තා විසින් ඉතිරිව ඇති ධුර කාලය හොබවනු ලබයි.

78 41උ(3) ව්‍යවස්ථාවේ දක්වෙන්නේ සභා රැස්වීමක ගණපූරණය සාමාජිකයන් 6ක් වියයුතු බවයි.

ජනාධිපතිවරයා වෙත ප්‍රදානය කොට ඇති මුක්තිය හේතුවෙන් මෙම පෙත්සම නිෂ්ප්‍රභා කිරීම විසින් නිරූපණය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හානි පමුණුවන දේශපාලන විධායකය ආරක්ෂා කිරීම සඳහා එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම අවකාශය සලසාදී ඇති ආකාරයයි. ජනාධිපතිවරයාගේ නියෝග මත කටයුතු කරන නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් අධිකරණමය විමර්ශනයට ලක්කළහැකි බවට වන අධිකරණ පූර්ව නිදර්ශනයක්[79] පැවතියද ඍජුවම ජනාධිපතිවරයාගේ ක්‍රියාවන් හෝ පැහැරහැරීම් සම්බන්ධයෙන් තත්ත්වය වඩා අපැහැදිලි වෙයි. සමහර අවස්ථාවන්හිදී මුක්තිය පවතිද්දීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එවැනි ඍජු ක්‍රියාකාරකම් විමර්ශනය කොට ඇති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙක් පත්කිරීම[80] අභියෝගයට ලක්කරමින් ඉදිරිපත්වූ පෙත්සමකදී අධිකරණය කටයුතු කළ ආකාරය තුළ මේ බව මනාව නිරූපණය වෙයි. 107 ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා පත්කිරීම් සිදුකිරීමේදී ප්‍රකාශිතව සඳහන් කිරීමකින් තොරව ජනාධිපතිවරයාට එම පත්කිරීම් කිරීමේ බලය පවතින බව දක්වා ඇති නමුත් විනිසුරුවරුන් බහුතරය ප්‍රකාශකොට සිටියේ 107 ව්‍යවස්ථාවේ අරමුණු ඉටුවීමට නම් එම බලය ක්‍රියාවේ යෙදවීමේදී විධායකය සහ අධිකරණය සහයෝගයෙන් කටයුතු කළයුතු බවයි.

> බලය අවහිරයක් හෝ මැඩපැවැත්වීමක් නොකළයුතු අතර සීමාවන් ඇතුළත භාවිතයේ යෙදවිය යුතු වෙයි. බලය අභිමතානුසාරී වන නමුත් එය පරම වූවක් නොවේ. මෙය ඉතා පැහැදිලි කරුණකි. උදාහරණයක් ලෙස ජනාධිපතිවරයා විසින් කිසියම් ධූරයකට පත්කරනු ලැබූ තැනැත්තකු 107(5) ව්‍යවස්ථාවේ දක්වා ඇති විශ්‍රාම යන වයස පසුකර ඇත්තකු බව පසු අවස්ථාවක සොයාගනු ලැබුවහොත් සැකයකින් තොරවම එම පත්කිරීම වැරැද්දකි. ප්‍රතිපාදනය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ජනතාවගේ අපේක්ෂාව වන බැවින් එවැනි තැනැත්තකුට එම ධූරය දැරිය නොහැකි වෙයි. ඒ අනුව එකී වයස පිළිබඳ හා නුසුදුසුභාවය පිළිබඳ ප්‍රශ්න විසඳීම සඳහා 125 ව්‍යවස්ථාව යටතේ අධිකරණයට සිය බලය යෙදවිය හැක. මෙවැනි තවත් සිදුවීම් අතර පුරවැසියකු නොවන්නකු, බාලවයස්කරුවකු,

---

79 *කරුණාතිලක එ. දිසානායක* [1999] 1 SLR, *සේනසිංහ එ. කරුණාතිලක* SC 431/2001, SCM 17/3/2003 සහ මෑතකදී *පෙරේරා එ. බාලපටබැඳි සහ තවත් අය* SC(FR) No 27/2002, SCM 19.10.2004 මැතිවරණ කොමසාරිස් සහ පොලිස්පතිද ඇතුලු නීතිවිරෝධී ජනාධිපති නියෝග යන් පිටුපස සරණ පතා සැඟවීම කළනොහැකි බව ප්‍රකාශ කෙරින.

80 *සිල්වා එ. බණ්ඩාරනායක* [1997] 1 SLR 92. මීට ප්‍රතිපක්ෂ මතයක් ප්‍රකාශවූ නඩු තීන්දු සඳහා බලන්න, *වික්ටර් අයිවන් එ. සරත් සිල්වා* [2001] 1 S.L.R. 309 පි. 327 සහ *මල්ලිකාරච්චි එ. ශිවපඥපති* [1985] 1 S.L.R. 74 පි. 80.

බුන්වත් තැනැත්තකු, උන්මත්තකයකු, නීතිඥවරයකු නොවන්නකු, නීතිඥ වෘත්තියෙන් නෙරපනු ලැබූවකු, සදාචාරාත්මක දුරාචාරය ඇතුළත් වරදකට වරදකරුවකු වූවකු යනාදී තැනැත්තන් පත්කිරීම දැක්විය හැක[81].

අධිකරණමය විමර්ශනය පිළිබඳ ඉහත මූලධර්මය 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාවට නැංවීම සහතික කරනු පිණිස සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම මඟින් බැඳීසිටින විධායකයේ ප්‍රධානියකු විසින් එසේ කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක වඩාත් හොඳින් කැපී පෙනෙනු ඇත. මීට සමාන්තරව *විශ්වලිංගම් සහ තවත් අයෙක් එ. නීතිපති සහ තවත් අය* හිදී මුක්ති මූලධර්මය විසින් අභියාචනාධිකරණයේ විමර්ශනය කිරීමේ හැකියාව වළකනු ලැබ ඇති බවට දැඩි අධිකරණමය ස්ථාවරයක පිහිටා කටයුතු කිරීම ඉතා කණගාටුදායක වනවා පමණක් නොව අනාගත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකද කේන්ද්‍රීය කරුණක් වනු ඇත. විධායකයේ ප්‍රධානියා නීතියට ඉහළින් සිටීමේ සංකල්පය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉතා විනාශකාරී තත්ත්වයකට ඇදවැටී තිබීම වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යුහයේ ලක්ෂණයක් වෙයි.

6. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පළමුවන අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය යටතේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් සිදුකොට ඇති නිවේදනයන්

6.1 ප්‍රොටොකෝලයට පසුව ප්‍රවේශවීම

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පළමුවන අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය විසින් හඳුනාගනු ලබන අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් තනි පුද්ගලයන්ගේ පැමිණිලි භාරගැනීමේ හා විභාග කිරීමේ හැකියාව කොමිසම වෙත ලබාදී ඇත[82].

---

81 *සිල්වා එ. බණ්ඩාරනායක*හිදී විනිසුරුවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත පූර්ණතර විනිශ්චයාසනයේ බහුතරය වෙනුවෙන් තීන්දුව ප්‍රකාශයට පත්කරමින් එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුවරයා ප්‍රකාශකොට සිටියේ මුක්ති මූලධර්මය මඟින් විමර්ශනය වලකාලනු ලබන බවයි.

82 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පළමුවන අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය, 4(1) වගන්තිය (සම්මත කිරීම, සහතික කිරීම, නිවැරදි කිරීම හා පරිග්‍රහණය කිරීම සඳහා වූ 2200 A (XXI) මහා මණ්ඩල රැස්වීම යෝජනාව, 1966 දෙසැම්බර් 16, 1976 මාර්තු 23 දින සිට බලාත්මක කෙරුනු, 9 වන ව්‍යවස්ථාව අනුකූලව)

1997 ඔක්තෝබර් මාසයේ 3 වන දින ශ්‍රී ලංකාව එයට ප්‍රවේශවන ලදී. එහිදී රාජ්‍යය පැහැදිලි ප්‍රකාශයක් කරමින් කියාසිටියේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට එකී දිනයෙන් පසුව එළැඹෙන සිදුවීම් සම්බන්ධ තීරණයන් සම්බන්ධයෙන් පමණක් කටයුතු කිරීම පිළිගනු ලබන බවයි. මෙහි ප්‍රොටෝකෝලය සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නොවුනි.

පසුගිය දශකය තුල (2005 අවසානය වනතෙක්) විවිධ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් කොමිසම විසින් හය වතාවක් නිවේදනයන් නිකුත්කොට ඇත. මෙම අදහස් දක්වීම් තුල අන්තර්ගතවූ එකදු නිර්දේශයක් හෝ ක්‍රියාවට නංවනු ලැබ නොමැත[83]. දේශීය ප්‍රතිකර්මයන්හි අර්ථ විරහිතභාවය සම්බන්ධයෙන් වන අනිවාර්ය රීතිය මත පදනම්ව මෙන්ම සමහර අවස්ථාවන්හිදී පැමිණිල්ලද සාධාරණ නොවන බව නිරීක්ෂණය කරමින් කොමිසම විසින් වෙනත් නිවේදනයන් ගණනාවක්ද නිකුත්කොට ඇත.

2006 වසර තුලදී කොමිසම මගින් නිවේදනයන් තුනක් ඉදිරිපත්කොට ඇති අතර ඉන් දෙකකින්ම සිදුකෙරුනේ කොමිසම වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක් පිළිගත නොහැකි බව ප්‍රකාශයට පත්කිරීමයි[84] එක්

83 එකී නිවේදනයන් කිහිපයක් පහතින් දක්වේ. *ඇන්තනි මයිකල් එම්මානුවෙල් ප්‍රනාන්දු එ. ශ්‍රී ලංකාව* CCPR/C/83/D/1189/2003, මතය ප්‍රතිග්‍රහණය, 2005-03-31, *නල්ලරත්නම් සිංගරාසා එ. ශ්‍රී ලංකාව* CCPR/C/81/D/1033/2001, මතය ප්‍රතිග්‍රහණය, 2004-07-21, *එස්. ජෙගදීශ්වර ශර්මා එ. ශ්‍රී ලංකාව* CCPR/C/78/D/950/2000, මතය ප්‍රතිග්‍රහණය, 2003-07-16, *ජයලත් ජයවර්ධන එ. ශ්‍රී ලංකාව* CCPR/C/75/D/916/2000, මතය ප්‍රතිග්‍රහණය, 2002-07-22, *වික්ටර් අයිවන් මාජුවාන කංකානමගේ එ. ශ්‍රී ලංකාව* CCPR/C/81/D/909/2000, මතය ප්‍රතිග්‍රහණය, 2004-07-27, සහ *ශ්‍රී ලංකාවේ මැත්සින්ජෙන්හි ශාන්ත ෆ්‍රැන්සිස්ගේ තුන්වන ආඥාවේ සිරිකුරුසියේ නිමල ජෝසෆ් සොයුරිය සහ ගුරු සොයුරියන් 80 ක් එ. ශ්‍රී ලංකාව* CCPR/C/85/D/1249/2004, මතය ප්‍රතිග්‍රහණය, 2005-10-21.

84 *පුසිලා දහනායක සහ තවත් අය එ. ශ්‍රී ලංකාව* CCPR/C/87/D/1331/2004, 2006 ජූලි 25 වන දින පිළිගතහැකිභාවය පිළිබඳ තීරණය ප්‍රොටෝකෝලයේ 2 වන වගන්තිය යටතේ පිළිගත නොහැකි බව තීරණය කරන ලද්දේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 6 වන වගන්තිය යටතේ යහපත් වටපිටාවක් අහිමි කිරීම තුලින් සිය ජීවත්වීමේ අයිතිය උල්ලංඝනයවී ඇති බව තහවුරු කොට නොමැතිය යන පදනම මතය. පැමිණිලිකරුගේ සමානව නොසැලකීම යන චෝදනාවට දේශීය අධිකරණය විසින් පිලියම් යොදා ඇති බැවින් 1 වන වගන්තිය යටතේ ඉල්ලීම පිළිගත නොහැකි බවද ප්‍රකාශ කෙරිනි. *හිරාන් ඒකනායක එ. ශ්‍රී ලංකාව* CCPR/C/88/D/1201/2003, පිලිගැනීම සම්බන්ධ තීරණය 2006-10-31 දින ප්‍රකාශයට පත්වූ අතර ප්‍රොටෝකෝලයේ 5(2)(ආ) වගන්තිය යටතේ එය පිළිගත නොහැකි බව තීරණය වූයේ ප්‍රොටෝකෝලයේ 2 වන වගන්තිය යටතේ දේශීය ප්‍රතිකර්මයන් අවසන්කොට නොතිබීම හේතුවෙනි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 26 වන වගන්තිය යටතේ සිදුකරනු ලැබූ ඉල්ලීම ප්‍රමාණවත් ලෙස සනාථකොට නොමැති බව ප්‍රකාශ විනි.

පෙත්සමක් කොමිසම විසින් පිළිගනු ලැබූ අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අයිතිවාසිකම් කඩවී ඇති බව ප්‍රකාශයට පත්කරනු ලැබිනි. මේ අනුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අයිතිවාසිකම් කඩවී ඇති බව ප්‍රකාශයට පත්වූ අවස්ථාවන් සංඛ්‍යාව හතක් බවට පත්වෙයි. මෙතැන් සිට විමර්ශනයට ලක්කරනු ලබන්නේ මෙම අවසන් නිවේදනයයි.

6.2 සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ එ. ශ්‍රී ලංකාව[85]

6.2.1 නඩුවෙන් මතුවන අදාළ කරුණු

උත්පාදක පැමිණිල්ල

මෙහිදී පොලිස් නිලධාරීන් කිහිපදෙනකු විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගනු ලැබූ අතර රඳවා තබාගනු ලැබූ කාලය තුළ බරපතල තුවාල ඇතිකරමින් වධ හිංසනයන්ට ලක්කර තිබින. තුවාල වෛද්‍ය වාර්තා මඟින් තහවුරු කෙරිනි. පැමිණිලිකරු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2(3), 7 සහ 9 වගන්ති කඩවී ඇති බව කියාසිටි අතර පොලිස් නිලධාරීන්ගෙන් තමන් වෙත එල්ලවූ තර්ජනයන්ගෙන් තමන්ව ආරක්ෂා කිරීමට රාජ්‍ය බලය හිමි පක්ෂය අපොහොසත්වීම හේතුවෙන් 9(1) වගන්තියද කඩවී ඇති බවයි. මේ අනුව වධ හිංසා පැමිණවීම පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් කඩිනම් සහ අපක්ෂපාතී පරීක්ෂණයක් නිසි අධිකාරයක් ලවා පැවැත්වීමට රාජ්‍ය පක්ෂය අපොහොසත්වීම හේතුවෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2(3) වගන්තිය යටතේ එලදායී ප්‍රතිකර්මයන් ලැබීමේ හිමිකමද උල්ලංඝනයවී තිබිණි.

පැමිණිල්ලේ අන්තර්ගතවූ වැඩිදුර කරුණු පහතින් දැක්වේ.

අ) ඔහු දේශීයව මහාධිකරණයෙන් මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ද නෛතික ප්‍රතිකර්මයක් ලබාගැනීමට උත්සාහකොට තිබූ නමුත් එම උත්සාහයන්හි ප්‍රතිඵලයක් අත්නොවුනි.

---

85 CCPR/C/87/D/1250/2004, මතය ප්‍රතිග්‍රහණය, 2006-07-14.

ආ) දරුණු තුවාල සිදුකරමින් ඔහුට මසකට වැඩි කාලයක් රෝහල්ගතව සිටීමට හේතුවූ වධ හිංසා පැමිණවීමෙන් මාස 3 ක් ගතවීමෙන් අනතුරුවද කිසිදු අපරාධ පරීක්ෂණයක් ආරම්භ නොකෙරුනි.

ඇ) චෝදනාවන්ට ලක්වූ අපරාධකරුවන්ගේ වැඩ තහනම් කිරීමක් හෝ අත්අඩංගුවට ගැනීමක් සිදු නොවුනි. ඒ හේතුවෙන් පැමිණිලිකරුට තර්ජනය කිරීමට හා බලපෑම් කිරීමට ඔවුන්ට අවස්ථාව උදාවිය.

ඈ) කිසිදු අවස්ථාවක ශ්‍රී ලංකාව තුල වධ හිංසා පැමිණවීම සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු සිදුකිරීම ඵලදායී නොවන්නක් බව පෙනීගිය අතර වර්තමාන නඩුව සම්බන්ධයෙන්ද බලධාරීන්ගේ උද්‍යෝගයක් පල නොවුනි. මේ අනුව චෝදනා එල්ලවී ඇති අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් ඵලදායී ප්‍රතිකර්මයක් සැලසීමට පවතින අපරාධ හෝ සිවිල් කාර්යපටිපාටීන්ට නොහැකි බව පෙනීයන ලදී.

රජයේ පාර්ශවයෙන් ඉදිරිපත්කළ සැලකර සිටීම්

රජයේ පාර්ශ්වයෙන් සැලකර සිටියේ නීතිපතිවරයා විසින් 2004 ජූලි 14 වන දින 1994 වධ හිංසාවන්ට එරෙහි පනත යටතේ උපපොලිස් පරීක්ෂකවරයකුට එරෙහිව නඩු පවරා ඇති බවත් එකී නඩු විභාගය වේගවත් කරන ලෙස විනිසුරුවරයාට දැනුම්දී ඇති බවත්ය. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ ඉල්ලීම තවදුරටත් විභාග වෙමින් පවතින අතර පැමිණිලිකරු විසින් අසාධාරණ ලෙස නඩුව ප්‍රමාදවීම සම්බන්ධයෙන් කරුණු කියාපෑමක් හෝ නඩු ඇසීමේ ක්‍රියාවලිය වේගවත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම සිදුකොට නොමැත.

පැමිණිලිකරුගේ ප්‍රතිචාරය

පැමිණිලිකරු කියාසිටියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රමාදය පුරුද්දක් බවට පත්ව ඇති බවත් අපරාධ අධිකරණ කටයුතු පිළිබඳව සැලකීමේදී එය අසම්පූර්ණ එකක් බවත්ය. චෝදනාවන්ට කිහිප දෙනෙකුම ලක්ව සිටියද එක් අයෙකුට එරෙහිව පමණක් චෝදනාකරමින් අපරාධ නඩුව පවරා ඇති බවද පෙන්වාදෙන ලදී. හඳුනාගැනීමේ පෙරෙට්ටුවේදී පැමිණිලිකරු විසින් එක් තැනැත්තෙක්ව පමණක් හඳුනාගත්තේය යන රජයේ පාර්ශ්වයේ තර්කය තෘප්තිමත් එකක් නොවූයේ අදාල පහරදීම හේතුවෙන් පැමිණිලිකරු

සති දෙකක කාලයක් සිහිසුන්ව සිට තිබීමත් පැවති තත්ත්වයන් යටතේ හඳුනාගැනීම සිදුකිරීම සඳහා පැවැති අවකාශය සීමාසහිත වීමත් හේතුවෙති.

මේ අතර වෙනත් නිලධාරීන්ට එරෙහිවද චෝදනා නැගිය හැකිව තිබූ බවට පොලිස් නිලධාරීන්ම විසින් මහේස්ත්‍රාත් අධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ ලේඛන පදනම් කරගනිමින් සාක්ෂි ඉදිරිපත්විනි. මේ අනුව පැවති තත්ත්වයන් යටතේ හුදෙක් පැමිණිලිකරුගේ හඳුනාගැනීම මත රඳාසිටීම හේතුවෙන් අනෙකුත් අපරාධකරුවන් වරදින් නිදහස් කරනු ලැබ තිබුනි. එමෙන්ම පැමිණිලිකරු තර්ක කර සිටියේ චෝදනා එල්ලකොට ඇති පොලිස් නිලධාරියාටද වධ හිංසා පැමිණවීම සම්බන්ධයෙන් පමණක් චෝදනාවන් එල්ලකොට ඇති බවත් නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම සහ/හෝ රඳවා තබාගැනීම සම්බන්ධයෙන් චෝදනා එල්ලකොට නොමැති බවත්ය. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් නොමැති තත්ත්වයක් තුළ තර්ජනය කිරීම් හා බලපෑම් කිරීම් නැවැත්වීම සඳහා කුමන පියවරයන් අනුගමනය කරනු ලැබ ඇත්තේද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් රජයේ පාර්ශවයෙන් ඉදිරිපත් නොවුනි.

6.2.2 කමිටුවේ තීරණය

අ) පැමිණිල්ල පිළිගැනීමේ ප්‍රශ්නය

මෙකී ඉදිරිපත්වූ කරුණු සැලකිල්ලට ගනිමින් කමිටුව දක්වා සිටියේ පැමිණිලිකරු විසින් නඟන ලද කාරණාවන් සම්බන්ධ නඩු පවරා වසර 3 කට වැඩි කාලයක් ගතව තිබුණද, තවමත් මහාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින බවයි. තවද චෝදනාවන් එල්ලව ඇති පොලිස් නිලධාරියාද තවමත් අපරාධ නඩුවේ අධිචෝදනාවන්ට ලක්ව සිටියි. මූලික අයිතිවාසිකම් නඩුව හෝ අපරාධ නඩුව වඩා වේගවත් ලෙස විභාග කළ නොහැක්කේ මන්ද යන්නට රජයේ පාර්ශවයෙන් කිසිදු හේතු දැක්වීමක් සිදුකොට නොමැත. එමෙන්ම තීරණයක් ලබාදීම වසර 3 ක් තිස්සේ ප්‍රමාද කරවමින් පරීක්ෂණ සහ අධිකරණමය තීරණය වඩාත් සංකීර්ණ කරවන කිසියම් හේතුසාධකයක් පවතින්නේද යන්නද රජයේ පාර්ශවය විසින් හෙළිදරව්කොට නොමැත.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ සහ අපරාධ නඩුවේ තීන්දුව ලැබීම අසාධාරණ හා අනවශ්‍ය ලෙස දිග්ගැස්සුනු එකක් බව පෙනීයන අතර එය ප්‍රොටෝකෝලයේ 5 වන වගන්තියේ 2(ආ) ඡේදය යටතට ගැනිය හැකි බව පෙනීයයි. මේ අනුව පැමිණිල්ල පිළිගත හැකි බවට තීරණය කරනු ලැබිණි.

ආ) සුදුසුකම පිළිබඳව

නඩු දෙකම පැවරීම සඳහා වසර එකහමාරක කාලයක් ප්‍රමාද කිරීම ප්‍රොටෝකෝලයේ 5(2) වගන්තිය යටතේ අසාධාරණ ලෙස කාලය ප්‍රමාද කිරීමක් බව කමිටුව කියාසිටින ලදී. එහි අධිකරණ බලය අනුව ප්‍රඥප්තිය විසින් කිසිදු තැනැත්තකුට රජයේ පාර්ශවය විසින් අධිචෝදනා කරනු ලැබීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කෙරින[86]. කෙසේ වෙතත් මානව හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳ චෝදනාවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ එකී උල්ලංඝනය කිරීම් සිදුකළ තැනැත්තන්ට දඬුවම් කිරීමේ වගකීම රජයේ පාර්ශවය සතු වන බවත් අවධාරණය කෙරිණි.

මහාධිකරණයේ විශාල වැඩ ප්‍රමාණය මත රාජ්‍ය පාර්ශවය රඳා පැවතීම, ඊට ප්‍රඥප්තිය මඟින් පැවරී ඇති වගකීම්වලට සමාවට හේතුවක් ලෙස සැලකිය නොහැකි බැව් ඉතා පැහැදිලිව ප්‍රකාශ කරනු ලැබිණි. නීතිපතිවරයාගේ උපදෙස් මත පැමිණිල්ල මෙහෙයවන්නන් විසින් නඩු විභාගය වේගවත් කරන ලෙස අධිකරණ විනිසුරුවරයාගෙන් ඉල්ලා සිටීම හැරුනුවිට නඩු විභාගය සඳහා කාලරාමුවක් ලබාදීමට රාජ්‍ය පාර්ශවය අසමත්වීම හේතුවෙන් ප්‍රමාදය සිදුවී ඇති බවද ප්‍රකාශ විය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 7 වන වගන්තිය සහ 2(3) වගන්තිය රාජ්‍ය පාර්ශවය විසින් උල්ලංඝනය කොට ඇති බව කමිටුවේ නිගමනය විය[87].

අත්අඩංගුවට ගැනීම සිදුවූ තත්වයන් මත සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9 වන වගන්තිය යටතේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ ඉල්ලීම පිළිබඳව කමිටුව කියා සිටියේ පැමිණිලිකරු

86 නඩු අංක 213/1986, *H.C.M.A* එ. නෙදර්ලන්තය, මතය ප්‍රතිග්‍රහණය 1989 මාර්තු 30, නඩු අංක 275/1988, *S.E* එ. ආජන්ටිනාව, මතය ප්‍රතිග්‍රහණය, 1990 මාර්තු 26, නඩු අංක 343-345/1988, *V.N.* එ. ආජන්ටිනාව, මතය ප්‍රතිග්‍රහණය, 1990 මාර්තු 26.

87 ඒ අනුව සමාන්තරව මෙම නඩුවේදී ප්‍රඥප්තියේ 7 වන වගන්තිය උල්ලංඝනය වීම පිළිබඳ කාරණය තීරණය කර නොමැති බව කමිටුවේ තීරණය විය.

නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමේ චෝදනාව රජයේ පාර්ශවයෙන් ප්‍රශ්න නොකරන ලද බවයි. පැමිණිලිකරුට එරෙහිව ඇති චෝදනා දක්වා සිටීම, නිසි විනිසුරුවරයකු වෙත ඉදිරිපත් නොකිරීම යනාදියද රජයේ පාර්ශවයෙන් ප්‍රශ්න නොකළ අතර හුදෙක් මෙම චෝදනාවන් දූනටමත් විභාග වෙමින් පවතින මූලික අයිතිවාසිකම් පෙත්සමේ දක්වා ඇතැයි පවසා සිටින ලදී. රාජ්‍ය පාර්ශවය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 1, 2, 3 ඡේද සහ 2(3) වගන්තිය උල්ලංඝනය කරඇති බව ප්‍රකාශයට පත්කෙරිණි. තිල වශයෙන් නිදහස අහිමිකරවීම යන සන්දර්භයෙන් පිටත තැනැත්තන්ගේ ආරක්ෂාවට ඇති අයිතිය සුරැකිය යුතු බවට වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9(1) වගන්තියද උල්ලංඝනය කර ඇති බව තීරණය කෙරිනි[88].

> 9 වන වගන්තියේ අර්ථනිරූපණය රාජ්‍ය පාර්ශවයට සිය අධිකරණ බලය යටතේ රඳවාගනු නොලැබ සිටින තැනැත්තන්ගේ ආරක්ෂාවට ඇති තර්ජනයන් නොතකා සිටීමට අවකාශයක් සලසා නොදෙයි. මෙම නඩුවේදී පොලිස් ස්ථානයකදී සාක්ෂි දෙන ලෙසට නැවත නැවතත් පැමිණිලිකරු වෙත ඉල්ලීම් කොට ඇති බවත්, හිරිහැරකොට ඇති බවත්, සිය පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට බලපෑම් කරඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුට සැඟවී සිටීමට සිදුව ඇති බවත් පෙනීයයි. රාජ්‍ය පාර්ශවය විසින් හුදෙක් තර්ක කර සිටින්නේ පැමිණිලිකරුට පොලිස් ආරක්ෂාව පවතින බවය. නමුත් හිරිහැර කිරීම් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකෙරෙන්නේද යන්න පිළිබඳ සඳහනක් නොකරන අතරම එවැනි තර්ජනයන්ගෙන් ඔහුව ආරක්ෂා කරන ලද්දේ කෙසේද යන්න සහ අනාගතයේදී ආරක්ෂා කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව කිසිවක් නොදක්වයි. එපමණක් නොව චෝදනාවන් එල්ලවී ඇති අපරාධකරු සිටින්නේද අත්අඩංගුවේ නොවේ.

---

88 නඩු අංක 821/1998, කොංග්වේ එ. සැම්බියා මතය ප්‍රතිග්‍රහණය, 2000 ඔක්තෝබර් 25, නඩු අංක 195/1985, ඩෙල්ගාඩෝ පායෙස් එ. කොලොම්බියාව, මතය ප්‍රතිග්‍රහණය, 1990 ජූලි 12, නඩු අංක 916/2000, ජයවර්ධන එ. ශ්‍රී ලංකාව, මතය ප්‍රතිග්‍රහණය, 2002 ජූලි 22.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2(3)(අ) වගන්තිය යටතේ පැමිණිලිකරුට ඵලදායී ප්‍රතිකර්මයක් ලබාගැනීමේ හිමිකම පවතින බව ප්‍රකාශයට පත්කෙරුනු අතර විභාග වෙමින් පවතින නඩු කටයුතු වේගවත් කිරීම සඳහා පියවර ගැනීමත්, තර්ජනයන් සහ/හෝ බාධා කිරීම්වලින් පැමිණිලිකරු ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමත්, ඵලදායී හානිපූරණයක් ලබාදීමේත් වගකීම රාජ්‍ය පාර්ශවය සතුවන බව ප්‍රකාශ කෙරින. එවැනි අයිතිවාසිකම් කඩවීම් අනාගතයේ සිදුනොවන බවට රාජ්‍ය පාර්ශවය විසින් වගබලාගත යුතුය. දින 90 ක් ඇතුලත සිදුකෙරෙන චාරිත්‍රානුකුල දැනුම්දීමේදී කමිටුවේ නිර්දේශයන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළයුතු වෙයි[89].

6.2.3 නිර්දේශයන් ක්‍රියාවට නැංවීමෙන් වැළකී සිටීම

කලින්ද සඳහන් කළ ආකාරයට මෙම නිවේදනයේ හෝ අනෙකුත් නිවේදනයන්හි හෝ අන්තර්ගත නිර්දේශයන් ක්‍රියාවට නංවනු ලැබ නැත. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9(1) වගන්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වූ *ප්‍රනාන්දු එ. ශ්‍රී ලංකාව*[90] හිදී ශ්‍රී ලංකා රජයට අධිකරණයට අපහාස කිරීම පිළිබඳ පනතක් බලාත්මක කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ අතර රජය එයට ලබාදුන් ගැටළු සහගත ප්‍රතිචාරය වූයේ එය අධිකරණයට මැදිහත්වීමක් වියහැකි බැවින් එකී ඉල්ලීම ක්‍රියාවට නැංවිය නොහැකි බව පවසා සිටීමයි. අසල්වැසි ඉන්දියාවේ මෙන් නොව අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතියක් තවමත් මෙරට නොමැත. කෙසේ වෙතත් එය අධිකරණයේ අවසානාත්මක විනිශ්චයන්ට බලපෑමක් එල්ලවිය හැකි බැවින් කමිටුවේ යෝජනාවන් බලාත්මක කළ නොහැකිය යන අතාර්කික ප්‍රතිචාරය

---

89 මෙය අබ්දෙල්ෆට්ටා අමර් මහතා, නිසුකි ඇන්ඩෝ මහතා, පෆුල්ලච්චන්ද්‍රා නට්වාලල් භගවති මහතා, ඇල්ෆ්‍රෙඩෝ කැස්ට්‍රිලෝ හයෝස් මහතා, ක්‍රිස්ටීන් චානට් මියල මොරිස් අලහැන්ද්‍රෝ මහතා, වෝල්ටර් බාන් මහතා, අහමඩ් තවුෆික් කාහිල් මහතා, රාජ්සූමර් ලලාහ් මහතා, අෆායල් රිවාස් පොසාඩා මහතා, ශ්‍රීමත් නයිජල් රොඩ්ලි අයිවන් ෂියරර් මහතා, හජ්හිතෝ සොලාරි යිරිගෝයෙන් මහතා යන අයගෙන් සමන්විතවූ කමිටුවක් විසින් ලබාදෙන ලද ඒකමතික තීරණයක් විය.

90 *ඇන්තනි මයිකල් එම්මානුවෙල් ප්‍රනාන්දු එ. ශ්‍රී ලංකාව*, CCPR/C/83/D/1189/2003, මතය ප්‍රතිග්‍රහණය, 2005-03-31

කමිටුව විසින් නිකුත් කරනු ලැබූ 31 වැනි සාර්ව විවේචනය[91] විසින් බැහැරකර ඇත. එහි 4 වන ඡේදයේ වෙනත් කරුණු අතර මෙසේ දැක්වේ.

> ප්‍රඥප්තියේ බැඳීම් පොදුවේ සහ විශේෂයෙන් 2 වන වගන්තිය සමස්තයක් ලෙස සියළු රාජ්‍යයන් කෙරෙහි බැඳීම්සහගත වෙයි. රජයේ සියළු ශාඛාවන් (විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය) සහ ජාතික, කලාපීය හෝ ප්‍රාදේශික වශයෙන් ඕනෑම තරාතිරමක රාජ්‍ය පාර්ශවයේ කටයුතුවල නිරතවන්නාවූ අනෙකුත් රජයේ හෝ ආණ්ඩුවේ අධිකාරයන්ද මෙම වගකීම දරති. සාමාන්‍යයෙන් කමිටුව ඉදිරියේදී මෙන්ම පොදුවේ ජාත්‍යන්තරව රාජ්‍ය පාර්ශවය නියෝජනය කරනු ලබන විධායක ශාඛාවට ප්‍රඥප්තියේ ප්‍රතිපාදනයන් හා නොගැලපෙන ක්‍රියාවක් සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවය වගකීමෙන් නිදහස්වීම සඳහා ආණ්ඩුවේ වෙනත් ශාඛාවක් විසින් එය සිදුකරන බව දැක්වීම කළ නොහැකිය. මෙම තේරුම්ගැනීම ඍජුවම ගිවිසුම් නීතිය පිළිබඳ වියානා ප්‍රඥප්තියේ 27 වන වගන්තිය තුළ අන්තර්ගත මූලධර්මයන්ගෙන් පැනනගින අතර ඒ අනුව රාජ්‍ය පාර්ශවයකට 'ගිවිසුමක් උල්ලංඝනය කිරීමට හේතුව අභ්‍යන්තර නීතියේ විධිවිධානයන් යැයි කියාසිටීම කළ නොහැකි වෙයි.'

7. සිංගරාසා නඩුව

7.1 සිද්ධිමය පසුබිම

රජය පෙරළාදැමීමේ අදහසින් නීතිවිරෝධී ලෙස කුමන්ත්‍රණය කරමින් හමුදා කඳවුරු 4 කට පහරදීමට වරදකරු කරනු ලැබ බූස්ස බන්ධනාගාරයේ රඳවනු ලැබ සිටි නල්ලරත්නම් සිංගරාසා නැමැත්තකුට නියම කරන ලද දඬුවම සම්බන්ධයෙන් ගොනුකළ අභියාචනය ප්‍රතික්ෂේප

91 සාර්ව විවේචන අංක 31[80] - ප්‍රඥප්තියට බැඳුනු රාජ්‍ය පාර්ශවයන් වෙත බලපාන පොදු නෛතික බැඳීම්වල ස්වභාවය, සම්මත කිරීම, 2004 මාර්තු 29 (2187 වන රැස්වීම) මේ සම්බන්ධයෙන් බලන්න, ජාත්‍යන්තර වැරදි සහගත ක්‍රියාවන් පිළිබඳ රාජ්‍යයන්ගේ වගකීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීති කොමිසම කෙටුම්පත් කළ ලිපිවල 4 වැන්න.

කිරීමේ නියෝගය ප්‍රතිශෝධනය සහ/හෝ සමාලෝචනය කරන ලෙස ඉල්ලා සිටිමින් 2006 අගෝස්තු 16 දින මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනුකරනු ලැබිනි. එකී ඉල්ලීමද ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව ප්‍රඥප්තියේ 14 වගන්තියේ 3(උ) ඡේදය යටතේ (කිසිවකුට තමන්ට එරෙහිව සාක්ෂි දීමට හෝ වරදකරු බවට පාපොච්ජාරණය කිරීමට බල නොකල යුතුය) තමන්ට හිමි අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පවසමින් සිංගරාසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ඉදිරියේ පුද්ගලික පැමිණිල්ලක් ඉදිරිපත්කරන ලදී[92].

සිංගරාසා නිදහස් කිරීම හෝ නැවත නඩු විභාගයක් පැවැත්වීම හා වන්දියක් ලබාදීම ඇතුළු ඵලදායී සහ ප්‍රමාණවත් ප්‍රතිකර්මයක් සම්පාදනය කරන ලෙසට රජයට නිර්දේශ කරනු ලැබින. එමෙන්ම අනාගතයේදී ප්‍රඥප්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කරන බවට වගබලාගන්නා ලෙසටත්, එවැනි උල්ලංඝනයවීම් වලින් වළකින ලෙසටත් ශ්‍රී ලංකාවට අවවාද කරනු ලැබිනි. මෙම නිර්දේශයන්ට අනුගාමී ලෙස කලින් නිෂ්ප්‍රභා කිරීම නැවත සලකාබලන ලෙස ඉල්ලා සිටිමින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබින. කමිටුවේ නිර්දේශයන් මෙහිදී <u>අනුනයන අධිකාරයක්</u> ලෙස උපුටා දක්වනු ලැබිනි. එහි කිසිදු අවස්ථාවක ප්‍රතිශෝධන ඉල්ලීම් යාන්ත්‍රණයක් හරහා නිර්දේශයන් 'දේශීයව ක්‍රියාවට නැංවීමේ'[93] උත්සාහයක් අන්තර්ගත නොවුනි.

2006 සැප්තැම්බර් 15 වන දින අගවිනිසුරු සරත් නන්ද සිල්වා විසින් මුලසුන දැරූ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ලක බහුතර විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවක් විසින් තීරණය කරනු ලැබුවේ රාජ්‍යය විසින් ප්‍රොටෝකෝලයට ප්‍රවේශවීම (ශ්‍රී ලංකා අධිකරණ බලය තුළ සිටින ඕනෑම තැනැත්තකු විසින් පුද්ගලිකව කමිටුව වෙත ඉදිරිපත්කරන පැමිණිලි භාරගැනීමට හා සලකා බැලීමට කමිටුවට අවස්ථාව ලබාදෙන) ව්‍යවස්ථාදායක බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී ලෙස භාවිතා කිරීමක් මෙන්ම අධිකරණ බලය ව්‍යවස්ථා විරෝධී ලෙස කමිටුව වෙත ප්‍රදානය කිරීමක් වන බවයි. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව (ව්‍යවස්ථාදායක බලය ව්‍යවස්ථා විරෝධී ලෙස ප්‍රදානය කිරීම) සමඟ කියවෙන 4(ඇ) ව්‍යවස්ථාව සමඟ කියවෙන 3 වන ව්‍යවස්ථාව සහ

---

92 *නල්ලරත්නම් සිංගරාසා එ. ශ්‍රී ලංකාව,* CCPR/C/81/D/1033/2001, මතය ප්‍රතිග්‍රහණය, 2004-07-21

93 සාමාන්‍ය යෙදුමක් භාවිතා කිරීමට

4(ඇ) සහ 105(1) (අධිකරණ බලය ව්‍යවස්ථා විරෝධී ලෙස ප්‍රදානය කිරීම) ව්‍යවස්ථාවන් සමඟ කියවෙන 3 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇතැයි ප්‍රකාශ කෙරිනි.

අධිකරණය ප්‍රකාශකොට සිටියේ ශ්‍රී ලංකාව තනි ක්‍රමයක් (රාෂ්ට්‍රීය නීතිය බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයකින් තොරව ජාත්‍යන්තර නීතිය ඍජු සහ ක්ෂණික ලෙස අභ්‍යන්තරිකව ක්‍රියාවේ යෙදවිය හැකි) වෙනුවට ද්විත්ව ක්‍රමයක් සහිත රටක් (එකිනෙකට වෙනස් ක්‍රම දෙකක් වන රාෂ්ට්‍රීය නීතිය සහ ජාත්‍යන්තර නීතිය යන දෙකම) වන බැවින් ප්‍රඥප්තිය පරිග්‍රහණය කිරීමේ රාජ්‍යයේ ක්‍රියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී වන බවයි. මේ අනුව සිංගරාසාගේ ප්‍රතිශෝධන ඉල්ලීම නෛතික පදනමකින් තොර වරදවා වටහාගැනීමක් බවට තීරණය කෙරින.

7.2 නඩු තීන්දුව පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය[94]

රාජ්‍යයක් වගවිභාගයකින් තොරව සිය රටේ නීතිය තුළ වන බැඳීම් නොතකාහරිමින් ජාත්‍යන්තර නීතිය මඟින් විශේෂිත බැඳිම්වලින් බැඳී සිටීමට එකඟ වන්නේ කුමන හේතුවක් නිසාවෙන්ද යන්න සාමාන්‍ය බුද්ධියක් ඇති ඕනෑම තැනැත්තකුට ගැටළුවක් වෙයි. නමුත් ද්විත්ව ක්‍රමයක් පිළිබඳ පහසු තර්කනය යටතේ කටයුතු කරමින් විධායකය විසින් ඇතුලත් වන ජාත්‍යන්තර ගිවිසුම් රට අභ්‍යන්තරය තුළ බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාවන් නිර්මාණය කරමින් ශ්‍රී ලංකාව සිදුකර ඇත්තේ මෙයයි[95]

94 මෙම නඩු තීන්දුවේ වැදගත්කම සලකා බැලීමේදී වියයුතුව තිබූ පරිද්දෙන් මෙම නඩුව බලවත් ශාස්ත්‍රාලීය සංවාදයන්ට ලක් නොවුනි. නඩු තීන්දුව පිළිබඳ විචාරයන් සඳහා බලන්න, ජ්‍යෙෂ්ඨ නීතිඥ ආර්.කේ.ඩබ්. ගුණසේකර සහ නීතිය පිළිබඳ මහාචාර්ය/නිව් ඉංග්ලන්ඩ් ස්කූල් ඔෆ් ලෝ (බොස්ටන්) හි ජාත්‍යන්තර නීතිය හා ප්‍රතිපත්ති පිළිබඳ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ජෝන් සෙරෝන් විසින් රචිත LST Review, 17 වන වෙළුම, 2006 සැප්තැම්බර් හා ඔක්තෝබර්, ඒකාබද්ධ කලාපය, පි. 227 හා 228 පි. 25-33 හි පළවූ ලිපි, 'රාජ්‍ය විසින් විධිමත් ලෙස ඇතුලත්වූ ගිවිසුම විධායක බලය ක්‍රියාවේ යෙදවීමක් වන අතර වියානා සම්මුතියේ දක්වා ඇති ජාත්‍යන්තර නීතියට අනුව එය අධිකරණමය විමර්ශනයට විෂය වෙයි. රාජ්‍ය පාර්ශ්වයකට ප්‍රොටෝකෝලය ප්‍රතික්ෂේප කළහැකි කාර්යපටිපාටියක් ප්‍රොටෝකෝලයේ අන්තර්ගතව ඇති අතර ඒ අනුව කටයුතු කරනතුරු එම රට තුල ප්‍රොටෝකෝලය බලාත්මකව පවතී' - ආර්.කේ.ඩබ්. ගුණසේකර මහතාගේ ලිපිය (එම).

95 තනි ක්‍රමයක් හා ද්විත්ව ක්‍රමයක් ලෙස පාලන තන්ත්‍රයන් වර්ගීකරණය කිරීම සංකීර්ණ විෂයක් පමණ ඉක්මවා සරල කිරීමක් බව බොහොමයක් නීතිවේදීන්ගේ මතය වෙයි. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් දේශීය නීතීන් තුළට ඇතුලත් කිරීම අවශ්‍ය වන්නේ ඇයිද යන්න පිළිබඳ තර්කනයක් ගොඩනංවමින් 2005 මාර්තු 29 වන දින වොෂින්ටන් ඩී.සී. හිදී ජාත්‍යන්තර නීතිය පිළිබඳ ඇමරිකානු සංගමයේ වාර්ෂික රැස්වීමේදී හත්වන ග්‍රෝෂස් දේශනයේදී විනිසුරු මයිකල් ක්‍රිබිලි මෙම අදහස් දක්වා සිටින ලදී.

කෙසේ වෙතත් සිංගරාසා නඩුවේදී අධිකරණය තවදුරටත් ඉදිරියට යමින් මෙම යල්පිනූ මූලධර්මය නැවතත් ප්‍රකාශයට පත්කරමින් එය රට තුළ ක්‍රියාවට නැංවීමේ බලයක් නොමැති බව ප්‍රකාශ කිරීමෙන් නොනැවති තවදුරටත් ඉදිරියට යමින් ප්‍රොටෝකෝලයට අත්සන් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බවද ප්‍රකාශයට පත්කරන ලදී.

අ) මානව හිමිකම් කොමිසම අධිකරණ බලයක් ක්‍රියාවට නංවනු ලබන්නේද ?

අධිකරණයේ තීරණාත්මක උපකල්පනයක් වූයේ ප්‍රොටෝකෝලයට අත්සන් කිරීම මඟින් 'අධිකරණ බලය' මානව හිමිකම් කොමිසම වෙත පවරාදී ඇති බවයි. මේ පිළිබඳව වූ අධිකරණමය තර්කනය පහත සංවාදය මඟින් විචාරාත්මකව විමර්ශනය කරනු ඇත[96]. තර්කනය පහත ආකාරයෙන් සංක්ෂිප්ත කරනු ලැබිය හැක.

අ) තමන්ට පැවරී ඇති 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නාවූද ජාත්‍යන්තර නීතිය චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටුකිරීමට ඔහුට නියමිතව හෝ බලය ලැබී ඇත්තාවූද සියලු ක්‍රියා හා දේ කිරීමට' ඇති බලය අනුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට සහ ප්‍රොටෝකෝලයට අත්සන් තබන ලදී.

ආ) මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයම යොදාගනිමින් ප්‍රොටෝකෝලයට අත්සන් තැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

---

96 තියුණු විවේචනයන් අවහිර කරනු ලැබ ඇති ශ්‍රී ලාංකික අධිකරණයන් විසින් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් ගොඩනංවනු ලැබ ඇති අතිශය සාම්ප්‍රදායික සූත්‍රගත කිරීම තුළ වර්තමාන සංවාදය පිළිබඳ අදහස් දැක්වීම් වලට සීමාවී ඇති බව මෙහිදී අවධාරණය කළ යුතුය. කලින් සඳහන් කළ ආකාරයට කිසියම් තීරණයක් සම්බන්ධයෙන් සාධාරණ හා තාර්කික විවේචනයන්ට අවකාශය සලසන ඉන්දියාවේ හා එක්සත් ජනපදයේ පවතින ආකාරයේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතියක් තවමත් ශ්‍රී ලංකාවේ නොමැත. මීට ප්‍රතිපක්ෂව ශ්‍රී ලංකාවේ අපහාසය ලෙසින් සැලකෙන්නේ කුමක්ද යන්න පිළිබඳ අර්ථ නිරූපණය අනතුරුදායක ලෙස නිරවද්‍ය නොවූවක් වන අතර අධිකරණයේ ක්‍රියාකලාපයන් සහ ඔවුන්ගේ තීරණයන් පිළිබඳ විවේචනයන් මැඩපැවැත්වීම පිණිස ආයුධයක් ලෙස මේ හිඩැස මෑතකාලීනව භාවිතා කරනු ලැබ ඇත. බලන්න, Contempt of Court – the Need for Substantive cum Procedural Definition and Codification of the Law in Sri Lanka, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 2004 දෙසැම්බර්.

> විරෝධී බවත් එම ක්‍රියාව 'අධිකරණ බලයේ කාර්යයක්' (පාර්ලිමේන්තුව විසින් ක්‍රියාවේ යෙදවිය යුතු) බවත් ප්‍රකාශ කෙරින. බහුතර විනිශ්චයකාරවරුන් පිරිසකගේ මතය අනුව ප්‍රකාශයට පත්වූ තීන්දුවෙන් කියැවුනේ මානව හිමිකම් කොමිසම වෙත 'අධිකරණ බලය' පවරාදී ඇති බවත් එය සිදුකළ හැකිව තිබුණේ ව්‍යවස්ථාදායකයට පමණක් වන බවත්ය.

මේ අනුව පෙනීයන්නේ ශ්‍රී ලංකාව ප්‍රොටෝකෝලයට අත්සන් කිරීම මඟින් අධිකරණ බලය කමිටුව වෙත ප්‍රදානය කොට ඇතිය යන්න මෙම තර්කනයේ හරය වන බවයි. කෙසේ වෙතත් කමිටුවේ අධිකරණ බලය මෙන්ම එහි සාමාන්‍ය අදහස් දැක්වීම්වල තර්කනය වී ඇත්තේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අන්තර්ගත අයිතිවාසිකම් ජාත්‍යන්තර අයිතිවාසිකම් පිළිබඳ නීතියක් මඟින් බලාත්මක කළයුතු බවත් ප්‍රඥප්තිය යටතේ එකී අධිකාරය ජාත්‍යන්තරව හිමි නිසි යාන්ත්‍රණය වන්නේ කමිටුව බවත්ය. <u>කිසිදු අවස්ථාවක දේශීය මට්ටමේ 'අධිකරණ බලය' සම්බන්ධයෙන් කමිටුව මැදිහත්වී නොමැත.</u>

> එවැනි අයිතිවාසිකම්[97] ප්‍රකාශිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ අන්තර්ගත නොවූවද ඒවා මූලික අයිතිවාසිකම් ලෙස සලකනු ලැබිය හැක. පරමාධිපත්‍ය ජනතාව වෙත <u>රඳවා තැබීම</u> හෝ ජනතාවට අයිතිවාසිකම් <u>ලබාදීම</u> අරමුණු කරනොගත් 3 වන ව්‍යවස්ථාව ඊට ආධාරකයක් වෙයි. ඒ වෙනුවට 3 වන ව්‍යවස්ථාව දැනටමත් පරමාධිපත්‍ය ජනතාව වෙත (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්වායත්තව) ඇතිය යන පදනම මත ඉදිරියට යයි. ඒ අනුව ජනතාවට යම් යම් අයිතිවාසිකම් <u>දැනටමත් හිමිව</u> පවතී. 4(ඇ) ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද හා පිළිගන්නා ලද' මූලික අයිතිවාසිකම් ලෙස පටු වර්ගීකරණයකට ලඝු නොකරමින් 3 වන ව්‍යවස්ථාව කිසිදු සීමාකිරීමක් හෝ සුදුසුකම් පැවතීමකින් තොරව මූලික අයිතිවාසිකම් පිළිබඳව සඳහන් කරයි. මේ අනුව 'පරමාධිපත්‍යය' ට විශේෂිතව දක්වා ඇති අයිතිවාසිකම්වලට අමතරව අනෙකුත් අයිතිවාසිකම්ද ඇතුළත් වන අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ඇතුළත් අයිතිවාසිකම්ද ඒ අතර වෙයි. මේ තත්ත්වය

97 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙනි.

> සමහර අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වනු ලැබ තිබීම ජනතාවට වෙනත් අයිතිවාසිකම්ද හිමි බව ප්‍රතික්ෂේප කිරීම සඳහා යොදා නොගත යුතුය යන්න පිළිගත් එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන සහ දහවන සංශෝධනයන්ගෙන් වෙනස් නොවේ[98].

මීට පෙර ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතව ඇති අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සඳහා අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් විශාල වශයෙන් උපුටා දක්වනු ලැබ තිබිනි. නූතන මානව හිමිකම්වල අර්ථනිරූපණයන් සහ වැඩිදියුණුවීම් නිවැරදි සහ නිසි බවට සලකනු ලැබූ අතර ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුවම ස්වෛරී තැනැත්තන් වෙත තවදුරටත් අයිතිවාසිකම් ලබාදෙන සාරවත් අධිකරණ දේහයක් ප්‍රතිඵල කෙරිනි.

අනෙකුත් මානව හිමිකම් සංවිධානයන්හි සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ සමහර අදහස් මෙන්ම ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක්ද අභියාචනාධිකරණය විසින් සලකා බැලූ අවස්ථාවන් මුල් කාලීන උදාහරණයන් වෙයි. මෙයින් පැහැදිලිවම නිරූපණය වන්නේ හේබියස් කෝපුස් රිට් පුළුල් කිරීමේ සන්දර්භය තුළ කිසියම් සත්‍යාර්ථක ක්‍රියාකාරීත්වයක් අත්‍යාවශ්‍යව ඇති බවයි[99].

විශේෂයෙන් වැදගත්වන 1991 වසරේ තීන්දුවකදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව අර්ථනිරූපණය කරමින් 'අත්අඩංගුවට ගැනීම' යන්නට වරදක් කළ බවට සැකයක් පැවතීම හේතුකොටගෙන නිදහස අහිමි කිරීම පමණක් නොව නිදහස අහිමි කරවන කවර ආකාරයක හෝ හිතුවක්කාරී ක්‍රියාවක් ඇතුළත් වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථනිරූපණය කිරීමේදී හිතුවක්කාරී අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීමෙන් නිදහස පිළිබඳව වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

---

98 "Judicial Development of Human Rights; Some Sri Lankan Decisions," විනිසුරු එම්.ඩී.එච්. ප්‍රනාන්දු, *Sri Lanka Journal of International Law*, 16 වන වෙළුම, 2004, නීති පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, එමෙන්ම LST Review, 15 වන වෙළුම, 211 කලාපය, 2005 මැයි, පි. 15.

99 *ලීඩා වයලට් සහ තවත් අය එ. විදානපතිරණ, ස්ථානාධිපති පොලිසිය දික්වැල්ල සහ තවත් අය,* [1994] LKCA 45; [1994] 3 SLR 377, (1994 නොවැම්බර් 16), (එවකට) විනිසුරු සරත් නන්ද සිල්වා විසින්, හබයාස් කෝපුස් රිට් ආඥාවන් සම්බන්ධයෙන් පොදු නීතිය වර්ධනය කිරීම සඳහා අනුනයනයක් ලෙස එක්සත් ජාතීන්ගේ කමිටුවේ අදහස් සලකා බලන ලදී.

පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9 වන වගන්තිය සිය මතයට ආධාරකයක් ලෙස උපුටා දක්වනු ලැබින[100] මැදිවක එ. දිසානායක[101] හිදී නිදහස්, සමාන සහ රහස් ඡන්දයක් සහතික කරන ආකාරයෙන් පළාත් සභා ඡන්ද විමසීමකදී ඡන්දය භාවිතා කිරීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 25 වන වගන්තිය යොදාගන්නා ලදී. ඡන්දය දීමේ අයිතියේ තනි හා ද්විත්ව යන පැතිකඩ දෙකම මෙහිදී අවධාරණය කෙරිනි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 25 වන වගන්තිය පිළිබඳ මීට සමාන උදෘතයක් *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එ දිසානායක*[102] නඩුවේදීද දැකගත හැකිවිය. *සිල්වා එ. ඉද්දමල්ගොඩ*[103] හිදී වධ හිංසා සහ අනෙකුත් කෲර අමානුෂික හෝ අයුතු සැලකීම හෝ දඬුවම්වලට එරෙහි ප්‍රඥප්තියේ[104] 14.1 වගන්තිය ආධාර කරගනිමින් නීතිය ජාත්‍යන්තර බැඳීම් සහ ප්‍රමිතීන් සමඟ සමපාත වෙමින් ගොදුර බවට පත්වූ තැනැත්තාගේ වැන්දඹුව ලෙස පෙත්සම්කාරියට සහ බාලවයස්කාර දරුවාට වන්දි ලබාගැනීම සඳහා නඩු පැවරීමේ අයිතිය පිළිගන්නා ලදී.

වැවලගේ රාණි ප්‍රනාන්දු (මියගිය ලමාහේවගේ ලාල් යන අයගේ බිරිඳ) සහ තවත් අය එ. ස්ථානාධිපති, සුළු වැරදි, සීදූව පොලිස් ස්ථානය, සීදූව සහ තවත් අය[105] හිදී බන්ධනාගාර නිලධාරීන් විසින් මියගිය තැනැත්තාට කෲර ලෙස සැලකීම පිළිබඳව දෝෂාරෝපණය කරමින් අධිකරණය දැඩි ලෙසම කියාසිටියේ බන්ධනාගාර පනතේ අන්තර්ගත දේශීය නීතිය පමණක් නොව බන්ධනාගාර රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අදාල වන ජාත්‍යන්තර සම්මුතීන් සහ ප්‍රකාශනයන්හි ප්‍රතිපාදනයන්හි

---

100 *සිරිසේන එ. පෙරේරා*, [1991] 2 SLR 97.

101 [2001] 1 SLR 177.

102 SC 26/2002, SCM 27/5/2003. නඩු තීන්දුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 25 වන වගන්තිය උපුටා දක්වන්නේ වැරදීමකිනි.

103 [2003] 2SLR 63.

104 වධ හිංසාවන්ට එරෙහි ප්‍රඥප්තියට 1994 ජනවාරි 3 වන දින ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී. එහි සමහර ප්‍රතිපාදනයන් දේශීය නීතිය තුළට අන්තර්ග්‍රහණය කරමින් 1994 අංක 22 දරන පනත ඉදිරිපත් කරනු ලැබිනි. කෙසේනමුත් ගොදුර බවට පත්වූ තැනැත්තකුගේ හෝ විත්තිකරුවකුගේ වන්දි සඳහා ඇති හිමිකම පිළිබඳ ප්‍රතිපාදනයක් 1994 අංක 22 දරන පනත තුළ අන්තර්ගත නොවේ. මෙම නඩුවේදී අධිකරණය විශ්වාසය තබා තිබුණේ දේශීය නීතියට වඩා මුල් ප්‍රඥප්තියේ ඒ පිළිබඳව වන වගන්තිය වෙතය.

105 SC(FR) No 700/2002, SCM 26/07/2004.

දැක්මද අදාල වන බවයි[106]. ෂාහුල් හමීඩ් නිලාම් සහ තවත් අය එ. කේ උඩුගම්පොල සහ තවත් අය[107] හිදී වධ හිංසාවෙන් නිදහස පිළිබඳ අයිතිවාසිකම කඩවී ඇති බව ප්‍රකාශ කරමින් විනිසුරුවරුන් දක්වා සිටියේ අයිතිවාසිකම් කඩවීමක් ඔප්පුකිරීම සඳහා බරපතල මානසික පීඩාව මෙම මූලධර්මය සම්බන්ධයෙන් වන ඔප්පුකිරීමකදී ප්‍රමාණවත් වන බවයි. දේශීය, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර පූර්වාදර්ශයන්ද උපුටා දක්වනු ලැබින[108].

ශ්‍රී ලංකා අධිකරණය විසින් ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳව සඳහන් කිරීම ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සම්බන්ධයෙන්ද අදාළ වෙයි. උදාහරණයක් ලෙස *ෆර්වින් එ. විජේසිරි, විභාග කොමසාරිස් සහ තවත් අය*[109] හිදී ශ්‍රේෂ්ඨාධිකරණය අන්තර්ජාතික ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 13 වන වගන්තියේ දක්වා ඇති උසස් අධ්‍යාපනයට ඇති අයිතිය මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(ඌ) ව්‍යවස්ථාවෙන් දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිපත්තියේ අරමුණක් ලෙසද එය අර්ථනිරූපණය කරමින් අවධාරණය කළේ විභාගයේ අවංකභාවය සුරක්ෂිත වන පරිද්දෙන් ප්‍රමාණවත් ආරක්ෂිත පියවර අනුගමනය කරමින් විභාග පැවැත්වීම විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වගකීමක් වන බවයි. එය තහවුරු කිරීම සඳහා උත්තරපත්‍ර වෙනස්කිරීම් නොවන බවට සහතිකවීම සහ බරපතල අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පූර්ණ සහ විවෘත පරීක්ෂණ පැවැත්වීම මේ අනුව අවශ්‍ය බවද ප්‍රකාශ කෙරින.

---

106 තෝමස් එ. ජැමෙයිකා (නිවේදන අංක 266/1989, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ අදහස්, 1993 නොවැම්බර් 2). මෙහිදී අධිකරණය 1988 දෙසැම්බර් 9 වන දින මහා සභා රැස්වීමේ 43/174 දරන යෝජනා සම්මතයද, 1957 ජූලි 31 දින දරන 663 C(XXIV) යෝජනා සම්මතය සහ 1977 මැයි 13 දින දරන 2076 (LXII) යෝජනා සම්මතය මඟින් ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ එක්සත් ජාතීන්ගේ මහා සභාව විසින් අපරාධ සහ චූදිතයන්ට සැලකීම පිළිබඳ 1955 දී සම්මත කළ ජිනීවා ප්‍රඥප්තියද සැලකිල්ලට ලක්කරන ලදී.

107 SC(FR) 68/2002, 73/202, 74/2002, 75/2002, 76/2002, SCM 29.01.2004.

108 මානව හිමිකම් පිළිබඳ යුරෝපීය අධිකරණයේ අධිකරණ බලය පිළිබඳව මෙහිදී සලකා බලනු ලැබින. විශේෂයෙන්ම ටයිරර් එ. එක්සත් රාජධානිය (1978, 2 EHHR, 1), ග්‍රීක් නඩුව (127 B (1969), කැම්බල් සහ කෝසන්ස් එ. එක්සත් රාජධානිය (Case law of the EUCT, Vol. 1, pg 170).

109 *වික්‍රමසිංහ එ. ද සිල්වා* (SC 551/98, SCM 31.8.2001) හිදී සහ *හේවගේ එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව* (SC 627/2002, SCM 8.8.2003) හිදීද මෙම උපුටා දැක්වීමම සිදු කරනු ලැබින.

සිංගරාසා නඩුවේදී ප්‍රශ්නය වූයේ අධිකරණය විසින් හුදෙක් පාපොච්චාරණයක් යොදාගනිමින් ලබාගෙන තිබූ දණ්ඩනය තහවුරු කිරීම නැවත විමර්ශනය කිරීම සඳහා අධිකරණය විසින් සිය ප්‍රතිශෝධන බලතල භාවිතා කිරීම සාධාරණ වේද යන්නයි. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් පිළිබඳ අධිකරණයේ පූර්ව උදෘතයන් අනුව යමින් මෙම සිද්ධිය පිළිබඳ කමිටුවේ අදහස් අනුනයන අධිකාරයක් ලෙස සැලකිය හැකි බවට තර්ක කෙරිනි. කමිටුවේ අදහස් දැක්වීම් හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය විසින් සහනයක් ලබාදීමට බලකලයුතු බවට තර්කයක් මෙහිදී ඉදිරිපත් නොවුනි. මේ දෙක අතුරින් වඩා වැදගත් කුමක්ද යන පැනය සිංගරාසා නඩුව තුල පිළිඹිබු නොවන්නකි.

ඇ) 'ජාතීන් අතර කටයුතුවලදී ජාත්‍යන්තර නීතිය සහ ගිවිසගත් බැඳීම් කෙරෙහි ගෞරවය ඇති කිරීමට උත්සාහ කිරීමේ' රාජ්‍යයේ වගකීම කෙරෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(15) ව්‍යවස්ථාවේ බලපෑම

27(15) ව්‍යවස්ථාවේ බලපෑම (සිංගරාසා නඩු තීන්දුවේදී මෙම ව්‍යවස්ථාවට කිසිදු අයුරක වැදගත්කමක් ලබාදී නොමැත) ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් දේශීයව බලාත්මක කිරීම සම්බන්ධයෙන් වන පූර්ව අධිකරණ නඩු තීන්දුවලදී ප්‍රකාශයට පත්ව ඇත. මේ අනුව,

> මෙම අධිකරණය ප්‍රඥප්තියේ (එනම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය) ප්‍රතිපාදනයන් සැලකිල්ලට ගතයුතුද? මා සිතන්නේ එසේ කළයුතු බවයි. 27(15) ව්‍යවස්ථාව (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ) ජාතීන් අතර කටයුතුවලදී ජාත්‍යන්තර නීතිය සහ ගිවිසගත් බැඳීම් කෙරෙහි ගෞරවය ඇතිකිරීමට උත්සාහ කළයුතු බව දක්වා සිටියි. එයින් කියැවෙන්නේ රාජ්‍යය ජාත්‍යන්තර නීතියට සහ තමන් අත්සන්කොට ඇති සම්මුතීන්ගේ බැඳීම්වලට ගරුකළ යුතු බවය.

> ජාත්‍යන්තර නීතිය විසින් හඳුනාගනු ලබන සුරක්ෂිතයන්ගේ ප්‍රතිලාභය රාජ්‍ය විසින් ඔවුන් වෙත සැලසිය යුතුවේ[110].

මෙම මූලධර්මයන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සන්දර්භය තුළ විනිශ්චයක විෂයක් නොවූවද රටේ නෛතික ප්‍රතිපත්තිය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි. 27(1) ව්‍යවස්ථාවේ මෙසේ දක්වේ.

> මෙහි ඇතුළත් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්මයන් ධර්මිෂ්ට නිවහල් සමාජයක් ඇතිකිරීම සඳහා නීති පැනවීමේදීද, ශ්‍රී ලංකාවේ රාජ්‍යානුශාසනයේදීද, පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ගුරුකොට ගනු ලබන්නේය.

පළාත් සභා පනත් කෙටුම්පත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධන පනත් කෙටුම්පතෙහි[111] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවේදී අගවිනිසුරු සරත් නන්ද සිල්වා පහත ප්‍රකාශය සිදු කරන ලදී.

> රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන් අධිකරණයකදී බලාත්මක කළ නොහැකිය යන්න සත්‍යයක් වන නමුත් එකී අඩුලුහුඬුතාවය හේතුකොටගෙන ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩුවක ඉලක්කයන් ප්‍රක්ෂේපනය කරන්නක් ලෙසින් ඒවායේ ඇති වටිනාකම පහත නොවැටේ. මෙහෙයවීමේ මූලධර්මයන් ව්‍යවස්ථාදායකය විසින් ක්‍රියාවට නැංවිය යුතුවෙයි. අපගේ දැක්මේ හැටියට මෙම පනත් කෙටුම්පත් දෙක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් අරමුණු කොටගත් ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ගොඩනැංවීම දෙසට වන පියවරයන්ය[112].

---

110 *වීරවංශ එ. නීතිපති සහ තවත් අය* [2000] LKSC 27; (2000) 1 SLR. 387 (2000 ජූනි 26), විනිසුරු එම්.ඩී.එච්. ප්‍රනාන්දු විසිනි. එමෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සන්දර්භය තුල රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ විධානාත්මක මූලධර්මයන් සඳහා *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එ. දිසානායක* (SC 26/2002, SCM 27/5/2003), ඡන්දය දීමේ අයිතිය තහවුරු කරමින් 25 වන ව්‍යවස්ථාව, විනිසුරු එම්ඩීඑච් ප්‍රනාන්දු විසිනි.

111 [1987] 2 SLR 312, p. 326.

112 ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මීට සමාන ස්ථාවරයක් ප්‍රකාශ කළ අවස්ථාවන් සඳහා බලන්න, *මෛත්‍රීපාල සිරිසේන සහ තවත් අය එ. මහින්දසෝම සහ තවත් අය*, ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා අංක 41/96, 96.12.14 දින කාර්ය සටහන්, නඩු තීන්දුවේ 13-14 පිටු (වාර්තාගත නොවූ).

අවසානය

2006 වසර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් පමණක් නොව 'ජාතීන් අතර කටයුතු සම්බන්ධයෙන් අදාළ වන ජාත්‍යන්තර නීතිය සහ ගිවිසුම්මය වගකීම්' සඳහා අවසරය ලබාදෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(15) ව්‍යවස්ථාව මඟින් නියමකොට ඇති නියාමනයන් අපට මතක් කරදෙන අවස්ථාවන් එකකට වඩා වැඩි වාර ගණනක් ළඟාකරදුන් කාල පරිච්ඡේදයක් විය. එකී නීති සහ සම්මතයන්ට අප ගරුකළයුතු වන්නේ කවර ආකාරයකින්ද? බොහෝවිට ජාතීන්ගේ ප්‍රජාව බැඳතබන නීතියේ සමස්තය ලෙස හඳුන්වනු ලබන මෙම සම්මතයන්ගේ අරමුණට පටහැනිව අප කටයුතු කර ඇතිද? ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන්ට සහ ඒවායේ ප්‍රොටෝකෝලයන්ට ශ්‍රී ලංකාව අත්සන් කිරීමේ ප්‍රායෝගික බලපෑම කුමක්ද? සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ප්‍රොටෝකෝලය පමණක් නොව කාන්තාවන්ට එරෙහිව සියළුම ආකාරයන්ගේ වෙනස්කොට සැලකීම් ඉවත්කිරීම පිළිබඳ සම්මුතියේ අනිවාර්ය නොවන ප්‍රොටෝකෝලය සම්බන්ධයෙන් වන අසීරු ගැටළු බවට මේවා පත්ව ඇත. වධ හිංසාවන්ට එරෙහි සම්මුතියේ ප්‍රොටෝකෝලයට අත්සන් කරන ලෙසට රජයට බලකරනු වස් ක්‍රියාකාරීන් විසින් ක්‍රියාවට නංවන ලද ව්‍යාපාරයන්ද විමර්ශනයට ලක්කෙරුනු වසර තුළදී අතරමඟ නැවතී තිබින.

මේ අතර ගොනුකරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් සංඛ්‍යාවේ මෙන්ම ඉතා වැදගත් අයිතිවාසිකමක් වන කෲර හා අමානුෂික වධ හිංසාවන්ගෙන් නිදහස සම්බන්ධ අධිකරණ බලයද පහල වැටීම ඉතා පැහැදිලි ලෙසම කණගාටුදායක වෙයි. මෙය අනූව දශකයේ මැද සහ අවසන් භාගයේ පැවැති ශක්තිමත් අධිකරණමය ක්‍රියාමාර්ගයන්ට පටහැනි වූවක් වෙයි. දේශීය විෂයපථය තුළ අවසන් විනිශ්චයකය ලෙස අධිකරණයේ භූමිකාව පිළිබඳව සැලකීමේදී මෙය සැලකියයුතු මහජන අවධානයට ලක්විය යුතු ගැටළුවක් බව නොකිවමනාය.

3

අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන් සහ සිවිල් ජනතාවගේ රැකවරණය

*භවානි ෆොන්සේකා**

1. හැඳින්වීම

2005 වසරේ දෙසැම්බර් මාසයේ සිට උතුරේ සහ නැගෙනහිර එදිරිවාදිකම්වල වැඩිවීමත් සමඟ සිවිල් වැසියන්ගේ හා ප්‍රජාවගේ ආරක්ෂාව කෙරෙහි තර්ජනයන් ඇතිවී ඇත. ශ්‍රී ලංකාවේ බොහොමයක් ප්‍රදේශයන්හි ඝාතන, අතුරුදහන්වීම්, පැහැරගෙනයාම්, තර්ජනයකිරීම් වර්ධනය වී ඇති අතර මෙයින් අතිමහත් බහුතරය උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්ගෙන් වාර්තා වෙයි. වර්ධනය වෙමින් පවතින එදිරිවාදිකම් සහ ආරක්ෂාව පිළිබඳව වන තර්ජනයන් විසින් සිවිල් පුරවැසියන් අතර අස්ථාවරත්වය, බිය සහ ආතතිය ජනිත කොට ඇති අතර 2006 අප්‍රේල් මාසයේ ත්‍රිකුණාමලයේ සිදුවූ සිදුවීම්වලදී ප්‍රජාවන් අතර ජනවාර්ගික ධ්‍රැවීකරණය මනාව පිළිඹිබු විය. මෙවන්වූ සන්දර්භයක සිය නිවහන් සහ ගම්බිම් හැරදා දිස්ත්‍රික්කය තුලම පිහිටි හෝ වෙනත් දිස්ත්‍රික්කයන්හි පිහිටි ආරක්ෂිත යැයි හැඟෙන ප්‍රදේශයන් කරා සිවිල් වැසියන් හා ප්‍රජාවගේ සංක්‍රමණය සිදුවිය. තවත් සමහරෙක් දකුණු ඉන්දියාවේ සරණාගතයින් ලෙස සිය ආරක්ෂාව සලසාගෙන ඇත්තාහ. 2006 වසරේදී සැලකියයුතු සරණාගතයින් පිරිසක් ඉන්දියාව වෙත ළඟාවූහ. මෙම පරිච්ඡේදයේදී

---

* ජ්‍යෙෂ්ඨ පර්යේෂිකා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2006 වසරේ ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා වන කාල රාමුව තුළ අවතැන්වීමේ ප්‍රවණතාවයන් සහ අවතැන්වීම සහ මානුෂීය තත්ත්වයට අදාල වන්නාවූ මූලික කාරණාවන් සැලකිල්ලට ලක්කරනු ලබයි.

2. අවතැන්වීමේ ගතිකයන්

අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන් පිළිබඳ නිර්වචනය

ජාත්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්මයන්ට අනුව"අවි ගැටුම්, සාමාන්‍යකරණය වූ ප්‍රචණ්ඩ තත්ත්වයන්, මානව හිමිකම් කඩවීම හෝ ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද්දාවූ ආපදාවන් හේතුකොටගෙන ස්වකීය නිවාස හෝ නිත්‍ය පදිංචි ස්ථානයන්ගෙන් පලායාමට තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම්වලට සිදුවීම හෝ එසේ කිරීමට බලකරනු ලැබ සහ එසේ පලායන තැනැත්තන් ජාත්‍යන්තරව පිළිගත් රාජ්‍ය මායිම්වලින් එතෙර නොවී සිටින විට එකී තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම්"[1] අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන් යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලාංකීය සන්දර්භය

මිනිසා විසින් නිර්මාණය කළ ආපදාවන් මෙන්ම ස්වාභාවික ආපදාවන්ද ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන්වීම් සඳහා දායක වී ඇත. වාර්තාවන්ගෙන් දැක්වෙන්නේ දිවයින තුළ කාලයක් තිස්සේ පවත්නා ගැටුම් හේතුකොටගෙන සිවිල් වැසියන් 800,000 ක පමණ පිරිසක් අවතැන්ව ඇති බවය.[2] 2002 වසරේදී සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමත් සමඟ බොහොමයක් අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා සරණාගතයින්ට දිවයිනේ උතුරේ සහ නැගෙනහිර පිහිටි සිය නිවාස කරා නැවත පැමිණීමට හැකිවූ අතර බොහෝ සහන, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් සහ නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතීන් රජය විසින් මෙන්ම දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන් විසින්ද ආරම්භ කරනු ලැබිණි. 2004 දෙසැම්බර් මාසයේදී සුනාමිය හේතුවෙන් 1,000,000 ක පමණ පිරිසක්

1 අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්මයන්, www.unhcr.ch

2 අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන්ගේ ඉඩම් හා දේපල අයිතිවාසිකම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2003

අවතැන්වූහ.[3] බොහොමයක් අභ්‍යන්තරිකව අවතැන්වූවෝ අවතැන්වීමේ අත්දැකීම කිහිප වතාවක්ම ලැබූවෝ වෙති.

2006 ජනවාරි මාසයෙන් පසුව සිදුවූ එදිරිවාදීත්වයන්ගේ වර්ධනය විසින් නව අවතැන්වූවන්ගේ රළවේගයන් නිර්මාණය කරන ලදී. කලින් උතුරේ සහ නැගෙනහිර පදිංචිව සිටි බොහොමයක් දෙනෙකුට රටේ සෙසු ප්‍රදේශයන්ට හෝ දකුණු ඉන්දියාවට පළායාමට සිදුවිය. එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසමේ 2006 ඔක්තෝබර් මස 11 වන දිනැති දත්තයන්ට අනුව 2006 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුල අභ්‍යන්තරිකව අවතැන්වූ පිරිස 207,564 කි.[4] එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසමට අනුව 2006 දෙසැම්බර් 18 වන විට නව අවතැන්වීම්හි (2006 අප්‍රේල් සිට) සංඛ්‍යාව 212,759 ක් විය. මෙම දත්තයන් අදාල දිස්ත්‍රික්කයන්හි උප දිසාපතිවරුන් විසින් ස්ථිර කරනු ලැබ ඇත.

අවාසනාවන්ත ලෙස මෙම සංඛ්‍යාවන්ගෙන් නිරූපණය වන්නේ රජයේ ලියාපදිංචි වූ අභ්‍යන්තරිකව අවතැන්වූවන් පමණකි. සිය පවුලේ සෙසු සාමාජිකයන් හා මිතුරන් සමඟ ජීවත්වන්නන්ද, නව ස්ථානයන්හි නිවාස කුලියට ගෙන ජීවත්වන්නන්ද, 'රාත්‍රී කාලයේ අභ්‍යන්තරිකව අවතැන්වන පිරිස්'[5] ලෙසින් හැඳින්වෙන රාත්‍රියේ රජයේ ගොඩනැගිලිවල හෝ පාසැල් ගොඩනැගිලිවල සෙවණ ලබන තැනැත්තන්ද මෙම නිල සංඛ්‍යාවන්ට ඇතුලත් නොවේ. සුභසාධන කඳවුරු ව්‍යුහයෙන් පිටත සමහර අභ්‍යන්තරිකව අවතැන්වූවන් ජීවත්වන්නේය යන කරුණ වඩාත් පිළිගැනීමට ලක්ව ඇති නමුත්, අභ්‍යන්තරිකව අවතැන්වූවන් සියල්ලන්ගේම අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කළහැකි විධිමත් ක්‍රියාවලියක් තවමත් නොමැත. අවතැන්වීමේ පවත්නා වේගවත් හා විවිධාකාර ස්වභාවය

3 පශ්චාත් සුනාමි ප්‍රතිසාධන සහ නැවත ගොඩනැඟීම, ශ්‍රී ලංකා රජය සහ සංවර්ධන සහායකයින් විසින් නිකුත් කරනු ලැබූ ඒකාබද්ධ වාර්තාව, දෙසැම්බර් 2005

4 එක් එක් ග්‍රාමසේවා වසමේ අභ්‍යන්තරිකව අවතැන්වූ තැනැත්තන් පිළිබඳ තොරතුරු අදාළ ග්‍රාම නිලධාරීවරුන් විසින් එක්රැස් කරනු ලබන අතර එකී තොරතුරු ඔවුන් විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ලබාදෙනු ලබයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් විසින් අභ්‍යන්තරිකව අවතැන්වූවන් පිළිබඳ තොරතුරු එක්රැස්කොට සංගෘහිත කොට තමන්ට අදාල උප දිසාපති කාර්යාලයන් වෙත යවනු ලබයි. මෙම අදියරේදී සියළුම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන් වෙතින් ලැබෙන තොරතුරු එක් එක් දිස්ත්‍රික්කයේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ සමස්ත තොරතුර නිරූපණය වන අයුරින් සංගෘහිත කරනු ලබයි. අනතුරුව එය අදාල අමාත්‍යවරුන් හා වෙනත් බලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

5 රාත්‍රී කාලයේ අභ්‍යන්තරිකව අවතැන්වන පිරිස් වන්නේ පොදු ගොඩනැගිලි සහ ආගමික ගොඩනැගිලිවල රාත්‍රිය පහන්කොට දිවා කාලයේ සිය නිවහන් කරා පැමිණෙන පිරිස්ය.

මෙන්ම සංචලනයේ අස්ථිරභාවයද හේතුවෙන් සමහර අවස්ථාවන්හිදී නිශ්චිත අභ්‍යන්තරිකව අවතැන්වූවන් කණ්ඩායම් ලියාපදිංචිකිරීම අසීරු වීම මෙයට එක්වී ඇති තවත් ගැටළුවකි.

පර්යේෂණය විසින් පෙන්වා දෙනු ලබන ආකාරයට අභ්‍යන්තරිකව අවතැන්වූවන් කවුරුන් විසින් සංයුක්ත කරනු ලබන්නේද, ආගන්තුක පවුලක් කුමකින් සංයුක්ත වන්නේද යන්න පිළිබඳ තේරුම්ගැනීමේ විවිධ මට්ටම් පවතී.[6] උදාහරණයක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ අභ්‍යන්තරිකව අවතැන්වූවෝ බොහොමයක් ප්‍රාදේශීය ප්‍රජාවන් තුලට අන්තර්ග්‍රහණය වී සිටින අතර තමන්ව අභ්‍යන්තරිකව අවතැන්වූවන් ලෙස හඳුන්වනු දැකීමට ඔවුහු අකමැති වෙති. මේ හේතුවෙන් ඔවුහු අභ්‍යන්තරිකව අවතැන්වූවන් ලෙස ලියාපදිංචි නොවෙති. මීට ප්‍රතිපක්ෂව තවමත් රජය හා වෙනත් ආයතනයන්ගේ ආධාර මත සම්පූර්ණයෙන්ම යැපෙමින් සුභසාධන කඳවුරුවල හෝ ආගන්තුක නිවාසයන්හි ජීවත්වන සමහර දීර්ඝ කාලීනව අභ්‍යන්තරිකව අවතැන්වූ පිරිස්ද වේ. අවතැන්වීම පිලිබඳ සංකල්පය තුල මෙවැනි විවිධත්වයක් පැවතීම මෙන්ම අභ්‍යන්තරිකව අවතැන්වූවන් තමන් පිළිබඳව දරන්නාවූ හැඟීම්ද ශ්‍රී ලංකාව වැනි රටක වාර්තාගත වන අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ සංඛ්‍යාවන් කෙරෙහි බලපෑම් ඇති කරයි.

අවතැන්වීමට බලපාන හේතු

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන්වීමට බලපාන හේතු විමර්ශනය කිරීමේදී පෙනීයන කරුණක් වන්නේ බොහොමයක් අවතැන්වීම්වලට හේතුව වී ඇත්තේ මානව ආරක්ෂාව සම්බන්ධයෙන් පැනනැගී ඇති සැබෑ ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා තර්ජනයන්ය. ගැටුම්වල බලපෑමට ඍජුවම ලක්වීම හේතුවෙන් තමන් ගැටුම්වලට මැදිවීමට සිදුවෙතැයි යන බිය නිසා ජනතාව සිය නිවාස අතහැර යති. යම් ප්‍රදේශයක් වෙත එල්ල වන අඛණ්ඩ ප්‍රහාරයන් මෙන්ම බහුවිධ සිදුවීම් නිර්මාණය කිරීමට හේතුවන්නාවූ තනි සිද්ධියක් පවා ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ වියවුල් සහගතභාවය වැඩිවර්ධනය කරනු ලබයි. ගුවන් මෙන්ම කාලතුවක්කු ප්‍රහාරයන්ද ඇතුළත් යුධ මෙහෙයුම් හේතුවෙන් උතුරේ හා නැගෙනහිර

6 භවානි ෆොන්සේකා, "A Profile on Internally Displaced Persons Living with Host Families", www.cpalanka.org

ගම්මානයන්හි සම්පූර්ණ ප්‍රජාවන්ම සිය නිවාස සහ ගම්බිම් අතහැර යාම ප්‍රතිඵල කරන ආකාරය අපගේ නිරීක්ෂණයට ලක්වූ සම්පූර්ණ කාලය පුරාවටම දැකගත හැකිවිය. වැඩිවර්ධනයවූ ජනවාර්ගික ආතතීන් මෙන්ම යුධ ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශයන්හි ජීවත්වන නානාවිධ ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන් අතරවූ ධ්‍රැවීකරණයන්ද ගම්බිම් අතහැරයාමේ තීරණයන්ට බලපාන සෙසු සාධකයෝ වෙත්.

බොහොමයක් සිය නිවාස, ගම්මාන, ජීවිකාවන් සහ දේපල අතහැර ඉතා සුළු සූදානම්වීමක් තුළ ගම්බිම් හැරගොස් ඇත්තේ නැවත පැමිණ තමන්ට හිමි දෑ ලබාගන්නා දිනයක් පිළිබඳව අදහසකින් තොරවය. සමහර අවස්ථාවන්හිදී පළායාමේදී මෙම අභ්‍යන්තරිකව අවතැන්වූවෝ සිය ජීවිත අවදානමට පවා මුහුණදී ඇත. දෙපාර්ශවය අතර වෙඩි හුවමාරුවලට ඔවුන් මැදිවූ අවස්ථාවන් පිළිබඳව වාර්තා වී ඇත. උදාහරණයක් ලෙස 2006 අගෝස්තු මාසයේදී මුතූර් සිට කන්තලේ දක්වා පළායමින් සිටි අභ්‍යන්තරිකව අවතැන්වූවෝ පිරිසක් අතරමගදී ෂෙල් ප්‍රහාරයකට ගොදුරු වූහ.[7] අභ්‍යන්තරිකව අවතැන්වූ මුස්ලිම්වරුන්ද තර්ජනයට ලක්ව ඇති අතර පළායාමේදී සමහරුන් අතුරුදන්ව ඇති බව ස්ථිර ලෙසින්ම පෙනීයයි. සිය නිවාස අතහැර ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශයන් කරාද, අනතුරුව මඩකලපුව දිස්ත්‍රික්කය වෙතද පළායාමට සිදුවූ සාම්පූර්හි වැසියන්ටද මීට සමාන අත්දැකීම්වලට මුහුණදීමට සිදුව ඇති ආකාරය දැකගත හැකිවිය.[8] 2006 දෙසැම්බර් මාසයේදී සහ 2007 ජනවාරි මාසයේදී වාකරෙයි සිට රජයේ පාලන ප්‍රදේශයන්ට පළා ආ දෙමළ සිවිල් වැසියන්ට පැමිණීමට සිදුවූයේ වනාන්තරයක් මැදිනි.[9] තවත් සමහරෙක් වාකරෙයි සිට පේසාලෙයි දක්වා බෝට්ටුවක් මගින් පළා ඒමට තීරණය කළ අතර බෝට්ටුව පෙරළීමෙන් කිහිපදෙනකුම මුහුදට වැටී දියේ ගිලීමෙන් සිදුවූ මරණ 5 ක් වාර්තා වි ඇත.[10] තවත් සමහර අවස්ථාවලදී යම් නිශ්චිත සිද්ධියකින් අනතුරුව මහා පරිමාණයේ අවතැන්වීම් දැකගත හැක. උදාහරණයක් ලෙස 2006 ජනවාරි මාසයේදී 61 දෙනකු මරණයට පත්කරමින් කැබිතිගොල්ලෑවේදී සිදුවූ

---

7 CPA, IMADR සහ INFORM, "කන්තලේ සහ සේරුනුවර වෙත සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවන් පිළිබඳ වාර්තාව", 2006 අගෝස්තු 25

8 මඩකලපුව වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවකදී රැස්කරගත් තොරතුරු, 2007 ජනවාරි

9 මඩකලපුව වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවකදී රැස්කරගත් තොරතුරු, 2007 ජනවාරි

10 CPA සහ IMADR, "Batticaloa Fact Finding Report," 2007 ජනවාරි, පි.4

ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව ප්‍රදේශයේ ප්‍රජාව මහා පරිමාණ වශයෙන් ප්‍රදේශය හැර ගියහ[11].

බහුවිධ අවතැන්වීම්

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගෙන් බොහොමයක් එක් වතාවකට වඩා අවතැන්වූවෝ වෙති. ඔවුහු යුධ ගැටුම් මෙන්ම සුනාමිය යන දෙකින්ම අවතැන්වීමට ලක්ව ඇත. මින් වැඩි පිරිසක් ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කයන්හි පදිංචිකරුවන්ය. උතුරේ හා නැගෙනහිර බොහොමයක් සිවිල් වැසියන් ස්වකීය ආරක්ෂාව පිළිබඳව මුහුණ දෙන්නාවූ තර්ජනයන් මෙකී බහුවිධ අවතැන්වීමේ තත්ත්වයන් විසින් නිරූපණය වෙයි. උදාහරණයක් ලෙස 2006 අප්‍රේල් මාසයේ සිට ක්ලේමෝ ප්‍රහාරයන්ට, වෙඩිතැබීම්වලට, ගුවන් හා කාලතුවක්කු ප්‍රහාරයන්ට මුහුණදීමට සිදුවූ ත්‍රිකුණාමල ප්‍රදේශයේ වැසියන් ස්වකීය ආරක්ෂාව සම්බන්ධයෙන් මුහුණ දෙන්නාවූ තර්ජනයන් වර්ධනය වී ඇත. මෙවැනි සිදුවීම් විසින් බොහෝ සිවිල් වැසියන්ට කිහිපවතාවක්ම සිය උන්හිටිතැන් අතහැර යාමට බලකරනු ලැබ ඇත. උදාහරණයක් ලෙස මුතූර් ප්‍රදේශයේ දෙමළ ජනතාවට 2006 මාර්තු/ අප්‍රේල් මාසවලදී ඊචලම්පත්තු දක්වා පළායාමට සිදුවූ අතර ප්‍රහාරයන් ඉදිරියට ගමන් කිරීමේදී ඔවුන්ට වාකරෙයි වෙතටද, අනතුරුව වාකරෙයි සිට මඩකලපුවේ රජයේ පාලන ප්‍රදේශ වෙතද පළායාමට සිදුවිය.[12] තවත් සමහරෙක් යුධ ගැටුම්වල වෙනස්වීම් අනුව ශ්‍රී ලංකාව තුළම කිහිප වතාවක්ම අවතැන්ව ඇත. මන්නාරම හා වවුනියා ප්‍රදේශවාසීහු මෙයට උදාහරණ වෙති. මින් සමහරෙක් සරණාගතයින් ලෙස ඉන්දියාවට පළාගොස්[13] නැවත පැමිණ සිට ශ්‍රී ලංකාවේ තත්ත්වය නැවත නරක අතට හැරෙන විට නැවත වතාවක් ඉන්දියාවට පළාගොස් ඇත.

වර්ධනය වන එදිරිවාදිකම්, බිය සහ අනාරක්ෂිතභාවය පිළිබඳ හැඟීම විසින් ප්‍රතිඵල කරනු ලැබ ඇත්තේ අවතැන්වීම පමණක් නොවේ. උතුරේ, නැගෙනහිර හා ඒ අවට ප්‍රදේශයන්හි සියලු ප්‍රජාවන්හි එදිනෙදා ජීවිතය සහ ජීවිකාවන්ටද එය බලපෑම් ඇතිකොට ඇත. භාණ්ඩ හා සේවාවන්

---

11 AFHRD, CPA, INFORM සහ මායිම ගම්මානයන්හි ජීවිතයට ඇති හිමිකම සඳහා වන පුරවැසි කොමිසම, "තොරතුරු සොයාබැලීම සඳහා වූ දූතගමන" 2006 ජූනි 18, පි. 2

12 UTHR (J), තොරතුරු බුලටිනය : 45 - "Sri Lanka's Humanitarian Crisis or the Crisis of a Majoritarian Policy ?", 2007 මාර්තු 27

13 CPA, "War, Peace and Governance: Overview and Trends 2006", www.cpalanka.org

ප්‍රවාහනයට පනවා ඇති සීමාකිරීම්ද ඇතුලත්ව සංචලනය කෙරෙහි පනවා ඇති සීමාවන් හේතුවෙන් ඇතිවී ඇති පොහොර, ට්‍රැක්ටර් හා ධීවර එන්ජින් සඳහා අමතර කොටස් සහ ඉන්ධන හිඟය ධීවර කර්මාන්තය, ගොවිතැන වැනි ජීවිකාවන් කෙරෙහි බලපා ඇත. මෙම තත්වය අත්‍යාවශ්‍ය භාණ්ඩයන්හි මිළ ගණන් ඉහළ යාමට මෙන්ම භාණ්ඩ හා පුහුණු ශ්‍රමික හිඟයක්ද ඇතිවීමට බලපා ඇත. A-9 වැනි LTTE පාලන ප්‍රදේශ වෙත දිවෙන මාර්ගයන් වසා දැමීමද අවහිරතාවයන් උත්සන්න කිරීමට හේතුවී ඇත. මෙහි අතිශය බැරෑරුම් ප්‍රතිඵලය වන්නේ බොහොමයක් දුප්පත් පවුල් තමන්ගේ එදිනෙදා ආහාර වේල ලබාගැනීම අතිශය අසීරු තත්ත්වයකට පත්කරලනු ලැබීමයි. මන්දපෝෂණය පිළිබඳ වාර්තාවන් සහ මෙම ප්‍රදේශයන්හි වැඩිවන දුගීභාවය පිළිබඳ වාර්තාවන් වැඩිවෙමින් පවතින අතර "කුසගින්න" හේතුවෙන් සිදුවූ මරණයක්ද ජනමාධ්‍ය විසින් වාර්තාකොට ඇත.[14] LTTE පාලන ප්‍රදේශ වෙත මානුෂවාදී ආධාර දෙන ආයතනයන්ට ඇතුල්වීමට ඇති සීමාකිරීම් මෙම ප්‍රදේශවල වෙසෙන අත්‍යාවශ්‍ය සහන හා මානුෂවාදී සහනාධාර ලැබිය යුතු සිවිල් වැසියන් හා අභ්‍යන්තරිකව අවතැන්වූවන් මුහුණ දෙන තවත් බාධකයකි. එදිරිවාදිකම්වල අවසානයක් නොපෙනෙන එනයින්ම ඉදිරි අනාගත චිත්‍රණයද සුභදායක නොවන තත්ත්වයක සිවිල් වැසියන්ට හා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට එහි ප්‍රධානතම පීඩාවන් දරා සිටීමට සිදුව ඇත.

3. ජාතික රාමුව

නීති සහ ප්‍රතිපත්ති

අභ්‍යන්තරිකව අවතැන්වූවන් හෝ මානුෂවාදී ආධාර ඉල්ලා සිටින තත්ත්වයක සිර වී සිටින සිවිල් වැසියන් සම්බන්ධයෙන් වන විශේෂිත නෛතික ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකාව සතු නොවේ. සාම්ප්‍රදායිකව ගංවතුර හෝ සුළි සුළං තත්ත්වයන් වැනි ස්වාභාවික උපද්‍රවයන් හේතුවෙන් සිදුවන තාවකාලික අවතැන්වීම් තත්ත්වයන්ට මුහුණපාන්නාවූ පිරිස් වෙත සහන සැලසීම සඳහා වන ක්‍රමවේදයක් හා ඒ සඳහා වෙන්කෙරුනු අරමුදලක් සාම්ප්‍රදායිකව සමාජ සුභසාධන අමාත්‍යාංශය සතුව පවතී. දීර්ඝ කාලයක්

14 රොයිටර්ස් "Man starves death in Jaffna, first on record," 2006 නොවැම්බර් 16 (එම තැනැත්තා මියගියේ ආහාර හිඟය නිසාවෙන් නොවන බවට වන ප්‍රතිතර්කයන්ද ඉදිරිපත්ව ඇත)

තිස්සේ පවත්නා ගැටුම්කාරී තත්ත්වයක් තිබියදී පවා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට ආධාර සහ සහන සැලසීම සඳහාවූ ප්‍රතිපත්ති හා ආයතන නිර්මාණය වී ඇත්තේ කිහිපයක් පමණකි. පුද්ගලයින්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය (REPPIA)[15] උතුරේ නැවත පදිංචිකිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය (RRAN)[16] මේ කිහිපය අතර වේ. 2002 වසරේ අත්සන් තැබුනු සටන් විරාම ගිවිසුම ක්ෂණික මානුෂික අවශ්‍යතා සඳහාවූ අනුකාරකසභාව (SIRHN) වැනි ආයතන ගණනාවක්ම සාම ක්‍රියාවලිය තුළදී නිර්මාණය කිරීමට මග පෑදීය. 2004 දෙසැම්බර් මාසයේ දිවයින වටා වෙරළ තීරයේ ජනතාවට බලපෑම් කරමින් ඇතිවූ සුනාමිය පවා අභ්‍යන්තරිකව අවතැන්වීම් පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්තියක් සහ නෛතික අවධානයක් යොමුකරවීමට සමත් නොවුනි.

සමාන රැකවරණය, යාමේ ඒමේ නිදහස, තමන්ට අභිමත ස්ථානයක වාසය කිරීමේ අයිතිය, ප්‍රකාශනයේ නිදහස, කෲර, අමානුෂික වධහිංසාවලින් නිදහසද ඇතුළත් සියළු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන මූලික අයිතිවාසිකම් ඇතුළත් පරිච්ඡේදයක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත වේ. ජාතික ආරක්ෂාව, මහජන පර්යාය සහ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා යම් යම් අවස්ථාවන්හිදී මෙම අයිතිවාසිකම් සීමාකිරීමට මහජන ආරක්ෂක පනත යටතේ ජනාධිපතිවරයාට බලය ඇත. එවැනි අවස්ථාවක 'මහජන ආරක්ෂාව සහ මහජන පර්යාය ආරක්ෂා කිරීම' සඳහා එසේ කිරීම අත්‍යාවශ්‍ය වන්නේ යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් ඔහු/ ඇය විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කොට හදිසි අවස්ථා රෙගුලාසි අනුව කටයුතු කළ හැකිය. 2005 වසරේ අගෝස්තු මාසයේදී විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් මහතා ඝාතනය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුල හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කෙරිණි. එතැන් සිට බලපවත්වනු ලැබූ හදිසි නීති රෙගුලාසි මාසිකව යාවත්කාලීන කරනු ලැබීම සිදුවිය. අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ මෙන්ම සිවිල් ජනතාවගේද අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නාවූ හදිසි අවස්ථා රෙගුලාසි කිහිපයක්ම වෙයි. මුරකපොලු සහ සෝදිසි මෙහෙයුම් සිදුකිරීමට රඳවා

15 1987 අංක 29 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලදී

16 RRAN පිහිටුවනු ලැබුයේ විශේෂ ගැසට් නිවේදනයක් මගින් 1995 දීය. උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහ එනම් යාපනය, මුලතිවු, කිළිනොච්චි, මන්නාරම සහ වවුනියාව එමගින් ආවරණය කෙරුණු අතර දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක 20 තවදුරටත් REPPIA යටතේ පැවතුනි.

තබාගැනීම් හා අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවන්ට වැඩි බලයක් ලබාදෙන ප්‍රතිපාදනයන් ආදිය මේ අතර වෙයි.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR) සහ ජිනීවා ප්‍රඥප්තිය ඇතුළු මානව හිමිකම් හා මානුෂවාදී කාරණාවන් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මුතීන් හා ප්‍රඥප්තීන් ගණනාවකට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. මීට අමතරව අභ්‍යන්තරික අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්මයන් සහ සරණාගතයින් හා අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහා වන නිවාස හා ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධයෙන් වන මූලධර්මයන්ද ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇත. ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර නීතියේ පිළිගැනීම සිංගරාසා[17] නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රශ්නකොට ඇති නමුත් ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියේ අඩංගු මූලික මූලධර්මයන් ශ්‍රී ලාංකීය සන්දර්භය තුල අපරානුමත කිරීමක් හෝ ප්‍රතිග්‍රහණය කිරීමකින් තොරවම පිළිගැනීම මෙරට පිලිගත් පරිචයකි.

අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ අයිතිවාසිකම් මත පදනම්වූ විශේෂිත ජාත්‍යන්තර ගිවිසුමක් නොමැත්තේ වී නමුත් පොදුවේ පිළිගත් කරුණක් වන්නේ ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂවාදී නීතිය අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පුළුල් රාමුවක් සපයනු ඇති බවයි. ජිනීවා සම්මුතීන් සහ අතිරේක ප්‍රොටෝකෝලයන් ගැටුම් අතරවාරයේ

17 2006 සැප්තැම්බර් 16 වන දින අගවිනිසුරුවරයා ප්‍රධානත්වය දරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මණ්ඩලය ප්‍රකාශකර සිටියේ ශ්‍රී ලංකා ආණ්ඩුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටොකෝලයට එකඟතාවය දක්වීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බවයි. මෙහිදී පෙත්සම්කරුවූ නල්ලරත්නම් සිංගරාසා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරමින් කියා සිටියේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2000 අංක 1033 දරන නිවේදනය ප්‍රකාරව ස්ථාපිත කරනු ලැබූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් 1995 වසරේදී තමන්ව අත්අඩංගුවට ගැනීම, නඩු පැවරීම සහ වරදකරු කිරීම යන ක්‍රියාවන් මගින් ශ්‍රී ලංකා රාජ්‍යය තමාගේ මානව අයිතිවාසිකම් කඩකොට ඇති බවට ලබාදුන් නිගමනය අධිකරණය සතු නෛසර්ගික බලය උපයෝගී කරගනිමින් බලාත්මක කරන ලෙසය. අධිකරණයේ මතය වූයේ සම්මුතිය පිළිගැනීම මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන බැවින් එම තීරණය වලංගු එකක් නොවන බවය. අධිකරණය කියා සිටියේ ගිවිසුම මඟින් නීති සෑදීමේ බලයේ එක් අරමුණක් වන මහජන නීති සෑදීමේ බලය ඒ වෙත පවරාගැනීම පාර්ලිමේන්තුව හා ජනමත විචාරණයකදී ජනතාව විසින් තීරණය කළ යුත්තක් වන බවයි. අධිකරණය තවදුරටත් කියාසිටියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය මඟින් 'අධිකරණ බලය' කමිටුව වෙත පවරාගැනීම 'ජනතාවගේ අධිකරණ පරමාධිපත්‍යය' අන්තර්ගත වන්නාවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 ව්‍යවස්ථාවන් කඩකිරීමක් වන බවයි.

සිවිල් වැසියන්ගේ මානුෂවාදී, වෛද්‍ය හා ආගමික ක්‍රියාධරයින්ගේ ආරක්ෂාව පිළිබඳ පදනමක් සපයනු ලබන අතර සාම කලාපයන් හා මානුෂවාදී මංතීරු ස්ථාපිත කිරීමද ඇතුළත්ව අසීරු තත්ත්වයන් යටතේදී ඔවුන්ගේ අඛණ්ඩ බාධා රහිත ක්‍රියාකාරීත්වය සඳහා රාමුවක් සපයනු ලබයි. තවද සාම්ප්‍රදායික ජාත්‍යන්තර නෛතික සම්මතයන්ද අනතුරුවලට භාජනය වියහැකි පිරිස් වෙත හා මානුෂවාදී මැදිහත්වීම්වල නිරතව සිටින ක්‍රියාධරයින්ගේ ආරක්ෂාව සැලසිය යුතු බවට පිළිගෙන ඇත. අභ්‍යන්තරිකව අවතැන්වීම පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්මයන් විශේෂිත අවශ්‍යතා ඇති කණ්ඩායම් එනම්; කුඩා දරුවන්, විශේෂිතවම භාරකරුවන් නොමැති බාලවයස්කරුවන්, ගර්භනී මව්වරුන්, කුඩා දරුවන් සිටින මව්වරුන්, ගෘහමූලිකයින් වන කාන්තාවන්, ආබාධිතයින් හා වැඩිහිටි තැනැත්තන් විශේෂකොට හඳුනාගනු ලබයි.

ජාත්‍යන්තර හා ජාතික සම්මතයන්ට අනුව සෑම අයෙකුටම එක හා සමාන ලෙස සැලකිය යුතු බවටත් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ද ඇතුලත්ව එක් විශේෂිත කණ්ඩායමකට වෙනස්කොට සැලකීම නොකළයුතු බවටත් පිළිගැනේ. ජාත්‍යන්තර සම්මතයන් සමාන ලෙස සැලකීම සලසනවා පමණක් නොව තවත් පියවරක් ඉදිරියට යමින් කාන්තාවන් හා ළමුන්ද ඇතුලත්ව විශේෂිතව අවධානයට ලක්විය යුතු පිරිස් ප්‍රවර්ගගත කරයි. ප්‍රතිමානක මට්ටමේදී එකී ප්‍රමිතීන් සහ සම්මතයන් පිළිගැනීමෙන් ඔබ්බට යමින් ඒවා ක්‍රියාවට නැංවීම සහ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම, වර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහතික කරනුවස් ප්‍රතිපත්තීන් සහ පරිචයන් තුලට ඒවා අන්තර්ග්‍රහණය කිරීම කළ යුතුය.

ව්‍යුහයන්

ශ්‍රී ලංකා රජයේ මානව හිමිකම් සහ මානුෂවාදී කරුණු සම්බන්ධ ප්‍රධාන ක්‍රියාධරයා වන්නේ ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ අමාත්‍යවරයාය. සහන සැලසීම, නැවත පදිංචිකිරීම සහ නැවත ගොඩනැංවීමේ කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් වැදගත් භූමිකාවන් ඉටුකරන තවත් ක්‍රියාධරයින් ගණනාවක්ම වෙති. නැවත පදිංචිකිරීමේ සහ ආපදා සහන සේවා අමාත්‍යාංශය, ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය මෙන්ම ආපදා සහන සේවා අමාත්‍යවරයා වැනි කැබිනට් නොවන අමාත්‍යවරුන් යටතේ පවතින විෂයයන්ද මීට අයත් වේ. මීට අමතරව

නැවත පදිංචිකිරීමේ අධිකාරියක්ද, අත්‍යාවශ්‍ය සේවා පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයකු සහ ජාතික මානව හිමිකම් කොමිසමේ විශේෂිත අභ්‍යන්තරික අවතැන්වූවන් පිළිබඳ ඒකකයක්ද වෙයි. විධිවිධානයන් හා වගකීම් අතිපිහිත වූ බහුවිධ අමාත්‍යාංශයන් සහ ආයතන පැවතීම මෙන්ම නිලධාරිවාදයේ විවිධ ස්ථරයන් පැවතීම හේතුවෙන් සමහර අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීම ප්‍රමාදවීමට, අකාර්යක්ෂමතාවයට හා සමායෝජනය දුර්වලවීමට හේතුවෙයි. මීට සමාන්තරව අවම තොරතුරු විමසා බැලීමකින් යුතුව හෝ එසේ කිරීමකින් තොරවම කොළඹ සිට තීරණ ගෙන ප්‍රාදේශීය ක්‍රියාධරයින් වෙත දන්වන මධ්‍යගත තීරණගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙයි.

සහන සේවා නැව්ගත කිරීම සහ මානුෂවාදී ප්‍රවේශයන්ට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් ආධාර දෙන ආයතන හා ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයෙන් (ICRC) සමන්විත වන්නාවූ අන්තර් ආයතනික ස්ථාවර කමිටුව (IASC) ශ්‍රී ලංකා රජය සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි. උපදිසාපතිවරු (GA) ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය (MDMHR) සහ මානුෂවාදී සහනාධාර පිළිබඳ උපදේශන කමිටුව (CCHA) මේ ක්‍රියාවලියේ නිරතව සිටින තවත් වැදගත් ආයතනයෝ වෙති. CCHA යනු වර්ධනය වෙමින් පවත්නා මානුෂවාදී අර්බුදයට පිළිතුරක් ලෙස ස්ථාපිත කරන ලද නව ව්‍යුහයක් වන අතර අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්, විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක ලේකම්, මානුෂවාදී සහ ආරක්ෂණවාදී න්‍යායපත්‍රයක් සහිත එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, මානුෂවාදී නියෝජිතායතන සාමූහිකය (CHA) සහ වැදගත් තානාපතිවරුන් කිහිප දෙනෙක්ම එයට ඇතුළත් වෙති. මෙම සාමූහිකය නිර්මාණය කොට ඇත්තේ රජයේ ඉහළ නිලධාරීන් සහ වැදගත් රාජ්‍ය නොවන හා ජාත්‍යන්තර ක්‍රියාධරයින් අතර වඩා හොඳ සංවාදයකට ඉඩ සලසනු පිණිසය. කෙසේ වෙතත් යුධ ගැටුම්වල බලපෑමට ගොදුරුවූ ප්‍රදේශයන්හි කටයුතු කරන මානුෂවාදී ක්‍රියාධරයින් මුහුණපාන්නාවූ ප්‍රායෝගික දුෂ්කරතාවන් මඟහැරවීමට එවැනි යාන්ත්‍රණයක් සමත්වේද යන්න ඉදිරියේදී විමසා බැලිය යුත්තකි.

මානුෂවාදී අර්බුදයක් තුළ ආරක්ෂක ගැටළු

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන්වීම් සම්බන්ධ ප්‍රධානතම ගැටළුවක් වී ඇත්තේ බිය හේතුවෙන් සිය නිවාස හැරයන සිවිල් වැසියන්ගේ

අනාරක්ෂිතභාවයය. පළාප්මේදී සහ වඩා සුරක්ෂිත ප්‍රදේශ කරා පැමිණීමේදී හෝ සුභසාධන කඳවුරුවලදී හෝ ආරක්ෂිතයැයි ඔවුන් බලාපොරොත්තු වන ස්ථානයන්හිදී සහ 'ආරක්ෂිත' යැයි පෙනෙන්නට ඇති ස්ථානයන්හිදී බොහෝදෙනෙකු තර්ජනයන්ට ලක්වෙති. සිවිල් වැසියන් හා අභ්‍යන්තරිකව අවතැන්වූවන් ස්වකීය ගම්බිම් හැරයාම වළක්වනු ලැබූ හා ඔවුන් මිනිස් පලිහක් ලෙස යොදාගනු ලැබූ අවස්ථාවන්ද වෙයි. උදාහරණයක් ලෙස LTTE පාලනය යටතේ පවතින වන්නියේ සිවිල් වැසියන්ට ඇතුල්වීමේ හා පිටවීමේ ස්ථානයන් විවෘතව තිබියදී පවා නිදහසේ ගමන්බිමන් යාමට LTTE ය අවසර නොදෙන අතර ඔවුහු එම ප්‍රදේශය තුළ සිරවී සිටිති.[18] යම් හෙයකින් සිවිල් වැසියන් පාලන ප්‍රදේශයන්ගෙන් මිදී පැමිණියද ඔවුන්ගේ ආරක්ෂාව සහතික නොවන්නේ ආරක්ෂක හමුදාවන් හා පැරාමිලිටරි කණ්ඩායම් LTTE සැකකරුවන් ලෙස ඔවුන් දෙස බලන බැවිනි.[19] උතුරේ සහ නැගෙනහිර දෙමළ වැසියන්ට ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශයන්හි රැකවරණය ලබාගැනීම අතිශය අසීරු වන අතර බොහොමයක් දෙනා සිය දිවි පරදුවට තබමින් නීතිවිරෝධී ලෙස මුහුදු මඟින් ඉන්දියාවට පළායති. දිවයිනේ පිරිහෙමින් පවත්නා මානව හිමිකම් තත්ත්වය සමඟ බැඳුනු 'ජාතික ආරක්ෂක'රාමුව හේතුකොටගෙන උතුරේ හා නැගෙනහිර ජනතාව පිළිබඳව වර්ධනය වෙමින් පවත්නා අවිශ්වාසය හා සැකය සියලුම අභ්‍යන්තරිකව අවතැන්වූවන් වෙතට නොව විශේෂිතවම දෙමළ ජනයා වෙතට යොමුව ඇත.

කඳවුරුවල ආරක්ෂාව සම්බන්ධ සිදුවීම්

2006 වසරේ සිදුවීම් විසින් පෙන්වාදෙනු ලබන්නේ සුභසාධන කඳවුරු හා වෙනත් අවතැන්වූවන් සඳහා වන භූමිභාගයන් පවා අවතැන්වූවන් සඳහා අත්‍යාවශ්‍ය ආරක්ෂාව නොසපයන බවයි. 2006 නොවැම්බර් 08 වන දින අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහාවූ සුභසාධන කඳවුරක් ලෙස පවත්වාගෙන යනු ලැබූ වාකරේහි කදිරවේලි පාසලට කාලතුවක්කු ප්‍රහාර එල්ලවූ අතර එහිදී 62 දෙනකු මියගියහ.[20] 2006 අගෝස්තු මාසයේදී මුතූර් පහරදීම්වලට මැදිවූ පාසැල්වලට මෙන්ම යුධ ගැටුම් පැවැති අවස්ථාවන්හිදී

18 BBC, South Asia, "Civilians' Plight in Sri Lanka", 2006 ඔක්තෝබර් 24

19 CPA සහ IMADR, "Batticoloa Fact Finding Report", 2007 ජනවාරි

20 UTHR(J), තොරතුරු බුලටිනය,45 – "Sri Lanka's Humanitarian Crisis or the Crisis of a Majoritarian Polity?", 2007 මාර්තු 27

ජනතාව ආරක්ෂාව පතා රැඳී සිටි වෙනත් පොදු ගොඩනැගිලිවලටද ෂෙල් ප්‍රහාර එල්ල විය. මුතූර්හි සිදුවීමේදී මුස්ලිම් හා දෙමළ දහස් ගණනක් පාසැල් හා වෙනත් පොදු ගොඩනැගිලිවල ආරක්ෂාව පතා රැඳීසිටි අතර අරාබි විද්‍යාල හා ඒ ආසන්නයට එල්ලවූ ෂෙල් ප්‍රහාර 3 කින් එම ස්ථානයේදී සිවිල් වැසියන් 19 දෙනකු ජීවිතක්ෂයට පත්වූහ.[21] යාපනයේ අල්ලායිපිඩ්ඩිහි වැසියෝ ප්‍රදේශයේ පල්ලියක් තුල ආරක්ෂාව පතා රැඳී සිටි අතර 2006 අගෝස්තු 14 වන දින ඊට එල්ලවූ කාලතුවක්කු ප්‍රහාරයකින් සිවිල් වැසියෝ 15 දෙනෙකු මරණයට පත්ව 50 කට වැඩි පිරිසක් තුවාල ලැබූහ.[22] මන්නාරමේ මඩු පල්ලිය වැනි භූමිභාගයන් කිහිපයක් 'සාම කලාප' ලෙස නම්කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවන් කිහිපයක් සිදුවී ඇතත් එවැනි යෝජනාවක් ක්‍රියාවට නැංවීම සඳහා වන සැබෑ කැපවීමක් ගැටුමේ නිරතව සිටින කිසිදු පාර්ශවයක් විසින් පෙන්නුම් කොට නොමැත.

ෂෙල් හා කාලතුවක්කු ප්‍රහාරයන්ට අමතරව අභ්‍යන්තරිකව අවතැන්වූවෝ වෙනත් ආකාරයේ තර්ජනයන්ටද මුහුණපාති. උදාහරණයක් ලෙස වාලච්චේනහි විනයාගපුරම්හි අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහා වන සුභසාධන කඳවුරුවල වෙසෙන්නන්ට ආරක්ෂක වළලු මැද ජීවත්වීමට, මුදල් පැහැරගනු ලැබීමට, පැහැරගැනීම්වලට ලක්වීමට, අතුරුදන්වීම්වලට හා ඝාතනයන්ට ලක්වීමට සිදුව ඇත.[23] අභ්‍යන්තරිකව අවතැන්වූවන් සිය පශුසම්පත් හා දේපළ පිළිබඳව සොයාබැලීම සඳහා සිය ගම්බිම්වලට නැවත ගිය අවස්ථාවන්හිදී ඔවුන් ඝාතනයට ලක්කරන ලද අවස්ථාවන් පිළිබඳ වාර්තාවන් කිහිපයක්ද විය. මේ සිදුවීම්වලින් බොහාමයක් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ පවත්නා දේශපාලන සම්බන්ධතාවයන් හෝ පෙර පැවැති දේශපාලන සම්බන්ධතාවන් හේතුවෙන් සිදුවූ ඒවා වුවත් අනන්‍යතාවය වරදවා වටහාගැනීමෙන් සිදුවූ සිද්ධීන් සහ සමස්තයක් ලෙස අභ්‍යන්තරිකව අවතැන්වූ ප්‍රජාව බියට පත්කිරීමේ අරමුණින් සිදුකෙරුනු අහඹු පහරදීම්ද මේ අතර වෙයි.

---

21 HRW, "Improving Civilian Protection," 2006 සැප්තැම්බර්, පි.33 , UTHR(J), "Hubris and Humanitarian Catastrophe", 2006 අගෝස්තු

22 HRW, "Improving civilian protection in Sri Lanka", 2006 සැප්තැම්බර්, පි. 41

23 CPA සහ IMADR, "Fact Finding visit to Batticoloa", 2007 ජනවාරි

විශේෂිත කණ්ඩායම් පිළිබඳ සැලකිල්ල දැක්වීම

කාන්තාවන්, දරුවන් හා විශේෂ හැකියාවන් ඇත්තන් වැනි විශේෂිත කණ්ඩායම්වලට අවතැන්වීම සුවිශේෂී බලපෑම් ඇතිකොට ඇත. අවතැන්වීම හා තාවකාලික නිවාසයන්හි ජීවත්වීම ගැටළු ගණනාවක්ම නිර්මාණය කොට ඇත. සුහසාධන මධ්‍යස්ථානයන්හි ජනගහනය අධික වීම හා සුහසාධන කඳවුරු ප්‍රමාණවත් සැලසුම් සහිතව ඉදිකර නොතිබීම හේතුවෙන් සමාජ ලිංගිකත්වය පදනම් කොටගත් ප්‍රචණ්ඩත්වයට ආධාරක වන්නාවූ පුද්ගලිකත්වය සහ ආරක්ෂාව සම්බන්ධ ගැටළු සුලභව පවතී. සමහර අවස්ථාවන්හිදී සුහසාධක කඳවුරු තුළ හෝ ඒ ආශ්‍රිතව කාන්තාවන්ට වෙන්කොට පිහිටුවනු ලැබූ වැසිකිළි සංඛ්‍යාව සීමාසහිත වෙයි. නොඑසේනම් කිසිසේත්ම නොපවතී. සමහර විටෙක ආවරණය කරන ලද ස්නානය සඳහා වන ස්ථානයන් නොමැත. මේ හේතුවෙන් ඉතා මඳ ආලෝකය සහිත හා අවිගත් පිරිමින් ගැවසෙන ප්‍රදේශයක් තුල යාබද කැලෑබද ප්‍රදේශයකට යාමට හෝ විශාල දුරක් යාමට කාන්තාවන්ට සිදුවේ. මේ සියලුම කාරණාවන් විසින් ඔවුන්ව අනතුරුදායක සහ අනතුරට භාජනය වියහැකි තත්ත්වයට පත්කරවනු ලබයි.

පවුලේ ප්‍රධාන උපයන්නා බවට පත්වීමට කාන්තාවන්ට සිදුවන තත්ත්වයන් යුධ ගැටුම් විසින් නිර්මාණය කොට ඇත. පවුලේ ආරක්ෂකයා සහ පවුල් ජීවිතය දරාසිටින්නිය වශයෙන් ඇයට තවත් අසීරුතාවයන්ට මේ හේතුවෙන් මුහුණ දෙන්නට සිදුව ඇත. සියළුම ගැටුම් විසින් ස්ත්‍රිය පවුලේ මූලිකයා වන පවුල් බිහිකොට ඇත. මේ කාරණයේදී ශ්‍රී ලංකාවද ව්‍යතිරේකයක් නොවේ.

මාර්ගෝපදේශ මූලධර්මයන්හි දැක්වූ පරිදි ගැටුම්කාරී තත්ත්වයන්හි හා අවතැන්වූ තත්ත්වයන්හි සිටින දරුවන් වෙත විශේෂිත අවධානයක් දැක්විය යුතුවේ. ඝාතනයන්, සටන්කාමීන් ලෙස බඳවාගනු ලැබීම්, පහරදීම් හා පැහැරගෙනයාම් ආදී වූ විවිධ ආකාරයන්ගෙන් දරුවන් බලපෑම්වලට ගොදුරු වී ඇත. මීට අමතරව ඔවුන්ට පාසැල් යාමට ඇති අවස්ථාව කෙරෙහිද ප්‍රමාණවත් ආහාර, ඖෂධ හා සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම සඳහා වන අවස්ථාවන් කෙරෙහිද යුධ ගැටුම් බලපෑම් ඇතිකොට ඇත. අවතැන්භාවය තුල ජීවත්වන දරුවන් මනෝවිද්‍යාත්මකව හා චිත්තවේගාත්මකව බලපෑම්වලට ලක්වේ. කෙනෙකුගේ ගේදොර, ආදරණීයයන් අහිමිවනු දැකීම, සුහසාධක කඳවුරක ආගන්තුක පවුල්

සමඟ ජීවත්වීමට සිදුවීම, අවිනිශ්චිතභාවය සහ අනාරක්ෂිතභාවය විසින් අභ්‍යන්තරිකව අවතැන්වූ දරුවකුගේ ජීවිතය කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකරනු ලබයි. ඔවුන්ගේ සංචලතාවය සම්බන්ධයෙන් පනවනු ලැබ ඇති සීමාවන් නිසාවෙන් හෝ ප්‍රමාණවත් ආහාර හෝ සෙවණක් ඔවුන්ට නොලැබීමෙන් අවතැන්වීම තුල ඔවුන්ගේ අයිතිවාසිකම්ද සීමා විය හැක. 2006 වසරේදී මුහුණදීමට සිදුවූ නව නැඹුරුවක් වන්නේ මානුෂවාදී, ආගමික හා වෛද්‍ය ක්‍රියාධරයින්ට මුහුණදීමට සිදුව ඇති ආරක්ෂාව පිළිබඳව වර්ධනය වෙමින් පවතින තර්ජනයන්ය. මේ පිළිබඳව වඩාත් සවිස්තරාත්මකව පහත තැනක සාකච්ඡා කෙරෙයි.

5. සංචලනයේ සීමාවන් හා බාධාවන්

2006 වසරේදී සංචලනයේ නිදහසට විවිධාකාරයේ සීමාවන් එල්ල විය. සංචලනයට සීමාවන් පැනවීම මෙන්ම බලහත්කාරයෙන් සංචලනයේ යෙදවීමද අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට පමණක් සීමාවූවක් නොවන අතර ශ්‍රී ලංකාවේ බොහොමයක් ප්‍රදේශයන්හි සිවිල් වැසියන් හා මුළුමහත් ප්‍රජාවම මුහුණ දෙන්නාවූ සංසිද්ධියකි. එයින් උතුරේ හා නැගෙනහිරදී තත්ත්වය වඩාත් අයහපත් වෙයි.

මාර්ග වසාදැමීම සහ ප්‍රජාවන් වෙත එහි බලපෑම

LTTE යේ මෙන්ම රජයේ ක්‍රියාකාරිත්වය තුළින්ද සංචලනයට සීමාවන් පැනවීම සිදුව ඇත. යාපනයට භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන නැව්වලට ප්‍රහාර එල්ලකිරීම වැනි ක්‍රියාවන් මඟින් LTTE ය සංචලනය සීමාකිරීමට සිදුවන ආකාරයේ තත්ත්වයන් නිර්මාණය කොට ඇත.[24] තවද LTTE ය A9 මාර්ගය නැවත විවෘත කරන ලෙස[25] ඉල්ලා සිටිමින් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ ධජය යටතේ සිවිල් ජනතාව හා භාණ්ඩ යාපනයට ප්‍රවාහනය කරන බෝට්ටුවල ආරක්ෂාව සහතික කළ නොහැකි බව කියා සිටියි.[26]

---

24 SCOPP, SCOPP වාර්තාව. "Ship carrying essential food to Jaffna attacked by LTTE", "LTTE continues with acts of piracy", 2007 ජනවාරි 23

25 ඩේලි මිරර්. ඊස්වරන් රත්නම්. "Geneva Talks break down on A9 highway", 2006 ඔක්තෝබර් 30

26 "Humanitarian Situation in Sri Lanka-an Update" SCOPP වාර්තාව. 2007 මාර්තු 08

දකුණ, යාපනය ද ඇතුළු උතුරු ප්‍රදේශ සමඟ සම්බන්ධ කරන මාර්ගය 2006 අගෝස්තු මාසයේදී උතුරින් සහ දකුණින් මුහමලේ සහ ඕමන්තෙයිහිදී වසාදමනු ලැබිණ. පසුව දකුණේ සිට පැමිණෙන ජනයා LTTE පාලනය යටතේ පවතින වන්නි ප්‍රදේශ කරා ප්‍රවේශ වන වවුනියාවේ ඕමන්තෙයි මුරපොළ විවෘත කෙරුණු නමුත් දැඩි සීමාකිරීම් සහ නිරන්තරයෙන් වන වසාදැමීම් දක්නට විය. ඕමන්තෙයි මුරපොළ වසාදැමීම හේතුවෙන් දෙපාර්ශවයේම පාලන ප්‍රදේශයන්හි සීමාවේ සිවිල් වැසියන්ට සිරවී හිඳීමට සිදුවිය.[27] එපරිද්දෙන්ම 2006 අවසන් භාගයේදී වාකරෙයි වෙත ප්‍රවේශවන මාර්ගයන්ද යම් කාලයකට වසාදමන ලදී.[28] මේ වනවිට යාපනය අර්ධද්වීපය වෙත වන ගොඩබිම් ප්‍රවේශයන් වසාදමා ඇති අතර ඒ වෙත ළඟාවිය හැක්කේ ගුවනින් හෝ මුහුදින් පමණකි. සමහර මාර්ගයන් වසාදැමීම සහ සංචලනයේ ඇතිකොට ඇති සීමාවන් හේතුවෙන් බලපෑම්වලට ගොදුරුවී ඇති ප්‍රදේශයන්හි ප්‍රජාවන්ට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා ඉන්ධන වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයන් නිසා දැඩි පීඩාවන්ට මුහුණදීමට සිදුව ඇත. දැනටමත් සඳහන්කර ඇති ආකාරයට මෙම සීමාවන් හා ආරක්ෂාව පිළිබඳව වන තර්ජනයන් සීඝ්‍ර මිල ගණන් වැඩිවීමකට හේතුවී ඇති අතර බොහොමයක් සිවිල් වැසියන් සිය දෛනික අවශ්‍යතාවයන් මිලදීගැනීමට නොහැකි තත්ත්වයකට පත්කොට ඇත. නීරක්තියෙන් පෙළෙන කුඩා දරුවන් විශාල සංඛ්‍යාවක් පිළිබඳ වාර්තාවන් මෙන්ම ඌණපෝෂණය හා මන්දපෝෂණය සහ නිරාහාරව සිටීමට සිදුවීම පිළිබඳ වාර්තාවන්ද මේ ප්‍රදේශවලින් වාර්තාවේ. සීමාකිරීම් හේතුවෙන් හදිසි වෛද්‍යාධාර හා අවශ්‍යතාවයන් නිසි කලට වේලාවට නොලැබුණු අවස්ථාවන් පිළිබඳ වාර්තාවන්ද වෙයි. අර්ධද්වීපය තුළට භාණ්ඩ ගෙනඒම සම්බන්ධයෙන් බලපවත්වන්නාවූ සීමාවන් හේතුවෙන් යාපනය මහරෝහල අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ හිඟයෙන් පෙළෙන බව දිගින් දිගටම වාර්තාවී ඇත. මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේදී පනවා ඇති සීමාවන් හේතුවෙන් යාපනය රෝහලේ ඔක්සිජන් හිඟයක් පවතින බවටද වාර්තාවී ඇත.

---

27 ACHR සතිපතා කලාපය, "Don't make another Dafur: Geneva talks for Peace", 2006 ඔක්තෝබර් 25, http://www.achrweb.org/Review/2006/138-06.htm, CPA. War, Peace and Governance in Sri Lanka- Overview and Trends 2006, පි .27-29, http://cpalanka.org, TamilNet, SLA closes Vavunia, Uyilankulam, Madhu checkpoints, 2006 අගෝස්තු 12

28 Tamilnet, "Vaharai IDPs rally, demand International relief, re-opening of A-15", 2006 දෙසැම්බර් 29

සීමාකිරීම් උපකරණයක් ලෙස භාවිතා කිරීම: කුමන වන්දියක් යටතේද ?

ඉහත කරුණු අනුව පෙනීයන්නේ රජය හා LTTE ය යන දෙපාර්ශවයම අනෙක් පාර්ශවය වෙත පීඩනයක් එල්ලකිරීමේ උපක්‍රමයක් ලෙසින් සංචලනයේ හා ප්‍රවාහනයේ සීමාකිරීම් භාවිතා කරන බවයි. දෙපාර්ශවයම එවැනි උපක්‍රමයන් යොදාගැනීම සම්බන්ධයෙන් වරදකරුවෝ වෙති. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයෙන් තේරී පත්වූ ජනතාවගේ නියෝජනයක් ලෙස ශ්‍රී ලංකාවේ පුරවැසියන් ආරක්ෂාකිරීමේ හා ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලසීමේ මූලික වගකීමක් එය සතුවෙයි. ඒ අනුව වර්ධනය වෙමින් පවත්නා මානුෂවාදී අර්බුදය හා මානව හිමිකම් තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම රජය සතු වේ.

දෙපාර්ශවයේ සීමාවන් හරහා ගමන්කිරීම වඩාත් අසීරු බවට පත්වෙද්දී ඒ තුළ ගමන්කිරීම මෙන්ම උතුරේ හා නැගෙනහිර සිට පිටතට ගමන්කිරීමද අසීරු වී ඇත. 1990 ගණන්වල සහ 2000 ගණන්වල මුල් වසරවලදී, එනම් යුද්ධයේ කලින් අදියරවලදී උතුරේ හා නැගෙනහිර වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සංචලනයන් සීමාකෙරුනේ උතුරේ හෝ නැගෙනහිර සිට දකුණේ ප්‍රදේශ කරා පැමිණීමේදී අවසරපත් නිකුත්කිරීමේ ක්‍රමවේදයක් පැවතීම හේතුවෙනි. මෙය ස්ථාපිත කෙරුනේ ආරක්ෂක පියවරක් ලෙසින් වුවද මේ හේතුවෙන් එහි බලපෑමට ලක්වූ ප්‍රජාවන්ට අතිමහත් දුක්ගැහැට විඳීමට සිදුවිය. 2001 නොවැම්බර් මාසයේ හා 2002 ජනවාරි මාසයේ වවුනියාවේ මෙම අවසරපත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනුකරනු ලැබිණ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය වූයේ අවසරපත් ක්‍රමය යාම්-ඊම් පිළිබඳ නිදහස කඩකිරීමක් වන බවත් එබැවින් එම ක්‍රමය ඉවත් කළයුතු බවත්ය.[29] වර්තමානයේ අවසරපත් ක්‍රමයක් ක්‍රියාත්මක නොවන නමුත් උතුරේ හා නැගෙනහිර සිට පැමිණෙන රථවාහන සඳහා අවසර පත්‍රයක් ලබාගත යුතු අතර ආරක්ෂක අංශවල පරීක්ෂා කිරීම්වලට ලක්කරනු ලබයි. උතුරේ හා නැගෙනහිර සිට පැමිණෙන බොහෝ සිවිල් වැසියන් රටේ සෙසු ප්‍රදේශ කරා ගමන්කිරීමේදී ආරක්ෂක අංශවල පරීක්ෂාකිරීම් සහ නිලධාරිවාදය හේතුවෙන් මුහුණදීමට සිදුවන අසීරුතාවයන්ගේ වැඩිවීම පිළිබඳව පැමිණිලිකර සිටිති.

29 වැඩිදුර තොරතුරු සඳහා- www.cpalanka.org

ජීවිකාවන් කරගෙනයාමට ඇති සීමාවන්

සිය ජීවිකාව සොයාගැනීමටත්, සිය දෛනික අවශ්‍යතාවයන් සඳහා අවශ්‍යවන්නාවූ වියදම උපයාගැනීමටත් ජනතාවට ඇති ශක්‍යතාවය කෙරෙහි බලපෑම් ඇතිකිරීම මඟින් ජනතාවගේ ජීවිකාවන් යුධ ගැටුම් විසින් විනාශකර දමා ඇත. උතුරේ හා නැගෙනහිර ධීවර කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා විසින් පනවා ඇති විශේෂිත සීමාවන් මෙයට එක් උදාහරණයකි. මෙම සීමාකිරීම් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස්වෙයි. බොහොමයක් ප්‍රදේශයන්හි රාත්‍රී කාලයේ මසුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම්කොට ඇත. 2006 ජූනි මාසයේදී පේසාලෙයිහිදී මුහුදු කොටින් විසින් ප්‍රහාරයක් සිදුකළ අවස්ථාවේදී මෙන් කිසියම් සිදුවීමක් සිදුවීමෙන් අනතුරුව ධීවර කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ තහනමක් හඳුන්වාදෙනු දැකගත හැක. එමෙන්ම ධීවරයින්ට මුහුදු වෙරළේ සිට දියඹට ගමන් කළහැකි දුර පිළිබඳව මෙන්ම ඔවුන්ට භාවිතා කළ හැකි බෝට්ටුවල එන්ජින් ධාරිතාවය පිළිබඳ සීමාවන්ද පනවනු ලැබ ඇත. දිවා කාලයේ ධීවර කටයුතු සිදුකිරීමේදී ඊටම ආවේණික වූ බාධාවන් රැසකට මුහුණදීමට සිදුවේ. ඔවුන්ට මුහුදට යා හැකි වේලාවන් සීමාකොට ඇතිවා පමණක් නොව ඔවුන් මුහුදට යනවිට හා නැවත පැමිණෙන විට ආරක්ෂක අංශවල දැඩි පරීක්ෂාකිරීම්වලට ලක්කෙරේ.

6. අවතැන්වීම් හා යුධමය උපායමාර්ග

රජය මෙන්ම LTTE සංවිධානය විසින්ද යම්යම් අවස්ථාවන්හිදී සිවිල් ජනතාව යුධමය උපායමාර්ගයන් ලෙස 'යොදාගනු' ලබන ආකාරය යුධ ගැටුම් තුළදී පෙනීගොස් ඇත. බලකිරීම හේතුවෙන් අවතැන්වීම හා පදිංචිවීමට සිදුවීම මෙන්ම සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙසින් යොදාගැනීමද දෙපාර්ශවය විසින් යොදාගනු ලබන යුධෝපායන් වෙයි. යුධ මෙහෙයුම් මඟින් හෝ යම්කිසි ප්‍රචණ්ඩ ක්‍රියාවන් මඟින් අවි අතදරා සිටින පිරිස් සිවිල් වැසියන්ට අවතැන්වීමට බලපෑම් කරනු ලබයි. සිවිල් ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව කිසිදු තැකීමක් නොකරමින් යුද්ධය සිදුකෙරෙමින් පවතින ආකාරය අනුව අතිවිශාල අවතැන්වීමක් සිදුකිරීමේ යුධෝපායික අරමුණක් පවතින බව මෙහිදී සඳහන් කළ යුතුය. කිසියම් ප්‍රදේශයක් වෙත ඉවක්බවක් නොමැතිව වෙඩි ප්‍රහාර එල්ල කිරීමේදී සිවිල් වැසියන් පළායන අතර එවිට එම ප්‍රදේශයන්හි බලය ආරක්ෂක හමුදාවන්ට

අත්පත් කරගැනීම පහසුවෙයි.[30] රජයේ හමුදා සාම්පූර් හා මුතූර් ප්‍රදේශයන්හි 2006 වසරේදී සිදුකළ මෙහෙයුම්වලදී මෙම උපක්‍රමය අනුගමනය කරනු දකගත හැකිවූ අතර මේ හේතුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හා සෙසු දිස්ත්‍රික්කයන්හි දහස් ගණනාවක් අවතැන්වූහ. උතුරු මැද පළාතේ මායිම්ගම්මානවල සිවිල් වැසියන්ට ප්‍රහාර එල්ලකරන LTTE ය ද සිවිල් වැසියන් ඉලක්ක කර ප්‍රහාර එල්ලකරනු ලබයි. සිවිල් වැසියන්ට ඉවත්වීමට ඉඩ සලසාදීම ආදිය මඟින් සිවිල් වැසියන් ආරක්ෂාකිරීමට යුධ ගැටුම්වලට සම්බන්ධ පිරිස් පියවර ගතයුතු වන අතර සිවිල් ඉලක්කයන් වෙත ප්‍රහාර එල්ලකිරීමෙන් වැළකීමට හා සිවිල් වැසියන් ප්‍රහාරයන්ට නිරාවරණය කිරීමෙන් වැළකී සිටීමට වගබලාගත යුතුය. මීට අමතරව අවතැන්වූවන්ගේ අවශ්‍යතාවන් තෘප්තකිරීම මෙන්ම සටන් පවතින ප්‍රදේශයන්හි ඇති සිවිල් ජනතාවගේ දේපල ආරක්ෂා කිරීමටද කටයුතු කළ යුතුය.

යුධෝපක්‍රම හේතුවෙන් සංචලනයට ඇතිවී ඇති බාධාවන්

අදාළ ප්‍රදේශයන් පාලනය කරන අයගේ යුධමය හා දේශපාලන අරමුණුවලට ප්‍රතිපක්ෂ ලෙස අවතැන්වීම් පැවතිය හැක. එවන් සන්දර්භයන්හිදී ජනතාවගේ සංචලනය සීමාකරනු ලැබිය හැක. සමහර අවස්ථාවන්හිදී එම ස්ථානයෙන් නික්මයාමට නොහැකිවීම හේතුවෙන් යම් ප්‍රජාවකට සිරවී සිටීමට සිදුවන අතර එමඟින් ඔවුන්ගේ අනාරක්ෂිතභාවය තවදුරටත් වර්ධනය වෙයි. 2006 අගෝස්තු මාසයේදී යාපන අර්ධද්වීපයේ අලෙයිපිඩ්ඩිහි වැසියන් එම ප්‍රදේශයෙන් පිටවීම ආරක්ෂක හමුදාවන් විසින් වළකන ලදී.[31] 2006 සැප්තැම්බර් මාසයේදී නාඳුනන කණ්ඩායමක් විසින් මුතූර් ප්‍රදේශයෙන් මුස්ලිම්වරුන් ඉවත්විය යුතු බව නියෝග කරමින් පත්‍රිකා බෙදාහරිනු ලැබිණි.[32] ප්‍රහාරයක් එල්ලවෙතැයි බියට පත්වූ මුස්ලිම් පවුල් මුතූර් හැරයාමට සැරසුනු නමුත් ආරක්ෂක හමුදාවන් විසින් ඔවුන්ව නවත්වන ලදී. ආරක්ෂක හමුදාවන් විසින් මෝටර් බෝට්ටු මඟින් මුතූර් සිට ත්‍රිකුණාමලය නගරය දක්වා සිවිල් වැසියන් ප්‍රවාහනය කිරීම තහනම් කරනු ලැබිණි.[33] සංචලනය සම්බන්ධයෙන් පනවන ලද්දාවූ මෙම සීමාවන් හඳුනාගත හැක්කේ සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස

30 UTHR(J), තොරතුරු බුලටිනය : 45- "Sri Lanka's Humanitarian Crisis or the Crisis of a Majoritarian Polity?", 2007 මාර්තු 27

31 IASC, "Conflict related displacement in Sri Lanka", 2007 ජූලි, පි. 20

32 CHA Situation Report Eastern Province, 2006 සැප්තැම්බර්

33 සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ලබාගත් තොරතුරු, 2006 ඔක්තෝබර්

යොදාගැනීමක් ලෙසිනි. 2006 දෙසැම්බර් මාසයේදී අඛණ්ඩව එල්ලවූ ෂෙල් ප්‍රහාර හේතුවෙන් සිවිල් වැසියන් මඩකලපුව දිස්ත්‍රික්කයේ LTTE පාලනය යටතේ පැවති වාකරෙයි ප්‍රදේශය හැරයාමට සූදානම් වූ විට LTTE ය විසින් එසේ කිරීමට උත්සාහ දරූ සිවිල් වැසියන්ට වෙඩිතබනු ලැබීය.[34]

සංචලනයට බලකිරීම

එක් ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයක් වෙත ජනතාව යාමට සැලැස්වීම සඳහාත් බලය යොදාගනු ලැබ ඇත. 2006 සැප්තැම්බර් මාසයේ සිට රජය අවතැන්වූ ප්‍රජාවන් මූතූර්, වාකරෙයි, මඩකලපුව-බටහිර සහ ඊචලම්පත්තුහි ඔවුන්ගේ මුල්බිම්වල නැවත පදිංචිකරවීමට කටයුතු කොට ඇත. මේ හේතුවෙන් අවතැන්වූවන්ට සිය ගම්බිම් කරා පැමිණ නැවත සිය ජීවිත යළි ආරම්භ කිරීමට හැකිවූ නමුත් එම නැවත පදිංචිකරවීමේ ක්‍රියාවලිය විසින් ගැටළු කිහිපයක්ම මතුකොට ඇත. ඉන් එකක් වන්නේ එම නැවත පදිංචිකිරීමේ ක්‍රියාවලිය ස්වෙච්ඡාවෙන් සිදුවන්නක්ද යන්නය. අවතැන්වූවන් නැවත පදිංචිකරවීම සඳහා විවිධාකාරයේ බලහත්කාරයන් යොදාගනු ලැබිණි. 2006 සැප්තැම්බර් මාසයේදී අවතැන්වූ කඳවුරු වෙත පැමිණි හමුදාව විසින් ජනතාව බලහත්කාරයෙන් වාහන වලට නංවනු ලැබිණි. එහිදී බලය යොදාගත්බව නැවත පදිංචිකරවීමේ හා සහන සේවා අමාත්‍යවරයා වන රිෂාඩ් බදූර්දීන් මහතාද පිළිගෙන ඇත.[35] සුභසාධක කඳවුරුවල ලබාදෙන ආහාර සලාකය කපාහරින බවට හා ප්‍රදානයන් ලෙස ලබාදෙනු ලබන ඇඳුම් ලබානොදෙන බවට තර්ජනය කිරීම වැනි බලපෑම්ද සිදුකෙරී ඇත. නිවාස ඉදිකරගැනීමට ආධාරකිරීම හා ආහාර සලාක අඛණ්ඩව ලබාදීම වැනි පෙළඹවීම්ද රජය විසින් සිදුකර ඇත. මේ සියලු පියවරයන් තුළින් පෙනීයන්නේ නැවත පදිංචිකිරීම තුල ඇති ස්වෙච්ඡාසහගතභාවය ප්‍රශ්නාර්ථයක් බවය.[36]

අවතැන්වූවන් නැවත සිය මුල්බිම් වෙත යාමට කැමත්තක් දක්වන්නේද යන්න ඔවුන්ගෙන් විමසනු නොලැබූ අතර එයට විරෝධය දැක්වීමේ අවස්ථාවක්ද ඔවුන්ට නොවුණි. ඒ වෙනුවට සිදුකෙරුනේ ඔවුන් යළි පදිංචිකරවීමට යන

---

34 UTHR, තොරතුරු බුලටිනය: 45 "Sri Lanka's Humanitarian Crisis or the Crisis of a Majoritarian Polity ?" 10.6 "Rain of Shells and the Final Flight," 2006 දෙසැම්බර් 09

35 ඩේලි මිරර්, "IDPs moved against their will," 2007 මාර්තු 20

36 CPA, IMADR සහ INFORM, "කන්තලේ සහ සේරුනුවර වෙත සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාවේ වාර්තාව, 2006 අගෝස්තු 25

බව දැන්වීම පමණකි. මානුෂික ආධාර දෙන නියෝජිතායතනයන්ට නැවත පදිංචිකරනු ලබන බිම් වෙත ප්‍රවේශවීම සීමාකිරීම මඟින්ද අවතැන්වූ ප්‍රජාවගේ නැවත පදිංචිවීමේ කැමැත්ත පිළිබඳ ගැටළුසහගතභාවය වැඩිකරවයි.[37] අධික තදබදය, අයහපත් සනීපාරක්ෂක තත්ත්වයන්, ගංවතුර හේතුවෙන් කඳවුරු බිම් අවතැන්වූවන්ට ජීවත්විය නොහැකි තත්ත්වයට පත්වීම වැනි කඳවුරු තුළ පවත්නා අයහපත් තත්ත්වයන්ද මේ පිරිස නැවත සිය ගම්බිම් වෙත යාමට පොළඹවාලූ සාධකයෝ වෙති. කඳවුරු තුළ පැවති මෙම ගැටළුවලට රජය ප්‍රමාණවත් අවධානයක් නොදැක්වීමට හේතුව මෙම පිරිස ඔවුන්ගේ මුල්බිම්හි නැවත පදිංචිකරවා නැගෙනහිර යළි 'සාමාන්‍ය තත්ත්වයට' පත්ව ඇතැයි ප්‍රකාශයට පත්කිරීමේ රජයේ වුවමනාවයැයි සිතිය හැක.

නැවත පදිංචිකිරීම් සිදුකරනු ලැබූ බිම්බෝම්බ ඉවත්කිරීම සම්පූර්ණයෙන් අවසන් නොකළ සහ ආයුධ සන්නද්ධ අර්ධ මිලිටරි කණ්ඩායම් හා නැවත නැවත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් ගහන ප්‍රදේශයන්හි ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම වැදගත්ය. උදාහරණයක් ලෙස 2006 අගෝස්තු මාසයේදී අවතැන්වූ මුතූර්හි වැසියන්ව නැවත බලහත්කාරයෙන් පදිංචිකරවූ නමුත් 2006 සැප්තැම්බර් මාසයේදී ඔවුන්ට පිටවන ලෙස දන්වමින් අත්පත්‍රිකා බෙදූවිට නැවත වරක් ඔවුන්ට අවතැන්වීමට සිදුවිය.

අධි ආරක්ෂිත කලාප හා සීමාවන්

යාපනයේ හා ත්‍රිකුණාමලයේ අධි ආරක්ෂිත කලාප පිහිටුවීමද ජනතාවගේ භූමිය වෙත ප්‍රවේශවීමට ඇති අයිතිය හා සංචලනයට ඇති සීමාවන් පිළිබඳ අතිශය අයහපත් නිදර්ශනයකි. යාපනයේ යම්යම් ප්‍රදේශ සිවිල් වැසියන්ට ඇතුල්වියනොහැකි ප්‍රදේශ ලෙස සලකුණුකිරීම හේතුවෙන් දහස් ගණනක ජනතාවකට සිය ඉඩම්, නිවාස හා ජීවිකාවන් අහිමිවී ඇත. වගාකළහැකි භූමියෙන් වැඩි කොටසක්ද ඇතුළත්ව අධි ආරක්ෂිත කලාපයන්ට යාපනය අර්ධද්වීපයේ මුළු භූමි ප්‍රමාණයෙන් 18 % ක් අයත් වේ. යාපනයේ සුභසාධක කඳවුරුවල වෙසෙන අවතැන්වූවන් නැවත

37 CPA, IMADR සහ INFORM, "කන්තලේ සහ සේරුනුවර වෙත සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාවේ වාර්තාව, 2006 අගෝස්තු 25

මුල්බිම් කරා නොපැමිණීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේද මෙයයි.[38] ත්‍රිකුණාමලයේ සාම්පූර්/ මුතූර් ප්‍රදේශයන් අවට අධි ආරක්ෂිත කලාප ලෙස නම්කිරීම හේතුවෙන් අභ්‍යන්තරිකව අවතැන්වූ එම ප්‍රදේශවල ජනතාව නැවත පදිංචිවීම වළක්වා ඇත.

අධි ආරක්ෂිත කලාපයන් ලකුණුකිරීම අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කර ඇත. කලින් සඳහන් කළ නඩු දෙකේදී අධිකරණය ධනාත්මක ලෙස සංචලනයේ නිදහස කඩකිරීම හඳුනාගනු ලැබූ නමුත් මූලික අයිතිවාසිකම් අභිබවා ජාතික ආරක්ෂාව වඩා වැදගත් ලෙස සලකනු ලැබූ අවස්ථාවන්ද පවතී. 2003 වසරේදී ද්‍රවිඩ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මාවෙයි සේනාධිරාජා සහ තවත් අය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරමින් යාපනයේ අධි ආරක්ෂිත කලාප අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කරන ලදී. එම නඩුව තවමත් විභාග වෙමින් පවතින අතර අධි ආරක්ෂිත කලාප සීමාකර යම් භූමි ප්‍රමාණයක් සිවිල් වැසියන්ට ලබාදෙමින් යුධහමුදා ආඥාපතිවරයා සහ යාපනයේ උපදිසාපතිවරයා අතර මේ සම්බන්ධයෙන් එකඟතාවයක් ඇතිකරගන්නා ලෙසට අගවිනිසුරුවරයා විසින් උපදෙස් දෙනු ලැබ ඇත.

7. ආපදා සූදානමක් පවතීද ?

2006 වසරේ අවතැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම විසින් පෙන්වාදෙනු ලබන්නේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට සහන සැලසීමේදී සිදුවන ප්‍රමාදයන් හා වෙනත් ගැටළු අවම කරගැනීම සඳහා බොහෝ දේ කළයුතුව ඇති බවයි. මෙම තත්ත්වය පවතින්නේ ශ්‍රී ලංකාව ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද යන බහුවිධ ආපදාවන්ට මුහුණදී තිබියදීය. එමෙන්ම ධාරිතාවය ගොඩනැගීමේ පුහුණුවීම් හා ආපදා සූදානම්වීම්ද සිදුකෙරී තිබියදීය. 2006 අගෝස්තු මාසයේදී කන්තලේ වෙත අවතැන්වූ මුතූර්හි සිට පැමිණි මුස්ලිම් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ සිද්ධියේදී මෙන්ම වාකරේ හා නැගෙනහිර ත්‍රිකුණාමලයේ දෙමළ ජනයා මඩකලපුවට පළා ආ අවස්ථාවේදීද රාජ්‍ය බලධාරීන් විසින් අවශ්‍ය සහන සැලසීමේදී ප්‍රමාදයන් ඇතිවිය. දැවැන්ත මානුෂවාදී අර්බුදයක් කළමනාකරණය කිරීමේ හැකියාව ඇති පුහුණුව ලත් පළපුරුදු තැනැත්තන්ගේ හිඟය ආපදාවට ප්‍රතිචාර දැක්වීමේදී මනා ලෙස නිරූපණය වූ අතර මේ හේතුවෙන්

---

38 HRW, "Return to war- Human Rights under Siege", 2007 අගෝස්තු, පි. 34-37

බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් වෙත මානුෂවාදී ආධාර ලබාදීම ප්‍රමාදවීම හා වැළකීම සිදුවිය. මේ හේතුවෙන් 2004 වසරේ සුනාමිය ඇතිවූ පසු දේශීය ක්‍රියාධරයින්ගේ ධාරිතාවය ගොඩනැංවීම සම්බන්ධයෙන් ගතකළ කාලය හා ඒ සඳහා යෙදවූ සම්පත් සම්බන්ධයෙන් ගැටළු පැනනැඟුණි. ප්‍රධානතම ගැටළුව පැනනැගෙන්නේ එම වැඩසටහන්වල දීර්ඝකාලීන ප්‍රතිඵලයන් පිළිබඳවය.

නැඹුරුතාවන් ː රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාධරයින්ගේ භූමිකාව

ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේදී තීරණාත්මක වෙනස නිරූපණය වන්නේ රාජ්‍ය ක්‍රියාධරයින්ගේ පවත්නා සූදානම අවම තත්ත්වයක පැවතීම තුළිනි. යුධ මෙහෙයුම්වල මානුෂවාදී ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී මෙය මනාව නිරූපණය වෙයි. ආරක්ෂක හමුදා යුධමය ක්‍රියාමාර්ගය උග්‍ර කරමින් නැගෙනහිර පළාතේ LTTE පාලන ප්‍රදේශයන්ගෙන් පළාඑන ලෙසට ජනතාව දිරිමත් කරන අතර අවතැන්වන ජනතාවට ආහාර ලබාදීම හා නවාතැන් ලබාදීම සම්බන්ධයෙන් පැවතියේ අවම සූදානමකි. යුධ හමුදාව හා සිවිල් බලධාරීන් හෝ අදාළ අමාත්‍යවරුන් අතර ඉතා අවම මට්ටමක සහසම්බන්ධතාවයක් පැවති බව පෙනීයන ලදී. උදාහරණයක් ලෙස රිදීතැන්න හරහා පැමිණි වාහනවලට පෙට්‍රල් ලබාදීම වැනි යම් යම් උපකාරයන් හමුදාව විසින් සිදුකරනු ලැබූ නමුත් එම වාහන මඩකලපුවට යාම වැළැක්වීමට සිදුවිය. ඒ හේතුවෙන් අවතැන්වූවන් ප්‍රවාහනය කිරීම කළ නොහැකි විණි.[39] සුභසාධන කඳවුරු පිහිටුවීම සඳහා භූමිභාගයන් හඳුනාගැනීම සඳහා පවා කාලයක් ගතවූ අතර එවැනි විශාල පහරදීමක් සිදුකරද්දී අනිවාර්යයක් ලෙස මඩකලපුව වෙත අතිවිශාල ජනතාවක් ගලාඒම නොවැළැක්විය හැක්කක් බව පෙනීගොස් තිබුණි.

2006 වසරේදී දැකගත හැකිවූ තවත් නැඹුරුතාවක් වූයේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් වෙත සහන සැලසීම සඳහා වඩවඩාත් ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන මත යැපීමයි. අවසාන ඉලක්කය බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් වෙත වේගවත්ව හා කාර්යක්ෂමව සහන සැලසීම වුවද සිය පුරවැසියන් වෙත සහන සැලසීම ශ්‍රී ලංකා රජයේ මූලික වගකීම විය යුතුය. එම වගකීම කිසි

39 CPA, IMADR, " Batticaloa Fact Finding Report," 2007 ජනවාරි, පි. 4

ලෙසකින් හෝ අවප්‍රමාණ නොකළ යුතුය. ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් හා ධාරිතාවය නැංවීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් මෑත කාලීනව පවත්වා තිබියදීත් ආධාර ලබාදීමේදී සමහර ක්‍රියාධරයින්ගේ මන්දගාමී හා අලස භූමිකාවන් පිළිබඳව ප්‍රශ්න කළ යුතුය.

මුතූර්හි සිදුවූ මහාපරිමාණ අවතැන්වීමේදී මානුෂවාදී නියෝජිතායතනයන්ද ආපදා තත්ත්වයන්හි කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්වකීය සූදානම් සහගතභාවයේ පවත්නා සීමාසහිත බව ප්‍රදර්ශනය කළහ. ජාත්‍යන්තර නියෝජිතායතනයන්ට සංඛ්‍යාත දත්තයන් සඳහා ප්‍රවේශය පැවතියද අවතැන්වීමේ වූ සුවිසල්භාවය හේතුකොටගෙන ඔවුන්ගෙන් ප්‍රමාණවත් සූදානමක් ප්‍රදර්ශනය නොවුණි.[40] මෙහි ප්‍රතිඵලයක් ලෙස කඳවුරු, ප්‍රමාණය ඉක්මවා පිරීගිය, ප්‍රමාණවත් සෙවණක් හෝ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය නොමැති ඒවා බවට පත්වූ අතර කඳවුරු සංවිධානයද ඉතා දුර්වල තත්ත්වයක විය.[41] මුතූර්හි අවතැන්වූ මුස්ලිම්වරුන්ට සහන සැලසීමේදී කන්තලේ පිහිටුවා තිබූ සුබසාධන කඳවුරුවල කටයුතු සඳහා දේශීය මුස්ලිම් රාජ්‍ය නොවන සංවිධාන ඉතා වැදගත් භූමිකාවක් ඉටුකළ බව මෙහිදී සඳහන් කළ යුතුය. ප්‍රතිචාර දැක්වීමේ වේගය මෙන්ම සමහර රාජ්‍ය නොවන සංවිධාන ප්‍රතිචාර දැක්වූ ආකාරයද අනුව පෙනීගියේ සුනාමියෙන් ලත් අත්දැකීම් ඊට බලපා ඇති බවය.

ප්‍රාදේශීය මට්ටම දෙස බැලීමේදී 2006 දෙසැම්බර් මාසයේ කන්තලේ සිදුවූ දෙවන අදියරේ අවතැන්වීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ සේවකයින් කියා සිටියේ කලින් සිදුවීම්වලින් පාඩම් ඉගෙනගත් බව සහ කාර්යපටිපාටි වඩාත් සූනම්‍ය ලෙස සකසා තිබූ බවත්ය. 2006 දෙසැම්බර් මාසයේ කන්තලේ සිදුවීම්වලදී ධනාත්මක සංඥාවන් දැකගත හැකි වුවද 2006 අගෝස්තු සහ දෙසැම්බර් යන සිදුවීම් දෙකම විසින් නගන ප්‍රශ්නය වන්නේ ප්‍රතිචාර දැක්වීමේ වේගවත්භාවය හා ගුණාත්මකභාවය ජනවාර්ගිකත්වය වැනි වෙනත් හේතූන් මත තීරණය වන්නේද යන වගයි.

---

40 බලන්න CPA, IMADR, " Batticaloa Fact Finding Report," 2007 ජනවාරි, පි. 4

41 CPA, IMADR, " Batticaloa Fact Finding Report," 2007 ජනවාරි, පි. 5. ජලය හෝ වැසිකිළි නොවූ කඳවුරු පිළිබඳවද මෙම වාර්තාවේම සඳහන් වේ. මාසයකට අධික කාලයක් කිසිදු වැසිකිළි පහසුකමක් සැලසීමෙන් තොරවම පවත්වාගෙන ගිය සතුරුකොන්ඩන් කඳවුරු පිළිබඳවද එහි සඳහන් වෙයි.

8. සාධාරණත්වය

බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් හා තැනැත්තන්ට සාධාරණ ලෙස සලකනු ලැබීම සහ විවිධ වූ කණ්ඩායම් අතර ආතතීන් හා අමනාපයන් ඇතිකරවන්නාවූ වෙනස්කොට සලකන ආධාර ලබාදීමේ වැඩපිළිවෙලවල් හා ප්‍රතිපත්තීන් මඟින් තවදුරටත් බලපෑමට ගොදුරුවීමට ලක්නොවන බව සහතික කරනු ලබන කේන්ද්‍රීය සංකල්පය වන්නේ සාධාරණත්වයයි. එක හා සමාන තත්ත්වයන්ගේ බලපෑමට ගොදුරුවූ පිරිසට ඔවුන් එකිනෙකා සමඟ තරඟ කිරීමට ඉඩ සැලසීමකින් තොරව එක හා සමාන ලෙස සලකනු ලැබීම සාධාරණත්වය විසින් සහතික කරනු ලබයි. වෙනස්කොට නොසලකන පියවරයන් අනුගමනය කිරීම, සහභාගීත්ව, පාරදෘශ්‍ය හා විශ්වාසදායක අයුරින් කටයුතු කිරීම තුලින් ජනතාවගේ අයිතිවාසිකම්වලට ගරුකරනු ලැබෙන බවට හා ඒවා ආරක්ෂා කෙරෙන බවට සාධාරණත්වය සහතික වෙයි.

පශ්චාත් සුනාමි සන්දර්භය තුළ සාධාරණත්ව සංකල්පය කෙරෙහි මානුෂවාදී අභිරුචිය වර්ධනය විය. සුනාමියෙන් පසු ආධාර දීමේදී ඉතා සුළු සීමාවන් සහිතව හෝ සීමාවකින් තොරවම ශ්‍රී ලංකාවට ඇදී ආ පෙර නුදුටුවිරූ මුදල් ප්‍රමාණයන් හේතුවෙන් එම මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් බොහොමයක් නියෝජිතායතනයන් හා ක්‍රියාධරයින්ට සැලකියයුතු මට්ටමක සුනම්‍යතාවයක් අත්කරදෙන ලදී. සංසන්දනාත්මකව 2006 වන විට ප්‍රායෝගික අභියෝගයන් හා ආධාර දීමේදී බලපෑම්සහගතවීම්/ සීමාවන් හේතුවෙන් යුධ ගැටුම්වල බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන්ට හිමිවූයේ සීමාසහිත සහයෝගයක් පමණකි. මෙහි ප්‍රතිඵලය වූයේ සුනාමි අවතැන්වූවන් හා යුද්ධයෙන් අභ්‍යන්තරිකව අවතැන්වූවන් අසමාන ලෙස සලකනු ලැබීමට පාත්‍රවීමයි. උදාහරණයක් ලෙස සුනාමියේ බලපෑමට ගොදුරුවූ පවුලක එක් සාමාජිකයකුට සතියකට රු. 375 ක ආහාර සලාකයක් ලබාදෙනු ලැබූ අතර නිවාස විනාශවූ පවුලකට රු. 5000 ක් සහ මුළුතැන්ගෙයි උපකරණ මිළටගැනීම සඳහා රු. 2500 ක් ලබාදෙනු ලැබිණ.[42] මීට සංසන්දනාත්මකව යුද්ධයේ බලපෑමට ලක්වූවන්ට ලැබුණේ අඩු ප්‍රමාණයකි. එනම් යුධ ගැටුම්වලින් පීඩාවට ලක්වූ එක් තැනැත්තකුට මසකට රු. 336 ක ආහාර සලාකයක් සහ පස් දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින පවුලකට 1995දී නිකුත්කරන ලද චක්‍රලේඛයක දැක්වෙන මිළ ගණන්වලට අනුව

42 සහන, නැවත පදිංචිකිරීමේ හා පුනරුත්ථාපන අමාත්‍යාංශය, 2005 අප්‍රේල් 7

සකස්කරනු ලැබූ රු. 1260 ක මුදලකි. යුධ ගැටුම්වලින් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කණ්ඩායම්වලද අසමානතාවයන් පවතින බව මෙහිදී සඳහන් කළ යුතුය. උදාහරණයක් ලෙස 'මුලින්' අවතැන්වූවන්ට 1995 ක්‍රමවේදයට අනුකූලව ආහාර සලාක ලැබෙන අතර මෑතකදී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට කැලරි ප්‍රමාණය මත පදනම්වූ හාල්, තිරිඟු පිටි, පරිප්පු, සීනි හා තෙල් වලින් සමන්විත ලෝක ආහාර වැඩසටහනේ සලාක ලැබේ.[43]

සුනාමියෙන් අවතැන්වූ ජනතාව හා ගැටුම්වලින් අවතැන්වූ ජනතාවට සපයනු ලබන නිවාස වැඩසටහන් තුළද සාධාරණත්වය පිළිබඳ ගැටළු පැනනැගේ. ගැටුම්වලින් අවතැන්වූ සමහර අභ්‍යන්තරිකව අවතැන්වූවෝ අවතැන්වීමෙන් දශකයකට වැඩි කාලයකට පසුවද පුත්තලම හා යාපනය වැනි ප්‍රදේශයන්හි තාවකාලික නිවාසයන්හි ජීවත්වන අතර සුනාමියෙන් අවතැන්වූවෝ දැනටමත් ස්ථිර නිවාසවල පදිංචිව සිටිති. එමෙන්ම සුනාමි නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන්ද සාධාරණත්ව ගැටළු පැනනැගී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයට, සුනාමියේ බලපෑමට ලක්වූ සෙසු දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව වැඩි සහන ලැබුණේ ඇයි, අතිරේක නිවාස පවා එහි ඉදිවූයේ ඇයි වැනි ප්‍රශ්න මෙහිදී නැගිය හැක.[44] අම්පාර වැනි ප්‍රදේශයන්හි සුනාමියේ බලපෑමට ගොදුරුවූ තැනැත්තන්ගේ ස්ථිර නිවාස ඉදිකර අවසන්කොට නොමැති ස්ථාන තවමත් පවතී. සුනාමි ආධාර ලබාදීමේදී මානුෂවාදී නියෝජිතායතන රැසක්ම කටයුතු කිරීම නිසා විවිධ නිවාස ව්‍යාපෘතිවලදී වෙන්කරනු ලැබූ මුදල් ප්‍රමාණයන්හි අසමානත්වයක් පවතින අතර සමහර ව්‍යාපෘතීන්හිදී තෝරාගත් පවුල් සඳහා නිවාසයන්හි වැඩ අවසන් කිරීමේ ප්‍රදානයක් ලෙස රු. 550,000 ක මුදලක් ලබාදුන් අවස්ථාවන්ද විය.

නිවාසයන්හි වේගවත් ඉදිකිරීමට අමතරව සුනාමියේ බලපෑමට ගොදුරුවූවෝ නිවාස ඉදිකරගැනීම සඳහා වඩා හොඳ ආධාර ලදහ. අවරෝධක කලාපයෙන් පිටත නිවාස විනාශවූ අයට රු. 250,000 ක මුදලක් වාරික වශයෙන් ලැබුණු අතර අර්ධ වශයෙන් නිවාස විනාශ වූ අයට රු. 100,000 ක මුදලක් වාරික වශයෙන් ලැබුණි. මීට ප්‍රතිචාර වශයෙන් ගැටුම්වලින් අවතැන්වූවන් සඳහාවූ NEHRP නිවාස ව්‍යාපෘතියේ මුදල් ප්‍රමාණයන්ද මීට සමාන වන ලෙස වැඩිකරනු ලැබිණි.[45]

---

43 CPA, "Puttalam Fact Finding Report," 2006 ජූලි 19, පි. 7

44 සන්ඩේ ලීඩර්, "New circular, new hopes and new fears", 2006 ජූනි 11

45 TAFREN, Report on Housing and Township Development, 2005 මාර්තු 15

සුනාමි අවතැන්වීම් හා ගැටුම් අවතැන්වීම්වල පවතින විෂමතාවය පිළිබඳ කලින් සංවාදය, ගැටුම් අවතැන්වූවන් හා ඔවුන් අලුතින් වාසයට පැමිණි ප්‍රදේශයන්හි ආගන්තුක ප්‍රජාවන් අතරද දැකගත හැක. රජය හා ආයතන ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රජාව දුගීභාවයෙන් පෙළෙන ආගන්තුක ප්‍රජාවන්ට ඉතා සමීපව නැවත පදිංචිකරවීමට උත්සාහ කරනු ලබයි. සමහර අවස්ථාවන්හිදී අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහා වැසිකිළි හා ජලය සඳහා ප්‍රවේශය සහිත ස්ථිර නිවාස ප්‍රදේශයේ දුගී ජනයා ජීවත්වන පිදුරු සෙවිලි කරන ලද කටුමැටි ගෑසූ නිවාසයන් ආසන්නයෙන් ඉදිකරනු ලැබ ඇත. පුත්තලමේ විදුලි බලය ලබාදීම සම්බන්ධයෙන් උණුසුම් තත්ත්වයක් හටගැණින. එයට හේතුවූයේ තමන් වසර ගණනාවක් තිස්සේ විදුලි පහසුකම් ඉල්ලාසිටියදී තමන්ට විදුලිය ලබා නොදී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ නිවාස ඒකක සඳහා පමණක් විදුලිය ලබාදුන් බවට ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන් විරෝධය දැක්වීමය. සමහර නියෝජිතායතනයන් මෙම ගැටළු සම්බන්ධයෙන් වඩාත් සංවේදී ආකාරයකින් කටයුතු කරමින් ඒ අනුව තම ව්‍යාපෘති සැලසුම්කොට ඇත. උදාහරණයක් ලෙස පුත්තලමේ ලෝක බැංකු නිවාස ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ප්‍රදේශයේ පවතින නිවාසයන් වෙතද යටිතල පහසුකම් ලැබෙන ආකාරයට ගැටුම්වල බලපෑමට ගොදුරුවූ මායිම් දිස්ත්‍රික්කයක් ලෙස සලකා සමස්ත ප්‍රදේශයේ සංවර්ධනය ඉලක්ක කරමින් සැලසුම් සකස්කිරීම දැක්විය හැක.

ගැටුම් හේතුවෙන් අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහා වන වැඩසටහන් ඔවුන්ගේ ජීවිකාවන් ගොඩනගාගැනීමට ආධාරදීම සහ ඔවුන්ට තනිව නැගීසිටීමට හැකි තත්ත්වයට පත්කරලීම අරමුණු කරගන්නවා වෙනුවට ඔවුන්ට යම් අවම සහනයක් ලබාදීම වැඩි වශයෙන් ඉලක්ක කරගනී. මේ හා සංසන්දනය කිරීමේදී සුනාමිය සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාරයන් වඩා විස්තීර්ණ වන අතර එය ජීවිකාවන් හා නිවාස ගොඩනංවාගැනීමට ආධාර සපයමින් ජනතාව හා ප්‍රජාවන් ආධාර මත අවම වශයෙන් යැපෙමින් ආදායම් උපයාගතහැකි තත්ත්වයට පත්කරලීම අරමුණු කරගත් දීර්ඝකාලීන ප්‍රතිසාධනය අරමුණු කරගත්තක් විය. මේ අනුව මෙම ව්‍යසනයන් දෙකේදී අනුගමනය කරනු ලබන ප්‍රවේශයන්හි එකිනෙකට වෙනස් විතැන්වීම් දෙකක් හඳුනාගත හැක. සුනාමිය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාරයේදී යොදාගනු ලැබූ යෙදුම වූයේ 'වඩා හොඳින් නැවත ගොඩනැංවීම' යන්න තුළ බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන්ට දීර්ඝකාලීන ප්‍රතිඵල සහිතව වඩා හොඳ ජීවන තත්ත්වයන් සැපයීමේ අපේක්ෂාව මනාව නිරූපණය විය. මෙම ප්‍රවේශය යුධ ගැටුම්වල බලපෑමට හසුවූ ප්‍රදේශයන් කරාද දිගු කළයුතු වන

අතර එය මහා පරිමාණ යටිතල පහසුකම් ගොඩනැංවීමේ ව්‍යාපෘතීන් හරහා පමණක් නොව පවුලේ ජීවිකාවන් හා ප්‍රාදේශීය ආර්ථිකයන් ගොඩනැංවීම තුළින්ද ගෙන යා යුතුය.

9. මානුෂවාදී උපකාරයන් : විකාශය වෙමින් පවත්නා නැඹුරුතාවන්

මෑතකාලීන අවතැන්වීම් හා අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා බලපෑමට ලක්වූ ප්‍රජාවන් සම්බන්ධයෙන් දක්වනු ලබන ප්‍රතිචාරයන් විසින් නිරූපණය කරනු ලබන්නේ රාජ්‍ය ක්‍රියාධරයින්, අන්තර්ජාතික හා දේශීය රාජ්‍ය නොවන සංවිධානයන් සහ දේශීය ක්‍රියාධරයින්ගේ වෙනස්වනසුළු භූමිකාවය. දැනටමත් මා විසින් පෙන්නුම්කර දෙනු ලැබූ ආකාරයට මෑතකාලීන ප්‍රතිචාරයන් කෙරෙන් පිළිඹිබු වන්නේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට හා බලපෑමට ලක්වූ ප්‍රජාවන්ට සහන සැලසීම රාජ්‍ය ක්‍රියාධරයින් වෙතින් වඩවඩාත් ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධානයන් වෙත විතැන්වන ආකාරයකි.

මානුෂවාදී තත්ත්වයන් හා ආධාර වැඩසටහන් ඉතා වේගයෙන් දේශපාලනීකරණය වෙමින් පවතී. අවතැන්වීම ආශ්‍රිත ගැටළු හැසිරවීමේදී සහ දෙනලද මොහොතකදී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ සංඛ්‍යාව පිළිබඳව නැවත නැවත ඇතිවන්නාවූ ගැටළු සහගත තත්ත්වය, හැමවිටම අවතැන්වූ සංඛ්‍යාව පහත මට්ටමක පවතින බව පෙන්වීම සහ ගැටුම්වල බලපෑම අවම බව, විශේෂයෙන්ම සුළුතර ප්‍රජාවන් වෙත අවම බව දැක්වීමේ රජයේ දේශපාලන න්‍යායපත්‍රය සමඟ බැඳී ඇත. සමහර අවස්ථාවන්හිදී බලය යෙදූ බවට වන වාර්තාවන්ද සමඟින් 2006 වසරේදී නැවත පදිංචිකිරීම් සිදුකරනු ලැබූ පරිමාණය සහ වේගය අනුව පෙනීයන්නේ අභ්‍යන්තරිකව අවතැන්වූ සංඛ්‍යාව අවමයක පවතින බව පෙන්වමින් අවතැන්වීම් පෙනෙන තරම් සැලකියයුතු මට්ටමක නොපවතින බව ජාත්‍යන්තර ප්‍රජාවට පෙන්වාදීමේ න්‍යායපත්‍රයක් පවතින බවයි.

මානුෂවාදී ආධාරකිරීම් දේශපාලනයට යොදාගැනීම

මානුෂවාදී තත්ත්වයන් දේශපාලනය සඳහා යොදාගැනීම තුළ පරිසිද්ධීන් ගණනාවක්ම පවතී. තමන්ගේ දේශපාලන න්‍යායපත්‍රයන් සහිත විවිධාකාර

දේශපාලන ක්‍රියාධරයින් අවතැන්වූවන් වෙසෙන විවිධ පරිශ්‍රයන් තුළ ක්‍රියාත්මකව සිටිති. මෙය අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට එක හා සමාන ලෙස සැලකීම් තවදුරටත් අසීරු කරවයි. උදාහරණයක් ලෙස අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගෙන් බහුතරය දෙමළ වන මඩකලපුවේ කඳවුරුවලට වඩා බහුතර සිංහල ප්‍රදේශයන්වූ කැබිතිගොල්ලෑව හා කන්තලේ වෙත අමාත්‍යවරුන් කිහිපවතාවක්ම සංචාරය කිරීම තත්ත්වය සංකේතීයව නිරූපණය කරයි. මේ මට්ටමින් සිදුවන දේශපාලනික මැදිහත්වීම් වෙත පුළුල් මාධ්‍ය ආවරණයක් ලැබෙන අතර මේ හේතුවෙන් එක් අභ්‍යන්තරිකව අවතැන්වූ පිරිසක් අභිබවමින් තවත් පිරිසක් වෙත මහජන අවධානය ඇදීයයි.

මානුෂවාදී ක්‍රියාකාරකම් දේශපාලනීකරණයවීම මානුෂවාදී හා ප්‍රජා ක්‍රියාධරයින්ටද පක්ෂග්‍රාහීත්වයකින් හා බාධාවකින් තොරව සිය කටයුතු කරගෙනයාමට අවහිරයක් වෙයි. උදාහරණයක් ලෙස මූතූර් ප්‍රදේශයේ සිට පැමිණි අභ්‍යන්තරිකව අවතැන්වූවන් වෙසෙන සේරුනුවර කඳවුර වෙත ජනතා විමුක්ති පෙරමුණේ සහන සේවා අංශය වන රතු තරුවේ මැදිහත්වීම පිළිබඳ තොරතුරු පවතී.[46] එය එම ප්‍රදේශය සම්බන්ධයෙන් වන ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන න්‍යායපත්‍රයේ කොටසක් ලෙස තේරුම්ගත හැකිය. දේශපාලනික පසුබිමක් සහිත සහන සැලසීමේ ආස්ථිතියක් විසින් තමන් මත යැපීමේ තත්ත්වයක් ඇති කරමින් බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් තුළ තමන් කෙරෙහි විශ්වාසයක් වර්ධනය කරවමින් පමණක් නොව බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන් තුල අනෙක් දේශපාලන ක්‍රියාධරයින්ගේ භූමිකාවන් පිළිබඳව විවේචනයන් ගොඩනගමින් අවතැන්වූ ප්‍රජාවන් අතර කෙතරම් තීරණාත්මක භූමිකාවක් රඟපානු ඇතිද යන්න මෙම සිදුවීම මඟින් නිරූපණය වෙයි.

මධ්‍යගත කිරීම

මානුෂවාදී ක්‍රියාකාරකම් දේශපාලන කටයුතුවලට යොදාගැනීමට අමතරව ඉතා සීඝ්‍ර ලෙසින් සිදුවන තීරණගැනීමේ හා සැලසුම් සකස්කිරීමේ මධ්‍යගත කිරීමක්ද පවතී. මෙය මානුෂවාදී ක්‍රියාකාරකම්වලට පමණක් සීමාවූවක් නොවන නමුත් ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ හා කළමනාකරණ අදියරේදී

46 CPA, IMADR සහ INFORM, "Kanthale and Serunuwara Fact Finding Report", 2006 අගෝස්තු, පි. 9

ප්‍රාදේශීය ක්‍රියාධරයින් අත්හැරදමන බවට වන සංඥාවන් දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. ඉලක්කගත කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාධරයෙක් වගකීම භාරනොගන්නා බව පැහැදිලි අවස්ථාවක ඒ වෙත යොමුවීම සඳහා මධ්‍යම රජය වඩාත් පරීක්ෂාකාරී නියාමන භූමිකාවක යෙදිය යුතුය. සුනාමියෙන් පසු යළි ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ ක්‍රියාදාමයේදී මෙය මනාව දැකගත හැකිවිය. ආරම්භක අවස්ථාවේදී නිවාස පිළිබඳ ගැටළුවට විසඳුම් සැපයීමට බහුවිධ හා අනුක්‍රමිකව පැමිණෙන ආයතනයන් ගණනාවක් පැවතියද වසර දෙකක් ගතවීමෙන් අනතුරුව විශේෂයෙන් ආධාරකරුවන් විසින් ඉදිකරනුලැබූ නව පදිංචි ප්‍රදේශයන් තුල ගැටළු උද්ගතවන අවස්ථාව වන විට වගකීම් දැරීමට කිසිවකු නොවුනි. එහි අර්ථලාභීන්ගෙන් ඉතා සුළු විමසීමක් හෝ කිසිදු විමසීමක් නොකරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ කොළඹදී ව්‍යාපෘති සැලසුම් කිරීම මධ්‍යගතවූ ප්‍රවේශයක් මඟින් ප්‍රතිඵල කරනු ඇත. මේ අනුව විනිවිදභාවය, අදහස් විමසීම හා ව්‍යාපෘති සඳහා ජනතා සහභාගීත්වය නියෝජිතායතන සඳහා අත්‍යාවශ්‍ය කාරණාවන් වන අතර වර්තමානයේ ක්‍රියාත්මක මානුෂවාදී හා සංවර්ධන ව්‍යාපෘතීන්හිදී විශේෂයෙන් අවධානය යොමුකළ යුතු කාරණාවක් බවට මෙම කරුණ පත්ව ඇත.

අදහස් විමසීමේ හා සහභාගීත්වයේ ඌනතාවය

මහජනතාවගේ අදහස් විමසීම හා ඔවුන්ව සහභාගි කරවාගැනීම අවමවීම බොහෝ අවස්ථාවන්හිදී මුහුණදෙන ප්‍රධාන ගැටළුවකි. බලපෑමට ගොදුරු වූ පිරිස් පිළිබඳව අවධානය යොමුකිරීම අවමවීම බොහෝ අවස්ථාවන්හිදී හඳුනාගත හැකි අතර රජයේ නැවත පදිංචිකිරීමේ කටයුතුවලදී සමහර අවස්ථාවන්හි ඔවුන් එම ප්‍රදේශයන්හි පදිංචිවීමට කැමැත්තක් දක්වන්නේද යන්න පවා නොවිමසා කටයුතුකොට තිබිණි. මුතූර් හා වාකරෙයි ප්‍රදේශවල ජනතාව සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරයට අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට ඔවුන්ව නැවත පදිංචිකරවීමට යන බව දන්වා තිබුණේ එසේ කිරීමට නියමිත දිනයේ උදෑසනය. 'ගිහින් බලන්න' වැනි ගමන් සහ නැවත සිය මුල් බිම් වෙත යාමට ඔවුන් තුළ වන බිය සන්සිඳුවීම උදෙසා ගත් පියවරයන් හේතුවෙන් 'බලහත්කාරී' නැවත පදිංචිකිරීම් පිළිබඳ චෝදනාවන් එල්ලවීමට මඟ පෑදීය. අදහස් විමසීමේ හා සහභාගී කරගැනීමේ පියවරයන් සුනාමි නැවත ගොඩනැංවීමේ ව්‍යාපෘතීන් තුළදී යොදාගනු ලැබූවද ගැටුම් අවතැන්වීම් හා නැවත පදිංචිකිරීම්වලදී එම

ක්‍රමවේදය යොදාගැනීම ප්‍රශ්නාර්ථයක් වියහැකි යැයි බලධාරීන්ට හැඟුනු සෙයක් පෙනීයයි.

සීඝ්‍ර මිලිටරීකරණය

උතුර හා නැගෙනහිර සීඝ්‍ර මිලිටරීකරණයකට ලක්වීමද මානුෂවාදී ආධාර ලබාදීමට, නැවත පදිංචිකිරීම්, නැවත ඉදිකිරීම් හා සංවර්ධන මුල්පිරීම් අඛණ්ඩව හා ක්‍රමවත්ව ලබාදීමට බාධාකාරී ලෙස බලපා ඇත. උදාහරණයක් ලෙස උතුරේ හා නැගෙනහිර පළාත්වල ආණ්ඩුකාරවරුන් ලෙසත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ උප දිසාපති ලෙසත් හිටපු හමුදා නිලධාරීන් පත්කිරීම දැක්විය හැක. කලින් සිවිල් පරිපාලන නිලධාරීන්ගේ විෂය පථය යටතේ පැවැති නැවත පදිංචිකිරීම් සම්බන්ධයෙන් වගකීම දරන තනතුරුවලට හිටපු හමුදා නිලධාරීන් පත්කරමින් එම තනතුරු මිලිටරීකරණය කිරීම අවධානයට ලක්විය යුතු කරුණකි. පරිපාලනයේ මිලිටරිමය භූමිකාව ඉහළයාම හේතුවෙන් මානුෂීය ආධාර සැපයීමේදී ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ට මිලිටරිමය ස්ථාපිතයන් හරහා ගමන්කිරීමට සිදුවීමත් සිය ව්‍යාපෘතීන් හා වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා අනුමැතිය ලබාගැනීමට ඔවුන්ට හිටපු හමුදා නිලධාරීන් වෙත යාමට සිදුවීමත් ප්‍රතිඵලකොට ඇත. 2006 වසරේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් පදිංචිකිරීම්වලින් බොහොමයක් හමුදා හා විශේෂ කාර්යබලකා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවුනු අතර සිවිල් පරිපාලනයට මෙහිදී එතරම් වැදගත් කාර්යභාරයක් හිමි නොවුනි. මිලිටරීකරණයවීම සාමාන්‍ය තත්ත්වයට පත්වීමට හා සිවිල් පරිපාලනය ශක්තිමත්වීමට බාධාවක් ලෙස පැහැදිලිවම තර්ක කළ හැක. හමුදා රැඳීසිටීම හා එම ප්‍රදේශයන් තුල ඔවුන් ක්‍රියාවට නංවන බලය වර්ධනයවීම ප්‍රදේශය සම්බන්ධ අනාගත සැලසුම් සම්බන්ධයෙන් ගැටළුකාරීත්වයක් මතු කරයි.

මානුෂවාදී ක්‍රියාකාරකම් මිලිටරීකරණයට ලක්කිරීම හමුදාවන් විසින් සිදුකරන්නක් පමණක් නොවේ. නැගෙනහිරදී ආයුධ සන්නද්ධ පැරාමිලිටරි කණ්ඩායම්ද මානුෂවාදී සහන සැලසීම භාරගෙන ඇත. උදාහරණයක් ලෙස මඩකලපුවේ මානුෂවාදී ආධාර කළමනාකරණය කිරීමේ භූමිකාව TMVP විසින් පවරාගෙන ඇතිවා පමණක් නොව ප්‍රාදේශීය රජයේ සේවකයන් හා මානුෂවාදී ක්‍රියාධරයින්ට නැගෙනහිරදී එක් විශේෂිත ප්‍රජාවක් සමඟ පමණක් කටයුතු කරන ලෙසට ඔවුන් විසින් බලපෑම් එල්ලකරනු ලැබ

ඇත. ජනවාර්ගික පක්ෂපාතීත්වයකින් යුතුව ඔවුන් කටයුතු කර ඇති අතර අරයම්පති හා ආලන්කුලම් යන මුස්ලිම්වරුන් අයිතිවාසිකම් කියන ප්‍රදේශයන්හි නිවාස ඉදිකිරීමට දිරිමත් කරවති.[47]

මානුෂවාදී සහන සැලසීම් ජනවාර්ගිකත්ව වුවමනාවන් වෙනුවෙන් යොදාගැනීම

මානුෂවාදී සහන සැලසීම් ජනවාර්ගිකත්ව වුවමනාවන් සඳහා යොදාගන්නේය යන චෝදනාවන් මතුවන්නේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට සැලකීමේදී ඔවුන් විශේෂිත ජනවාර්ගික කණ්ඩායමකට අයත්වන අවස්ථාවලදී කඩිනම් ප්‍රතිචාර දැක්වීම් හා සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් වෙනස් ආකාරයේ ප්‍රවේශයන් අනුගමනය කිරීම තුළය. උදාහරණයක් ලෙස 2006 වසරේ අවසන් භාගයේදී ත්‍රිකුණාමලයේ විවිධ ප්‍රදේශයන්ගෙන් සෙවණ සොයා අඛණ්ඩව කන්තලේ වෙත ඇදී ආ අවතැන්වූවන්ගේ ප්‍රවාහයන් දැක්විය හැක.[48] 2006 අගෝස්තු මාසයේදී මුතූර්වල සිට මුස්ලිම්වරුන්ගේ ආගමනය සම්බන්ධයෙන් දක්වන ලද ප්‍රතිචාරයන් ඉතා දුර්වල මට්ටමක පැවති අතර සහන සැලසීමේ කාර්යයන්හි ප්‍රධාන වශයෙන් නිරතවූයේ මුස්ලිම් සහන සංවිධානයන් පමණකි. 2006 දෙසැම්බර් මාසයේදී අවතැන්වූ සිංහල ජනයා සේරුනුවර වෙත ඇදී ආ අවස්ථාවේදී සහන සැලසීමේ කටයුතු වඩා හොඳින් කළමනාකරණය කරනු දැකගත හැකිවිය.[49]

ත්‍රිකුණාමල නගරයේ අවතැන්වූ දෙමළ ජනයා ආන්තිකකොට ඇත්තේ මන්ද යන්න සහ කැබිතිගොල්ලෑවේ අභ්‍යන්තරිකව අවතැන්වූ සිංහල ජනතාවට ලැබුණු ආධාර ගලාඒමට සාපේක්ෂව ඔවුන්ට ආධාර නොලැබුණේ මන්ද යන්න ජනමාධ්‍ය වාර්තාවන් මඟින් ප්‍රශ්න කරනු ලැබිණි.[50] කැබිතිගොල්ලෑවේ අවතැන්වූවන්ට මසක් ඇතුළත තාවකාලික නිවාස ලැබුණු අතර ත්‍රිකුණාමලය වැනි උතුරේ හා නැගෙනහිර ප්‍රදේශයන්හි අවතැන්වූවන්ට මාස ගණනාවක් තිස්සේ පාසැල් ගොඩනැගිලි හා ආගමික

47 CPA සහ IMADR, Batticaloa Fact Finding Report, 2007 ජනවාරි

48 CPA සහ IMADR, Trincomalee Fact Finding Report, 2007 අප්‍රේල් 23-27, පි. 7

49 CPA ,IMADR සහ INFORM, Kanthale and Serunuwara Fact Finding Report, 2007 අගෝස්තු 21, පි. 5

50 Tamilnet, "Trincomalee displaced suffer discrimination in provision of relief- Elilan", 2006 ජූලි 6

ගොඩනැගිලිවල ජීවත්වීමට සිදුවිය. මීට අමතරව කැබිතිගොල්ලෑවේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට ලෝක ආහාර අරමුදල විසින් ලබාදෙන ආහාර ද්‍රව්‍ය මල්ලට අමතරව රජය විසින් මාසිකව වියළි ආහාර සලාකයක් ලබාදීමට තීරණය කරමින් අඛණ්ඩව සහන සැලසීමේ පරිශ්‍රමයක් දැකගත හැකිවිය.[51] ත්‍රිකුණාමලයේ සමහර ප්‍රදේශයන්, මඩකලපුව, පේසාලෙයි වැනි ප්‍රදේශයන්ද ඇතුළුව උතුරේ හා නැගෙනහිර අවතැන්වූ දෙමළ ජනයා සම්බන්ධයෙන් කටයුතුකොට ඇති ආකාරය මේ හා සැසඳිය යුතුය. එකී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා තිරසාර පරිශ්‍රමයක් දරා නොමැති අතර වියළි සලාක ලබාදීමක්ද සිදුව නොමැත.[52] මේ අනුව අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට අසමාන ලෙස සැලකීම යන කාරණය සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතු අතර ජනවාර්ගිකත්වය මත පදනම්ව විශාල වශයෙන් සැලකිල්ල දැක්වීම සිදුව ඇති බවක් පෙනී යයි.

විවිධ වූ අභ්‍යන්තරිකව අවතැන්වූ කණ්ඩායම් සඳහා එකිනෙකට වෙනස් ලෙස සැලකීම අවතැන්වීමේ පරිමාණය, ප්‍රවේශයේ පහසුව හා අවතැන් කඳවුරුවල ගුණාත්මකභාවය මතද රඳා පවතී. උදාහරණයක් ලෙස ප්‍රධාන මාර්ගයන්ට වඩා ඈතින් හා මහජනතාවගේ දර්ශනයෙන් ඔබ්බට පවත්නා කඳවුරුවලට වඩා ප්‍රධාන මාර්ගයන්ට හා ප්‍රධාන නගරයන්ට යාබදව පිහිටුවා ඇති අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරුවල පිරිස් හැමවිටම වඩා හොඳ පහසුකම්, විශේෂයෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන් වෙතින් අත්විඳිති.

ජනවාර්ගික වශයෙන් ප්‍රජාවන් ඉලක්ක කෙරෙමින් සිදුකෙරෙන ප්‍රචණ්ඩත්වයන්ද අවධානයට ලක්විය යුතුය. උතුරේ හා නැගෙනහිර ප්‍රචණ්ඩත්වයේ බලපෑමට වඩාත්ම ගොදුරුවී ඇත්තේ දෙමළ ප්‍රජාව වන අතර මායිම් ගම්මානයන්හි ජීවත්වන සිංහල හා උතුරු-නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන මුස්ලිම් ප්‍රජාවද ප්‍රචණ්ඩත්වයට ගොදුරුව පසුගිය වසර කිහිපය තුළ අවතැන්වීමට ලක්ව ඇත. එතරම් අවධානයට ලක් නොවුනද මානුෂවාදී ප්‍රතිචාරයන් තුල ජනවාර්ගිකමය ප්‍රචණ්ඩත්වය පැවතීම අනතුරුදායක වන අතර දරුණු ප්‍රතිවිපාකයන්

51 රූපවාහිනී, 2006 ජූලි 16

52 CPA සහ INFORM, තොරතුරු සොයාබැලීම සඳහා පේසාලෙයි වෙත කළ සංචාරය, 2006 ජුනි 28, පි. 5, CPA, INFORM, WMC සහ LST, "Batticloa Fact Finding Report", 2007 අප්‍රේල් 10, පි. 3

ඇතිකළ හැක. උදාහරණයක් ලෙස කල්පවත්නා විසඳුමක් වශයෙන් වෙනත් ස්ථානයන්හි පදිංචිකරවීමේදී එකී ස්ථාන තේරීම සිදුකරනු ලබන්නේ දේශපාලනික අරමුණු පෙරදැරි කරගෙන වියහැක. ගැටුමේ නිරත දෙපාර්ශවයම පදිංචිකරවීම්, සංවර්ධන යෝජනාක්‍රම මෙන්ම ප්‍රචණ්ඩත්වයද යොදාගනිමින් ජන අනුපාතයේ සමතුලිතතාවය පවත්වාගැනීමට උත්සාහ දරා ඇත. නැවත පදිංචිකරවීමේ යෝජනාක්‍රමයන් සම්බන්ධව කටයුතු කරන මානුෂවාදී නියෝජිතායතනයන් අධි ආරක්ෂිත කලාපවලින් දෙමළ ජනයා හා උතුරේ මුස්ලිම්වරුන් මෙන් බලහත්කාරයෙන් පිටමං කරනු ලැබූ ප්‍රජාවන්ට ස්වෙච්ඡාවෙන් එම ප්‍රදේශ වෙත නැවත පදිංචිවීමට ඇති අයිතිවාසිකම පිළිබඳව බලධාරීන්ට පැහැදිලි කළ යුතුය. එසේ කිරීමට අසමත්වීම, එකී නියෝජිතායතනයන්ගේ මධ්‍යස්ථභාවය ප්‍රශ්නකිරීමට ලක්කරනු ඇති අතර ගැටුම් සංවේදීතාවය වැනි පිළිගත් මානුෂවාදී මූලධර්මයන් අභියෝගයට ලක්කරනු ඇත.

10. මානුෂවාදී අවකාශය ඌනනයවීම

මානුෂවාදී ක්‍රියාධරයින්ට පවත්නා තර්ජනයන්

2006 වසරේදී වර්ධනය වෙමින් ආ නැඹුරුවක් වූයේ මානුෂවාදී ක්‍රියාධරයින් හා මානුෂවාදී අවකාශය මුහුණදෙන්නාවූ බාධකයන් හා තර්ජනයන්ය. තර්ජනයකිරීම්, පහරදීම් හා ඝාතනයකිරීම්ද ඇතුලත්ව මානුෂවාදී ක්‍රියාධරයින්ගේ ජීවිතවලට එල්ලවන්නාවූ තර්ජනයන් දැකිය හැකිවූ අතර එහි උච්චතම සිද්ධිය වූයේ 2006 අගෝස්තු මාසයේදී මුතූර්හිදී ජාත්‍යන්තර නියෝජිතායතනයක් වන Action Contre La Faim (ACF) හි දේශීය කාර්යමණ්ඩලයේ 17 දෙනකු ඝාතනය කරනු ලැබීමයි. මානුෂවාදී ක්‍රියාධරයින් වෙත එල්ලවූ පහරදීම් සංඛ්‍යාව විශාල වන අතර ඝාතනය කෙරුනු හා පැහැරගෙන යනු ලැබූ පිරිස ස්වදේශිකයන්වූ අතර ඉන් බහුතරයක් දෙමළ විය. එයින්ද වැඩි පිරිස දෙමළ තරුණ පිරිමි අයවලුන් වූහ. ගැටුම් සන්දර්භය තුල මානව හිමිකම් කඩවීමේ රටාව මින් නිරූපණය කෙරෙයි. මෙම සමහර ඝාතනයන් සිදුව ඇත්තේ ගැටුම් අතරවාරයේ මානුෂවාදී සේවකයින් 'දෙපාර්ශ්වය අතර වෙඩි හුවමාරු' වලට මැදිවීම, ක්ලේමෝ ප්‍රහාරයන්ට ලක්වීම ආදියෙනි. නමුත් අනෙකුත් සිද්ධීන් ඉතා නිවැරදි ලෙසම ඔවුන්ව එල්ලකර සිදුකරන ලද ප්‍රහාරයන් බව පෙනීයයි. යම් නිශ්චිත ජාත්‍යන්තර හෝ දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් ඉලක්ක

කිරීම වැනි හේතූන් මත මෙන්ම ජනවාර්ගිකත්වය සහ දේශපාලන ඝාතන, පුද්ගලික කෝන්තර වැනි වෙනත් පුද්ගලික හේතූන් මතද මෙම ඝාතන සිදුවිය හැක.

සියළුම සිදුවීම් විශේෂයෙන්ම ඝාතනයන් හා අතුරුදහන්වීම් විසින් පෙන්වාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා රජය මෙන්ම දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) ද මානුෂවාදී ක්‍රියාධරයින්ගේ සුරක්ෂිතභාවය හා අපක්ෂපාතීත්වය සහතික කරන්නාවූ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සම්බන්ධයෙන් දක්වන පැහැදිලි නොසැලකිල්ලයි. අභ්‍යන්තර ආයුධ සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් බලපවත්වන්නාවූ ජිනීවා සම්මුතියේ 3 වන වගන්තියට අනුව සිවිල් වැසියන්ට මානුෂික ලෙස සැලකියයුතු වන අතර ඔවුන්ගේ ජීවිතයට හෝ ශරීරයට එරෙහි ප්‍රචණ්ඩත්වයට ඔවුන් ලක් නොකළ යුතුය. ශ්‍රී ලංකාව ජිනීවා සම්මුතියේ දෙවන ප්‍රොටෝකෝලයට අත්සන් තබා නොමැති වුවද ජාතික මට්ටමේ නීති සම්පාදනයන් සිදුකිරීමේදී මානුෂවාදී සේවකයින් සම්බන්ධයෙන් සුවිශේෂී ලෙස අදාල වන්නාවූ ජිනීවා සම්මුතියේ 18 වන වගන්තිය ඇතුලත්කර 3 වන වගන්තිය බැහැර කිරීම හේතුවෙන්[53] එය තවදුරටත් සාම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියෙන් බැඳීසිටින්නේ යැයි තර්ක කළහැක.[54] මානුෂවාදී සේවකයින්ද ඇතුළුව සිවිල් වැසියන් වෙත එල්ලවන්නාවූ ඕනෑකමින්ම සිදුකරනු ලබන ප්‍රහාරයන් විසින් යුධ අපරාධයක් සංයුක්ත කරනු ලබයි. එබැවින් රාජ්‍යයන් විසින් එම වැරදි සිදුකරනු ලැබූ තැනැත්තන්ට එරෙහිව නඩු පැවරිය යුතුය.[55]

---

53 ජිනීවා සම්මුති පනත, 2006

54 Action Against Hunger, "Action Against Hunger ජාත්‍යන්තර ජාලය බෙහෙවින් කණගාටුවට පත්ව සිටින අතර මූතූර්හි 'යුධ අපරාධය' සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටියි.", 2006 අගෝස්තු 10. ගෞරවනීය සභාපති ප්‍රකාශයට පත්කොට සිටියේ මෙය ඉතාමත් බියගුළු අපරාධයක් බවත්, Action Against Hunger සේවකයින් මරාදැමීම සිතාමතා වුවමනාවෙන් කරන ලද මිනීමැරුමක් වන බවයි. ඔවුහු දෙආකාර විනාශයක් සිදුකරනු ලැබූහ. එනම් ඔවුන් ජීවිත විනාශකිරීම සහ මානුෂවාදී නිලධාරියකු නියෝජනය කරන 'පූජනීය වූ' අවකාශය විනාශ කිරීමයි."

55 ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, පින්ලන්ත රතු කුරුස ප්‍රකාශනයකින් උපුටා ගැනීමකි, ඇලෙක්සැන්ඩර් ෆෙයිට්, "ක්ෂේත්‍රයේදී මානුෂවාදී සේවකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වන නෛතික වැදගත්කම," 2002 ජුනි, පි. 38

මානුෂවාදී ක්‍රියාධරයින් වෙත පැනවී ඇති බාධාවන්

ආරක්ෂාව පිළිබඳ ගැටළුවලට අමතරව සිය කටයුතු කරගෙනයාමේදී මානුෂවාදී නියෝජිතායතනයන් මුහුණපාන්නාවූ වෙනත් බාධකයන්ද පවතී. දැනටමත් සාකච්ඡා කළ ආකාරයට මාර්ග වසාදැමීම හා භාණ්ඩ ප්‍රවාහනයේදී සීමා පැනවීම වැනි සංචලනයේ සීමාවන් මේ අතර වෙයි. මානුෂවාදී ක්‍රියාධරයින්ගේ ආරක්ෂාව සැපයීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය විසින් පිළිගෙන ඇති අතර ජිනීවා සම්මුතිය හා ආනුෂංගික ප්‍රොටෝකෝලයන් මඟින් සුරක්ෂිත කරනු ලැබ ඇත. ගැටුම්වල බලපෑමට ගොදුරුවූ ප්‍රදේශයන් වෙත මානුෂවාදී ක්‍රියාධරයින් ප්‍රවේශවීම ආරක්ෂක හේතූන් මත සටන්වල නියුතු කණ්ඩායම් විසින් විශාල වශයෙන් සීමා කරනු ලබයි. මේ කාරණය LTTE පාලන ප්‍රදේශයන්ට බෙහෙවින්ම අදාළ වූවකි. ආරක්ෂක මෙහෙයුම් තීව්‍ර කිරීමේදී සාම්පූර්, වහාරි, මඩකලපුව බටහිර හා වන්නි ප්‍රදේශයන්ට ඇතුළුවීම සීමාකරනු ලැබිණි. කාලතුවක්කු ප්‍රහාර, ගුවනින් බෝම්බ හෙලීම් හා වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ද ඇතුළු එදිරිවාදිකම් ආරම්භවීමත් සමඟ එම ප්‍රදේශයන් තුල ක්‍රියාත්මකවීමට සහ බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන් සැපිරීමට මානුෂවාදී ක්‍රියාධරයින්ට අවකාශ සැලසීම අතිශයින් වැදගත්ය. මෙහිදී රජයට හා LTTE යට මානුෂවාදී ක්‍රියාධරයින් හා ඔවුන්ගේ වාහනවලට ආරක්ෂිතව ප්‍රවේශ වියහැකි ආරක්ෂිත මංතීරුවක් ස්ථාපිතකිරීම වැනි පියවරයන් අනුගමනය කළ හැක. එවැනි ක්‍රියාමාර්ගයක් ඵලදායී වීමට නම් දෙපාර්ශවයම මූලික කොන්දේසින්ට එකඟවිය යුතු වන අතර දෙන ලද කාල රාමුවක් තුළ එදිරිවාදී කටයුතුවලින් වැළකිය යුතුය. උදාහරණයක් ලෙස 2006 අගෝස්තු මාසයේදී වහාරෙයිහි ප්‍රචණ්ඩත්වය උත්සන්න වීමෙන් අනතුරුව එම ප්‍රදේශයට ප්‍රවේශවීම අතිශයින් සීමාකරන ලදී. එක්තරා දුර්ලභ අවස්ථාවකදී එක්සත් ජාතීන්ගේ රථ පෙළකට ගමන්කිරීමට දෙපාර්ශවය විසින්ම අවසර ලබාදෙනු ලැබූ අතර අතරමඟදී රථ පෙළ අනතුරට ලක්කරමින් සටන් ඇවිලී යන ලදී.

රජය ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් දැඩි පිළිවෙතක් අනුගමනය කරනු ලබයි. 2006 වසරේදී සියළුම ජාත්‍යන්තර ආධාර දෙන නියෝජිතායතනයන්ට සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලියාපදිංචි වන ලෙසට දැනුම්දෙනු ලැබිණි. මීට සමාන්තරව ජාත්‍යන්තර සහන සේවකයින්ට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිවීමට සිදුවිය. ඇත්ත වශයෙන්ම ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය වූයේ නියෝජිතායතනයන්

සඳහා නොව පුද්ගලයින් සඳහා වන අතර එහිදී ලබාදිය යුතුවූ තොරතුරු අනුව පෙනීගියේ එය ප්‍රධාන කොටම උතුරේ හා නැගෙනහිර ක්‍රියාත්මක ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් වන බවයි.[56] සිය විදේශීය සේවකයින් සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්ට නව වීසා බලපත් ලබාගැනීමට සිදුවිය. සේවා අවසරපත් නොලද අය අත්අඩංගුවට ගැනීමේ හැකියාව පැවතිණි.[57] බහුතරයක් නියෝජිතායතනයන්ට සේවා අවසරපත් ලැබුණු නමුත් ඒවා නිකුත්කිරීමේ ප්‍රමාදයන්ට මුහුණදීමට බොහෝ දෙනෙකුට සිදුවිය. සිය මෙහෙයුම් කටයුතු සිදුකළයුතු භූගෝලීය ප්‍රදේශය හා වීසා බලපත්‍රයන්හි කාලසීමාව සම්බන්ධයෙන් සීමාවන් පනවනු ලැබිණි.

මානුෂවාදී ක්‍රියාධරයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා බැඳුනු බලධාරීන් හා ආයුධ අතැති පිරිස් විසින් පනවන ලද ආරක්ෂක සීමාකිරීම් හා වැඩිවෙමින් පවත්නා බලහත්කාරයන් මානුෂවාදී ක්‍රියාධරයින් සඳහා වන අවකාශය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇතිකොට ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමහර වැඩසටහන් නැවත සැලසුම් කිරීමට මෙන්ම සමහර ප්‍රදේශයන්හි ක්‍රියාකාරීත්වයන් සීමාසහිත කිරීමට පියවර ගනු ලැබ ඇත. මානුෂවාදී ක්‍රියාධරයින් මුහුණ දෙන්නාවූ විවිධාකාර තර්ජනයන් සීමාකිරීම් හා බාධාවන්හි අවසාන බලපෑම ඇතිවන්නේ ඔවුන්ගේ මැදිහත්වීම හා සහයෝගය වඩාත් අවශ්‍ය කරන්නාවූ ප්‍රජාවන් කෙරෙහිය. දැනටමත් සාකච්ඡා කරන ලද ආකාරයට ආපදා තත්ත්වයන්හිදී රජයේ මන්දගාමී හා අකාර්යක්ෂම ප්‍රතිචාර දැක්වීම් හමුවේ විශාල වශයෙන් ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන මත යැපීමට සිදුවන තත්ත්වයක් පවතින බව පෙනීගොස් ඇත. සමහර ප්‍රදේශයන්හි කටයුතු කිරීම සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් නියෝජිතායතනයන්ට බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිවීම තුළ මානුෂවාදී අර්බුදය තවදුරටත් නරක අතට හැරීමේ සම්භාවිතාවයක් පවතී. මානුෂවාදී ක්‍රියාධරයින්ගේ ආරක්ෂාව සහතික කිරීමට හා ඔවුන් මත පටවනු ලබන අනවශ්‍ය බාධකයන් ඉවත්කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ සියළුම පියවරයන් රජය සහ LTTE ය විසින් ගත යුතුව ඇත.

56 HRW, "Improving Civilian Protection in Sri Lanka", 2006 සැප්තැම්බර්, පි. 25
57 AFHRD, "Sri Lankan government and LTTE must…" 2006 අගෝස්තු 21

11. අවසානය

මෙහිදී අවධානයට ලක්කරන ලද වසර බරපතල මානව හිමිකම් කඩකිරීම් අත්දකින ලද වසරක් වන අතර වර්ධනය වෙමින් පවත්නා අර්බුදයට පිළියම් යෙදීම සඳහා රජය දරා ඇති උත්සාහයන් සීමාසහිතය. සුනාමියෙන් හා ගැටුම්වලින් සිදුවූ අවතැන්වීම් අත්දුක ඇති ශ්‍රී ලංකාවට මෙම පරිච්ඡේදයෙන් ආවරණය කරනු ලැබූ කලාපයන් කිහිපයක්ම අලුත් ඒවා නොවන නමුත් ආහාර, සෙවණ, සනීපාරක්ෂාව හා කඳවුරු තුළදී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ආරක්ෂාව සැලසීම වැනි මානුෂවාදී අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීමේදී මෙන්ම ජීවිකාවන්, අධ්‍යාපනය හා මානුෂවාදී ප්‍රතිචාර දක්වීම වැනි දීර්ඝකාලීන ක්‍රියාවලීන් තුළදීද දක්වා ඇත්තේ මන්දගාමී හා අලස ප්‍රතිචාරයකි. ආරක්ෂක හෝ පරිපාලනමය පරිචයන් හේතුකොටගෙන මානුෂවාදී මැදිහත්වීම් සඳහා වන අවකාශය ක්ෂයවීම, මානුෂවාදී ප්‍රතිචාර දක්වීම් දේශපාලන හා ජනවාර්ගික වුවමනාවන් වෙනුවෙන් යොදාගැනීම වැනි නව නැඹුරුතාවයන්ද 2006 වසරේ අත්දකින ලදී. මෙම පරිච්ඡේදය විසින් අවතැන්වීම සම්බන්ධයෙන් හඳුනාගනු ලැබූ වැදගත් කාරණාවන් කිහිපයක්ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අවධානයට ලක්වියයුතු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම පැවරෙන්නේ ශ්‍රී ලංකා රජයටය. පිරිහෙමින් පවත්නා තත්ත්වය සහ අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා බලපෑමට ලක්වූ ප්‍රජාවන්ගේ තත්ත්වය යහපත් අතට හැරවීම සඳහා අදාළ සියලුම පාර්ශවයන් විසින් වේගවත් හා ඵලදායී පියවරයන් ක්‍රියාවට නංවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

සඳහා නොව පුද්ගලයින් සඳහා වන අතර එහිදී ලබාදිය යුතුවූ තොරතුරු අනුව පෙනීගියේ එය ප්‍රධාන කොටම උතුරේ හා නැගෙනහිර ක්‍රියාත්මක ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් වන බවයි.[56] සිය විදේශීය සේවකයින් සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්ට නව වීසා බලපත් ලබාගැනීමට සිදුවිය. සේවා අවසරපත් නොලද අය අත්අඩංගුවට ගැනීමේ හැකියාව පැවතිණි.[57] බහුතරයක් නියෝජිතායතනයන්ට සේවා අවසරපත් ලැබුණු නමුත් ඒවා නිකුත්කිරීමේ ප්‍රමාදයන්ට මුහුණදීමට බොහෝ දෙනෙකුට සිදුවිය. සිය මෙහෙයුම් කටයුතු සිදුකළයුතු භූගෝලීය ප්‍රදේශය හා වීසා බලපත්‍රයන්හි කාලසීමාව සම්බන්ධයෙන් සීමාවන් පනවනු ලැබිණි.

මානුෂවාදී ක්‍රියාධරයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා බැඳුනු බලධාරීන් හා ආයුධ අතැති පිරිස් විසින් පනවන ලද ආරක්ෂක සීමාකිරීම් හා වැඩිවෙමින් පවත්නා බලහත්කාරයන් මානුෂවාදී ක්‍රියාධරයින් සඳහා වන අවකාශය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇතිකොට ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමහර වැඩසටහන් නැවත සැලසුම් කිරීමට මෙන්ම සමහර ප්‍රදේශයන්හි ක්‍රියාකාරීත්වයන් සීමාසහිත කිරීමට පියවර ගනු ලැබ ඇත. මානුෂවාදී ක්‍රියාධරයින් මුහුණ දෙන්නාවූ විවිධාකාර තර්ජනයන් සීමාකිරීම් හා බාධාවන්හි අවසාන බලපෑම ඇතිවන්නේ ඔවුන්ගේ මැදිහත්වීම හා සහයෝගය වඩාත් අවශ්‍ය කරන්නාවූ ප්‍රජාවන් කෙරෙහිය. දැනටමත් සාකච්ඡා කරන ලද ආකාරයට ආපදා තත්ත්වයන්හිදී රජයේ මන්දගාමී හා අකාර්යක්ෂම ප්‍රතිචාර දැක්වීම් හමුවේ විශාල වශයෙන් ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන මත යැපීමට සිදුවන තත්ත්වයක් පවතින බව පෙනීගොස් ඇත. සමහර ප්‍රදේශයන්හි කටයුතු කිරීම සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් නියෝජිතායතනයන්ට බලපෑමට ගොදුරුවූ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිවීම තුළ මානුෂවාදී අර්බුදය තවදුරටත් නරක අතට හැරීමේ සම්භාවිතාවයක් පවතී. මානුෂවාදී ක්‍රියාධරයින්ගේ ආරක්ෂාව සහතික කිරීමට හා ඔවුන් මත පටවනු ලබන අනවශ්‍ය බාධකයන් ඉවත්කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ සියළුම පියවරයන් රජය සහ LTTE ය විසින් ගත යුතුව ඇත.

56 HRW, "Improving Civilian Protection in Sri Lanka", 2006 සැප්තැම්බර්, පි. 25
57 AFHRD, "Sri Lankan government and LTTE must…" 2006 අගෝස්තු 21

11. අවසානය

මෙහිදී අවධානයට ලක්කරන ලද වසර බරපතල මානව හිමිකම් කඩකිරීම් අත්දකින ලද වසරක් වන අතර වර්ධනය වෙමින් පවත්නා අර්බුදයට පිළියම් යෙදීම සඳහා රජය දරා ඇති උත්සාහයන් සීමාසහිතය. සුනාමියෙන් හා ගැටුම්වලින් සිදුවූ අවතැන්වීම් අත්දුක ඇති ශ්‍රී ලංකාවට මෙම පරිච්ඡේදයෙන් ආවරණය කරනු ලැබූ කලාපයන් කිහිපයක්ම අලුත් ඒවා නොවන නමුත් ආහාර, සෙවණ, සනීපාරක්ෂාව හා කඳවුරු තුළදී අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ආරක්ෂාව සැලසීම වැනි මානුෂවාදී අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීමේදී මෙන්ම ජීවිකාවන්, අධ්‍යාපනය හා මානුෂවාදී ප්‍රතිචාර දූක්වීම වැනි දීර්ඝකාලීන ක්‍රියාවලීන් තුළදීද දක්වා ඇත්තේ මන්දගාමී හා අලස ප්‍රතිචාරයකි. ආරක්ෂක හෝ පරිපාලනමය පරිචයන් හේතුකොටගෙන මානුෂවාදී මැදිහත්වීම් සඳහා වන අවකාශය ක්ෂයවීම, මානුෂවාදී ප්‍රතිචාර දූක්වීම් දේශපාලන හා ජනවාර්ගික වුවමනාවන් වෙනුවෙන් යොදාගැනීම වැනි නව නැඹුරුතාවයන්ද 2006 වසරේ අත්දකින ලදී. මෙම පරිච්ඡේදය විසින් අවතැන්වීම සම්බන්ධයෙන් හඳුනාගනු ලැබූ වැදගත් කාරණාවන් කිහිපයක්ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අවධානයට ලක්වියයුතු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම පැවරෙන්නේ ශ්‍රී ලංකා රජයටය. පිරිහෙමින් පවත්නා තත්ත්වය සහ අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා බලපෑමට ලක්වූ ප්‍රජාවන්ගේ තත්ත්වය යහපත් අතට හැරවීම සඳහා අදාළ සියලුම පාර්ශවයන් විසින් වේගවත් හා ඵලදායී පියවරයන් ක්‍රියාවට නංවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

4

ශ්‍රී ලංකාවේ අභිචෝදන ක්‍රමය තුළ විමර්ශනය සඳහාවූ කොමිසම්හි කාර්යභාරය

*ආචාර්ය ජේ. ද අල්මේදා ගුණරත්න**

1. හැඳින්වීම

මූලික වශයෙන්ම, ශ්‍රී ලංකාව යටත් විජිත කොළනියක්ව පැවති අවධියේදී, විධායක ප්‍රඥප්තීන් ව්‍යවස්ථාපිතව හඳුන්වාදීමෙන් අනතුරුව 1872 "රාජ සන්නසෙහි" vii වන ව්‍යවස්ථාව අනුව අග්‍රාණ්ඩුකාරවරයා විසින් ප්‍රථමයෙන්ම විමර්ශනය සඳහාවූ කොමිසම් පිහිටුවන ලදී.[1] 1948 දිවයින නිදහස ලබාගැනීමෙන් අනතුරුව නිදහස් ශ්‍රී ලංකාවේ සම්මත කරගන්නා ලද පළමු පනත්වලින් එකක් වූයේ 1948 අංක 17[2] දරන විමර්ශනය සඳහාවූ කොමිසම් පනතයි. මෙම පනත 1872 ආඥා පනතට ව්‍යවස්ථාපිත අනුප්‍රාප්තිකයෙක් ලෙස පිහිටුවා තිබූ අතර මෙම පනතේ වගන්තීන් යටතේ අග්‍රාණ්ඩුකාරවරයාහට[3] විමර්ශනය සඳහාවූ කොමිසම්වලට පත්කිරීම් කිරීමේ සම්පූර්ණ බලය යන සංකල්පනාත්මක වෙනස්කම් ගැබ්ව තිබිණි. ඒ අනුව 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිහට

---

* ජනාධිපති නීතිඥ, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ආරාධිත දේශක සහ විභාග පරීක්ෂක, නීතිය සහ සමාජ භාරයේ උපදේශක, බස්නාහිර, දකුණු සහ සබරගමු පළාත්වල පුද්ගල අතුරුදහන්වීම් සහ ස්වෙච්ඡාවෙන් නොවන ඉවත්කිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා 1994 පිහිටුවන ලද කොමිසමෙහි හිටපු කොමසාරිස්

1 1872 අංක 09 දරන විමර්ශන කොමිසම් ආඥා පනත

2 1948 අංක 17 දරන විමර්ශන කොමිසම් පනත (සංශෝධන පරිදි) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) සහ 33 යන ව්‍යවස්ථා අනුව කියවිය යුතුය.

3 නිදහසට පෙර ආණ්ඩුකාරවරයා යන නිලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය උරුමකරු

නාමික විධායකය ලෙසද, දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපතිවරයාහටද විමර්ශනය සඳහාවූ කොමිසම් පත්කිරීමේ බලය ලබාදී තිබුණි.[4]

2. විමර්ශනය සඳහාවූ කොමිසම් පනත යටතේ අදාළ කොමිසම්වල විෂය පථය සහ ස්වභාවය[5]

පනතේ 2(1) වගන්තිය මගින් පහත සඳහන් කාරණා සම්බන්ධ තොරතුරු අනාවරණය කරයි.

(අ) රජයේ දෙපාර්තමේන්තුවක පරිපාලනය හෝ මහජන හෝ ප්‍රාදේශීය අධිකාරියක හෝ ආයතනයක පරිපාලනය

(ආ) රාජ්‍ය සේවයේ සිටින සාමාජිකයකුගේ ක්‍රියාකලාපය

(ඇ) මහජන ආරක්ෂාව හෝ සුභසාධනය සම්බන්ධයෙන් වන ඕනෑම ගැටළුවක්

මහජන ආයතනයන් සම්බන්ධයෙන් සහ මහජන නිලධාරීන්ගේ ක්‍රියාකලාපයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට, අල්ලස් සහ දූෂණ චෝදනා,[6] පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය,[7] ආණ්ඩුව විසින් ඇති කරගන්නා ගිවිසුම් සම්බන්ධ දූෂණයන්[8] සහ නාවුක නිලධාරීන්ගේ ක්‍රියාකලාපයන් සම්බන්ධයෙන් විස්තර ලබාගැනීම[9] සඳහා පසුගිය අවුරුදු කිහිපය පුරාවට විවිධ කොමිසම් පත්කරන ලදී.

---

4 1948 අංක 17 දරන විමර්ශන කොමිසම් පනත (සංශෝධන පරිච්) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) සහ 33 යන වගන්ති සමග කියවිය යුතුය.

5 මින් පසුව පනත ලෙස දැක්වේ

6 *ද මෙල්. ඒ. ද සිල්වා* (51 NLR 105) සහ *කොළඹ නගරාධිපති ඒ. සී. එම්. සී. අල්ලස් කොමසාරිස්*, 41 CLW 28. එසේම *කොළඹ නගරාධිපති ඒ. සී. එම්. සී. අල්ලස් කොමසාරිස්* 41 CLW 33.

7 *සිල්වා සහ තවත් අය ඒ. සිද්දික්* (1978 - 79) 1 SLR 166

8 *රත්න ගෝපාල් නඩුව*, 70 NLR 409

9 *නීතිපති ඒ. චන්මුගම්* (71 NLR 78)

3. මානව හිමිකම් කඩකිරීම්, අතුරුදහන් කිරීම් සහ අධිකරණ බාහ්‍ය ඝාතනයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිසම් පත්කිරීම සම්බන්ධ කෙටි හැඳින්වීමක්

අධිකරණ බාහ්‍ය ඝාතනයන් සහ බලෙන් අතුරුදහන් කිරීම් ඇතුළු මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීමට පනතේ 2(1) වගන්තිය යටතේ පත්කරන ලද කොමිසම් සඳහා ප්‍රකාශිතව බලය දී නැත. මෙවැනි උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන් ඉදිරියට පැමිණවීම, ස්ථාපනයවූ නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් අතට සාධාරණවම සහ ඍජුවම පත්වේ. මෙම ආයතනයන් මඟින් අදාළ ක්‍රියා කිරීමට අසමත්වීම තුළ, ඔවුන්ගේ පරිපාලනයේ දෝෂයන් සහ ඔවුන්ගේ පෞද්ගලික ක්‍රියාකලාපයන් සම්බන්ධයෙන් විමර්ශනය කළ යුතුය. මෙවැනි නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් මගින් ඔවුන්ගේ පොදු බලතල සහ මහජන ආරක්ෂාව සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිකර්මයන් ගැනීමට අසමත්වීමට හේතු විමර්ශනය කිරීම මෙම කොමිසම් මගින් විචාරා දැනගත යුතුය.

ඊළඟට මතුවන ගැටළුව වන්නේ බලහත්කාරයෙන් සිදුවන අතුරුදහන්වීම් සහ අධිකරණ බාහ්‍ය ඝාතනයන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීම සඳහා මෙම විමර්ශනය සඳහාවූ කොමිසම් සේවයේ යෙදවීම ප්‍රයෝජනයක් වූයේද යන්නයි. මෙම කොමිසම්හි ක්‍රියාකාරීත්වය සහ බලතල තුළින් නීතිය බලාත්මක කිරීමේ ආයතනයන්හි ආයතනික සේම තර්කානුකූල හේතූන් සහ මහජන කාර්යභාරයක් ඇති කළ නොහැක. කොමිසම් මගින් සිදුකරන විමර්ශනයන් තුළින් අදාල අයිතිවාසිකම් උල්ලංඝනය කළ වැරදිකරුවන් හඳුනාගැනීම හෙළිදරව් කළද එනයින්ම දණ්ඩනීය ප්‍රතිඵල ලබාදීමක් සිදුනොවේ. මෙම කොමිසම් මගින් සිදුකරනු ලබන එවැනි සොයාගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිය බලාත්මක කිරීමේ ආයතනයන්හට ඔවුන්ගේ මහජන ක්‍රියාකාරීත්වයන් හරහා අවස්ථාව ලබාදෙයි. මූලික අවස්ථාවේදීම මෙම ආයතනයන් විසින් සිය බලතල නිසි අයුරින් ක්‍රියාත්මක කරවූයේ නම් විමර්ශනය සඳහා කොමිසම් පත්කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට මෙම කොමිසම් පත්කිරීමේ සමස්ත ක්‍රියාවලිය සම්බන්ධයෙන්ම මෙම පරස්පර විරෝධීභාවය තුළින් බරපතල ගැටළුවක් මතු කරයි.

1987 සහ 1990 යන කාල පරිච්ඡේදය ඇතුළත අතිමහත් වශයෙන් සිදුවූ බලහත්කාරයෙන් අතුරුදහන්වීම් සහ අධිකරණ බාහ්‍ය ඝාතනයන් ඇතුළු මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් දේශීය සහ අන්තර්ජාතික වශයෙන් ඇතිවුණු පීඩනය හේතුවෙන් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා විසින් 1993 දී ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීම සඳහා විමර්ශන කොමිසම් පත්කරන ලදී. (මෙම කාල පරිච්ඡේදය දකුණේ සිදුවූ දෙවැනි කැරැල්ල ලෙස හඳුන්වනු ලැබේ.) කෙසේ වෙතත්, මෙම කොමිසම මඟින් 1991 ජනවාරි වලින් පටන් ගන්නා කාලය සම්බන්ධයෙන් පමණක් සිය විමර්ශන කටයුතු කළ අතර, 1991 ජනවාරි වන විටත් බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සිදුවී තිබූ අතර එම උල්ලංඝනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමක් මෙම කොමිසම මඟින් සිදු නොවුණි. ඊට අමතරව, 1979 සිට 1987 දක්වා කාලය තුළ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි සිදුවුණු උල්ලංඝනයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට කිසිදු උත්සාහයක් නොගන්නා ලදී.

මේ අතර සිදුවූ දේශපාලනික වෙනස්වීම් මත නිරුත්සාහක ඉවත්කිරීම් සහ පුද්ගලයන් බලහත්කාරයෙන් පැහැරගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග (1994 දී) "අතුරුදහන්වීම් පිළිබඳ කොමිසම" පත්කරන ලදී.[10] ජනාධිපති රණසිංහ ප්‍රේමදාස විසින් අත්හල ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් මෙම කොමිසම මඟින් ආවරණය කරන ලදී.[11]

1987 සිට 1990 දක්වා කාලය සඳහා බස්නාහිර, දකුණු සහ සබරගමුව පළාත් තුළ සිදුවන ලද මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් අධ්‍යයනය කිරීමට 1994 දී පිහිටුවන ලද "අතුරුදහන්වීම් පිළිබඳ කොමිසම" ඔවුන්ටම ආවේණික අයුරින් ක්‍රියාත්මකවූ

---

10 1988 ජනවාරි 01 දිනෙන් පසු අතුරුදහන්වූ පුද්ගලයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා 1948 පනත යටතේ ජනාධිපති විසින් 1994 නොවැම්බර් 30 වන දින පිහිටුවන ලදී. එවැනි වූ ආකාරයේ වැරදි නැවත සිදුවීම වැළැක්වීම සඳහා වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මෙහි අරමුණ විය. එසේම එම අතුරුදහන්වූවන්ගෙන් යැපෙන්නන් සහ ඔවුන්ගේ පවුල්වලට මෙය සහනයක් විය. බස්නාහිර, දකුණු සහ සබරගමුව පළාත් කොමිසමේ 1997 සැසිවාර පත්‍රිකා අංක II සහ V දක්වාවූ අතුරු සහ අවසාන වාර්තා, මධ්‍යම, ඊසාන, උතුරු මැද සහ ඌව පළාත් කොමිසමේ 1997 සැසිවාර පත්‍රිකා අංක III සහ VI හි අතුරු සහ අවසාන වාර්තා, උතුරු සහ නැගෙනහිර පළාත් කොමිසමේ 1997 II සහ V දක්වා වූ අතුරු සහ අවසාන වාර්තා බලන්න.

11 ජනාධිපති ප්‍රේමදාසගෙන් පසුව ආ ජනාධිපති ඩී. බී. විජේතුංග විසින් ඉල්ලා තිබූ පුළුල් කිරීම පරිදි 1993 කොමිසමේ නියෝජනය නැවත ස්ථාපනය කරන ලදී.

ආකාරය සම්බන්ධයෙන් 1948 අංක 17 දරන පනතෙහි අදාළත්වය සහ සුදුසුභාවය මෙම ලිපිය මගින් අධ්‍යයනය කෙරේ. (මින් පසුව මෙම කොමිසම් 1994 බස්නාහිර, දකුණු සහ සබරගමුව අතුරුදහන්වීම් පිළිබඳ කොමිසම ලෙස හඳුන්වනු ලැබේ.

ජනාධිපතිගේ අධිපත්‍ර ක්‍රියාත්මක කිරීම තුළින් මතුවූ සමහර සිද්ධීන්ද ඇතුළුව 2005 අගෝස්තු 01 වන දින සිට පැනනැගුණු තදබල මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට 2006 ඔක්තෝම්බර් මාසයේ ජනාධිපතිතුමා විසින් පත්කරන ලද වර්තමාන විමර්ශන කොමිසම ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නන්හට මෙම ප්‍රයත්නය උපකාර වනු ඇතැයි අරමුණු කෙරේ.

4. විමර්ශන කොමිසම ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් විවිධ ප්‍රවේශයන් පිළිබඳ සුවිශේෂී විග්‍රහයක්

4.1 1994 විමර්ශන කොමිසම ක්‍රියාත්මක කිරීම හා සසඳා බැලීමේදී 2006 විමර්ශන කොමිසමේ පුළුල් අරමුණු.

ඔවුන් පත්කිරීමේ පුළුල් අරමුණු සම්බන්ධයෙන් මෙම කොමිසම් දෙක සසඳා බැලිය හැකිය.

(i) මෙවැනි උල්ලංඝනයක් සම්බන්ධයෙන් වගකිවයුත්තෝ කවුරුන්ද යන්න හඳුනාගැනීම ස්ථාපිත කිරීම[12] සම්බන්ධව

(ii) වැරදිකරුවන්ට විරුද්ධව ශ්‍රී ලංකාවේ නීතියට අනුව ගතයුතු පියවරයන් නිර්දේශ කිරීම සම්බන්ධව

(iii) අදාළ උල්ලංඝනයන් සඳහා ගොදුරුවූවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් යථා තත්ත්වයට පත්කිරීම සඳහා පියවරයන් නිර්දේශ කිරීම

---

12 "නියෝජනය පිළිබඳ කාර්යපටිපාටිය සහ රීතීන් හා සම්බන්ධව කොමිසම විසින් යොදන ලද මූලධර්ම" සහ 3 වන ඡේදයේ "කැමරා ඉදිරියේ විභාගයන් අත්හිටුවීමට ගත් තීරණය" යන මාතෘකාවන් දෙක යටතේ වූ 1997 කොමිසම් වාර්තාවේ දෙවන පරිච්ඡේදය බලන්න.

4.2 ප්‍රසිද්ධියේ හෝ කැමරා ඉදිරිපිටදී හෝ සිදුවන ක්‍රියාදාමයන් පිළිබඳ පැනනැඟින ගැටළුව

ඉහතින් සඳහන් කරන ලද කිසිදු ගැටළුවක් සම්බන්ධයෙන් විමර්ශන මහජනතාව ඉදිරියේ නොපැවැත්වීමට අභිමතය භාවිතා කළ යුතු බවට 1994 අතුරුදහන්වීම පිළිබඳ කොමිසමට විධාන කරන ලදී.

2006 අතුරුදහන්වීම පිළිබඳ කොමිසමට නිකුත් කළ අධිපත්‍රය මගින් දක්වන ලද්දේ, ඉහත සඳහන් කරන ලද ගැටළු සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී එම විමර්ශන මහජනයා ඉදිරියේ නොපැවැත්වීමට හෝ අදාළ විමර්ශනයන්හි වැදගත්වන එක කොටසක් හෝ සම්බන්ධයෙන් මහජනයා ඉවත්කිරීමට අභිමතයක් කොමසාරිස්වරුන්ට ඇති බවයි.

කෙසේ වෙතත් මූලික වශයෙන් දැක්වූ මෙම කාරණය පිළිබඳ තවදුරටත් දක්වන්නේ නම්, ලැබෙන තොරතුරෙහි මටසිළුටුභාවය අදාළ විමර්ශනයන් සඳහා සාක්ෂි ලෙස ඉදිරිපත්කරන කරුණු හෝ තොරතුරු, එම තොරතුරු අනාවරණයෙන් ජාතික ආරක්ෂාව, මහජන සුරක්ෂිතභාවය සහ යහ පැවැත්ම ආරක්ෂා වේ නම් මෙම විමර්ශනය සඳහාවූ කොමිසම්හි විමර්ශනයන් මහජනතාවට එළිදැක්වීමට නියම කරන ලදී.

මෙසේ ප්‍රාරම්භ වශයෙන් ආරම්භ කරන ලද රීතීන් 1994 කොමිසමහි නොතිබුණු බව සහ එම අධිපත්‍රයන්හි මාධ්‍යය පිළිබඳ සඳහනක් නොවූ බව බැලූ බැල්මට පෙනීයයි. මාධ්‍යය සහ මහජනතාව අදාළ විමර්ශනයන්ගෙන් ඉවත්කිරීම සඳහා බස්නාහිර, දකුණු සහ සබරගමුව අතුරුදහන්වීම් පිළිබඳ 1994 කොමිසම සිය විමර්ශන කටයුතු ආරම්භකිරීමට පෙර "අදාළ ගැටළුවල මටසිළුටුභාවය අනුව එම ගැටළු අපේම රීතියකට අනුව විමර්ශනය කළයුතු බවට" රීතියක් සාදන ලදී. මෙම විමර්ශනයන්ට සහභාගිවීමෙන් මහජනයා වැළැක්වීම සහ මාධ්‍යය සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නොකිරීම ජනාධිපති අධිපත්‍ර මගින් ආරක්ෂා කරන ලද අදාළ කොමිසම්වලට ඇති අභිමතය තවදුරටත් ස්ථාපිත කරමින් 1948 අංක 17 දරන පනතේ 7 (ඉ) වගන්තිය නැවත ස්ථාපිත කරන ලදී.

ඒ අනුව එම අධිපත්‍රයේ ඇතුළත් වූයේ

(i) විමර්ශනයට හෝ විමර්ශනයේ කොටසක් සඳහා මහජනතාව ඇතුළත් කරගැනීම හෝ ඉන් ඉවත්කිරීම.[13]

(ii) විමර්ශනයට හෝ විමර්ශනයේ කොටසක් සඳහා මාධ්‍යය ඇතුළත් කරගැනීම හෝ ඉන් ඉවත්කිරීම.[14]

මෙම සන්දර්භය තුළ ප්‍රාථමික කරුණු 2 ක් හඳුනාගන්නා ලදී.

(අ) 1994 අතුරුදහන්වූවන් පිළිබඳ සොයාබැලීම සඳහාවූ කොමිසමේ බලපෑම මත 2006 අතුරුදහන්වූවන් පිළිබඳ සොයාබැලීම සඳහාවූ කොමිසමේ අධිපත්‍ර තුලින් මතු කරන ලද අදාළ විමර්ශනය සඳහා ලැබෙන සහ හෝ සාක්ෂි ලෙස ලැබෙන තොරතුරු සහ ද්‍රව්‍යයන්හි මටසිලුටුභාවය යන්න වර්තමාන ජනාධිපති කොමිසම තුලින් "ජාතික ආරක්ෂාවට, මහජන සුරක්ෂිතභාවයට හෝ යහ පැවැත්ම සඳහා හානි වේ නම් අනාවරණය වියයුතු බව තවදුරටත් දක්වන ලදී.

(ආ) ඉහතින් සඳහන් කරන ලද අධිපත්‍රයේ දක්වන ලද කාරණය අනුව ජාතික ආරක්ෂාව මහජන සුරක්ෂිතභාවය හෝ යහ පාලනයේ යහපත උදෙසා එකී කොමිසම සමර්ථ වියයුතු බව හෝ සිය අභිමතය භාවිතා කළයුතු බව දක්වන ලදී.

මෙම සන්දර්භය තුළ අදාළ වූ සමහර මූලධර්මයන් පිළිබඳ දැන් සාකච්ඡා කිරීම වැදගත් වේ.

(අ) මහජන භාරය පිළිබඳ සංකල්පය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාව මහජන ආරක්ෂක පනත[15] සමඟ කියවීමේදී ජනාධිපතිට හෝ ජනාධිපතිට පමණක්[16], ජාතික ආරක්ෂාව, මහජන සුරක්ෂිතභාවය සඳහා වඩාත්ම යහපත් කුමක්ද යන්න

---

13 වගන්ති (7) (ඉ) (i)

14 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිසම් පනතේ (1978 අංක 4 දරන පනතින් සංශෝධිත) 7 (ඉ) (ii) සහ 2(2) (ආ) වගන්ති බලන්න.

15 III වෙළුම, 51 වන පරිච්ඡේදය (LECSL) (1980 සංශෝධිත)

16 රටේ උසස් අධිකරණයන් විසින් බලගන්වන ලද අධිකරණමය සීමාකිරීම් වලට විෂය වේ.

තීරණය කිරීමට බලතල ලබාදී තිබේ. මේ සම්බන්ධ තීරණය විමර්ශනය සඳහාවූ කොමිසම් මත පැවරේද? පොදු නීතිය මගින් ස්ථාපනය කරන ලද සංකල්පයක් වූ "අභිනියෝජිතයාට තවද අභිනියෝජනය කළ හැකි නොවේ" යන *(delegatus non potest delegare)* යන සංකල්පය අභියෝගයට ලක්වේද?

මේ නයින් බලන කල තවදුරටත් මහජන භාරය යන සංකල්පයෙහි බලපෑම යන්නෙහි වැදගත්කම පැහැදිලි වේ. 7(ඇ) වගන්තිය මගින් අදාළ කොමිසම්වලට ස්වකීය විමර්ශනයන්ට මහජනතාව සහභාගි කරගැනීමේ හෝ නොගැනීමේ බලය ප්‍රදානය කර තිබේ. කෙසේ නමුත් ව්‍යවස්ථාපිතව සඳහන්ව ඇති මහජන භාරය යන්න තුළින් දෙන ලද බලය මගින් මහජනතාව හා සම්බන්ධවීමේදී වගකිවයුතුභාවය සහ විනිවිදභාවය යන සංකල්ප පිළිබඳ ඉල්ලුමක් ඇති කරයි.[17] එය එසේනම් මහජනතාව සහ මාධ්‍යය අදාළ කොමිසම්හි සවන්දීම් වලින් බැහැර කිරීම කෙතරම් සාධාරණද? ගුවන් තරංග[18] සහ ඛණිජ සම්පත්[19] වැනි ජාතික සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ව්‍යවස්ථාපිත අධිකාරීන් තීරණ ගැනීමේදී අධිකරණයට කීකරු වෙමින් මෙම මහජන භාරය යන සංකල්පය භාවිතා කරන ලදී. එය එසේනම් මෙම කොමිසම් මගින් සිය විමර්ශන කටයුතුවලින් මහජනතාව සහ මාධ්‍යය බැහැර කිරීම ඉතා බරපතල මානව හිමිකම් උල්ලංඝනයක් වේ.

(ආ) බලය, අභිමතය සහ මහජන යුතුකම් සම්බන්ධයෙන් පොදු නීතියේ බලපෑම

අභිමතානුසාරී අයුරින් ක්‍රියාත්මකවීමට යම් ව්‍යවස්ථාපිත ආයතනයකට බලය පවරා ඇති අවස්ථාවක එම අභිමතය නියමාකාරයෙන් සහ තීරක නොවන අයුරින් ක්‍රියාත්මක කිරීමට යුතුකමක් නීතිය මගින් පනවන බවට

17 *ද සිල්වා එ. අතුකෝරාල* 1993 (1) SLR 283, එම්. ඩී. එච්. ප්‍රනාන්දු. විනිසුරු (ශ්‍රේෂ්), *බණ්ඩාර එ. ප්‍රේමචන්ද්‍ර* 1994 (1) SLR 301, පි, 312 ජී. පී. එස්. ද සිල්වා අගවිනිසුරු, *හෙදර් මුන්ඩි එ. සී. ඊ. ඒ. සහ තවත් අය,* ශ්‍රේෂ්/58/03 (වාර්තාගත කර නැත) ශ්‍රේෂ්ඨ කාර්ය සටහන් 2004 ජනවාරි 20, එම්. ඩී. එච්. ප්‍රනාන්දු වි, *(ආචාර්ය) කුනානන්දන් එ. යාපනය විශ්ව විද්‍යාලය* (2006 (1) ALR1 ස්කන්ධයියා විනිසුරු (අභි) සහ *(ආචාර්ය) ශිරන්ති පෙරේරා එ. කොළඹ විශ්ව විද්‍යාලය* (2006 (2) ALR, ශ්‍රී පවන් විනිසුරු.

18 *ප්‍රනාන්දු එ. එස්. එල්. බී. සී.* 1996 (1) SLR 157 (ශ්‍රේෂ්) ඒ. ආර්. බී. අමරසිංහ විනිසුරු

19 *බුලන්කුලම එ. ලේකම්, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය* 2000 (3) SLR 243 (ශ්‍රේෂ්), ඒ. ආර්. බී. අමරසිංහ විනිසුරු

පොදු නීතිය මගින් මූලධර්මයක් ස්ථාපිත කර තිබේ.[20] මෙම අභිමතය තර්ක කළහැකි ආකාරයෙන් ක්‍රියාත්මක කළහැකි නොවේ නම් අදාළ විමර්ශනයන් සඳහා මහජනතාව සහ මාධ්‍යය සහභාගී කර නොගැනීම මගින් අතිමහත් මානව හිමිකම් උල්ලංඝනයක් සිදුවේද?

1994 දී බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වූවන් පිළිබඳ සොයා බැලීමේ කොමිසම් මගින් ඉහතින් සඳහන් කරන ලද චෝදනාත්මක රීතීන්[21] සෑදීමේදී දෝෂාරෝපණයන්ගෙන් පලායන ලදී. ඉහතින් මතු කර දක්වන ලද පොදු නීතියේ මූලධර්මයන් සංවර්ධනයවීම තුළින් අනාගත කොමිසම් මගින් මෙම මූලධර්මයම යොදාගැනීමේදී එවැනිවූ දෝෂාරෝපණයන්ගෙන් පලායාමට නොහැකිවනු ඇත.[22] 2006 විමර්ශනය සඳහාවූ කොමිසම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී උසස් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම්හට අදාළ විමර්ශනයන්ට සහ සභා වාරයන් සඳහා සහභාගීවීමට සහ තොරතුරු ලබාගැනීම සඳහා අධිපත්‍රයක් මගින් අවස්ථාව ලබාදෙන ලදී.[23] මෙම මූලාරම්භය ජනාධිපතිගේ පැත්තෙන් බැලූ කල මෙලෙස ජාත්‍යන්තර තොරතුරු ලබාදෙන්නන් සඳහා අවස්ථාව ලබාදීමට හේතුවූයේ මේ සම්බන්ධයෙන් පෙර නොවූ විරූ ආකාරයේ ගැටළු කිහිපයක් පැනනැඟුණු නිසාය.

(අ) උසස් පුද්ගලයන්ගෙන් සැදුම් ලත් ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම්හට මෙම විමර්ශනයන්ට සහභාගිවීමට අවස්ථාව ලබාදීම සහ තොරතුරු ලබාදීම තුළින් ස්වෛරී ශ්‍රී ලංකාවේ මහජනතාව සහ මාධ්‍යය මෙම විමර්ශනයන්ගෙන් බැහැර කිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක මොනවාද? මෙය විමර්ශනයන් සහ විමසීම් සඳහා අදාළව පවතීද? මූලික අයිතිවාසිකම් පිළිබඳ අයදුම්පතකින් (නීත්‍යානුකූල තත්ත්වය නමැති සංකල්පය අනුව මෙම සීමාවන් හා සම්බන්ධවීමක් ලබා දේ). රිට් ආඥාවක් පිළිබඳ නියෝගයකින් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව අනුව) ඔවුන්ගේ අයිතිවාසිකම් කිසිවක් උල්ලංඝනය

20 ප්‍රේමචන්ද්‍ර. එ. ජයවික්‍රම 1994 (2) SLR 90. (ශ්‍රේෂ්), ජී. පී. එස්. ද සිල්වා විනිසුරු. මැදිවක. එ. දිසානායක 2001 (1) SLR 177 (ශ්‍රේෂ්), එම්. ඩී. එච්. ප්‍රනාන්දු විනිසුරු

21 ඉහත 12

22 ඉහත 17 - 20

23 2006 විමර්ශන කොමිසම් පනතේ III වන ඇමුණුම බලන්න

නොවන නිසා (රිජ්. එ. බෝල්ඩ්වින්[24] නැමති නඩුවේදී ශ්‍රී ලංකා නීති විද්‍යාව තුළ මෙය ස්ථාපිත විය).[25] ඉහත සඳහන් උසස් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම් තනි තනිවම හෝ සාමූහිකවම කිසිදු අයෙක් මෙම රීතියෙහි ප්‍රතිඵල වලට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට තරම් තත්ත්වයක නැත.

(ආ) අනෙක් අතට බැලූ කල උසස් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම්හට අදාළ විමර්ශනයන්ට සහභාගීවීමට අවස්ථාව දී ශ්‍රී ලංකාවේ මහජනතාවගෙන් සහ මාධ්‍යයන්ගෙන් මෙම අයිතිවාසිකම බැහැර කිරීම මගින් ශ්‍රී ලංකා ජනරජය මහජනතාවට ලබාදී ඇති ස්වෛරීභාවය[26] පරස්පර විරෝධීතාවයකට ලක්වේ. මෙම මූලධර්මය ශ්‍රේෂ්ඨාධිකරණය මගින් අධිකරණ තීරණ කිහිපයකදී පිළිගත් අතර සිංගරාසා[27] නඩුවේදී මෙය වඩාත් තහවුරු කොට දක්වන ලදී. තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම ඉන්දියාවේ මෙන්[28] ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැහැදිලිව පිළිගෙන නොමැති අතර ශ්‍රේෂ්ඨාධිකරණය සිය අධිකරණ තීරණ[29] මගින් මෙලෙස ව්‍යංගව ඇති අයිතිවාසිකම් ප්‍රකාශිතව පැහැදිලි කර ඇත. කොමිසම්හි විමර්ශනයන්ට ළඟාවීමට පොදු ජනතාවට ඇති අවස්ථාව ප්‍රතික්ෂේප කිරීම මගින් තොරතුරු ලබාගැනීමට ඇති අයිතිවාසිකම කඩවේද යන ගැටළුව පැන නගී.

---

24 1964 (AC) (HL) 40

25 *ප්‍රනාන්දුපුල්ලේ එ. ඉඩම සහ කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය* (79 (I) NLR); *ප්‍රනාන්දු එ. ජයරත්න* (78 NLR), *ජයසේන එ. පුංචි අප්පුහාමි* (1980 (1) SLR *පුදාකරන් එ. භාරතී* (1989 (2) SLR) උදාහරණ ලෙස දැක්විය හැකිය.

26 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව

27 SC(Special) LA 182/99, SCM 15.09.2006 (අගවිනිසුරු සරත් සිල්වා) එකී තීරණයේ හොඳ හෝ නරක කුමක්වුවත් ස්වෛරීභාවය ඉදිරියේ ජාත්‍යන්තර සම්මුතීන් වලට ජනාධිපතිගේ ක්‍රියාමාර්ග හරහා ළඟාවන්නේ කෙසේද යන ගැටළුව මතුකරන ලදී. මේ සම්බන්ධ පූර්ණ විග්‍රහයක යෙදීම සඳහා මෙම ප්‍රකාශනයෙහි මානව හිමිකම් සඳහාවූ අධිකරණමය රැකවරණය පරිච්ඡේදය බලන්න.

28 "Right to Information: Illusionary court victories and its continuing Denial", කිෂාලි පින්ටෝ ජයවර්ධන, LST Review, Volume 17-Issue 229, 2006 නොවැම්බර්

29 *ප්‍රනාන්දු එ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව* 1996 (1) SLR 157, එම්. ඩී. එච්. ප්‍රනාන්දු විනිසුරු *පරිසර පදනම එ. ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය*, SC(FR) App. No. 47/2004, SCM 28. 11. 2005, අගවිනිසුරු සරත් සිල්වා

(ඇ) සාක්ෂිකරුවන් ආරක්ෂණය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා නීතියේ ඇති අඩුපාඩුකම් සලකාබැලීමේදී[30] "විමර්ශනයන්ට ලැබෙන හෝ සාක්ෂි හෝ උදාහරණ ලෙස ගෙනහැර දක්වන තොරතුරු සහ ද්‍රව්‍යයන්හි මටසිළුටුභාවය" සහ "අදාළ කොමිසම් ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව හෝ යහපත සඳහා" අදාළ කොමිසම්වලට තොරතුරු ලබාගැනීමෙන් හෝ නොගැනීමෙන් ජනතාව සහ මාධ්‍යයන් බැහැර කිරීමේ අභිමතය යන කාරණය අනුව කොමිසම්හි තොරතුරු සඳහා මහජනතාවට ළංවීමට ඇති හැකියාව කඩකිරීම විවාදයට ලක්වේ.[31] දැනට මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීම පමණක් ප්‍රමාණවත් වන නමුත් අදාළ කොමිසම්හි කටයුතු තුළින් මහජනතාවට ළඟාවීම සහ තොරතුරු ලබාගැනීම කලින් වැළැක්වීම සාධාරණ තර්කයක් නොවන අතරම මේ පිළිබඳව පසුව සාකච්ඡා කෙරේ.

(ඈ) වර්තමාන විමර්ශන සඳහාවූ කොමිසමෙහි (2006) ක්‍රියාකාරීත්වය 1994 අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් විමර්ශනය සඳහාවූ කොමිසමේ ක්‍රියාකාරීත්වයෙන් වෙන්කොට දැක්විය හැකිවන්නේ 2006 කොමිසමේ ක්‍රියාකාරීත්වය කොටස් දෙකකට එනම් විමර්ශනය සහ විමසීම ලෙස බෙදා මහජනතාවට විමසීමට සහභාගීවීමට අවස්ථාව දීමත් විමර්ශනයට සහභාගිවීමට අවස්ථාව නොදීමත් යනාකාරයෙන් කරුණු බෙදා දැක්වීමක් තුළිනි. මෙවැනි බෙදීමකට මුල්වූ කාරණය අපැහැදිලි වන අතරම, මෙම 2006 කොමිසම මගින් එවැනි ආකාරයේ අරමුණු සංශෝධනයකට පෙනී සිටීම තුළින් වර්තමාන කොමිසම නීතියට ගරු කරනවාද යන ගැටළුව පැනනගී. කෙසේ වෙතත් අළුතෙන් දක්වන ලද පරිදි විමර්ශනයන් සඳහා මහජනයා සහභාගී කරවාගැනීම ගෙනහැර දක්වන ඕනෑම රීතියක් වර්තමානයේ සංවර්ධිත පොදු නීතියේ මූලධර්මයන් මත අධිකරණ සමාලෝචනයන්ට භාජනය වන බව සැකයෙන් තොරව පැවසිය හැකිය.

(ඉ) ඉහතින් හේතු කාරණා දැක්වූ ඕනෑම අවස්ථාවකදී ව්‍යවස්ථාදායකයේ හොඳම උපදේශය විය යුත්තේ 1948 අංක 17 දරන විමර්ශන කොමිසම් පනතේ 7 (ඉ) වගන්තිය සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම බව පැවසිය හැකිය.

30 මෙමගින් රජයට ප්‍රමාණවත් සාක්ෂිකරුවන් රැකීමේ ක්‍රමයක් සපයා දීමට නොහැකියාවක් ඇති යන කරුණ ඇතුලත් වේ.

31 ඉහත 12

(ඊ) ඉහතින් දක්වන ලද සාක්ෂි සහ උදාහරණ තුළින් ජනාධිපතිගේ පත්කිරීම් කොමිසමට දීමෙන් මෙම ගැටළුව විසඳීම කොමිසම අතට පත්කිරීම තුළින් ඔවුන් පීඩාවට පත්වනවා සේම එමගින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය බලාත්මක කිරීමේ කාර්යක්ෂමභාවය වළකයි[32]. ඉහතින් දක්වන ලද පරිදි එවැනි වැළැක්වීම්, බේරුම්කරණ මගින් පනවන්නේ නම් ඒවා ගැලපෙන තීන්දු මගින් අධිකරණමය සමාලෝචනයන්ට විෂය වේ[33].

4.3 සාධාරණ ලෙස කටයුතු කිරීමේ යුතුකම.

නිසි ක්‍රියාපටිපාටියක් සඳහා අවම කාලසීමාව

2006 කොමිසමේ නියෝගයන්ගෙන් හෙළිදරව් කළ පරිදි අදාළ කොමිසමේ මූලික අරමුණ වී තිබුණේ අදාළ උල්ලංඝනයන් සඳහා වගකිවයුතු පුද්ගලයන් හඳුනාගැනීම ආදීවූ කරුණු ස්ථාපිත කිරීමය. මෙම සිද්ධීන් මගින් ඝාතන කිහිපයක් සහ එක අතුරුදහන්වීමක් පිළිබඳ කරුණු ආවරණය කරන ලදී[34]. මෙම කොමිසම්, නීතිය පිළිබඳ අධිකරණයක් නොවේ යන කරුණත් සමඟම (සමහර අධිකරණමය ලක්ෂණ එහි තිබුණද)[35] එයට හැකියාව ලැබෙනුයේ ජනාධිපති විසින් ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ දෙන ලද උපදේශයන් මත ඒ පිළිබඳ වාර්තා කිරීම සහ නිර්දේශයන් ඉදිරිපත්කිරීම පමණක් වේ. ප්‍රධාන වශයෙන්ම වරදකරුවන්ට එරෙහිව පැමිණිලි විභාග කිරීම ආරම්භ කිරීම කෙසේද යන්න, අදාළ කොමිසම් ඉදිරියේ සාක්ෂි ලබාදීම සඳහා කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල ස්වභාවය මත වේ.

මේ අනුව අදාළ කොමිසම මගින් සාකච්ඡා කිරීම අවශ්‍යවන එක් ගැටළුවක් පහත අයුරින් දැක්විය හැකිය. එක් සාක්ෂිකරුවකුගේ සාක්ෂි මගින් යම්

---

32 *නීතිපති එ. රත්නගෝපාල්* 72 NLR 145 (ප්‍රිවි කවුන්සලය) බලන්න.

33 මෙම පත්‍රිකාව මගින් සාකච්ඡා කරන ලද මූලධර්මයන් මත එවැනිවූ අභිමතයකට අධිකරණ සමාලෝචනයක් බලපවත්වයි. එහිම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වන ලද පරිදි එම මූලධර්මයන් මගින් දක්වන ලද ප්‍රවර්ධනාත්මක සංවර්ධනය පෙන්වන අතරම *කොළඹ නගරාධිපති එ. සී. එම්. සී. අල්ලස් කොමසාරිස්* (41 CLW 30) සහ *ද මැල් එ. ද. සිල්වා* (51 NLR 105) වැනි සීමාසහිත අධිකරණමය තීරණයන් මගින් මෙය දුරස් කරන ලදී.

34 කොමිසමේ විධි නියෝග හී උපලේඛනය

35 පනතේ 7 (අ) සිට (ඇ) දක්වා සහ 8 වන වගන්ති මගින් පෙන්නුම් කරන කොමිසමේ බලතල බලන්න.

චෝදනා ලැබූ පුද්ගලයකුගේ නමක් හෙළිදරව් වීමෙන් හෝ සාක්ෂිකරුවන් දෙදෙනෙක් හෝ කිහිපදෙනෙකුගේ සාක්ෂි මගින් පුද්ගලයෙකුගේ නම් එළිදරව් වේ නම් යම් අවස්ථාවක එවැනි චෝදනා සම්බන්ධයෙන් දෙනුලබන පිළිතුරු ඇසීමට එවැනි සාක්ෂිකරුවන් සඳහා අවස්ථාව ලබාදිය යුතුද?

1994 බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වීමේ කොමිසම් ඉදිරියේ හේතු දැක්වීමට මෙම ගැටළුව පැන නැඟුනද එවන් දෙවැනි තලයකට එම කොමිසම් නොයන ලදී. මෙම අදාළ කොමිසම් මගින් චෝදනා ලත් පුද්ගලයන්ගේ නම් වැඩිදුර විමර්ශනයන් අවශ්‍ය බවට නිර්දේශ කරමින් එවනවා වෙනුවට "ඔවුන්ගේ මෙම ප්‍රසිද්ධිය හේතුවෙන් ඔවුන්ගේ චරිතවලට සහ තත්ත්වයට වන බලපෑම" පිළිබඳ අවධානය යොමු කරමින් ඔවුන්ට විරුද්ධව ඇති බැලූ බැල්මට පෙනෙන සාක්ෂි පිළිබඳ අදහස් දක්වන ලදී[36].

මෙසේ චෝදනා ලත් පුද්ගලයන්ගේ නාමයන් අදාළ සිද්ධීන් ඉදිරියේ කථා කිරීම අවශ්‍ය නොවේ යන මූලධර්මය විවේචනයන්ට විෂය විය[37]. 1994 අතුරුදහන්වීමේ කොමිසම්වලට හෝ ගොනුකරනලද විශාල පැමිණිලි ප්‍රමාණයක් මෙම දෙවැනි තලයේ විභාග නොවූ බව පැවසිය යුතුය. කෙසේ වෙතත් 2006 විමර්ශන කොමිසම මගින් 302 ක් ඝාතනයන් සහ එක අතුරුදහන්වීමක් පිළිබඳ කරුණු විමර්ශනය කිරීමට නියෝග කිරීමේදී මෙම මූලධර්මය පසු අවස්ථාවන්ට වඩා අඩුවෙන් අදාළ විය. මෙම දෙයාකාරවූ ක්‍රියාවලිය තුළ චෝදනා ලත් පුද්ගලයන්ගේ හඳුනා ගැනීම් සම්බන්ධයෙන් සාක්ෂි ලබාගැනීම සහ සපයා ගැනීමේ විධිමත් නොවන ක්‍රියාවලිය තුළින් ඔවුන්ගේ නඩුව සම්බන්ධයෙන් ජනාධිපතිට නිර්දේශ කිරීමට සහ වාර්තා කිරීමට පෙර එම රහස් ආදිය එළිදරව් කිරීමට අවස්ථාව සැලසීම

---

36 බලන්න. දකුණ, බස්නාහිර සහ සබරගමුව කොමිසම් වාර්තා (1997), මෙන්ඩිස් ෆවුසි සහ තවත් අය එ. ගුණවර්ධන, ජී. පී. ඒ. සිල්වා (1978 - 79 (2) SLR 322) මගින් කොමිසමේ සොයාගැනීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ අධිකරණමය විචාරයට භාජනය කළ අතර එම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනයේදී (1978 - 79 - 80 (1) SLR 166) ආපස්සට ගන්නා ලදී.

37 *වික්‍රමසිංහ එ. තම්බයියා* (46 NLR 105) හිදී 1948 වර්තමාන පනතට පෙර විමර්ශන කොමිසම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නීතිය වූ 1872 අංක 9 දරන ආඥා පනත යටතේ කොමිසම්හි ක්‍රියාකාරීත්වය දක්වන ලදී. එහිදී දැක්වූයේ සාක්ෂිකරුවන් සාකච්ඡාවට ලක් කිරීම සම්බන්ධයෙන් හෝ ඔවුන්ට අදාළ ලිපි කියවාදීම සම්බන්ධයෙන් සාධාරණ විරුද්ධත්වයක් නොතිබිය හැකි බවයි. මෙම නඩුවේදී පෙත්සම්කරු විරුද්ධත්වය දක්වන ලද්දේ අදාළ කොමිසම් සැසිවාරයේදී සාකච්ඡා නොකරන ලද කරුණු වාර්තාවේ තිබීම හේතුකොට ගෙනය.

මෙහිදී ඉතා විශාල ලෙස නිර්දේශ කරන ලදී. ප්‍රනාන්දු එ. ජයරත්න[38] යන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේදී අදාළ විමර්ශන කොමිසම් මගින් සාධාරණව කටයුතු කිරීමේ යුතුකම වැඩියකින් හෝ අඩුවකින් තොරව ඉටුකිරීමේ අවශ්‍යතාවය ගෙනහැර දක්වන ලදී.

4.4 විමර්ශන කොමිසම් පත්කිරීමේ ප්‍රායෝගික යථාර්ථයන් සහ ප්‍රයෝජනාත්මක අගයන් පිළිබඳ කෙටි විග්‍රහයක්

මෙතෙක් දුරට මෙම ලිපිය මගින් වැරදිකරුවන් හඳුනාගැනීම සිදුකළද මෙම පරිච්ඡේදය මගින් අතුරුදහන්වීම් පිළිබඳ කොමිසම්හි නියෝජනය, කාර්යභාරය සහ ක්‍රියාමාර්ගයන් පිළිබඳ සාකච්ඡා කරයි. 2006 විමර්ශන කොමිසම් සම්බන්ධයෙන් එවැනි ආකාරවූ විග්‍රහයක් කිරීම කෙතෙක් දුරට අදාළද යන්න සම්බන්ධයෙන් කෙනෙකුට සාධාරණීකරණයක් ගෙන ආ හැකිය. එම සාධාරණීකරණය ජනාධිපති විසින් විමර්ශන කටයුතු සඳහා 2006 විමර්ශන කොමිසම පත්කිරීම යන සිද්ධිය කෙරෙහි කෙනෙකු ඉක්මන් බැලීමක් හෙලයි නම් එකී සාධාරණීකරණය උනන්දුව ඇති කරන කාරණයක් නොවේ[39]. 3, 4, 6, 11, 12, 13, 14 සහ 15 යන කාරණා අනුව වරදකරුවන් කවුරුන් විය හැකිද? සැකයෙන් තොරව, සාක්ෂි නැවත ඇති කළ නොහැකි බව අනුමාන වශයෙන් සිතිය හැකිය. 2, 5, 7, 8, 9 සහ 10 යන කාරණා අනුව එවැනි අනුමාන වශයෙන් සිතීමක් පවා සාක්ෂි ආඥා පනතේ කිසිදු විධිවිධානයක් අනුව ගමන් නොකරන ජනාධිපති විසින් පත්කරන ලද විමර්ශන කොමිසම (2006) මගින් "සියළුම සාක්ෂි ආරක්ෂා කිරීම සහ ලබාගැනීම"[40] යන්න සාධාරණීකරණය කිරීම තුළින් මහත් දුෂ්කරතාවයකට ලක්වේ[41].

මෙවැනි ස්වභාවයේ කොමිසම් පත්කිරීම තුළින් අදාළ වැරදි සඳහා ගොදුරුවූවන්ගේ ළඟ ඥාතීන්හට වැරදිකරුවන් යැයි ඔවුන් හඳුනාගන්නා පුද්ගලයන්ට එරෙහිව ඔවුන්ගේ මැසිවිලි නැගීමට අවස්ථාවක් උදාවනවා සේම මෙමඟින් තවත් සමාජ ඓතිහාසික වාර්තා පිළිබඳ ගැටළුවක් මතු කරයි. කෙසේ වෙතත් තනි පුද්ගල වැරදිකරුවන් හඳුනාගැනීම ස්ථාපිත

---

38 78 NLR 123

39 ඔහු විසින් නිකුත්කරන ලද අධිපත්‍රයේ උපලේඛනය බලන්න.

40 1948 අංක 17 දරන පනතේ 7 (අ) වගන්තිය මගින් බලයදී ඇති පරිදි

41 එහිම 7 (ආ) වගන්තිය

කිරීම, අදාළ කොමිසම විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද සිද්ධියේ ස්වභාවය අනුව එය ඉටුකර ගැනීමට අපහසු වන කටයුත්තක් වන බව 2 සහ 8 යන කාරණා අනුව කෙනෙකුට දැක්විය හැකිය.

2001 ජූලි මාසයේදී[42] ජනාධිපති විසින් පත්කරන ලද වාර්ගික හිංසනය සඳහා වූ සත්‍යවාදී කොමිසමේ (1981 - 1984) වාර්තාව අනුව සමහර අවස්ථාවල වැරදිකරුවන් නම් කර ඇත[43]. 1994 බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වූවන්ගේ කොමිසම[44] මඟින් නිශ්චිත පොලිස් නිලධාරීන් සහ හමුදා නිලධාරීන්ට[45] එරෙහිව අදාළ කොමිසම් විසින් සොයාගන්නා ලද විය හැකි සහ සෑහෙන සාක්ෂි චෝදනා ගොනුකිරීම සඳහා නීතිපතිට නිර්දේශ කළ අතරම තවදුරටත් සාක්ෂි අවශ්‍ය නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම සඳහා තවදුරටත් විමර්ශන කටයුතු කිරීමට විශේෂ සිවිල් අධිකාරී විමර්ශන ඒකකයන්ට භාරදෙන ලදී[46].

නීතිවිරෝධී රැඳවුම් කඳවුරු සහ වධ හිංසා කුටි ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා 1995 දී පිහිටුවන ලද බටලන්ද කොමිසම[47] සමහර නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන්ට[48] එරෙහිව කරුණු සොයාගත් අතර පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් දිගින්දිගටම බණ්ඩනය කරන ලද බවට තොරතුරුවූ පුද්ගලයන්ට එරෙහිව ඔවුන්ගේ සිවිල් අයිතීන් නැමැති දූෂ්කරතාවය නොතකා නිසි දඬුවම් පැමිණවීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට අතිරේක අධිකරණ බලයක් ලබාදීමට

---

42 එස්. ෂර්වානන්ද (විශ්‍රාමික අග විනිසුරු, සභාපති ලෙස) සහ ජනාධිපති නීතිඥයින් වන එස්. එස්. සහබන්දු සහ එම්. එම්. සුහයිර් සාමාජිකයන් ලෙස ඇතුලත්ව

43 2003.04.24 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද වාර්තාවේ 3 වන පරිච්ඡේදයෙහි 23, 24 සහ 43 වන පිටු බලන්න (2003 සැසිවාර පත්‍රයෙහි අංක III)

44 මනෝරි මුත්තෙට්ටුවේගම (සභාපතිනිය, නීතිඥ), මහාචාර්ය අමල් ජයවර්ධන (කොළඹ විශ්ව විද්‍යාලය) සහ ආචාර්ය ජයන්ත ද අල්මේදා ගුණරත්න

45 මෙම කොමිසම්හි ප්‍රතිඵල ලෙස සොයාගන්නා ලද වූදිතයින් ගණන සංඛ්‍යාත්මකව අඩුවේ. අනෙකුත් අතුරුදහන්වූවන් පිළිබඳ කොමිසම්හි ප්‍රධානීන් ලෙස කේ. පලකිඩ්නර් (විශ්‍රාමික අභියාචනාධිකරණ සභාපති) සහ ටී. සුන්දරලිංගම් (මහාධිකරණ විනිසුරු) කටයුතු කරන ලදී. නියෝජනය සම්බන්ධව කාලය ඉකුත්වීම නිසා හා තවදුරටත් කාලය අවශ්‍යවීම නිසා ඉහත කී කොමිසම් විසින් අතහැර දමන ලද සිද්ධීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2001 මාර්තුවේදී පිහිටුවන ලද කොමිසමේ ප්‍රධානියා ලෙස මනෝරි මුත්තෙට්ටුවේගම කටයුතු කරන ලදී.

46 ළඟා වියහැකි රජයේ නිල වාර්තාවන්හි මෙම නිර්දේශයන් අඩංගු නොවේ.

47 ඩී. ජයවික්‍රම (සභාපති) සහ එන්. ඊ. දිසානායක (සාමාජිකයෙක්) එම අවස්ථාවේ මහාධිකරණ විනිසුරන් ඇතුළත්ව

48 සැසිවාර පත්‍රිකා අංක 1-2000, පි. 113-122, 2000 පෙබරවාරි 19 රජයේ ගැසට් පත්‍රයේ පළකළ

නිර්දේශ කරන ලදී[49]. 1994 අතුරුදහන්වීමේ කොමිසම තුලින් සොයාගත් කරුණු අනුව පැමිණිලි විභාගකිරීමක් සහ යම් වන්දි ප්‍රදානය කිරීමක් හැර මෙම නිර්දේශයන් සම්බන්ධයෙන් රජය විසින් ගන්නා ලද කිසිදු ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් සාක්ෂි සොයාගත නොහැකිය.

4.5 විමර්ශන කොමිසම්හි බලතල සහ බැඳීම්

පනත යටතේ මෙම විමර්ශනයන් අදියර දෙකකින් සිදුකරන ලද බව මෙම ලිපිය මුලදී සාකච්ඡා කළ අතර, ඒ අනුව පළමුව විමර්ශනයට විෂය වන සිද්ධිය සම්බන්ධව චෝදනා ලත් පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායම්වලට එරෙහිව විය හැකි සාක්ෂි හෙළිදරව් කරමින් සොයාගන්නා අතර දෙවනුව කොමිසම විසින් ඔවුන්ට එරෙහිව සොයාගත් සාක්ෂිවල වියහැකි බව සම්බන්ධයෙන් එම චෝදනා ලත් වගකිවයුත්තන්ම එයට ව්‍යතිරේකී වශයෙන් කරුණු දැක්වීමට අවස්ථාව ලබාදේ.

ශ්‍රී ලංකාවේ තීන්දුවූ නඩු නීතිය අනුව මෙමගින් උපදින මූලධර්මයන් අදාළ කොමිසම්හි බලතල සහ බැඳීම් ලෙස බෙදා වෙන්කර දක්වයි.

4.5.1 එහි කාර්යපටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අදාළ කොමිසම්හි බලතල

(අ) සාක්ෂිකරුවන් කැඳවීම

රත්නගෝපාල්[50] නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය දැක්වූයේ සාක්ෂිකරුවන් කැඳවීම සම්බන්ධයෙන් පනත යටතේ පිහිටුවන ලද කොමිසම්හි බලය, එංගලන්තයේ ස්ථිර පදිංචිය ඇති ව්‍යාපාරික සබඳතා සහ පවුල් සබඳතා හේතුවෙන් නිරන්තරයෙන් ලංකාවට පැමිණෙන ශ්‍රී ලාංකික පුරවැසියෙකු "ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු" යන අර්ථයට 7 (ඇ) වගන්තිය අනුව ඇතුළත් වන බවයි. තවදුරටත් මෙමඟින් දක්වන ලද්දේ පනතේ කොමිසම ඉදිරියේ දිවුරුම් දියයුතු බවට 7 (ආ) වගන්තිය මඟින් පරිපාලකයෙකුට දී ඇති බලය ප්‍රතික්ෂේප කිරීම මගින් සාක්ෂිකරුවන්ට අපහාස කිරීම සම්බන්ධයෙන් පනතේ 12 (1) (ආ) වගන්තිය අනුව වගකිවයුතු බව දක්වන ලදී.

49 එහිම පි. 124
50 70 NLR 409

කෙසේ වෙතත් ප්‍රිවි කවුන්සිලයට[51] කරන ලද අභියාචනයේදී මෙම තීන්දුව පහත සඳහන් කාරණය මත ප්‍රතික්ෂේප කරන ලදී.

අදාළ විමර්ශනයේ විෂයපථය අග්‍රාණ්ඩුකාරවරයා[52] සීමානොකළ අතර, එය කොමසාරිස් විසින් තීරණය කළයුතු බවටද, අදාළ කොමසාරිස් පත්කිරීමේ බලය බලාතික්‍රමණයක් බවද, පනතේ 2 වන වගන්තිය අනුව අග්‍රාණ්ඩුකාරවරයාගේ එම බලය වලංගු නොවන බවද දක්වන ලදී.

සිද්ධිමය වශයෙන් ප්‍රිවි කවුන්සිලය තවදුරටත් දක්වන ලද්දේ,

යම් පුද්ගලයෙක් පනතේ 7 වන වගන්තිය යටතේ කොමිසමේ අදාළ සැසියකදී සාක්ෂිදීම සඳහා වගකිවයුතු නම් එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ ස්ථිර වශයෙන් ජීවත්වීම සම්බන්ධයෙන් චේතනාවක් අවශ්‍ය නොවේ[53].

ඉහතින් දක්වන ලද කරුණු අනුව අදාළ කොමිසම ක්‍රියාකාරී ලෙස ක්‍රියාත්මකවීම සඳහා පනතේ 7 (ඇ) වගන්තියේ "සාක්ෂිකරුවන් කැඳවීම" යන්නට පසුව "ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙක්" ලෙස සංශෝධනය වියයුතු අතර සාක්ෂිකරුවන් රඳවාගැනීම සඳහා සාක්ෂිකරුවන්ගේ පැමිණීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව වරෙන්තු හෝ ප්‍රකාශයන් නිකුත් කිරීමට බලකිරීමට අදාළ කොමිසම්වලට බලයක් නොමැති බව දක්වයි[54].

ඉහතින් යෝජනා කරන ලද සංශෝධන මෙම පනතට ගෙනආවහොත් සාක්ෂිකරුවන් කොමිසම ඉදිරියේ කැඳවීම සලකාබැලීම සඳහා පනත යටතේ අදාළ කොමිසම් ක්‍රියාත්මකවීමට එම කොමිසම් සන්නද්ධව සිටී.

---

51 එම අවස්ථාවේ ඉහළම අධිකරණ ආයතනය ලෙස, 72 NLR 145 පිටුව බලන්න.

52 එම අවස්ථාවේ විධායක අධිකාරිය ලෙස

53 සැසිවාර පත්‍රිකා අංක 1 - 2000, පි. 151

54 රත්නගෝපාල් 70 NLR 409

(ආ) අපහාස කිරීමට[55] චෝදනා කිරීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය[56] නඩු පැවරීමට බලය දීම.

අදාළ පනත මගින් සිතාසි සඳහා සාධාරණ හේතු දැක්වීමට අසමර්ථ වන සාක්ෂිකරුවන්[57] හෝ දිවුරුම්දීම ප්‍රතික්ෂේප කරන සාක්ෂිකරුවන්[58] හෝ සම සාක්ෂිකරුවන්ගෙන් අසනු ලබන ප්‍රශ්නවලට සාධාරණ හේතු නොදක්වා, පිළිතුරු දීමට අසමර්ථ වීම[59], අධිකරණයට අපහාස කිරීම සඳහා නඩු පැවරීමට කොමිසමට ඇති බලය සීමාකරයි[60]. අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා කොමිසමට ඇති සීමාසහිත විෂය පථය පිළිබඳ පනත සාක්ෂි දරයි. "විජේතුංග" නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය දක්වන ලද්දේ "විමර්ශන කොමිසම් සම්බන්ධයෙන් කිසිදු ගෞරවයකින් තොරව අධිකරණයට ලිපියක් ලියන පුද්ගලයෙකුට අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කළ නොහැකි" යනුවෙනි[61].

විමර්ශන කොමිසම් සම්බන්ධයෙන් පුවත්පතක ගෞරවයෙන් තොරව ලිපි පළකිරීම[62] සඳහා වගකිව යුතුවේ. "නමුත් මේ සම්බන්ධයෙන් දැනට පවතින බිය වියයුත්තේ තවත් මැතිවරණයක් ළඟ ළඟම එනතුරු කොමිසම මෙය ආපස්සට ඇදීමයි[63]."

අධිකරණයට අපහාස කිරීමක් ලෙස දැක්වීම සඳහා ප්‍රශ්නගතවීමට තරම් බැලූ බැල්මට පෙනෙන කරුණු මෙම ලිපිය තුළ දක්නට නොවේ. කෙසේ වෙතත් හේතු සහගත සහ සාධාරණ විචාර සහ විවේචන සීමාවක් ඔවුන් ඉක්මවා ගියද පත්‍ර වාර්තාකිරීම සම්බන්ධයෙන් ඇති මූලධර්ම මෙම පරිච්ඡේදයේ සීමාවට විෂය නොවන අතර එමඟින් ඇතිවී ඇති හිඩැස් සම්බන්ධයෙන් කථාකිරීම මතුකර දැක්වීම පමණක් සිදුකරයි.

---

55 පනතේ 10 වන වගන්තිය අනුව

56 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාව අනුව

57 12 (1) (අ) වගන්තිය

58 රත්නගෝපාල් නඩුවේ පරිදි

59 12 (1) (ආ) වගන්තිය

60 12 (1) (ඇ) වගන්තිය

61 72 NLR 514

62 එහිම ඊ. එස්. ප්‍රනාන්දු විනිසුරු

63 එම නඩුවේදී එළිදැක්වූ කරුණු අනුව

පනතේ 12 වන වගන්තිය යටතේ දී ඇති විෂය පථයේ මදභාවය එනම් පනත යටතේ පත්කරන කොමිසමට දී ඇති සීමාසහිත බලය සහ අධිකාරිය මගින් මෙම කොමිසමට අපහාස කිරීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණයට බලය දීම මනාව පැහැදිලි කරයි. මේ නිසා මෙම පනතේ 12 වන වගන්තිය සංශෝධනය වියයුතු බවට යෝජනා ඇති අතර ඒ අනුව කොමිසමට සහ එහි ක්‍රියාකාරීත්වයට අපහාස කිරීම යන පදනම මත අදාළ නඩු ඇසීම අභියාචනාධිකරණය මගින් සිදුකිරීමට පනත මගින් පත්කරන ලද කොමිසමට බලයදී ඇති අතරම "ස්වාධීන හෝ වාර්තාකරුවකු මගින් පුවත්පතක පළකරනු ලබන ලිපියක් මගින් කිසිදු සාධාරණ හේතුවකින් තොරව විමර්ශනය සඳහාවූ කොමිසමකට අගෞරව කරයි නම් එමගින් එය කොමිසමට අපහාස කිරීම වරදක් ලෙස සැලකීමට පනතේ 10 වන වගන්තිය පුළුල් කිරීම මගින් බලය දේ ලෙස අතිරේක වගන්තියක් එකතු කිරීම මෙමගින් සිදු කරයි[64].

එවැනිවූ සංශෝධනයක් සම්පූර්ණයෙන්ම සහ ඉහතින් දැක්වූ නිර්දේශ වලට අනුව පනතේ 7(ඉ)(i) සහ (ii) යන වගන්තීන් අවලංගුවීම හා සම්බන්ධ වියයුතුය[65]. අදාළ කොමිසමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගකිවයුතුභාවයට ඇති ඉල්ලුම සම්බන්ධයෙන් සන්තෘප්ත වීමට කොමිසමේ ක්‍රියාකාරකම් තුළින් ජනතාව සහ මාධ්‍යය ඉවත් නොකළයුතුය යන්න නැවත නැවතත් කීම වැදගත්ය.

මෙම පනත යටතේ පත්කරනු ලබන ඕනෑම විමර්ශන කොමිසමක් සම්බන්ධයෙන් මෙම සංශෝධනය විධානාත්මක බව දැක්විය හැකි අතර එමගින් බියකින් හෝ කිසිදු පක්ෂපාතීත්වයකින් තොරව ඔවුන්ට ක්‍රියාකාරීවීමට හැකි බැවින් අදාළ කොමිසමේ ස්වාධීනත්වය හා ශක්‍යතාවය මෙමගින් ආරක්ෂා කරනු ලබයි. මෙමගින් විනිවිදභාවයෙන් තොරව අදාළ කොමිසම් ක්‍රියාත්මක වේ යන චෝදනාවෙන් ඔවුන්ට මිදිය හැකිවේ. අදාළ කොමිසම්හි විමර්ශන තුළින් මහජනතාව සහ මාධ්‍ය ඉවත්කිරීම, සාක්ෂිකරුවන් රැකීම යන පදනම මත පහත සඳහන් කාරණා අඩු වැඩි ලෙස දැක්විය හැකිය.

"සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ පදනම නැතිවීම සම්බන්ධයෙන් වගකීම නීතිපති දෙපාර්තමේන්තුවට පැවරෙනවා සේම සාධාරණත්වය සහතික

64 විජේතුංග නඩුවේ තීරණයට (ඉහත 61) ව්‍යවස්ථාපිත උත්තරයක් ලෙස
65 ඉහත 4.2 වගන්තිය බලන්න.

කිරීම සම්බන්ධයෙන් රජයේ කැපවීම මෙමගින් ඇතිකරයි. මෙය පුළුල් කිරීම (සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ ක්‍රමය නොමැතිවීම) අපරාධ විද්‍යාවේ ක්‍රියාවලිය විනාශකිරීමක් යන කරුණ පැහැදිලිය[66].

ලංකාවේ හිටපු නීතිපතිතුමා මෑත කාලයේදී මේ සම්බන්ධයෙන් පැහැදිලිවම කථා කළ අතර පහත සඳහන් විචාරය මගින් ඒ බව පැහැදිලි වේ.

"අපගේ අවධානය යොමුවිය යුතු තවත් වැදගත් කාරණයක් වන්නේ සාක්ෂිකරුවන් බියවැද්දීම සහ තර්ජනය කිරීම නොකරන ඉතා දක්ෂ ලෙස සාක්ෂිකරුවන් ආරක්ෂා කරන ක්‍රමයක් පිළිබඳවයි. මේ සම්බන්ධයෙන් රජයට අධික වියදම් දැරීමට සිදුවීමත් නීතියට සංශෝධන ගෙන ආ යුතු වීමත් සැකයෙන් තොරවේ. මේ සම්බන්ධයෙන් ඉතා සරල ප්‍රශ්නයක් මා විසින් ඉදිරිපත් කරන්නම්. සදාචාර සම්පන්න සමාජයකට නීතියේ රීතිය රඳාපවතින නීතිය සහ බැඳුණු සාමකාමී සමාජයක් පවත්වාගන්නවාට වඩා ඩොලර් මිලියන ගණන් වියදම් කරමින් ජාත්‍යන්තර තලයට ඔබින පාරවල් සෑදීම වඩා වැදගත් වේද?[67]

මෙම රට තුළ කාර්යක්ෂම ලෙස සාක්ෂිකරුවන් රැකීමේ ක්‍රමයක ඌනතාවය ජාත්‍යන්තර දෝෂ දර්ශනයට මෙම රට ලක් කළ තවත් කරුණක් වේ[68]. සමහර අවස්ථාවල සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම සේම සමහර අවස්ථාවල ඔවුන් ඝාතනය කිරීමද කර තිබේ[69]. ශ්‍රී ලංකා රජය සාක්ෂිකරුවන් රැකීමේ නීතින්[70] වාර්තාගත ලෙස කෙටුම්පත් කළ අතර, මේ සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම සීමාසහිත ලෙස පවතී. එමනිසා කාර්යක්ෂම

---

66 කිශාලි පින්ටෝ ජයවර්ධනගේ "A 'praxis' perspective on subverted Justice and the Breakdown of the Rule of Law in Sri Lanka", LST Review, Vol. 17, April-May (234-235) Joint Issue 2007. පි. 23.

67 කාංචන අභයපාල 13 වන අනුස්මරණ දේශනයේදී ගෙනහැර දැක්වූ සහ ආසියානු නෛතික සම්පත් මධ්‍යස්ථානය විසින් 2004 දී පළකරන ලද. "උස් හඬින් කථා කිරීමේ අයිතිවාසිකම" යන වාර්තාවේ පළවූ පරිදි

68 මෙවැනිවූ නඩුවල අභිචෝදක පක්ෂයට සහ විමර්ශනයන්ට බාධාකිරීම අවසන් කිරීම සඳහා සාක්ෂිකරුවන් රැකීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම සහ සාක්ෂිකරුවන් බියවැද්දීම සම්බන්ධව මෙම අධිකාරිය කඩිනමව ක්‍රියා කළයුතුය. අවසානාත්මක නිරීක්ෂණ අංක 09 (CCPR/CO/79/LKA) මානව හිමිකම් කමිටුව, 79 වන සැසිවාරය, 2003 නොවැම්බර්

69 වධ හිංසාව සම්බන්ධයෙන් මහාධිකරණයේ චෝදනා ගොනුකර තිබූ වධ හිංසාවට ලක්වූ ජෙරල්ඩ් පෙරේරා මහාධිකරණයේ සාක්ෂිදීමට දිනකට පෙර ඝාතනය කළ අතර ඒ සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වන්දි ලබාගන්නා ලදී. (සංජීව එ. සුරවීර 2003 (1) SLR 317)

70 බලන්න, සාක්ෂිකරුවන් රැකීමේ නීතියෙහි කෙටුම්පත, LST Review, Vol. 17, April-May Joint Issue (234-235) 2007, පි. 58.

ලෙස සාක්ෂිකරුවන් රැකීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීමේ වගකීම රජයේ වගකීමක් වන අතර අදාළ කොමිසම්හි විමර්ශනයක් සම්බන්ධයෙන් මහජනතාවගේ සුපරීක්ෂාකාරීභාවය වසාදැමීමේ පදනමක් බවට මෙය පත්කළ නොහැකි බවද පැහැදිලිවේ.

4.5.2 ක්‍රියාපටිපාටීන් හැසිරවීම සම්බන්ධයෙන් කොමිසම්හි බැඳීම

1948 අංක 17 දරන පනත යටතේ ඇතිකරන ලද විමර්ශනය සඳහාවූ කොමිසම් අධිකරණයක් ලෙස ක්‍රියානොකරන නිසා ඔවුන්ගේ සොයාගැනීම් නිර්දේශනාත්මක වන අතරම ඒවා මගින් කිසිදු අයිතිවාසිකමකට හානිවන ආකාරයේ ස්ථිර නියෝග දියනොහැකි අතර තවද එය අධිකරණ සමාලෝචනයන්ට වගකිවයුතු නොවේ[71]. කොමිසමේ වාර්තා හෝ නිර්දේශ සම්පූර්ණ හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේ අවශ්‍ය කොටසක් වන අතර තනි පුද්ගලයන්ගේ යහපතට ඇති අයිතිවාසිකම් වලට අහිතකර හෝ විරුද්ධ වන ක්‍රියා නැවැත්විය හැකිය[72].

ප්‍රනාන්දු එ. ජයරත්න[73] ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන් දැක්වූ ආකාරයට ශ්‍රී ලංකාවේ නෛතික ක්‍රියාවලියේ සම්පූර්ණ විෂය සහ අන්තර්ගතය වන ස්වභාවික යුක්ති මූලධර්මයන් හා බැඳීසිටීම අවශ්‍ය නොවන නමුත් සාධාරණ ලෙස ක්‍රියාකිරීමේ යුතුකම පවතින බව අධිකරණය මගින් ළඟාකරගත් සහ ක්‍රියාත්මක කරන ලද නීතියේ මූලිකම කරුණකි. එම නඩුවේ කරුණු මඟින් කොමිසමට ඇති යුතුකම් සියල්ල ඔවුන් විසින් ක්‍රියාත්මක කළේද යන්න හෙළිදරව් කරන ලදී. ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ නිලධාරීන් සහ සේවකයින්ගේ ක්‍රියාකලාපය පිළිබඳ විමර්ශනය කිරීමට කොමිසම පත්කරන ලදී. එම වාර්තාවේදී ඔහුගේ ක්‍රියාකලාපය විමර්ශනයට භාජනය වියයුතු බවට දන්වන ලද එක් සාක්ෂිකරුවෙකුට එරෙහිව කොමිසම විසින් කරුණු සොයාගත් අතර, ඔහුගේ නොපැමිණීම සම්බන්ධයෙන් කරුණු සැළවුණු සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් ඔහුව මේ හා සම්බන්ධ කරන ලදී.

---

71 *ද මැල් එ. ද සිල්වා* (51 NLR 282) (ශ්‍රේෂ්. තනි විනිසුරුවරයෙකුගේ නියෝගය), *ඩයස් එ. අබේවර්ධන* (68 NLR 109)

72 *ද මැල් එ. ද සිල්වා* (ඩීබී) (51 NLR 105), තනි විනිසුරුවරයෙකුගේ නියෝගයක පසු බලපෑම, 52 NLR 282 (ඉහත)

73 78 NLR 123

කොමිසම්හි කාර්යභාරය අධිකරණමය හෝ අර්ධ අධිකරණමය නොවන නිසා එම නියෝගය ස්ථිර අවසානාත්මක හෝ බැඳීම් සහගත නොවන නිසා මෙම සොයාගැනීම් සම්බන්ධයෙන් අයිතිවාසිකම්වලට බලපෑමක් වීම හේතු කොට ගෙන මෙම සොයාගැනීම් සම්බන්ධයෙන් කරන ලද රිට් අයදුම්පත මගින් අධිකරණය ඉදිරියේ හේතු දැක්වීමට අසමත් විය. අදාළ කොමිසමේ වාර්තාව මත පෙත්සම්කරුගේ රැකියාව අත්හිටුවා තිබිණි. කෙසේ වෙතත් නකුඩා අලි එ. ජයරත්න[74] යන ප්‍රිවි කවුන්සිලයේ තීන්දුව මත විශ්වාසය තබා අධිකරණය මෙම තීන්දුවට එළඹ තිබුණි. එමගින් එම කාලයේ ඉංග්‍රීසි නීතිය[75] අනුගමනය කර තිබූ අතර, මෙම පසුකාලීන තීන්දුව පසුකාලීනව සාමි මණ්ඩලය විසින් දුන් රිජ්. එ. බෝල්ඩ්වින්[76] නඩුවේ නොපිළිගත් හා ප්‍රතික්ෂේප කරන ලද බලතල බෙදා දැක්වීමේ මූලධර්මයට වගකිවයුතු වූ අතර රිජ් එ. බොල්ඩ්වින් නඩුව මගින් ප්‍රනාන්දු එ. ජයරත්න නඩුවේදී අධිකරණමය ළඟාවීම ප්‍රශ්නගතකිරීම සාධාරණීකරණය කරන ලදී. සාධාරණව ක්‍රියාකිරීමේ සංකල්පමය යුතුකමක් තිබේය යනුවෙන් කොමිසමේ වාර්තාව මත පමණක් පදනම් වෙමින් යම් පුද්ගලයෙකුගේ රැකියාව නැවතුවේ (එමනිසා එම පුද්ගලයාගේ අයිතිවාසිකම්වලට හානිවේ) නම් එවැනි වාර්තාවකට විවේචනයක් එකතුකළ නොහැකි නම් ඒ පිළිබඳ කථා කිරීමෙන් පමණක් සිදුවන යහපත කුමක්ද?

මෙම විවේචනයන් සම්බන්ධයෙන් අභියාචනාධිකරණ තීරණයක් වන මෙන්ඩිස් ෆවුසි සහ තවත් අය එ. ගුණවර්ධන[77] (ජී. පී. ඒ. සිල්වා) සලකා බැලිය යුතුය. එම නඩුවේදී විශේෂයෙන් දක්වන ලද නගර සභා දොළහක ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අදක්ෂභාවය, අයහපත් පරිපාලනය, වැරදි ලෙස බලය භාවිතකිරීම, දූෂණය සහ නිසිලෙස ක්‍රියාත්මක නොවීම් විමර්ශනය කිරීමට සහ නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට 1948 පනත යටතේ එක් පුද්ගලයෙකුගෙන් සහ පුද්ගලයන් දෙදෙනෙකුගෙන් යුත් කොමිසමක් ජනාධිපති අධිපත්‍රයක් මගින් පත්කරන ලදී. වාර්තා ලැබීම මත අංක 38 සහ 39 දරණ සිවිල් නොහැකියාව පිළිබඳ නීතිය සමහර පුද්ගලයන් සම්බන්ධයෙන් සිවිල් නොහැකියාව බලාත්මක කිරීම සඳහා නීතිගත කරන ලද අතර එම අදාළ කොමිසම විසින් සොයාගන්නා ලද සොයාගැනීම් මත මෙම නීති දෙක සම්මත කරගන්නා

---

74 51 NLR 457

75 උදා: ලෙස ඒක පාර්ශවීය පාකර් 1953 (1) WLR 1150

76 1964 AC

77 1978 - 79 (II) SLR 322

ලදී. කොමිසම විසින් සොයාගන්නා ලද කරුණු අවලංගු කිරීම සඳහා සර්ෂියොරාරි රිට් ආඥාවක් ගෙනඑන ලදී.

සිවිල් නොහැකියාව සම්බන්ධ නඩුවේදී රිට් අධිකරණ බලය සම්බන්ධයෙන් කොමිසම්හි ක්‍රියාපටිපාටිය වගකිවයුතු නොවේ යන මූලික විරෝධතාව අභිබවා යමින් අභියාචනාධිකරණය දැක්වූයේ කොමිසම්හි සොයාගැනීම් සහ නිර්දේශයන් අත්‍යවශ්‍ය සහ ක්‍රියාපටිපාටයේ අත්‍යවශ්‍ය කොටසක් වන අතර එමඟින් විෂය සම්බන්ධ අයිතිවාසිකම් පැතිරවීමට හානිකරන බවයි. මෙම නඩුවේදී ඔවුන්ගේ තීරණ සහ නිර්දේශයන් මඟින් පුද්ගලයන්ගේ චරිතයට සහ තත්ත්වයට සෘජුවම හානිවීමක් සිදුවිය. මෙම අවසානයට ළඟාවීමෙන් ප්‍රනාන්දු එ. ජයරත්න[78] හිදී ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීරණය අධිකරණය පිළිනොගන්නා ලදී[79]. "සාධාරණව ක්‍රියාකිරීමේ යුතුකම"[80] සහ "ස්වභාවික යුක්ති මූලධර්ම රීතීන් අදාළ කරගැනීමේ යුතුකම[81]" අතර ඇති වෙනස ප්‍රනාන්දු එ. ජයරත්න තීරණයට වඩා මෙන්ඩිස්, ෆවුසි සහ වෙනත් අය එ. ගුණවර්ධන පි. පී. ඒ. සිල්වා යන නඩුවේදී වෙනස් කොට දැක්වූ අතර ඒ අනුව.

"නීතියට අනුකූලව ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගත් කල සාධාරණව සහ යුක්තිසහගත ලෙස ක්‍රියාකිරීම අත්‍යවශ්‍ය වන අතරම එය තර්ක කළ හැකි සහ වෙනස්වනසුළු වීම අවශ්‍ය නොවේ. ස්වභාවික යුක්ති මූලධර්මයන් අනුගමනය කරමින් සාධාරණව ක්‍රියාකිරීමේ යුතුකමක් කොමසාරිස්වරුන් සතුවේ".

78 සැසිවාර වාර්තා 1 - 2000, පි. 314. වෛද්‍යලිංගම් වී.

79 ඉහත 73

80 අයිතිවාසිකම්වලට සෘජුවම හානි නොවූ

81 අයිතිවාසිකම්වලට හානිකරන අධිකරණමය හෝ අර්ධ අධිකරණමය පනත්

4.6 ඇඹිලිපිටියේ පාසල් සිසුන් 53 ක් සහ තවත් 11 දෙනෙකු පැහැරගෙනයාම සහ අතුරුදහන්වීම

ඇඹිලිපිටිය පැහැරගෙනයාම සහ අතුරුදහන්වීම[82] සම්බන්ධ වාර්තාවේදී කොමිසම සොයාගන්නා ලද්දේ

(අ) කටඋත්තර වාර්තා කිරීම පොලීසිය විසින් ප්‍රතික්ෂේප කිරීම

(ආ) සමහර අවස්ථාවලදී නාමයන් පවා හඳුනාගන්නා ලද හමුදා නිලධාරීන් විසින් මෙම පැහැරගැනීම් සිදුකිරීම සහ සමහර අවස්ථාවල ඔවුන් සම්බන්ධ නිශ්චිත රෙජිමේන්තු සහ සේනාංකයන් විසින් මෙම පැහැරගැනීම් සිදුකිරීම.

(ඇ) සමහර පැහැරගන්නා ලද දරුවන් හමුදා රඳවාගැනීමේ කඳවුරුහිදී මුලින් දැක තිබීම සහ පසුව ඔවුන් අතුරුදහන්වීම[83].

4.6.1 පොලීසිය විසින් කටඋත්තර වාර්තා කිරීම ප්‍රතික්ෂේප කිරීම

යම්කිසි පැමිණිල්ලක් පොලිස් නිලධාරියෙකුට එරෙහිවන සෑම අවස්ථාවකදීම පොලීසිය විසින් කටඋත්තර වාර්තා කිරීම ප්‍රතික්ෂේප කිරීම කොමිසම්වලට දැකිය හැකිවිය[84]. මෙම තත්ත්වය දැනට පවතින සේම අනාගත තොරතුරු සෙවීමේ කොමිසම් තුලින් සොයාබැලීමට මෙන්ම විස්තරාත්මක විභාගයක් කිරීම සඳහා බැඳියාවක් ඇති කරයි.

ප්‍රථම තොරතුර වාර්තාගත කර තබාගැනීම

ඕනෑම වරදක් සම්බන්ධයෙන් කොමිසම විමර්ශනයක් කිරීමේදී වාර්තාගත ප්‍රථම තොරතුරෙන් ආරම්භ කිරීම විධානාත්මක වේ[85]. කෙසේ වෙතත් පොලීසිය ප්‍රථම තොරතුර වාර්තා කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවල මෙවැනි ආකාරයේ ආරක්ෂණයක් අර්ථ විරහිත වන අතරම එමඟින්

---

82 1996 ජනවාරි 3 වන දින දරන 1983 - 1990 දක්වා කාලය තුළ ඇඹිලිපිටිය ප්‍රදේශය තුළ පාසල් ළමුන් අතුරුදහන්වීම පිළිබඳ විශේෂ වාර්තාව (බස්නාහිර, දකුණු සහ සබරගමුව ස්වේච්ඡා නොවන ඉවත්කිරීම හෝ අතුරුදහන්වීම සම්බන්ධ ජනාධිපති කොමිසම)

83 විශේෂයෙන්ම, "සෙවණ කෑම්ප්"

84 සැසිවාරාත්මක පි. 6

85 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 109 (1) වගන්තිය (සංශෝධන පරිදි)

වාර්තාගත අපරාධයන් සම්බන්ධ විමර්ශනයන් සහ විභාගයන් ප්‍රතික්ෂේප වීම සිදුවේ[86].

මෙවැනි ආකාරයේ ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රථම තොරතුර වාර්තා කිරීම පොලීසිය විසින් ප්‍රතික්ෂේප කිරීම සලකා බැලීමේදී රාජ්‍ය නොවන සංවිධාන සහ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත් මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් ක්‍රියාකරන මානව හිතවාදී කණ්ඩායම්වලට මෙම ප්‍රථම තොරතුර වාර්තා කිරීම සම්බන්ධව අවස්ථාව ලබාදෙමින් නීතිය සංශෝධනය කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පැනනගී. 1994[87] බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වීමේ කොමිසම ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක වන ලද්දේ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය[88] සහ දෙමාපිය/ළමා මූලස්ථානය (Parents/Children Front 1991)[89] ලබාදෙන ලද තොරතුරු මතය. එසේම පිළිගත් සහ සද්භාවී මානව හිතවාදී කණ්ඩායම්වලින් බලහත්කාරයෙන් අතුරුදහන්වීම් වැනි ක්‍රියා සිදුකරන ලද විශාල අපරාධ සම්බන්ධ ප්‍රථම තොරතුරු ලබාගැනීමේ ඉඩප්‍රස්ථා ලබාදෙන ලදී. මෙම කරුණ අනුව පනතේ 136 (1)(ආ) වගන්තිය මගින් නියෝගකර ඇති පළමු අවස්ථාවේදීම පනතේ 109 (1) වගන්තිය අනුව පළමු තොරතුරු මතම අධිකරණ කටයුතු ඉදිරියට ගෙනයාම පිළිබඳ සැලකීමේදී පනතේ 109 (1) වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම ප්‍රයෝජනවත් වේ. "කොමිසම් ක්‍රියාකරන වරදක් සම්බන්ධයෙන් වන සෑම තොරතුරක්ම පොලිස් නිලධාරියෙකුට හෝ විමර්ශකයෙකුට හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට හෝ එම තොරතුරු ලබාගැනීමේ අරමුණ සඳහා ස්ථාපනය කරන ලද ඕනෑම ස්වෙච්ඡා සංවිධානයකට ලබාදිය හැකිය[90]"

4.6.2 පසුව ඇතිවන විමර්ශන ක්‍රියාවලිය

කෙසේ වෙතත් ප්‍රථම තොරතුර වාර්තාගත කිරීම සම්බන්ධ නීතිය සංශෝධනය කිරීමට මෙයාකාරයේ අපරාධයන් සම්බන්ධ සම්පූර්ණ

---

86 එහිම

87 1997 සැසිවාරාත්මක වාර්තා අංක II සහ V හි අතුරු සහ අවසානාත්මක වාර්තා

88 එම කාලය තුල නඩු සම්බන්ධයෙන් මෙය ඉතා කඩිනම් විය.

89 එම කාලයේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ සාමාජිකයකුව සිටි වර්තමාන ශ්‍රී ලංකාවේ ජනාධිපති අධුවෙන් තොරව ආරම්භ කරන ලදී.

90 වෙනත් පනතකින්

විමර්ශනයක් කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. ඉහතින් යෝජනා කළ පරිදි නීතිය සංශෝධනය කළද විමර්ශනය කිරීමේ ක්‍රියාවලියේ පාලනය තවදුරටත් පොලීසිය මත රඳා පවතී. පොලීසිය විසින් ප්‍රථම තොරතුර වාර්තා කිරීම පළමු අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් වෙනත් ආයතනයන් මගින් එවැනි තොරතුරු වාර්තා කිරීම මත විමර්ශනයන් සිදුකිරීම විශ්වාස කළ හැකිද?

මෙය සිතෙහි තබාගෙන 1994 බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වීමේ කොමිසම මෙවැනි විමර්ශනයන් කිරීමට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලදී[91]. නමුත් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව යනු කුමක්ද? විවිධ තරාතිරම්වල පොලිස් බල ඇණියන්ගෙන්[92] සමන්විත පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත ආයතනයකින් අපක්ෂපාතී විමර්ශනයක් සිදුකිරීම බලාපොරොත්තුවීම ජනතාවට විශ්වාස කළ හැකිද? මෙවැනි ආකාරයේ විමර්ශනයක් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මත පැවරීම සහ විශාල වශයෙන් ඒ මත රඳා පැවතීම පිළිගත නොහැකි අතර මේ ආකාරයට ක්‍රියාකිරීමට නීතිපති ගන්නා ලද තීරණය දෝෂ දර්ශනයට ලක්වේ.

එසේනම් මෙම ප්‍රශ්නය සඳහා විසඳුම කුමක්ද?

(අ) 17 වන ව්‍යවස්ථා සංශෝධනය සඳහා කැපවීම - විධානාත්මක පැයක අවශ්‍යතාවය

මෙවැනිවූ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විමර්ශනයන් පාර්ලිමේන්තුව විසින් ස්ථාපනය කරන ලද ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් ක්‍රියාත්මක කළයුතුවූ අතර 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් මෙහි සාමාජිකයන් පත්කළ යුතුවිය. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දැනට ක්‍රියාත්මක නොවේ. මේ අනුව විය හැකි කාරණා දෙකක් සිතෙහි තබාගත යුතු අතර, එයට අනුව පොලිස් විමර්ශනයන් හෝ ජාතික පොලිස් කොමිසම පරීක්ෂා කළ හැකි මහජන අභිචෝදක දෙපාර්තමේන්තුවක් ස්වාධීනව ක්‍රියාත්මකවීම බලාපොරොත්තු වේ. කෙසේ වෙතත් ජාතික පොලිස් කොමිසම කෙරෙහි

---

91 1994 බස්නාහිර, දකුණු සහ සබරගමුව අතුරුදහන්වූවන් පිළිබඳ කොමිසමේ වාර්තාව, පි. 7

92 පොලිස් ආඥා පනත

ඇති මහජන විශ්වාසය ඔවුන්ගේ නියෝජිතයින් පත්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 17 වන ව්‍යවස්ථා සංශෝධනය අනුගමනය නොකිරීම තුළ කාවැද තිබේ. 17 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක නොවීම මූලික කරුණක් වන අතරම, ලංකාවේ අභිචෝදක ක්‍රමය සම්බන්ධයෙන් ආණ්ඩුව බරපතල අවධානයක් යොමුකිරීම අවශ්‍ය වේ.

(ආ) දැනට පවතින නීතියට සංශෝධනයක් ලෙස "පොලිස් කවුන්සලය" පිහිටුවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් පිහිටුවන ලද ජාතික පොලිස් කොමිසම එම විමර්ශන කිරීමේ බලතල ක්‍රියාත්මක නොකරන්නේ නම් හෝ මහජන අභිචෝදක දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක නොවේ යන සංකල්පය තහවුරු කළ නොහැකිනම් මේ සඳහා වන තෙවන විසඳුම වන්නේ 17 වන ව්‍යවස්ථා සංශෝධනයට ගෙනෙන සංශෝධනයක් ලෙස පොලිස් කවුන්සලය පිහිටුවිය යුතු බවයි. මෙම පොලිස් කවුන්සලයේ සාමාජිකයන්, හැකියාව සහ අවංකත්වය ඇති විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන්ගෙන් පත්කළ යුතු අතර ඔවුන්ට සහායවීම සඳහා දැනට පවතින පොලිසියේ ස්වාධීන සාමාජිකයන් බඳවාගත යුතු අතරම මෙම බඳවාගැනීම් පොලිස් ආඥා පනත අනුව සිදුකළ යුතු වන අතර, මේ සඳහා 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, පොලිස් ආඥා පනතේ සංශෝධනය අනුව තවත් සංශෝධනයක් එකතු කළ යුතුය.

4.7 අභිචෝදක ක්‍රමය සහ ඇටෝර්නි ජෙනරාල් කාර්යභාරය

4.7.1 ප්‍රාථමික විමර්ශන පිළිබඳ සංකල්පය (ලඝු නොවන කාර්ය පටිපාටිය)

සාමාන්‍ය ආකාරයෙන් නඩු ක්‍රියාත්මකවීමේදී චූදිත මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනීසිටීමේදී හෝ ඔහුව මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවීමේදී දැනට පවතින නීති අනුව අවස්ථා දෙකකදී ප්‍රාථමික විමර්ශනය රඳවා තබාගැනීමට මහේස්ත්‍රාත් උසාවියට හැකිවේ[93]. මෙම දෙවන අවස්ථාව නීතිපති විසින් දක්වන ලද්දේ,

93 1979 අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 145 වන වගන්තිය

"අදාළ චෝදනාව සෑදීම සඳහා ප්‍රාථමික විමර්ශනයේදී ගන්නා ලද සාක්ෂි අවශ්‍යයැයි නීතිපතිගේ අදහස වන අවස්ථාවක, අදාළ වරද සිදුවුණා යැයි කොමිසම පවසන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරියට කටයුතු කිරීම[94] .... යනුවෙනි.

(අ) පැහැරගෙනයාම් ස්වෙච්ඡාවෙන් නොවන ඉවත්කිරීම් හෝ අතුරුදහන්වීම් හෝ මිනීමැරුම් යන වැරදිවලට සම්බන්ධවූ පුද්ගලයන් සම්බන්ධ නඩුවලදී කොමිසමේ සොයාගැනීම් සම්බන්ධව සහතික කිරීම සළකා බැලීම.

යම් පුද්ගලයෙක් වරදක් හා සම්බන්ධ බවට කොමිසමේ සොයාගැනීම් අනුව ප්‍රාථමික විමර්ශනයේදී සෑහීමට පත්වීමට කරුණු තිබෙන විට එම වරද සම්බන්ධයෙන් අදාළ නඩුව ඉදිරියට ගෙනයාමට හෝ නොගෙනයාමට නීතිපතිට අදහස් දිය හැකිය.

මෙයාකාරයෙන් කරුණු සොයාගැනීම සඳහා ප්‍රාථමික විමර්ශනය අනුව සෑහීමකට පත්වීම අවශ්‍යවේ නම් මෙයාකාරයෙන් කොමිසම් පත්කිරීමේ අදහස සම්පූර්ණයෙන්ම අර්ථ විරහිත වන බව දැක්විය හැකිය. එවැනිවූ සොයාගැනීම් සඳහා කොමිසම ළඟාවේ නම් එය ප්‍රථම තොරතුරු වාර්තා කිරීම සහ ඒ හා සම්බන්ධ විමර්ශනයන් හා සම්බන්ධ දැනට තිබෙන තහනම ඉක්මවා යාමක් වන අතරම, එය දැනටමත් යෝජනා කර ඇති නීතියට වියයුතු සංශෝධනය ගෙනහැරපාන බව සැලකිය යුතුය[95]. දැනට පවතින නීතියට යෝජනාකර ඇති සංශෝධන මගින් පහත සඳහන් කරුණු ප්‍රකාශිතව දක්වා ඇත.

(ආ) අදාළ නඩුව චෝදනා ගොනුකිරීම සඳහා නීතිපති ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවල ඇතිවන ප්‍රතිඵල

රටේ දැනට ස්ථාපිත නීතිය අනුව, සාමාන්‍යයෙන් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 136 (1)(අ) වගන්තිය අනුව අදාළ චූදිතයාව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට පැමිණවීමෙන් පසු, මහේස්ත්‍රාත්වරයා විසින් එම චූදිතව නිදහස් කරයි නම් පීඩාවට පත් පාර්ශවය එම පනතේම 393 වන වගන්තිය අනුව නීතිපතිගේ ඒ සම්බන්ධ දඬුවම් පැමිණවීම බලාපොරොත්තුවේ නම් සහ

94 පනතේ 14 (ආ) වගන්තිය

95 ඉහත 4.6 වගන්තිය බලන්න

එයට මැදිහත්වීම නීතිපති ප්‍රතික්ෂේප කරයි නම් මෙම සියළුම චේතනාවන් සහ අරමුණුවලට අනුව ගැටළුව අවසන් වේ.

මෙම සන්දර්භය තුළ අධිපත්‍ර මගින් කාරණා දෙකක් ගෙනහැර දක්වයි.

(i) යම් නම්කරන ලද චූදිතයෙකුව මහේස්ත්‍රාත්වරයා විසින් නිදහස් කරන ලද්දේ නම් එයට මුහුණදෙන පීඩාවට පත් පාර්ශවය නීතිපතිවරයාගෙන් එම චූදිතයාව නැවතත් විභාගයකට බලහත්කාරයෙන් යොමුකිරීම බලාපොරොත්තු වේ[96]. නීතිපති රජයේ ප්‍රධාන නීති නිලධාරියාය යන කරුණ අනුව, කාර්යපටිපාටික පූර්ව අවශ්‍යතාවයක් ලෙස නීතිපතිගේ මෙම අවසරය විසඳෙන තෙක් කෙනෙකුට නීතිමය තත්ත්වය වරදවා වටහාගත නොහැකි බවයි.

(ii) එහෙත් මැදිහත්වීම නීතිපති ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ එම ප්‍රතික්ෂේප කිරීම පීඩාවට පත් පාර්ශවයට වේ නම්? නීතිපතිගේ විග්‍රහාත්මක තීන්දුවට ඔහු ඇතුළත් නොවේද?

(ඇ) මෙම සන්දර්භය තුළ අදාළ වන නීතිමය තත්ත්වයන්?

එක් උදාහරණයකදී[97], ශ්‍රේෂ්ඨාධිකරණය සිය ප්‍රතිශෝධන බලය[98] ක්‍රියාත්මක කිරීමේදී නිදහස්වීමක් සම්බන්ධව කරන ලද අභියාචනය පිළිබඳ අවසරය නීතිපති ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වෙතත් අතිවිශාල ඔප්පුකිරීමේ භාරයක් අභියාචක මත තබා "නීතිය හෝ විනිසුරුගේ අයදුම්පතෙහි කරුණු" අනුව යුක්තිය වැරදි ආකාරයෙන් හැසිරවූ බවට තදබල නඩුවක් ගොඩනැගුවහොත් මිස අදාළ නඩුව ඉදිරියට ගෙන යා නොහැකි බව දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී[99].

තවත් අවස්ථාවකදී[100], නීතිපතිගේ බලයේ විෂයපථය සහ ස්වභාවය මතුකර දැක්වූ අතර මෙහිදී ලඝු නොවන කාර්යපටිපාටියේදී "නීතිපතිගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම විනා ඕනෑම දෙයක් කිරීමට මහේස්ත්‍රාත්වරයාට

96 393 වන වගන්තිය

97 *රජ එ. නූර්දීන්* (12 NLR 115)

98 එහිම. වුඩ් රෙන්ටන් වි. පි. 117

99 එහිම. පි. 118

100 *නීතිපති එ. කනගරත්නම්* (52 NLR 121)

නොහැකි බව"[101] අධිකරණය ප්‍රකාශ කරන ලදී. මෙම නඩුවේදී මහේස්ත්‍රාත්වරයා විසින් සමහරක් චෝදනා තවදුරටත් පුළුල් කිරීම සඳහා තොරතුරු සොයා දෙන ලෙස දැක්වූ අතර මෙම නියෝගයට එරෙහිව නීතිපති ප්‍රතිශෝධනයක් ගෙන එන ලදී. මෙහිදී අදාළ චූදිතයාට මුලින් කියවා දෙන ලද චෝදනාව අනුවම අදාළ ක්‍රියාපටිපාටිය ඉදිරියට ගෙන යායුතු බව නීතිපති දක්වන ලදී. ප්‍රතිශෝධන බලය ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන්ම දක්වන ලද්දේ මහේස්ත්‍රාත්වරයා විසින් ලඝු නොවන කාර්යපටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී එම නියෝගය අදාළ චූදිතයාට එරෙහිව චෝදනාව ඉදිරිපත් කිරීමට පෙර හෝ ඒ හා සමඟම ක්‍රියාත්මක කළ යුතුය[102] යන්නයි.

කෙසේ වෙතත් නීතිපතිට ව්‍යවස්ථාපිතව ප්‍රතිශෝධන බලය සම්බන්ධ දී ඇති බලතල විචාර නොකරමින් නීතිපතිගේ උපදෙස් මත මහේස්ත්‍රාත්වරයා විසින් ක්‍රියාත්මක කරන නියෝගයන් ඕනෑම ආකාරයකට ප්‍රතිශෝධනය කිරීමට අධිකරණයට බලය ඇති බව සැලකිය යුතුය[103].

නීතිපති එ. දොන් සිරිසේන[104] යන නඩුව මේ පිළිබඳ තවත් අවස්ථාවක් දක්වයි. මෙහිදී චූදිතයාට අදාළ චෝදනා කියවාදීමට ප්‍රථමයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතව නිදහස් කළ අතර (සාක්ෂි ප්‍රමාණවත් නොවේ යන හේතුව නිසා) නීතිපති විසින් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ සමහර වගන්ති අනුව මේ සඳහා මැදිහත්වූ නමුත් එම වගන්ති අනුව පසුව චූදිතව නිදහස් කරන ලදී. මෙමඟින් අදාළ චූදිතයාව නැවතත් විභාගයකට ගෙනයාම සඳහා නීතිපතිව යොමුකරවන ලදී. මෙමඟින් නීතිපතිව එකඟ නොවීමේ නියෝගය මත ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රතිශෝධනයක් ගෙනඒමට යොමුකළ අතර එය මහේස්ත්‍රාත්වරයා එකඟවීම ප්‍රතික්ෂේප කිරීම මත සිදුවන ලදී.

නීතිපතිගේ යොමුකිරීම් අනුව, මෙම තීන්දුව සුපරීක්ෂාකාරීව කියවීමේදී මෙම ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ කරුණු තුනක් අනාවරණය වෙයි. ඒවා නම්:

---

101 එහිම. නාගලිංගම් වි.

102 එවකට නීතියවූ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 356 වන වගන්තිය අනුව

103 එම සංග්‍රහයේ 390 (2) වගන්තිය අනුව

104 70 NLR 347

01. අභිචෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් එකිනෙකාට විරුද්ධවීම

02. ඔවුන්ගේ සාක්ෂි යම්තාක්දුරකට ඔවුන්ගේ පෙර කටඋත්තරවලට වඩා වෙනස්වීම

03. එම සාක්ෂිකරුවන් චූදිතයන්ව චෝදනාවට හසුකර ගනිමින් අදාළ කටඋත්තරදීම ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රමාද කිරීම

මෙම පදනම සහ අදාළ විමර්ශනය සඳහාවූ කොමිසම විසින් සිදුකරන ලද විමර්ශනයන්හි අදාළත්වය සලකා බැලීමේදී 1994[105] අතුරුදහන්වූවන් සඳහාවූ කොමිසමේ අත්දැකීම් නැවත විස්තර කිරීමට සිදුවේ. පීඩාවට පත් පාර්ශවයේ මව, පියා, බිරිඳ, සැමියා බොහෝවිට ඔවුනොවුන්ට පරස්පර සාක්ෂි ගෙනහැර දක්වන ලදී. ඊට අමතරව 1994 බස්නාහිර, දකුණ සහ සබරගමුව අතුරුදහන්වූවන්ගේ කොමිසම් ගෙනහැර දැක්වූ උදාහරණ අනුව, බොහෝ පැමිණිලිකරුවන්ට (බොහෝ අය පැහැරගත් පුතුන්ගේ අම්මාවරුන්) වන්දි ලබාගැනීමේ ප්‍රශ්නයක් පැනනැගේ යැයි කියා රාජ්‍ය අධිකාරීන් විසින් ප්‍රමාදවී පවා පොලීසියට කටඋත්තර දෙන ලෙස උපදෙස්දී තිබූ අතර, ඒ අනුව අදාළ පීඩාවට පත් පාර්ශවය පැහැරගෙන තිබුණේ නොදන්නා පුද්ගලයන් හෝ කැරලිකරුවන් බවට ඔවුන් සාක්ෂිදී තිබිණි[106].

මෙම පසුබිම සලකා බැලීමේදී අදාළ විමර්ශනය දේශපාලනඥයකු සම්බන්ධයෙන් වන විට පොලිස් නිලධාරීන් විසින් හෝ හමුදා නිලධාරීන් විසින් ඔවුන්ට කරනුලබන බලපෑම් හේතුකොට ගෙන එවැනි විමර්ශනයකදී බැලූ බැල්මට සාක්ෂිකරුවන් විසින් ලබාදෙනු ලබන කටඋත්තරයන්ගේ ස්වභාවය පරස්පර විරෝධී වන බව පැහැදිලිය. (අදාළ නඩුව අනුව) කෙසේ වෙතත්, මෙම පීඩාවට පත් පාර්ශවය විසින් අදාළ පැහැරගෙනයාම සිදුවීමෙන් පසු පොලීසියට දෙන ලද කටඋත්තරය පරස්පර විරෝධී වන විට දක්වනුයේ "පැහැරගත් පුද්ගලයාගේ ශරීරය නොදන්නා හෝ නාඳුනන පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් බැහැරක ගෙනගිය බවයි."

105 බලන්න ඉහත 10

106 එහිම කොමසාරිස්වරයෙකුවූ මෙම රචකයාගේ පෞද්ගලික එකතුවද මේ සම්බන්ධයෙන් බලපායි.

මෙහිදී කොමිසම සිය අත්දැකීම් තුළින් හෙළිදරව් කරන ලද්දේ මෙයාකාරයේ පරස්පර විරෝධී සාක්ෂි දීමට හේතුව අදාළ පැහැරගෙනයාමත් සමගම අතුරුදහන්වීම සඳහා වන්දි දීමට රජය යෝජනා කිරීමයි.

මහේස්ත්‍රාත්වරයෙකු, මහාධිකරණ විනිසුරුවරයෙකු සහ නීතිපති මෙයාකාරයේ පරස්පර විරෝධීතාවයන් මත සිය කාර්යයන් ඉදිරියට ගෙනයන්නේ කෙසේද? මහේස්ත්‍රාත්වරයා එවැනි වැරදිකාරයකු විභාගයක් සඳහා යොමුකිරීමත් (කොමිසම් අවස්ථාවේදී ඔහුගේ නම අනාවරණය නොවූයේ නම්), මහාධිකරණ විනිසුරුවරයකු ඔහුව වැරදිකරුවකු කිරීම සඳහා මෙහෙයවීමත් (නීතිපති අදාළ දෝෂාරෝපණය ඉදිරිපත් නොකළේ නම්) මෙම පරස්පර විරෝධී සාක්ෂිවලට මුහුණ දෙමින් කරන්නේ කෙසේද?

1994 අතුරුදහන්වීමේ නිර්දේශයන් අනුගමනය කරන ලද සීමාසහිත සංඛ්‍යාවක් වන අභිචෝදනා සන්දර්භය තුළ සමහර නිදහස් කිරීම සඳහා පැහැදිලිකිරීම් අවශ්‍ය වන බව මෙමගින් ගෙන හැරපායි. නම්කරන ලද හෝ නොකරන ලද වැරදිකරුවන්ට චෝදනා කරයිද යන්න තීරණය කිරීමේදී නීතිපති විසින් මෙවැනි ප්‍රශ්න රාශියකට මුහුණ දෙයි.

නීතිපති එ. දොන් සිරිසේන[107] නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය නැවත සලකා බැලීමේදී, මහේස්ත්‍රාත්වරයා විසින් අදාළ චූදිතයාව නිදහස් කිරීම සඳහා පදනම් කරගත් කරුණු තිබියදීත්, නීතිපති විසින් චූදිතයාව විභාගයක් සඳහා යොමුකළ අතර, මෙම යොමුකිරීම සඳහා එකඟවීම මහේස්ත්‍රාත්වරයාද ප්‍රතික්ෂේප කරන ලදී. මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයට විරුද්ධව නීතිපති විසින් ගෙනා ප්‍රතිශෝධන ඉල්ලුම්පත පිළිගනිමින් මහේස්ත්‍රාත්වරයාගේ ප්‍රතික්ෂේප කිරීම නීතිවිරෝධී බව දක්වන ලදී. කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨාධිකරණය මෙහිදී දක්වන ලද්දේ "මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රාථමික විමර්ශනය පවත්වන අවස්ථාවේදී විභාගයක් සඳහා අදාළ පුද්ගලයා යොමුකිරීමේ අරමුණ තීරණය කිරීම සඳහා අධිකරණ බලයක් ක්‍රියාත්මක නොකරන බවයි." මෙම අදහස ආගන්තුක ලෙස සැලකිය යුතු අතර මෙම අදහස් තවදුරටත් සැලකීමේදී අධිකරණය දැක්වූයේ නීතිපතිගේ බලය මෙම සන්දර්භය තුළ අර්ධ අධිකරණ බවයි.

107 70 NLR 347

තවදුරටත් මේ පිළිබඳව සලකා බැලීමේදී පොදු නීතියේ විෂයපථය අනුව පසුකාලීන සංවර්ධනය දැක්වීමේදී[108] විමර්ශන කොමිසම් විසින් සිය කටයුතු ප්‍රාථමික ස්වභාවයේ විමර්ශනයන් මත, එනම් මහේස්ත්‍රාත්වරයා විසින් සිදුකරනු ලබන ලඝු නොවන විමර්ශනයක් හා සමානම විමර්ශනයන් මත සිදුකරයි යන කරුණ ස්ථිර නම් "මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණ කටයුතු ක්‍රියාත්මක නොකරයි" යන කරුණ සැකසහිත වේ. මෙයාකාරයේ කොමිසම් පත්කිරීම සම්බන්ධ මූලික විරෝධතාවක් ගෙන ඒ නම්, මෙම ලිපියේ ඉහතින් යෝජනා කළ ආකාරයට අභිචෝදන ක්‍රමයට සංශෝධන ගෙනඒමට හානිවේ.

(ඇ) මහේස්ත්‍රාත්වරයා විසින් යම් පුද්ගලයෙකු විභාගයක් සඳහා යොමු කරන නමුත් එවැන්නක් ඉවත දැමීමේ අවස්ථාව නීතිපතිට ඇත. මෙම ක්‍රියාත්මකවීමේ බලය පෙර තිබූ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 388 වන වගන්තිය අර්ථනිරූපණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන තිබේ[109]. මෙම වගන්තිය දැනට ඇති නීතියේද අඩංගු වේ[110]. මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ සාක්ෂිදී ඇති යම් පීඩාවට පත් පාර්ශවයක් සහ විමර්ශන කොමිසමක් මගින් මහේස්ත්‍රාත්වරයාහට සාක්ෂි ඉදිරිපත් කළේ නම් 1979 වර්තමාන පනතේ xxviii වන ඡේදයේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව හා කියවීමේදී ඉහත කී නීතිය යටතේ ඔවුන් නීතිපති විසින් ප්‍රතිශෝධනය කරන ලද අභියාචනාධිකරණ තීන්දුවකට යටත් වේද? මෙය විභාගයකට යාම සඳහා අදාළ විමර්ශනය භාජනය වන නම්කරන ලද වැරදිකරුවකුගේ වරදක් සම්බන්ධයෙන් නිර්දේශ කරන විට බව පැවසිය හැකිය.

මේ හා සම්බන්ධ ඉපැරණි අධිකරණමය රීතීන් මෙයාකාරයේ ප්‍රතිශෝධන බලයක් ක්‍රියාත්මක කිරීමට නොකැමතිවී තිබේ[111]. මෙයාකාරයේ ප්‍රතිශෝධන අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට හේතුවන්නේ[112], ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරනු ලබන "මෙම සමකාලීන අධිකරණමය තත්ත්වයන් නීතිපති විසින්

---

108 බලය, අභිමතය සහ මහජන යුතුකම හා සම්බන්ධව පොදු නීතියේ බලපෑම සම්බන්ධයෙන් මෙම වාර්තාවේ 4.2 වගන්තිය බලන්න.

109 නීතිපති එ. කනගරත්නම්, ඉහත 100, පි. 129

110 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 396 වන වගන්තිය බලන්න.

111 වේළු එ. වේළු (76 NLR 21)

112 ලිඛිත නීතිය මගින් අධිකරණය දක්වන ලද, එහිම පි. 23

ක්‍රියාත්මක කිරීම"[113]. පහත සඳහන් විවේචනයන්ට භාජනය වියහැකි බවයි. මෙම තීන්දුව විග්‍රහ කිරීමේදී මෙම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව කරුණු 3 ක් අනාවරණය කරයි.

01. මෙවැනි ආකාරයේ ප්‍රතිශෝධන බලයක් ක්‍රියාත්මක කරනුයේ එසේ නොවුවහොත් නීතිය වැරදි ආකාරයට ක්‍රියාත්මකවීමක් විය හැකි නිසාය[114]. කෙසේවෙතත්, මෙම අධිකරණ තීරණය පරීක්ෂාවෙන් කියැවීමේදී අනාවරණය වන්නේ මෙහිදී උපයෝගී කරගන්නා අවස්ථාවන් සහ කරුණු පිළිබඳ සාකච්ඡාවක් නොමැති බවයි.

02. මෙවැනි ප්‍රතික්ෂේප කිරීමකට දෙවැනි පදනම ලෙස දක්වන ලද්දේ, මෙම ප්‍රතිශෝධනයන් සම්බන්ධ අධිකරණයේ කොටස ක්‍රියාත්මක කිරීමේදී "මේ සම්බන්ධ නීතිපතිගේ බලතල සහ ක්‍රියාකලාපයන් කෙසේවුවද ඔවුන් එය ක්‍රියාත්මක කරන බවට සැකයක් නොමැතිය යන මතය දැක්විය හැකි අතර, "යහපත් වැරදීම්වලින් යුක්තිය නැවත ඇති නොවන බව" අතිශයෝක්තියෙන් අඩංගු විය.) මෙම මතය මඟින් යුක්තිය වැරදි ලෙස යොදාගැනීමේදී කාර්යපටිපාටික කරුණු ප්‍රශ්නවීම, නීතිය වැරදි ලෙස භාවිතය අධිකරණය විසින් විමර්ශනය කළ යුත්තේ මන්ද යන්න පැහැදිලි කරන ලදී.

එසේම මෙම දෙවන පදනම සම්බන්ධයෙන් ඉතාමත් ගෞරවයෙන් දැක්විය හැක්කේ, එවැනි ආකාරයේ ප්‍රතිශෝධන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම තුළ නීතිපතිගේ ඔප්පු කළ නොහැකි ප්‍රකාශයන්ට පක්ෂපාතී වෙමින් එයට යටත්වෙමින් අභියාචනාධිකරණය සිය අභිමතානුසාරී බලතල අත්හැර ඇති බවයි[115]. ඉතා ගෞරවාන්විත තත්ත්වයක් ලබාදුන් නීතිපතිගේ ඉහළ තත්ත්වය සත්‍යයක් වුවද, මෙම තත්ත්වය මඟින් සැමවිටම මහජනතාවගේ විශ්වාසය කෙරෙහි යොමු නොවූවේය යන කරුණ ශ්‍රේෂ්ඨාධිකරණය බිඳදමා ඇත[116]. නීතිපති විසින් මහේස්ත්‍රාත්වරයාට නියම නොකිරීම සඳහා නියෝග කිරීමේ තීරණයට එරෙහිව පීඩාවට පත් පාර්ශවයට ගතහැකි

---

113 වීරමන්ත්‍රි විනිසුරු, පි. 22., ඉහත 111

114 ඉහත 111., පි. 23

115 *නීතිපති එ. දොන් සිරිසේ*, 70 NLR 356

116 ඉහත එච්. එන්. ජී. ප්‍රනාන්දු අග විනිසුරු දක්වන ලද්දේ, මහේස්ත්‍රාත්වරයා විසින් විභාගය සඳහා තබන ලද නඩුවක් සම්බන්ධයෙන් නීතිපති නීත්‍යානුකූලව නිදහස් නොකර නම් වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයාගේ තර්කය භයගත්වන සුළු යෝජනාවක් ඉදිරිපත් කරන බවයි,

ප්‍රතිකර්මය කුමක්ද? මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස වූයේ "මෙහිදී විෂය වියයුත්තේ ඔහු අසතුටු වන නිදහස් කිරීමේ හෝ නියමකිරීමේ නියෝගයන්ට එරෙහිව ඇති ප්‍රතිකර්ම වල මදිපාඩුව නොව.........[117] කෙසේ වෙතත්, මෙම කරුණත් සමඟම ශ්‍රේෂ්ඨාධිකරණය පැවසුයේ "මෙම ප්‍රතිඵල අනුව මෙම අධිකරණයට සිය බලතල භාවිතා කිරීම සඳහා අවශ්‍යතාවයක් නොමැති බවයි[118]"

මෙහිදී ඉතාමත් ගෞරවයෙන් දැක්විය හැක්කේ ශ්‍රේෂ්ඨාධිකරණය සිය ප්‍රතිශෝධන බලය අපරාධ නඩුවිධාන සංග්‍රහයෙන් ව්‍යවස්ථාපිතව ලබාගන්නා අතර මෙම කාර්යපටිපාටීන්හි අධ්‍යයන වටිනාකමක් පමණක් දැකිය හැකි අතරම අභියාචනාධිකරණයේ ප්‍රතිශෝධන බලය[119] ස්වෛරීයව ජීවත්වන ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රදානය කර තිබේ[120]. මහේස්ත්‍රාත්වරයාගේ යුතුකම් සහ බැඳීම් නීතිපතිගේ බලතල සහ මුහුණට මුහුණලා ගත්කළ නීතිපති මෙම බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දී ඇති නිසා ඒ තුළ නැවුම් අධිකරණමය ළඟාවීමක් ඇති අතර, මෙම ප්‍රතිශෝධන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව අනුව ලබාදී ඇති නිසා එය උසස්ම තත්ත්වයේ බලතලයක් වේ[121].

03. තුන්වන පදනම ලෙස (ව්‍යංගයෙන්) පසු දෙනු ලබන වාර්තා තලයේදී අභිචෝදන නිවර්තන ක්‍රමයක් ඇතුළත් කිරීම සඳහා උනන්දු කරවීමට නීතිපතිට ඇති බලය වේ. *රජ එ. නූර්දීන්*[122] හිදී නීතිපති දක්වන ලද්දේ නීතිපතිගේ නියෝගය හෝ අභිමතය ප්‍රතිශෝධනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට (වර්තමාන අභියාචනාධිකරණය) හැකියාව තිබුණද පසුව දෙනු ලබන වාර්තා තලයේදී මෙයාකාරයෙන් අභිචෝදන නිවර්තන ක්‍රමයක් ඇතුළත් කිරීමට නීතිපතිට හැකියාව ඇති තෙක් මෙය නිශ්චල තර්ජනයක් ලෙස දැක්විය හැකි බවයි[123].

---

117 *වෙළු නඩුව*, පි. 23

118 එහිම

119 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව අනුව

120 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව 4 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතුය.

121 *අතපත්තු එ. මහජන බැංකුව (ශ්‍රේෂ්)* (1997(1) SLR 221) එම්. ඩී. එච්. ප්‍රනාන්දු වි. මුසාජ්. එ. *ආතර් සහ තවත් අය හිදී අනුමත කරන ලදී.* 2004 (2) ALR 1, වීරසූරිය වි. (ශ්‍රේෂ්)

122 13 NLR 115

123 *වෙළු නඩුව*, පි. 22, 23. වර්තමාන 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 194(1) වගන්තිය අනුව සහ පෙර පනතේ 202 වන වගන්තිය අනුව නීතිපතිගේ බලතල පරිදි.

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය රජ එ. නූර්දීන් නඩුවේදී සිතාබලන ලද්දේ "කිසිදු නීතිපතිවරයෙකුට සිය බලතල ක්‍රියාවට නැංවීම සාධාරණීකරණය කිරීමට නොසිතෙන බව සත්‍යයක් බවයි". අධිකරණය තවදුරටත් දක්වන ලද්දේ "මෙවැනි ආකාරයේ නඩුවක් තීන්දු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ව්‍යවස්ථාදායකය මගින්ම අධිකරණ බලය ලබාදීමෙන් තමාව ආරක්ෂා කරගැනීමට ප්‍රකාශිතව කැමති වන බවයි[124]. අභිචෝදන නිවර්තනය සම්බන්ධයෙන් නීතිපතිට ඇති බලය යටතේ එම අධිකරණ බලය ඉක්මවායාම නීතිපතිගේ දක්ෂතාවයක් වේ. මේ හා සමඟම සිතාබැලිය යුතු තවත් කරුණක් වන්නේ චූදිතයෙකුව නිදහස් කිරීමට හෝ යොමුකිරීමට මහේස්ත්‍රාත්වරයෙකුට ඇති බලය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීමට නීතිපතිවරයාට ඇති බලය සම්බන්ධයෙන් අධිකරණමය සමාලෝචන ගෙනහැර දැක්වීම වැදගත් වේ. ඒ අනුව "නීතිපතිවරයා විසින් පැහැදිලිවම නීතිවිරෝධී උපදෙස් නිකුත්කිරීම මචිත කරවන සුළුය යන්න දක්වයි[125].

(ඉ) ඉහතින් සඳහන් කරන ලද අධිකරණමය තීරණවල සමීක්ෂණ අනුව ප්‍රතිඵලවල තත්ත්වය සහ පවතින නීතිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය

(i) චූදිතයාව නිදහස් කිරීමට හෝ යොමුකිරීමට මහේස්ත්‍රාත්වරයාට ඇති බලය සම්බන්ධයෙන් පීඩාවට පත් පාර්ශවය විසින් නීතිපතිගේ මැදිහත්වීම බලාපොරොත්තු වේ නම් නීතිපතිගේ මාර්ගයට ප්‍රතිවිරුද්ධව ඉදිරියට යනවා විනා වෙනත් විසඳුමක් මහේස්ත්‍රාත්වරයාට නොමැති වේ.

(ii) නීතිපතිගේ මෙම පසු තීන්දුවට එරෙහිව අදාළ චූදිත පුද්ගලයා හෝ පීඩාවට පත් පාර්ශවය ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රතිශෝධන බලය සඳහා මැදිහත් වේ නම්, එම අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය එසේ ක්‍රියාකිරීමට ඔවුනට ඇති තහනම පෙන්නුම් කරයි. කෙසේවෙතත්, වර්තමාන ශ්‍රේෂ්ඨාධිකරණය මානව හිමිකම් අයදුම්පතකදී මෙම සන්දර්භය පිළිගන්නා ලදී.

අපරාධමය අපහාසය සඳහා චෝදනා ගොනුකිරීමට නීතිපතිට ඇති අභිමතානුසාරී බලය නියත හෝ නිදහස් නොවේ. යම් විටක

124 බලන්න රජ එ. නූර්දීන්, වුඩ්රෙන්වත් වි, පි. 117 - 118

125 නාගලිංගම් වි., නීතිපති එ. කනගරත්නම්, 52 NLR 12, පි. 130

එම බලය හෝ අභිමතය තුළින් මානව හිමිකම් කඩකිරීමක් සිදුවේ නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව අනුව විග්‍රහ කළ හැකිය[126].

(iii) කෙසේ වෙතත්, වර්තමාන අභියාචනාධිකරණයට දී ඇති ප්‍රතිශෝධන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම දී තිබේය යන්න සැලකිල්ලට ගතහොත්[127], මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත අධිකරණ බලයට මාර්ගය දිය යුතුය යන්නෙන් අනෙකුත් සියළුම ව්‍යවස්ථාපිත වගන්තිවල අගය අඩුවේ යන්න පැහැදිලි වේ. (කුමන හෝ නියෝග, උපදෙස්, යොමුකිරීම් හෝ නීතිපතිගේ නියෝග ඇතුළත්ව)

(iv) ඉහතින් සඳහන්කරන ලද අධිකරණ බලය ක්‍රියාවේ යෙදීමේදී, මහේස්ත්‍රාත්වරයාගේ නිදහස් කිරීම හෝ යොමුකිරීම සම්බන්ධයෙන් යම් පුද්ගලයෙක් පීඩාවට පත්වේ නම් එම අවස්ථාවේදී නීතිපතිවරයාගෙන් ඒ සඳහා මැදිහත්වීමට ඉල්ලීමක් කළ විට ඔහු විසින් එය පිළිගැනීම පසුබටවීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුකරයි නම්, එවැනි විටක නීතිපතිවරයාගේ නියෝගය, යොමුකිරීම, තහනම් කිරීම හෝ තීන්දුවේ නිවැරදිතාවය අවබෝධ කරගැනීමේ භාරය ඔහු සතු වියයුතු අතර එමඟින් පීඩාවට පත් පාර්ශවය "යම්කිසි නීතිමය ප්‍රතිකර්මයක් සඳහා ලුහුබැඳයාම"[128] සඳහා අභියාචනාධිකරණයේ ප්‍රතිශෝධන බලයට මැදිහත්වීමේ අවශ්‍යතාවය මඟහරියි.

(v) ඉහතින් සඳහන් කරන ලද කාරණා පිළිබඳව පැහැදිලිව සිතා බැලීමේදී 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතට 401 (අ) වගන්තිය ලෙස නව වගන්තියක් එකතුකරමින් එය සංශෝධනය කිරීමට යෝජනා වී ඇති අතර ඒ අනුව "ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණයට දී ඇති ප්‍රතිශෝධන බලය, මීට ඉහත දක්වන ලද නීතිපතිගේ බලයේ අන්තර්ගතයට විෂය විය යුතුය"

---

126 *වික්ටර් අයිවන් එ. සරත් නන්ද සිල්වා, නීතිපති සහ තවත් අය* 1998 (1) SLR 340

127 138 වන ව්‍යවස්ථාව

128 නීතිපති එ. කනගරත්නම් හි යෝජිත පරිදි ඉහත 125

05. නීතියෙහි වියයුතු සංශෝධන සම්බන්ධ නිර්දේශයන් කෙටියෙන්

මෙම ලිපියේ මුලදී ප්‍රකාශ කරන ලද කරුණු නැවත කියවීමේදී මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පිහිටුවන ලද විමර්ශන කොමිසම් පත්කිරීම් යථාර්ථයක් කිරීම සඳහා, 1948 අංක 17 දරන විමර්ශන කොමිසම් පනතට පහත ආකාරයේ සංශෝධන යෝජනා කළ හැකිය.

(අ) පනතේ 7(ඉ) වගන්තිය අවලංගු කිරීම

මහජනයාගේ යහපත සහ ඔවුන්ගේ විනිවිදභාවය සහ වගකිවයුතුභාවයේ නියෝජනය තබාගැනීම සඳහා මෙම විමර්ශන කොමිසම්හි සැසිවාර මහජනතාවට සහ මාධ්‍යයට විවෘත විය යුතුය. මේ සම්බන්ධව දැනට විමර්ශන කොමිසම්වලට ලබාදී ඇති අභිමතය ඉවත් කළ යුතු අතර ඒ සඳහා පනතේ 7(ඉ) වගන්තිය සම්පූර්ණයෙන්ම අවලංගු විය යුතුය. නියෝජනය අනුව මෙය සිදුකරයි නම් එය බලාතික්‍රමණය යන සිද්ධාන්තය බලපවත්වන්නක් වේ.

(ආ) පනතේ 7(ඇ) වගන්තිය සංශෝධනය කිරීම

විමර්ශන කොමිසම් කාර්යක්ෂමව ක්‍රියාත්මකවීම සඳහා, සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත්කිරීම සම්බන්ධයෙන් කොමිසමට ඇති බලය පුළුල් කළයුතු අතර, ඒ අනුව වර්තමාන පනතේ 7(ඇ) වගන්තිය "කැඳවීම සඳහා" යන්නට පසුව "ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකු" යන වචන එකතුකොට සංශෝධනය කළ යුතුය.

(ඇ) පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

දැනට පවතින මෙම වගන්තිය අනුව අපහාස කිරීම සම්බන්ධ ගැටළු අභියාචනාධිකරණයට තැබීම සඳහා සීමාසහිත බලයක් හෝ අධිකාරියක් කොමිසමට ලබාදී ඇත. මෙම පනත මගින් පත්කරන ලද කොමිසම්වලට එකී කොමිසම් වලට අපහාස කිරීම සඳහා වන නඩු විභාගය අභියාචනාධිකරණය මගින් පැවැත්වීමට යනුවෙන් අළුත් කොටසක් එකතු කරමින් සංශෝධනය වියයුතු අතර එය ඕනෑම ස්වාධීන ලේඛකයෙකු හෝ

වාර්තාකාරයෙකු පලකරන ඕනෑම පුවත්පත් ලිපියක් හෝ පල කිරීමත් මගින් කිසිදු සාධාරණ හේතුවකින් තොරව අදාළ කොමිසම්වලට ගෞරවයෙන් තොරව ලිපි නොකරයි නම් එමඟින් පනතේ 10 වන වගන්තිය අනුව අපහාස කිරීමේ වරද ජනිත කරයි.

(ඈ) ස්වභාවික යුක්ති මූලධර්මයේ විෂයපථය සහ සන්දර්භය තුළ සිට සංශෝධන ගෙනඒම.

මෙම වාර්තාව මගින් ගෙනහැර දැක්වූ කොමිසමේ කාර්යපටිපාටිය පිළිබඳ දැනට පවත්නා නීති තත්ත්වය මගින් පුද්ගලයන්ගේ නිදහස කාර්යාලීය තත්ත්වය හෝ දේපල සම්බන්ධයෙන් ඍජුවම හෝ අවසානාත්මකව බලනොපායි. කෙසේවෙතත්, එමගින් පුද්ගලයෙකුගේ ප්‍රසිද්ධිය, ගරුත්වය සහ ජනතාව ඉදිරියේ පෙනීසිටීම වැනි වෙනත් අයිතීන්ට හානිවිය හැකිය. මේ අනුව විෂයපථය සහ අන්තර්ගතය යන දෙකින්ම කොමිසම සාධාරණව ක්‍රියාකිරීමේ යුතුකම පමණක් නොව ස්වභාවික යුක්ති මූලධර්මයන්ටද එකඟවිය යුතුය. මෙම මූලධර්මය නීතිමය ලෙස ස්ථාපිතවූ සහ තීන්දු වූවක් බවට දැක්වුවද, මෙම ස්වාභාවික යුක්ති මූලධර්මයන්ට අවනත වීමේ යුතුකම සහ සාධාරණව ක්‍රියාකිරීමේ යුතුකම අතර වෙනස සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර නොමැති නිසා එය නොපැහැදිලි තත්ත්වයක රඳාපවතී. අභියාචනාධිකරණය විසින් දක්වා ඇති[129] "ස්වභාවික යුක්ති මූලධර්ම අනුගමනය කරමින් සාධාරණව කොමිසම ක්‍රියාත්මක වියයුතු බව" මගින් අදාළ වගන්තිය ප්‍රකාශිතව දැක්වීමේ අරමුණ අත්හිටුවයි. මේ අනුව, වර්තමාන පනත පහත ආකාරයේ අළුත් කොටසක් එකතු කිරීම මගින් සංශෝධනය විය යුතුය.

මෙම පනත යටතේ කොමිසම පත්කරන ඕනෑම අවස්ථාවක විමර්ශනය සඳහා පුද්ගලයෙකු කොමිසම ඉදිරියට පමුණුවනු ලබන විට එකී පුද්ගලයාට අදාළ කොමිසම විසින් ඔහුගේ/ඇයගේ කරුණු සියල්ල සාධාරණ සවන්දීමකට ලක්කරන බවට සැලකර සිටිය යුතුය.

ස්වභාවික යුක්ති මූලධර්මයන්ගේ විෂයපථය සහ අන්තර්ගතය සම්පූර්ණයෙන්ම ආවරණය කිරීම සඳහා මෙම වගන්තිය ප්‍රමාණවත් නොවන බව මෙම රචකයාගේ අදහස වන අතරම, මේ සඳහා අදාළ

129 වෛද්‍යලිංගම් වී. ඉහත 36

විමර්ශනය යටතේ සාක්ෂි දෙන පුද්ගලයන්ගේ නීතිය ඉදිරියේ පෙනීසිටීමේ සහ යම් පුද්ගලයෙකුට විරුද්ධව සාක්ෂි ඇති සාක්ෂිකරුවකුගේ සාක්ෂි හරස් ප්‍රශ්නයන්ට භාජනය කිරීමේ අයිතිවාසිකම යන අයිතිවාසිකම්ද ඇතුළත් විය යුතුය.

(ඉ) ප්‍රථම තොරතුර

අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 109(1) වගන්තියෙන් දක්වනු ලබන 136(1) වගන්තිය හා සම්බන්ධව ඇති පරීක්ෂණයක මූලික අවස්ථාව දක්වනු ලබන ප්‍රථම තොරතුර වාර්තා කිරීම සම්බන්ධ පනතේ 109(1) වගන්තිය පහත අයුරින් සංශෝධනය විය යුතුය.

යම් වරදක් සම්බන්ධයෙන් වන ඕනෑම තොරතුරක් පොලිස් නිලධාරියෙකුට හෝ විමර්ශකයෙකුට තොරතුරු ලබාගැනීමේ අරමුණ සඳහා ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත හෝ ස්වෙච්ඡා ආයතනයකට ලිඛිතව ලබාදිය යුතුය.

එසේම 1948 විමර්ශන පනතට පහත අයුරින් අළුතෙන් වගන්තියක් එකතු කරමින් සංශෝධනය කළ හැකිය.

යම් වරදක් සම්බන්ධයෙන් වන ඕනෑම තොරතුරක් පොලිස් නිලධාරියෙකුට හෝ විමර්ශකයෙකුට තොරතුරු ලබාගැනීමේ අරමුණ සඳහා ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත හෝ ස්වෙච්ඡා ආයතනයකට ලිඛිතව ලබාදිය යුතු අතර එය අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 109(1) වගන්තියේ අරමුණු අනුව ප්‍රථම තොරතුරක් ලෙස "එතෙකුදු සාක්ෂි ආඥාපනතේ වගන්ති ප්‍රකාරව"[130] යනුවෙන් අමතර වචන එකතු කරමින් සැලකිය යුතුය.

(ඊ) ප්‍රතිඵල ලෙස කරනු ලබන විමර්ශන

ඉහතින් සඳහන් කරන ලද සංශෝධන විමර්ශන කොමිසම් පනතට බලපෑවා වුවද, තවදුරටත් විමර්ශන ක්‍රියාවලිය සිවිල් විමර්ශන දෙපාර්තමේන්තුව

130 1 වෙළුම (එල්. ඊ. එස්. එල්. 1980 (සංශෝධිත)

ඇතුළු පොලීසිය මත රඳා පවතී[131]. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනා 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ හෝ විශේෂිතවූ ව්‍යවස්ථාවකින් පිහිටුවන ලද ස්වාධීන පොලිස් කවුන්සලයකට හෝ ස්වාධීන මහජන අභිචෝදක දෙපාර්තමේන්තුවකට හෝ ජාතික පොලිස් කොමිසමට මෙම විමර්ශන පැවැත්වීම සඳහා බලය නොදේ නම් මෙම ව්‍යවස්ථාවේ අරමුණු ඉටු නොවන බව පැවසිය හැකිය. එහිදී විමර්ශන ක්‍රියාවට නැංවීමේ අරමුණ සඳහා සහකාර කාර්ය මණ්ඩලයකින් සැදුම් ලත් මනා හැකියාවක් සහ අවංකකමක් ඇති (ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන්ට වඩා ඉහළ තලයේ සිටි) විශ්‍රාමික පොලිස් නිලධාරීන්ගෙන් මෙම කවුන්සිලය සැදුම් ලද යුතුය. පොලිස් ආඥා පනතේ දැනට පවත්නා වගන්තිවලටද මේ සම්බන්ධ සංශෝධන එකතු කළ හැකිය[132].

(ඉ) අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 145 වගන්තියේ අරමුණු සඳහා කොමිසම්හි සොයාගැනීම්

නීතිපති විසින් චෝදනා කිරීමේ අරමුණ සඳහා කොමිසම විසින් කරනු ලබන විමර්ශනයට විෂය වන යම් ආකාරයේ ක්‍රියාවකින් සම්බන්ධවූ පුද්ගලයෙකු සම්බන්ධ සොයාගැනීම් අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 145 වන වගන්තිය යටතේ ප්‍රාථමික විමර්ශනයේ සොයාගැනීම් ලෙස සැලකිය හැකි අතර එම වගන්තියේ දැනට දැක්වෙන කාල සීමාව වන්නේ මාස 3 කි. මේ සම්බන්ධයෙන් අළුත් වගන්තියක් එකතු කරමින් විමර්ශන කොමිසම් පනත සංශෝධනය කළ යුතු බව දැක්විය හැකිය. කොමිසම් පත්කිරීමේ කාර්ය ක්‍රියාවට නැංවීමේදී මෙවැනි ආකාරයේ සංශෝධනයක් ඉතා අර්ථාන්විත වේ.

(ඊ) නීතිපතිගේ බලතල

මහේස්ත්‍රාත්වරයා විසින් යම් චූදිතයෙකු නිදහස් කිරීමට හෝ ඔහුගේ නඩුව විභාග කිරීම සඳහා දෙන ලද නියෝගයක් ඉවත දැමීමෙන් මැදිහත්වීම

131 ඇඹිලිපිටිය තරුණයන්ගේ අතුරුදහන්වීම සම්බන්ධ නඩුවේදී මෙය සම්බන්ධව පැහැදිලිව දක්වන ලදී. අභියාචනාධිකරණ නියෝගයන්හි 46 වන පිටුව බලන්න. සී. එ. 93-99/99- මහාධිකරණය රත්නපුර 121/91. ලොකුගලප්පත්ති සහ තවත් අය එ. රජය. එසේම පොලිසියට හෝ රහස් පොලිසියට පැමිණිලි නොකරන ලද සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් විභාග සිදු කරන ලද විනිසුරුවරුන්ගේ විශ්වාසය පිළිබදව අභියාචනාධිකරණය අනුමැතිය ලබා දුන් අභියාචනාධිකරණ තීන්දුවේ 73 වන පිටුව බලන්න.

132 මෙයද පොලිසිය හා සමාන වේ.

සඳහා නීතිපතිවරයාට තීන්දුවක් ගතහැකි අතර එය ප්‍රතිශෝධන අයදුම්පතක් සඳහා විෂය කළහැකි බව ලිඛිතව ඇති නීතිමය සිද්ධාන්තයන් මගින් එළිදරව් කරයි. කෙසේ වෙතත්, මෙම ප්‍රතිශෝධන බලය ක්‍රියාත්මක කිරීමේදී අධිකරණයට තහනමක් ඇති බව පැහැදිලි වේ[133]. නීතිපතිගේ බලයට මුහුණට මුහුණලා ඇති මහේස්ත්‍රාත්වරයාගේ බලය සම්බන්ධයෙන් නීති පොත්වල කුමක් සඳහන් වුවද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණයට දී ඇති ප්‍රතිශෝධන බලයට විරුද්ධ බලයක් ව්‍යවස්ථාපිතව දක්වා තිබේ. මේ අනුව අපරාධ නඩුවිධාන සංග්‍රහය පහත ආකාරයේ නව වගන්තියක් එකතු කිරීමෙන් සංශෝධනය කළ හැකිය[134]. ඒ අනුව ප්‍රතිශෝධන අධිකරණ බලය සම්බන්ධයෙන් මීට ඉහතදී අභියාචනාධිකරණයට තිබූ බලය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයට දී ඇති ප්‍රතිශෝධන බලයට විෂය වියයුතු බවට යනුවෙන් අළුත් වගන්තියක් එකතු කළ යුතුය. එවැනි ආකාරයේවූ සංශෝධනයක් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 145 වන වගන්තියෙන් දක්වන ලද කොමිසමේ සොයාගැනීම් මගින් ප්‍රාථමික විමර්ශනයක අවශ්‍යතාවයන් සපුරාගැනීම හා සම්බන්ධව යෝජනා කළ සංශෝධනයන් සමග කියවයි නම් එමඟින් විමර්ශන කොමිසම්වලට කරන ලද පත්කිරීම් ප්‍රායෝගික අරමුණු හා සම්බන්ධව මහජන විශ්වාසය ඇති කළ හැකිය.

තවදුරටත් විභාගයට තැබීම සඳහා හෝ නිදහස් කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකු ගන්නා ලද තීරණයක් සම්බන්ධයෙන් නීතිපති මැදිහත්වීම සම්බන්ධයෙන් අදාළ නීතිපති විසින් ඔහුගේ නියෝගය, තීන්දුව, යොමුකිරීම හෝ උපදෙස්දීමට හේතු අදාළ මහේස්ත්‍රාත්වරයාට දියයුතු අතර මෙම අවශ්‍යතාව අපරාධ නඩුවිධාන සංග්‍රහයේ මෙන්ම විමර්ශන කොමිසම් පනතෙහිද ව්‍යවස්ථාපිතව සඳහන් විය යුතුය.

(උ) නොගැළපෙන සහ ප්‍රමාදවූ පැමිණිලි සම්බන්ධයෙන් වියයුතු සංශෝධන

අවසාන වශයෙන් බලාපොරොත්තු නොවූ සහ ස්ථිරව කිවනොහැකි තත්ත්වයන්ට විසඳුම් සෙවීම ඉතා අසීරු බව මෙම රචකයා අවබෝධයෙන්

133 ඉහත සාකච්ඡාව බලන්න.

134 401 (අ) වගන්තිය පරිදි

පසුවුවද චෝදනාවට ලක්වූ පුද්ගලයන් හඳුනාගැනීම සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් විසින් දෙනු ලබන පරස්පර විරෝධී ප්‍රකාශයන් සම්බන්ධව අතීත අත්දැකීම් අනුව[135] කොමිසමට දෙනු ලබන ඕනෑම ප්‍රකාශයක් වලංගු ප්‍රථම ප්‍රකාශයක් ලෙස නීතිය සංශෝධනය වියයුතු අතර (මෙම යෝජනා කරන ලද සංශෝධනය දැනටමත් පවත්නා නීතියට සිදුකර ඇත) මෙමඟින් නම්කරන ලද වරද, වැරදිකරුවන්ට පරස්පර විරෝධී ප්‍රකාශයන් ගෙනඒම මතම චෝදනා ලෙස ඉදිරිපත් ව්‍යතිරේකයන් අහිමි කරයි[136]. මෙම නිර්දේශයන් මතම රජය විසින් පවත්නා නීතිය සංශෝධනය කළ යුතුද යන්න සලකා බැලූ කල මෙය පරස්පර විරෝධී වන්නේ සාක්ෂි ආඥා පනතට පමණක් නොව අපරාධ නඩුවිධාන සංග්‍රහය යටතේද මෙය පරස්පර විරෝධී වන බව පැහැදිලිවේ. මෙමඟින් රටේ පවත්නා සම්පූර්ණ අභිචෝදන ක්‍රමයම වෙනස් කළයුතු බව පැහැදිලිවේ.

මෙවැනි ආකාරයේ නීතිමය මුලපිරීම්, ඔවුන්ගේ විකල්පයන්ට වඩා ගැටුම්කාරී බවින් අඩුවන අතර එමඟින් අපරාධ නඩුවලදී සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය ඇතුළු සියළුම ස්ථාපිත මූලධර්මයන් සම්බන්ධ නීතිය වෙනස්කිරීමට සිදුවන අතර මෙම මූලධර්මයට සාක්ෂි ආඥාපනත තුළින් පැහැදිලි අර්ථකථනයක් සොයාගත නොහැකි අතර, මෙහි ගමන්මග ඉංග්‍රීසි නීතියේ අභාෂයක් ඇති සාක්ෂි ආඥා පනතේ 100 වන වගන්තිය තුළින් ශ්‍රී ලංකා නීති විද්‍යාවට ඇතුළත් කරගෙන ඇත. ශ්‍රී ලංකා නීතිය තුළ ස්ථාපිතව ඇති මෙම නීතිය උදාහරණ ලෙස ප්‍රංශ නීති ක්‍රමයට අත්‍යන්තයෙන්ම ප්‍රතිවිරුද්ධ වේ.

(ඌ) සාක්ෂිකරුවන් සුරැකීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය

ඉහතින් සඳහන්කරන ලද සංශෝධනයන් සලකා බැලූ කල වරදකරුවන් පිළිබඳ දැනීමෙන් ජීවත්වන සාක්ෂිකරුවන්ට බියෙන් හා තැතිගැනීමෙන් තොරව ජීවත් වියහැකි පරිසරයක් සැදීමට ඔවුන් සුරැකීමේ ක්‍රමයක්ද ස්ථාපනය කළ යුතුය.

135 අදාල ප්‍රකාශය මගින් හෙළිදරව් කරනු ලබන පාර්ශවකාරයෙකු අදාල සිද්ධිය සිදුවීමට ආසන්නයේදීම මානව හිමිකම් සංවිධානයකට දෙනු ලබන ප්‍රකාශය මත නීතිපති විසින් චෝදනාව ගොනු කිරීමට නිර්දේශ කරන අවස්ථාව සහ චන්දි ලබා දීම මත අදාල වැරදිකරුව හඳුනා ගැනීමට සාක්ෂිකරු අපොහොසත් බව පොලිසියට දෙනු ලබන කටඋත්තරය මත සාක්ෂිකරු කියයි නම් එවන් අවස්ථාවකදී නීතිපති මෙම ගැටළුවට මුහුණ පායි.

136 "ප්‍රමාද වූ ප්‍රකාශයන්" යන පදනම මත පවා

6. අවසානය

අද වන විට ආණ්ඩුව ත්‍රස්තවාදී ක්‍රියා හා බද්ධවී සිටින තත්ත්වය කෙනෙකුට පැහැදිලිවේ. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පාලකයන් වීම තුලින් මානව හිමිකම් රැකීම සේම නීතියේ ආධිපත්‍යයද රජය විසින් යම්කිසි ප්‍රඥප්තියකට අනුව සිදුකරයි යන්න බලාපොරොත්තු වේ.

එවැනි ආකාරයේවූ විධානාත්මක මූලධර්මයන්හි පසුබිමට එරෙහිව ගත් කළ, අදාළ පැමිණිලි පොලිස් නිලධාරීන්ට සහ හමුදා නිලධාරීන්ට එරෙහිව වන අවස්ථාවල පොලීසිය විසින් අදාළ පැමිණිලි ලියාගැනීම අශෝභන ලෙස ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව පෙර පැවති විමර්ශන කොමිසම් මුහුණ දුන් ප්‍රායෝගික යථාර්ථය දෙස කෙනෙකුට බැලිය හැකිය. මේ නිසා 1979 වර්තමාන අපරාධ නඩුවිධාන සංග්‍රහ නීතිය මඟින් දක්වනු ලබන විමර්ශන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රථම තොරතුරක් නොමැතිවේ. රාජ්‍ය නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාත්මකවීම සඳහා විමර්ශන කොමිසමක් පත් කරන අවස්ථාවලදී ඔවුන් මේ සඳහා මුලපිරීමට කරුණු මඳභාවයකට මුහුණපායි. මෙම ලිපිය මඟින් මතුකර දක්වන ලද අපරාධ විමර්ශන ක්‍රියාවලියේ අනෙක් බරපතල ගැටළුව වූයේ විමර්ශන කොමිසම් පනතේ හිඩැස්ය.

වර්තමානයේ පවතින ආණ්ඩුවට මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට 1948 පනත යටතේ විමර්ශන කොමිසම් පත්කිරීම සම්බන්ධයෙන් විශාල කැපකිරීමක් කළයුතු අතර එය මහජනතාව සහ අන්තර්ජාතික ප්‍රජාව සැනසීම සඳහා ගෙනඑනු ලබන දේශපාලන කුටෝපායක් ලෙස නොව, මෙම රචකයාගේ අදහස වන්නේ දැනට පවතින අභිචෝදන ක්‍රමයට මෙම ලිපිය මඟින් විශේෂයෙන් යෝජනාකරන ලද සංශෝධන ඉක්මනින්ම ක්‍රියාවේ යෙදවිය යුතු බවයි. සත්‍ය වශයෙන්ම, මෙය මෙහි දක්වන ලද කරුණුවලට වඩා වැඩියෙන් අවශ්‍ය නොවනවා සේම අඩුවෙන්ද පැවතීම පිළිගත නොහැකිය.

I වන උප ලේඛනය

2006 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාව විසින් අත්සන් කර, අපරානුමත කර හෝ පසුව ප්‍රවේශවී ඇති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මුතීන් හා ත්‍රස්තවාදය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන්*

(සංඛ්‍යාව - 28, 2006 දී අපරානුමත කරන ලද සම්මුති දෙක කතිර සලකුණුද සහිතව ඉංග්‍රීසි අකාරාදී පිළිවෙලට දක්වා ඇත).

- *දරුණු තුවාල සහ ව්‍යාකුල ප්‍රතිඵල ඇතිකරන්නාවූ ආයුධ භාවිතය තහනම් කිරීම, සීමාකිරීම පිළිබඳව වන අතිරේක මූලපත්‍රය (විකිරණ උපකරණ බැඳ තැබීමේ IV වන මූලපත්‍රය)*
  2004 සැප්තැම්බර් මස 24 වන දින පසුව ප්‍රවේශ වන ලදී. (acceeded)

- *දූෂණයට එරෙහි සම්මුතිය*
  2004 මැයි මස 11 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *වධ හිංසා සහ අනෙකුත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් වලට හෝ දඬුවම් කිරීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය (CAT)*
  1994 ජනවාරි මස 3 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *මනුෂ්‍ය වෙළඳාම සහ අන් අය වෛශ්‍යා වෘත්තියෙහි යෙදවීම මැඩපැවැත්වීමේ සම්මුතිය*
  1958 අප්‍රේල් මස 15 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

---

* සම්මුතියකින් බැඳී සිටීමට රාජ්‍ය පාර්ශවයක කැමැත්ත ප්‍රකාශ කරනුයේ රාජ්‍යයේ නියෝජිතයාගේ අත්සන මඟිනි. කෙසේනමුත් බොහෝ අවස්ථාවලදී, සම්මුතියෙහි වගන්තියක් මඟින් හෝ සම්මුතියෙහි අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කරනුලබන අවස්ථාවේදී සම්මුතියෙන් බැඳීසිටීම සඳහා වන කැමැත්ත නියෝජිතයාගේ අත්සන තුළ පමණක් ප්‍රකාශ නොවන බවටත් සම්මුතියෙන් බැඳීසිටීම සඳහා රාජ්‍ය විසින් සම්මුතිය අපරානුමත කළ යුතු යයි පාර්ශවයන් එකඟතාවයට එළඹේ. මෙම පිළිවෙත අනුගමනය කරන සම්මුතීන් සම්බන්ධයෙන් නියෝජිතයාගේ අත්සන ප්‍රකාශ කරනුයේ සම්මුතියේ අන්තර්ගත අනුමත කිරීම පමණි. අපරානුමත කිරීමේ අරමුණ වනුයේ අදාළ රාජ්‍යයට සම්මුතියෙන් බැඳී සිටිනවාද නැද්ද යන්න පිළිබඳව සලකාබැලීමට තවත් අවස්ථාවක් ලබාදීමයි. මූලික සාකච්ඡාවලට සහභාගී නොවූ රාජ්‍යයන්ටද සම්මුතිය අපරානුමත කිරීම මඟින් සම්මුතියට බැඳීසිටීමට එකඟතාව පළ කළ හැකිය. යම් රාජ්‍යයක් සම්මුතියකට පාර්ශ්වයක්වූ ආකාරය කුමක් වුවත් සම්මුතිය යටතේ ඇති සියලු අයිතීන් රාජ්‍යයට හිමිවනවා මෙන්ම සම්මුතිය යටතේ ඇති සියලු වගකීම් වලින් රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටී.

- *කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳ සම්මුතිය සඳහාවූ වෛකල්පිත මූලපත්‍රය. (CEDAW)*
  1981 ඔක්තෝබර් මස 5 දින අපරානුමත කරන ලදී. (ratified)

- *දරුණු ආකාරයේ තුවාල හෝ ව්‍යාකුල ප්‍රතිඵල ඇතිකරන්නාවූ සම්මුතිමය ආයුධ භාවිතය තහනම් කිරීම සහ සීමාකිරීම පිළිබඳ සම්මුතිය (I, II හා III මූලපත්‍ර සහිත)*
  2004 සැප්තැම්බර් මස 24 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *තානාපති නියෝජිතයන් ඇතුළු අන්තර්ජාතික වශයෙන් ආරක්ෂිත පුද්ගලයන්ට එරෙහිව සිදුකරන අපරාධයන්ට එරෙහි සම්මුතිය*
  1991 පෙබරවාරි මස 27 දින පසුව ප්‍රවේශ වන ලදී.

- *වර්ග ඝාතනය වැළැක්වීම සහ දඬුවම් කිරීම පිළිබඳ සම්මුතිය*
  1950 ඔක්තෝබර් මස 12 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC)*
  1991 ජූලි මස 12 දින අපරානුමත කරන ලදී.

- *නාවුක ගමනාගමනයේ සුරක්ෂිතභාවයට එරෙහි නීතිවිරෝධී ක්‍රියා නිවාරණය පිළිබඳ සම්මුතිය*
  2000 සැප්තැම්බර් මස 6 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *ප්‍රාණ ඇපකරුවන් රඳවා තබාගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය*
  2000 සැප්තැම්බර් මස 6 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *න්‍යෂ්ටික ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය සඳහාවූ අන්තර්ජාතික සම්මුතිය*
  2005 සැප්තැම්බර් මස 14 වන දින අත්සන් තබන ලදී. (signed)

- *ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුල්‍යාධාර සැපයීම වැළැක්වීම සඳහාවූ අන්තර්ජාතික සම්මුතිය*
  2000 සැප්තැම්බර් මස 6 වන දින අපරානුමත කරන ලදී.

- *ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර පිටුදැකීම සඳහාවූ අන්තර්ජාතික සම්මුතිය*
  1999 මාර්තු මස 23 වන දින අපරානුමත කරන ලදී.

- *වර්ණභේදවාදය පිටුදැකීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICERD)*
  1982 පෙබරවාරි මස 18 දින පසුව ප්‍රවේශ වන ලදී.

- විදේශ සේවා නියුක්තිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාවූ අන්තර්ජාතික සම්මුතිය
  1996 මාර්තු මස 11 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR)
  1980 ජූනි මස 11 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICESCR)
  1980 ජූනි මස 11 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- වර්ණභේදවාදී අපරාධ සඳහා දඬුවම් පැමිණවීම සහ එම අපරාධ මර්දනය කිරීම පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය
  1982 පෙබරවාරි මස 18 දින පසුව ප්‍රවේශ වන ලදී.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සඳහාවූ 1 වන වෛකල්පිත මූලපත්‍රය (ICCPR)
  1997 ඔක්තෝබර් මස 3 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳ සම්මුතිය සඳහාවූ වෛකල්පිත මූලපත්‍රය (CEDAW)
  2003 ජනවාරි මස 15 වන දින අපරානුමත කරන ලදී.

- සන්නද්ධ අරගලයන්ට මැදිවූ ළමයින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහාවූ වෛකල්පිත මූලපත්‍රය
  2000 සැප්තැම්බර් මස 6 වන දින අපරානුමත කරන ලදී.

- ළමයින් වෙළෙඳාම, ගණිකා වෘත්තියේ යෙදවීම හා ළමයින් අසභ්‍ය ප්‍රකාශන සඳහා යොදාගැනීමට එරෙහි ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහාවූ වෛකල්පිත මූලපත්‍රය
  2006 ඔක්තෝබර් මස 22 වන දින අපරානුමත කරන ලදී.

- ගොඩබිමෙන්, මුහුදෙන් සහ ගුවනින් සංක්‍රමණිකයන් ජාවාරම් කිරීමට එරෙහි මූලපත්‍රය- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අතිරේකය.
  2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් කරන ලදී.

- සම්මුතිමය ආයුධ භාවිතය තහනම් කිරීම හෝ සීමාකිරීම පිළිබඳ සම්මුතියට සම්බන්ධ පාතාල, මර-උගුල් හා වෙනත් උපාංග භාවිතය තහනම් කිරීම හා සීමාකිරීම පිළිබඳ මූලපත්‍රය *(1996 මැයි 3 වන දින සංශෝධිත මූලපත්‍රය II)*
2004 සැප්තැම්බර් මස 24 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

- *විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ඇතුළු පුද්ගලයන් ජාවාරම් කිරීම වැළැක්වීම, මැඩපැවැත්වීම සහ දඬුවම් කිරීම සඳහාවූ මූලපත්‍රය - අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ අතිරේකය*
2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් කරන ලදී.

- *අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය*
2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් තබන ලදී.

- *තානාපති සම්බන්ධතා පිළිබඳ වියානා සම්මුතිය*
2006 මැයි මස 4 වන දින පසුව ප්‍රවේශ වන ලදී.

II වන උප ලේඛනය
2006 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාව විසින් අපරානුමතකර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන්

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C4	*රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය 1919*	1951.10.08	අහෝසි කොට ඇත
C5	*අවම වයස (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919*	1950.09.27	අහෝසි කොට ඇත
C6	*තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919*	1950.10.26	අහෝසි කොට ඇත
C7	*අවම වයස් සීමා (සාගර) සම්මුතිය 1920*	1950.09.02	අහෝසි කොට ඇත
C8	*සේවා වියුක්ති වන්දි (මුහුදු බත්වීම) සම්මුතිය 1920*	1951.04.25	
C10	*අවම වයස් සීමා (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921*	1991.11.29	අහෝසි කොට ඇත
C11	*සමාගමයේ නිදහස (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921*	1952.08.25	
C15	*අවම වයස් සීමා (අතරමැදියෝ සහ ව්‍යාපාර වස්තුකරුවෝ) පිළිබඳ සම්මුතිය 1921*	1951.04.25	අහෝසි කොට ඇත

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C16	*තරුණ පුද්ගලයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ (සාගර) පිළිබඳ සම්මුතිය 1921*	1950.04.25	
C18	*කම්කරු වන්දි (වෘත්තිමය රෝගාබාධ) පිළිබඳ සම්මුතිය 1925*	1952.05.17	
C26	*අවම වේතන නියම කිරීම පිළිබඳ (උපක්‍රමික) සම්මුතිය 1928*	1961.06.09	
C29	*බලහත්කාර ශ්‍රමය පිළිබඳ සම්මුතිය 1930*	1950.04.05	
C41	*රාත්‍රී වැඩ මුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) 1934*	1950.09.02	අහෝසි කොට ඇත
C45	*පතල් වැඩ (කාන්තා) සම්මුතිය 1935*	1950.12.20	
C58	*අවම වයස් සීමා (සාගර) සම්මුතිය (සංශෝධිත) 1936*	1959.05.18	
C63	*වේතන සහ වැඩමුර සඳහා වන සංඛ්‍යා ලේඛන පිළිබඳ සම්මුතිය 1938*	1952.08.25	අහෝසි කොට ඇත
C80	*අවසන් ගිවිසුම් වගන්ති සංශෝධන සම්මුතිය 1946*	1950.09.10	
C81	*කම්කරු විමර්ශන සම්මුතිය 1947*	1950.04.03	

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C87	*සමාගමයේ නිදහස සහ සංවිධානයවීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය 1948*	1995.11.15	
C89	*රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) 1948*	1966.03.31	අහෝසි කොට ඇත
C90	*තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1948*	1959.05.18	
C95	*වේතන සුරක්ෂිත කිරීම පිළිබඳ සම්මුතිය 1949*	1983.10.27	
C96	*පූර්ව ගෙවීමේ සේවායෝජන ආයතන පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1949*	1958.04.30	
C98	*සංවිධානයවීම සහ සාමූහික කේවල් කිරීම පිළිබඳ සම්මුතිය 1949*	1972.12.13	
C99	*අවම වේතන නියම කිරීමේ උපක්‍රමික (කෘෂි කර්මාන්තයේ) සම්මුතිය 1951*	1954.04.05	
C100	*සමාන වැටුප් සම්මුතිය, 1951*	1993.04.01	
C103	*මාතෘ ආරක්ෂණය පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1952*	1993.04.01	

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C105	කම්කරු ශ්‍රමය සූරාකෑම තහනම් කිරීමේ සම්මුතිය *1957*	2003.01.07	
C106	සති විවේක (වාණිජ හා කාර්යාල) සම්මුතිය *1957*	1983.10.27	
C108	මුහුදුගාමීන්ගේ අනන්‍යතා ලේඛන පිළිබඳ සම්මුතිය *1958*	1995.11.24	
C110	වතු කම්කරුවන්ගේ සේවා කොන්දේසි පිළිබඳ සම්මුතිය *1958*	1995.04.24	
C111	වෙනස්කොට සැලකීම (සේවා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතිය *1958*	1998.11.27	
C115	විකිරණ ආරක්ෂාව පිළිබඳ සම්මුතිය *1960*	1986.06.18	
C116	අවසන් වගන්ති සංශෝධනය පිළිබඳ සම්මුතිය *1961*	1974.04.26	
C131	අවම වේතන නියම කිරීම පිළිබඳ සම්මුතිය *1970*	1975.03.17	
C135	කම්කරු නියෝජිතයන් පිළිබඳ සම්මුතිය *1971*	1976.11.16	
C138	සේවයට ඇතුළත් කිරීමේ අවම වයස් සීමා පිළිබඳ සම්මුතිය *1973*	2000.02.11	

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C144	*ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ත්‍රෛපාක්ෂික සාකච්ඡා පිළිබඳ සම්මුතිය 1976*	1994.03.17	
C160	*කම්කරු සංඛ්‍යාලේඛන පිළිබඳ සම්මුතිය 1985*	1993.04.01	
C182	*ළමා කම්කරු සේවයේ අයහපත් පැතිකඩ පිළිබඳ සම්මුතිය 1999*	2001.03.01	

III වන උප ලේඛනය

2006 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර තිබෙන මානුෂවාදී නීති සම්මුතීන්

- යුද බිමෙහි සිටින හමුදාවේ තුවාල ලැබූ සහ අසනීපවූ පුද්ගලයන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහාවූ ජිනීවා සම්මුතිය, 1949
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- මුහුදුගතව සිටින යුධ හමුදාවේ තුවාල ලැබූ, අසනීපවූ සහ මුහුදුබත්වූ, සාමාජිකයන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහාවූ ජිනීවා සම්මුතිය, 1949
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- යුධ සමයේ සිවිල් වැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ ජිනීවා සම්මුතිය, 1949
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ ජිනීවා සම්මුතිය, 1949
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

IV වන උප ලේඛනය

2006 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන

(සංඛ්‍යාව-15, ඉංග්‍රීසි අකාරාදී පිළිවෙලට දක්වා ඇත).

- *යුධ අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත සීමාවන් අදාළ නොවීම පිළිබඳ සම්මුතිය, 1968*
- *කාන්තාවන්ගේ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය.*
- *සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතිය, 1954*
- *සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 11 වන වෛකල්පිත මූලපත්‍රය (ICCPR)*
- *අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව (ICC)*
- *සමාජ ආරක්ෂණය පිළිබඳ අවම ප්‍රමිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 102)*
- *සේවා ප්‍රතිපත්ති පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක 122)*
- *ග්‍රාමීය කම්කරු සංවිධාන සහ ආර්ථික සහ සමාජ සංවර්ධනයෙහිලා ඔවුන්ගේ දායකත්වය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක 141)*
- *විදේශ සේවා නියුක්තිකයන් අපයෝජනයට ලක්වීමේ තත්ත්වයන් සහ විදේශ සේවා නියුක්තිකයන්ට සමාන අවස්ථා ලබාදීම හා සැලකීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 143)*
- *රාජ්‍ය සේවයේ කොන්දේසි තීරණය කිරීමේ කාර්යපටිපාටිය හා සංවිධානයවීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 151)*
- *රාශිභූත කේවෙල් ක්‍රම අනුග්‍රහ කිරීම් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක 154)*
- *රැකියා උසස්වීම් හා රැකියා හිඟයෙන් ආරක්ෂාවීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 168)*
- *1949 අගෝස්තු 12 ජිනීවා සම්මුතියට අතිරේක සහ අන්තර්ජාතික යුධ ගැටුම් මඟින් පීඩාවට පත්වන්නන් ආරක්ෂාකිරීම පිළිබඳ මූලපත්‍රය (1වන මූලපත්‍රය)*

- *1949 අගෝස්තු 12 ජිනීවා සම්මුතියට අතිරේක සහ අන්තර්ජාතික නොවන යුධ ගැටුම් මඟින් පීඩාවට පත්වන්නන් ආරක්ෂාකිරීම පිළිබඳ මූලපත්‍රය (11වන මූලපත්‍රය)*
- *සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ මූලපත්‍ර සම්මුතිය, 1967*

V වන උප ලේඛනය

2006 වර්ෂයේදී තීරණය කරන ලද මූලික අයිතිවාසිකම් නඩු තීන්දු

11 වන ව්‍යවස්ථාව - වධ හිංසාවලට සහ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට බඳුන් නොකිරීමේ නිදහස

කෝරලලියනගේ පාලිත තිස්ස කුමාර එදිරිව සිල්වා සහ තවත් අය, SC (FR) Application No. 121/2004 , SCM 17. 02. 2006

12 වන ව්‍යවස්ථාව - නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

වෛද්‍ය අසෝක සෝමබන්දු කරුණානන්ද එදිරිව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සහ තවත් අය, SC (FR) Application No. 450/2003, SCM 03. 08. 2006

මහින්ද රාජපක්ෂ එදිරිව පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු සහ තවත් අය, SC (FR) Application No. 387/2005 , SCM 27. 03. 2006

එන්. ඩබ්. එම් . ජයන්ත විජේසේකර සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය, SC (FR) Application No. 243 - 245/2006 , SCM 16. 10. 2006

වික්‍රමගේ ඩී. රොහාන් විශ්වනාත් එදිරිව ප්‍රාදේශීය ලේකම් මදුරාවල, SC (FR) Application No. 174/2003 , SCM 17. 02. 2006

13 වන ව්‍යවස්ථාව - අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබාගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම / 11 වන ව්‍යවස්ථාව

නීතිඥ එම්. කේ. පී. ප්‍රසන්න චන්ද්‍රලාල් (දල්කදුර ආරච්චිගේ නිමල් සිල්වා වෙනුවෙන්) එදිරිව සහකාර පොලිස් අධිකාරී රන්මල් කොඩිතුවක්කු සහ තවත් අය, SC (FR) Application No. 565/2000 , SCM 16. 11. 2006

VI වන උප ලේඛනය

ගෙනහැර දක්වන ලද නඩු තීන්දු - ශ්‍රී ලාංකීය සහ වෙනත් අධිකරණ බල සීමා

පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් සලකා බැලීම

17 වන සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත, SC Special Determination No. 6/2001, 21. 09. 2001 , Parliamentary Debates (Hansard) 24. 09. 2001

දුම්කොළ හා මත්ද්‍රව්‍ය පිළිබඳ ජාතික අධිකාරි පනත් කෙටුම්පත, SC Special Determination No. 1 - 6 / 2006, Parliamentary Debates (Hansard) of 04. 07. 2006

දුම්කොළ හා මත්ද්‍රව්‍ය පිළිබඳ ජාතික අධිකාරි පනත් කෙටුම්පත, SC Special Determination No. 13 - 22 / 2005, Parliamentary Debates (Hansard) of 01. 02. 2006

පළාත් සභා පනත් කෙටුම්පත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත [1987] 2 SLR 312

ගෙනහැර දක්වන ලද වෙනත් නඩු තීරණ

නීතිපති එදිරිව ෂන්මුගම් 71 NLR 78

නීතිපති එදිරිව රත්නගෝපාල් 72 NLR 145 (Privy Council)

අමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු [1987] 2 SLR 119

[මානව හිමිකම් කොමිෂන් සභාවට සාමාජිකයින් පත්කිරීම පිළිබඳ නඩු තීන්දුව] CA (Writ) No. 890/2006

අතපත්තු එදිරිව මහජන බැංකුව (SC) [1997] 1 SLR 221

නීතිපති එදිරිව දොන් සිරිසේන, 70 NLR 347

නීතිපති එදිරිව කනගරත්නම්, 52 NLR 121 at 130, නාගලිංගම් විනිසුරුතුමා

බණ්ඩාර එදිරිව ප්‍රේමචන්ද්‍ර, [1994] 1 SLR 301 at p. 312 , G. P. S. ද සිල්වා අගවිනිසුරුතුමා

බ්‍රාහ්මණගේ අරුන් ෂෙරොන් සුරංග විජේවර්ධන එදිරිව ප්‍රියසෙන් අම්පාවිල සහ තවත් අය, SC (FR) No. 553/2002 , SCM 27. 05. 2005

බුලත්කුලම එදිරිව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශ ලේකම් [2000] 3 SLR 243, (SC), A. R. B. අමරසිංහ විනිසුරුතුමා

කැම්බෙල් සහ කෝසන්ස් එදිරිව එක්සත් රාජධානිය (Case law of the EUCT, Vol.1, P. 170)

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව දිසානායක. SC 26/2002, SCM 27. 05. 2003

චාස් පී. හේලි ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් එදිරිව වාණිජ සහ කර්මාන්ත සේවකයන් සහ තවත් අය [1995] 2 SLR 42

චොන්ග්වේ එදිරිව සැම්බියාව, Case No. 821 / 1998, මත පිළිගැනීම 25. 10. 2000

චූලසුභද්‍රා එදිරිව කොළඹ විශ්ව විද්‍යාලය [1985] 1 SLR 244

[ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ තීන්දුව] CA (Writ) No. 668 / 2006 , CA (Writ) 184 / 2006

[ජාතික පොලිස් කොමිසම පිළිබඳ තීන්දුව] CA (Writ) No. 555 / 2006

ලංකා පාරිභෝගික සංගමය එදිරිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ තවත් තුන් දෙනෙක් CA (Writ) Application No. 1776 / 2003, CA Minutes 25. 07. 2005

ද මෙල් එදිරිව ද සිල්වා 51 NLR 105 (DB)

ද මෙල් එදිරිව ද සිල්වා 51 NLR 282

ද සිල්වා එදිරිව අතුකෝරල [1993] 1 SLR 283, (SC) M. D. H. ප්‍රනාන්දු විනිසුරුතුමා

ඩෙල්ගොඩෝ පේස් එදිරිව කොලොම්බියා, Case No. 195 /1985, මත පිළිගැනීම 1990.07.12

ඩයස් එදිරිව අබේවර්ධන 68 NLR 109

වෛද්‍ය කුනන්දන් එදිරිව යාපනය විශ්ව විද්‍යාලය 2006 (1) ALR 1, ශ්‍රී ස්කන්දරාජා විනිසුරුතුමා (CA)

වෛද්‍ය ශිරන්ති පෙරේරා එදිරිව කොළඹ විශ්ව විද්‍යාලය 2006 (2) ALR කේ. ශ්‍රීපවන් විනිසුරුතුමා

එදිරිවීර එදිරිව කපුකොටුව [2003] 1 SLR 228

සී/ස පාරිසරික පදනම එදිරිව ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය SC (FR) Application No. 47/2004, SCM 28. 11. 2005, සරත් එන්. සිල්වා අගවිනිසුරුතුමා

ඒක පාර්ශවික පාකර් 1953 (1) WLR 1150

ෆායිස් එදිරිව නීතිපති [1995] 1 SLR 372

ෆාර්වින් එදිරිව විභාග කොමසාරිස් විජයසිරි සහ තවත් අය [2004] 1 SLR 9

ප්‍රනාන්දු එදිරිව ජයරත්න 78 NLR 123

ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව [1996] 1 SLR 157, (SC) A. R. B. අමරසිංහ විනිසුරුතුමා

ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව [1996] 1 SLR 157, M. D. H. ප්‍රනාන්දු විනිසුරුතුමා

ප්‍රනාන්දුපුල්ලේ එදිරිව ඉඩම් සහ කෘෂිකර්ම ඇමති 79 (1) NLR

ගමැතිගේ එදිරිව සිරිවර්ධන [1988] 1 SLR 385

එච්. සී. එම්. ඒ. එදිරිව නෙදර්ලන්තය, Case No. 213 / 1986, පිළිගැනීම 1989.03.30

එච්. ඩබ්. වනසිංහ සහ තවත් අය එදිරිව කොළඹ විශ්ව විද්‍යාලය සහ තවත් අය CA (Writ) Application No. 1261 / 2004 , CA Minutes 2006. 07. 06, ශ්‍රීස්කන්දරාජා විනිසුරුතුමා

හැම්ඩාර්ඩ් ඩවඛානා එදිරිව යුනියන් ඔෆ් ඉන්දියා AIR 1960 SC, p. 544

හිදර් මන්ඩි එදිරිව මධ්‍යම පරිසර අධිකාරිය සහ තවත් අය SC Appeal 58 / 2003, SC Minutes 2004. 01. 20

හේවගේ එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව SC No. 627 / 2002, SCM 2003. 08. 08

හේවාකුරුප්පු එදිරිව තේ කොමසාරිස් ජී. ඒ. ද සිල්වා සහ තවත් අය SC (FR) No. 118 / 1984 , SCM 1984. 11. 10

රත්නගෝපාල් හිදී 70 NLR 409

විජේතුංග හිදී 72 NLR 514

ජයසේන එදිරිව පුංචි අප්පුහාමි [1980] 1 SLR

ජෝන් ඩබ්. රස්ට් එදිරිව වැන් ඩිමන් ස ලෙවිස් කම්පැණි (1915) 60 US lawyers Ed. 679, at 690

ජෝසප් පෙරේරා එලියස් බෲට්න් පෙරේරා එදිරිව නීතිපති [1992] 1 SLR 199

කේ. සී. අධ්‍යපාතන් එදිරිව නීතිපති, SC Application No. 17 of 1979

කනපතිපිල්ලායි මච්චවාලවන් එදිරිව කාර්යභාර නිලධාරී, කෙසෙල් තුඩුව, ත්‍රිකුණාමලය [2005] 1 SLR 341

කරුණාතිලක සහ තවත් අයෙක් එදිරිව මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක සහ තවත් අය [1999] 1 SLR 157, at p. 180

කරුණාතිලක එදිරිව දිසානායක [1999] 1 SLR 157

කේමසිරි කුමාර කල්දේරා නඩුව SC (FR) Application No. 343 / 1999, SCM 2001. 11. 06

රජ එදිරිව නූර්දීන් 13 NLR 115

කෝරලලියනගේ පාලිත තිස්ස කුමාර එදිරිව සිල්වා සහ තවත්, SC (FR) Application No. 121 / 2004 , SCM 2006. 02. 17

ලීඩා වයලට් සහ තවත් අය එදිරිව විදානපතිරණ, කාර්යභාර නිලධාරි දික්වැල්ල පොලිස් ස්ථානය සහ තවත් අය [1994] LKCA 45; [1994] 3 SLR 377, 1994. 11. 16, සරත් නන්ද සිල්වා විනිසුරුතුමා

ලිලන්ති ද සිල්වා එදිරිව නීතිපති සහ තවත් අය [2000] 3 SLR 155

ලොකුගලප්පත්ති සහ තවත් අය එදිරිව රජය, HC Ratnapura No. 121/ 1994, CA 93 - 99 / 1999

මහේන්තිරන් එදිරිව නීතිපති SC (FR) Application No. 68/1980, SCM 1980. 08. 05

මෛත්‍රීපාල සේනානායක එදිරිව මහින්දසෝම සහ තවත් අය, SCC Appeal No. 41 / 1996 , SCM 1996. 12. 14

මනෝහර එදිරිව සභාපති පේරාදෙණිය මණ්ඩපය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය BALR [1983] Vo.1 , Prt II , p. 45

කොළඹ නගරාධිපති එදිරිව කොළඹ නගර සභාවේ අල්ලස් කොමිෂන් සභාව, 41 CLW 30

මැදිවක එදිරිව දිසානායක [2001] 1 SLR 177 (SC)

මෙන්ඩිස් ෆවුසි සහ තවත් අය එදිරිව ගුණවර්ධන, G. P. A. සිල්වා, [1978 - 79] 2 SLR 322

මුසාජී එදිරිව ආතර් සහ තවත් අය, 2004 (2) ALR 1, වීරසූරිය විනිසුරුතුමා (SC)

එන්. වී. කේ. කේ. වේරගොඩ, ප්‍රධාන ලේකම්, එක්සත් ජාතික පක්ෂය එදිරිව දිසානායක සහ තවත් අය (CA) No. 330 / 2006, CA Minutes 2006. 03. 24, ශ්‍රීපවන් විනිසුරුතුමා

එන්. ඩබ්. ජයන්ත විජේසේකර සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය SC (FR) Application Nos. 243 , 244 , 245 / 2006, SCM 2006. 10. 16

නක්කුඩා අලි එදිරිව ජයරත්න 5 NLR 457

නල්ලරත්නම් සිංගරාසා එදිරිව නීතිපති SC (spl) L. A. No. 182 / 1999, SCM 2006. 19. 15

පෙරේරා එදිරිව එදිරිසිංහ [1995] 1 SLR 148, at 16

පීරිස් එදිරිව රූපසිංහ [2000] 1 SLR 40

ප්‍රේමචන්ද්‍ර එදිරිව ජයවික්‍රම [1994] 2 SLR 90 (SC)

ආර්. ඒ. පී. එන්. සහ තවත් අය එදිරිව ආර්ජන්ටිනාව Case Nos. 349 - 345 / 1988, පිළිගැනීම 1990.03.26

රහුමා උම්මා එදිරිව දසනායක [1996] 2 SLR 40

රිඩ්ජ් එදිරිව බොල්ඩ්වින් 1964 (AC) (HL) 40

එස්. ඊ. එදිරිව පොඩිනිලමේ සහ තවත් අය SC Appeal No. 42 / 1996

සංජීව එදිරිව සුරවීර [2003] 1 SLR 90 37

සන්නස්ගල එදිරිව කැළණිය විශ්ව විද්‍යාලය [1991] 2 SLR 193

සීමාන්මෙරු පතිරණගේ ශාන්ත ධර්මප්‍රිය පතිරණ එදිරිව නියෝජ්‍ය පොලිස්පති පොලිස් භටයන් පුහුණුකිරීම සහ තවත් අය CA (Writ) Application No. 1123 / 2002 CA Minutes 2006. 10. 09

ශාහුල් හමීඩ් එදිරිව රූපසිංහ [1990] 1 SLR 104

ශාහුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ තවත් අය එදිරිව කේ. උඩුගම්පල සහ තවත් අය SC (FR) Application Nos. 68 / 2002 සහ 73 - 76 / 2002 , SCM 2004. 01. 29

සිල්වා එදිරිව බණ්ඩාරනායක [1997] 1 SLR 92

සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ [2003] 2 SLR 63

සිල්වා සහ තවත් අය එදිරිව සිද්දික් [1978 - 79] 1 SLR 166

සිරිසේන එදිරිව පෙරේරා [1991] 2 SLR 9

සොනික්නෙට් ටෙක්නොලොජීස් (පුද්) සමාගම එදිරිව මහින්දදාස වෛද්‍යාලංකාර සහ තවත් අය SC (FR) Application No. 471 / 2000

සුජීව අරුණසේනසිංහ එදිරිව නුගේගොඩ පොලිස් ස්ථානාධිපති සහ තවත් තුන් දෙනෙක් [2003] 1 SLR 172, at 186

සුදාකරන් එදිරිව භාරතී [1989] 1 SLR 46

තවනීතන් එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් සහ තවත් අය [2003] 1 SLR 74

ශ්‍රීක් නඩුව 127 B (1969) Co. Rep. 70

කොළඹ නගරාධිපති එදිරිව කොළඹ නගර සභාවේ අල්ලස් කොමසාරිස් 41 CLW 28

කොළඹ නගරාධිපති එදිරිව කොළඹ නගර සභාවේ අල්ලස් කොමසාරිස් 41 CLW 33

ටයිරර් එදිරිව එක්සත් රාජධානිය [1989] 1 SLR 46

වීරකේසරී ලිමිටඩ් එදිරිව ප්‍රනාන්දු 6 NLR 145

වේලු එදිරිව වේලු 76 NLR 21

වික්ටර් අයිවන් එදිරිව සරත් නන්ද සිල්වා නීතිපති සහ තවත් අයෙක් [1998] 1 SLR 340

විග්නේෂ්වරන් සහ ස්ටීවන් එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය [2002] 3 SLR 59 (CA) , 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත බලන්න

විෂුවලිංගම් එදිරිව ලියනගේ [1983] 1 SLR 203

ඩබ්. කේ. සී. පෙරේරා එදිරිව මහාචාර්ය දයා එදිරිසිංහ [1995] 1 SLR 148

වීරවංශ එදිරිව නීතිපති සහ තවත් අය [2000] 1 SLR 37

වැවලගේ රාණි ප්‍රනාන්දු (මියගිය ළමාහේවගේ ලාල්ගේ බිරිඳ) සහ තවත් අය එදිරිව සීදුව පොලිස් ස්ථානයේ සුළු අපරාධ අංශයේ කාර්යභාර නිලධාරී සහ තවත් අට දෙනෙක් SC (FR) Application No. 700 / 2002, SCM 26. 07. 2004

වික්‍රමසිංහ එදිරිව ද සිල්වා SC 551 / 1998 , SCM 31. 08. 2001

වික්‍රමසිංහ එදිරිව ද හේරත් [1990] 2 SLR 348

වික්‍රමසිංහ එදිරිව තම්බයියා 46 NLR 105

ගෙනහැර දක්වන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ නඩු තීන්දු

ඇන්තනි මයිකල් එම්මානුවෙල් ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 83 / D/ 1189 / 2003, මත පිළිගැනීම 31.03.2005

- *හිරාන් ඒකනායක එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 88 / D/ 1201 / 2003, අවසරය මත දුන් තීන්දුව 31.103.2006*

ජයලත් ජයවර්ධන එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 75 / D/ 916 / 2000, මත පිළිගැනීම 22.07.2002

ජෙගදීස්වර ෂර්මා එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 78 / D/ 90 / 2000, මත පිළිගැනීම 31.07.2003

නල්ලරත්නම් සිංගරසා එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 81 / D/ 1033 / 2001, මත පිළිගැනීම 21.07.2004

නිමල ජෝශප් කන්‍යා සොහොයුරිය සහ ශ්‍රී ලංකාවේ මෙන්සින්ජෙන්හි ප්‍රැන්සිස් සාන්තුවරයාගේ තුන්වන නිකායේ සිරි කුරුසියේ ගුරු කන්‍යා සොහොයුරියන් එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 85 / D/ 1249 / 2004, මත පිළිගැනීම 21.10.2005

සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 87 / D/ 1250 / 2004, අවසරය මත දුන් තීන්දුව 14.07.2006

- *සුසිලා මාලනී දහනායක සහ තවත් අය එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 87 / D/ 1331 / 2004, අවසරය මත දුන් තීන්දුව 25.07.2006*

තෝමස් එදිරිව ජැමෙයිකා නඩු අංක 266/1989, මත පිළිගැනීම 02.11.1993

වික්ටර් අයිවන් මාජුවාන කංකානම්ගේ එදිරිව ශ්‍රී ලංකාව CCPR / C / 81 / D/ 909 / 2000, අවසරය මත දුන් තීන්දුව 27.07.2004

ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2007

ශ්‍රී ලංකා රාජ්‍යය 2006 වර්ෂය තුළ සිය දේශීය මෙන්ම අන්තර්ජාතික මානව අයිතිවාසිකම් වගකීම් කොතෙක්දුරට ඉටුකර ඇතිද, එතුළින් සිය පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම කුමන මට්ටමකින් සුරක්ෂිතකර පෝෂණයකර ඇත්තේද යන කරුණු විදහා දක්වමින් පළකරන ලද "ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2007" වාර්ෂික වාර්තාවේ සමස්ත සමාලෝචනය සහ එම වාර්තාවේ සුවිශේෂ වැදගත්කමකින් යුත් පරිච්ඡේද තුනක සම්පූර්ණ සිංහල පරිවර්තනයයි.

මෙම කෘතිය තුළ,

- වර්ෂ 2006 දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සමාලෝචනය
- මානව හිමිකම් සඳහා වන අධිකරණමය ආරක්ෂණය
- අභ්‍යන්තරිකව අවතැන් වූ තැනැත්තන් සහ සිවිල් ජනතාවගේ ආරක්ෂණය
- ශ්‍රී ලංකාවේ අභිචෝදන ක්‍රමය තුළ විමර්ශනය සඳහා වූ කොමිසම්හි කාර්යභාරය

යන පරිච්ඡේදයන් ඇතුළත්ව ඇත.

ISBN 978-955-1302-22-1

මිල: රු. 350/-

නීතිය හා සමාජ භාරය
3, කින්සි ටෙරසය
කොළඹ 8
ශ්‍රී ලංකාව

ටෙලි : 2691228 / 2684845
ෆැක්ස් : 2686843
ඊමේල් : 1st@eureka.lk
වෙබ් : www.lawandsocietytrust.org

නීතිය හා සමාජ භාරය

මුද්‍රණය: සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම